# ප්‍රතිසංකරණය

## සභා ජීවිතයේ දිව්‍යමය නිර්මිතිය පිළිබඳ

## සමීක්ෂණයක්

*මේ කාලයෙහි සභාව කරණකොටගෙන දෙවියන්වහන්සේගේ අනේකවිධ ප්‍රඥාව දැනගන්නා පිණිසය.*

**(එපීස 3:10)**

**ඩ්වයිට් ස්මිත්**

# පටුන

පෙර වදන 02

| | |
|---|---|
| **කොටස 1**<br>**සභාවන් සඳහාවූ දෙවියන් වහන්සේගේ අරමුණු** | |
| 1. අපි අපේ ජාතියේ ඉතිහාසය ලියන්නෙමු | 04 |
| 2. සභාවේ අරමුණ කුමක්ද? | 16 |
| 3. සභාව එහි සාර්ථකත්වය මැනිය යුත්තේ කෙසේද? | 27 |
| 4. අපගේ ජීවිත සඳහාවූ ගබඩාකාරීත්වය | 41 |
| **කොටස 2**<br>**සභාව එහි අරමුණ සඳහා ජීවත් වීමට බලය ලබා දීම** | |
| 5. යේසුස් වහන්සේ උන්වහන්සේ සභාවට නායකත්වය ලබා දුන්සේක | 60 |
| 6. සභා නායකත්වය තුළ අන්තර් යැපීම | 70 |
| 7. ඇමරිකානු සභාව ගැන දැන් කුමක් ද? | |
| උපග්‍රන්ථය 1: දෙවියන් වහන්සේගේ සභාව සඳහාවූ උන්වහන්සේගේ අරමුණ ක්‍රියාත්මක කිරීම | 97 |
| උපග්‍රන්ථය 2: ලෝකයේ වෙනත් තැන්වල අපගේ අරමුණ ප්‍රක්ෂේපණය කිරීම | 99 |
| සටහන් | 109 |

# පෙරවදන

ප්‍රතිසංස්කරණය: සභා ජීවිතයේ දිව්‍යමය නිර්මිතිය පිළිබඳ සමීක්ෂණයක් වන මෙම කෘතිය මා විසින් ප්‍රථම වරට ප්‍රකාශයට පත් කරන ලද්දේ 2010 වර්ෂයේදීය. මෙම කෙටි සංස්කරණයේ අරමුණ වන්නේ සභාව සඳහාවූ දෙවියන්වහන්සේගේ අරමුණ වෙනුවෙන් සහ එය මෙහෙයවන්නන් උදෙසා සරල මෙවලමක් ලබා දීම වේ. මීට අමතරව, මා විසින් ලියනලද පළමු වෙළුමේ සිට, නායකත්වය, ගෝලත්වය සහ දේව ජනතාව සඳහාවූ උන්වහන්සේගේ අරමුණ පිළිබඳ සංකල්ප ගැන වඩාත් පුළුල් ලෙස ලියා ඇති අතර, මෙම කරුණුවල ගැඹුර සොයා ගැනීමට කැමති අය සඳහා මෙම මාතෘකාවන්ට අදාළ පොත් දැන් තනි තනිව ලබා ගත හැකිව ඇත. [1]එබැවින් මෙම පොත සභා ජීවිතයේ දිව්‍යමය නිර්මාණය පිළිබඳ රස පරීක්ෂකයක් බව අපට පැවසිය හැකිය.

පසුගිය වසර කිහිපය තුළ ලොව පුරා සිටින තරුණ තරුණියන්ට බලපෑම් කිරීමට මට ලැබුණු අවස්ථා පිළිබඳව මම අතිශයින් කෘතඥ වෙමි. එම යෞවනයන් දැන් පරිණත වී ඇති අතර දෙවියන්වහන්සේගේ සැලසුම පිළිබිඹු කරන සභා ගොඩනගමින් එනම්, ශුභාරංචිය ප්‍රකාශ කරන්නන් හරහා සෑම ස්ථානයක්ම ශුභාරංචියේ අභිමුඛත්වයෙන් පරිපූර්ණය කරන්නාවූ, සන්තෘප්තිමත් සභා රෝපණය ලෙස අප විසින් හඳුන්වන උත්සාහයට නායකත්වය දෙති. වසර ගණනාවකට පෙර දෙවියන් වහන්සේ මගේ හදවත මත තැබූ බරක් වන: ලෝක ශුභාරංචිය ප්‍රකාශ කිරීමේ කාර්යය ඔවුන්ගේ නගර, ජාතීන් සහ ඉන් ඔබ්බට ගෙන යන දේවභක්තික නායකයින්ගේ පරම්පරාවක් ඇති කිරීමේ කාර්යභාර ඉටු කිරීමට උර දෙන ඔබ සැමට ස්තූතියි.

**ඩවයිට් ස්මිත්**

**මාර්තු 2, 2017**

# කොටස 1

# සභාවන් සඳහාවූ දෙවියන්වහන්සේගේ අරමුණ

# 1
# අපි අපේ ජාතියේ ඉතිහාසය ලියන්නෙමු

ඇමරිකාවේ සභාවන් ඉබාගාතේ ගොස් ඇත. මෑත වසරවලදී, අපගේ ස්වාමින්වහන්සේ හා ගැලවුම්කරුවාණන් වන යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ *"නුඹලා ගොස් සියලු ජාතීන් ගෝලයන් කරපල්ලා" (මතෙව් 28:19 බලන්න)* යන අවසාන ආඥාව සම්පූර්ණ කිරීමට වසර දෙදහසක් පුරාවට තමන්ව කැපකළ දහස් සංඛ්‍යාත ක්‍රිස්තු අනුගාමිකයන්ගේ කැඳවීම සහ කැපවීම අමතක කිරීම හෝ නොසලකා හැරීම හෝ පහත් කොට සැලකීම සිදුවී තිබේ. දෙවියන් වහන්සේගේ මෙම ශ්‍රේෂ්ඨ මිනිසුන්ගේ සහ ස්ත්‍රීන්ගේ සළුව අතට ගන්නවාට වඩා, අද බටහිර සභාවේ බොහෝ දෙනෙක්, මිනිසුන් ක්‍රිස්තුස් වහන්සේ වෙතට දිනාගැනීමේ උත්සාහයක් ලෙස, රන්වන් භාෂාවෙන් කතා කරන නායකයින්, සුපිරි තරු-ගණයේ නමස්කාර කණ්ඩායම්, මහා පරිමාණ ගොඩනැගිලි, සහ අසංඛ්‍යාත සමාජ වැඩසටහන් මගින් අදාළත්වයක් පෙන්වීමට උත්සාහ කරති.

මෙවන් ක්‍රියාදාමයන් මා "ඇවිත් බලන්න" ආකෘතියක් ලෙස හැඳින්වීමට කැමතියි. අද කාලයේ සභාවන් මිනිසුන්ට එක්රැස් විය හැකි ස්ථානයක් ලෙස සැලකීමට නැඹුරු වන අතර, කවරදාකටත් වඩා විශාලවූ ජනකායක් තමන් වෙතට ඇද ගැනීමේ උත්සාහයක නියැළෙති. නමුත් අද අපි කරන්නට යන දේ අපේ ජාතියේ ඉතිහාසයේ කොටසක් බවට පත් වීමට නියමිතය. එක්සත් ජනපදයේ සභාවන්වල අප ගොඩනඟා ඇති ව්‍යුහයන් සම්පූර්ණයෙන්ම බයිබලානුකූල ප්‍රමිතියට අනුකූල බව අපට විශ්වාසද?

අවුරුදු තිහකට පෙර මගේ බිරිඳ පැටී සහ මම සන්තෘප්ත සභා රෝපණය (SCP) නමින් සේවාවක් ආරම්භ කළෙමු. අපගේ පණිවිඩය අලුත් දෙයක් නොවේ. එය හුදෙක් බයිබලයේ කේන්ද්‍රීය කතන්දරයේ, එනම්, දෙවියන් වහන්සේ පව්කාර මිනිසුන් මුදවා ගැනීමට සහ ඔවුන් සඳහා වූ උන් වහන්සේගේ මුල් අරමුණට ඔවුන්ව ප්‍රතිෂ්ඨාපනය කිරීමට ගැලවුම්කරුවෙකු එවූ බවට ඇති පුවතේ දේවධර්මීය දීර්ඝ කිරීමක් සහ සභාව වසර දෙදහසක් තිස්සේ තමන් ගැන අවබෝධ කරගත් දේ පිළිබඳව ඓතිහාසික දීර්ඝ කිරීමකි.

බයිබලයේ කථා වස්තුව ඇත්තෙන්ම සරලය. එය දෙවියන් වහන්සේ තම ස්වරූපයෙන් මවනලද පුරුෂයෙක් සහ ස්ත්‍රියෙක් ගැන සඳහන් කර ඇති උත්පත්ති පොතෙන් ආරම්භ වන

බව අපි කියවීමු. උත්පත්ති වාර්තාවෙන් අපට පෙනෙන්නේ, මනුෂ්‍ය වර්ගයා සැලසුම් කර ඇත්තේ, පළමුව, දෙවියන් වහන්සේට සම්බන්ධ වීමටත්, දෙවනුව, උන් වහන්සේ ඔවුන් තැබූ ස්ථානයේ මවා ඇති සියල්ලේ ක්‍රියාකාරී භාරකාරත්වයෙන් ලෝකය තුළ උන් වහන්සේව නියෝජනය කිරීමටත් බවයි. එය කෙසේ වෙතත්, මෙය තුලදී ඔවුන් අසාර්ථක වූහ. ඔවුන්ගේ අසාර්ථකත්වයේ සිට, දෙවියන් වහන්සේ ඔවුන්ගේ ප්‍රතිෂ්ඨාපනය උන් වහන්සේගේ අතට ගත් අතර, එතැන් සිට මෙම කථා වස්තුව ශුද්ධ ලියවිල්ලේ පිටු හරහා දිග හැරේ. ආත්මයාණන්වහන්සේ හරහා යේසුස් වහන්සේ තුළ දෙවියන් වහන්සේගේ දයාව සහ ඒකපාර්ශ්වික ක්‍රියාව නිසා, දෙවියන් වහන්සේ පුරුෂයන් සහ කාන්තාවන් හට මැවීමේ දී උන් වහන්සේට තිබූ මුල් සැලැස්ම වන: උන් වහන්සේ සමඟවූ සම්බන්ධතාවය සහ උන් වහන්සේව නියෝජනය කිරීම ඔවුන් තුළ ප්‍රතිෂ්ඨාපනය කිරීමේ අරමුණ, ඔවුන්ට ලබා ගැනීමට කරුණාව ලබා දුන්සේක. [2] මේ ලෝකයේ අවසානය ධර්මිෂ්ඨකම ප්‍රතිෂ්ඨාපනය කිරීම වනු ඇත, එය ස්වල්ප දෙනෙකු තුළ පමණක් නොව ධර්මිෂ්ඨකම රජකම් කරනු ලබන, මනුෂ්‍යයන් දෙවියන් වහන්සේගේ සැලැස්ම තුළ වර්ධනය වී පරිණත වන මුළු ලොකයකම වනු ඇත.

ශුභාරංචියේ කේන්ද්‍රීය පණිවිඩය නම්, පුරුෂයින්, ස්ත්‍රීන් සහ ළමයින් ආදම් සහ ඒව තුළ දෙවියන් වහන්සේගේ මුල් සැලැස්මට ප්‍රතිෂ්ඨාපනය කළ හැකි බවයි: එනම්, අප වෙනුවට උන් වහන්සේගේ පුත්‍රයා වන අවසාන ආදම්ගේ මරණය, භූමදානය සහ නැවත නැඟිටීම හරහා උන් වහන්සේ සමඟ ඇති *සම්බන්ධය* තුළට සහ උන් වහන්සේ නියෝජනය කිරීමට, එනම් අප උන් වහන්සේට සහ උන් වහන්සේගේ රාජ්‍යයට ප්‍රයෝජනයට ගෙන ආ හැකි ලෙස, ශුද්ධාත්මයාණන් දිනපතා අපව ගෙන යන සෑම ස්ථානයකම විශ්වාසවන්තව අපගේ ජීවිත භාර ගනිමින් යේසුස් වහන්සේ තුළ දෙවියන් වහන්සේගේ දයාවේ පණිවිඩයේ ප්‍රතිරූපයක් බවට පත්වීමයි. මනුෂ්‍ය වර්ගයාගේ පාපකාරී තත්ත්වය සුව කිරීමට ශුභාරංචියට බලය ඇති බවට අපගේ ජීවිත වඩාත් පැහැදිලි සාක්ෂියක් බවට පත්වේ.

දෙවියන් වහන්සේගේ සෙනඟගේ පෙර පරම්පරාවල බොහෝ දෙනෙක් අවබෝධ කරගෙන ඇති පරිදි, නැතිවූ පුරුෂයන් සහ ස්ත්‍රීන් තමන්වහන්සේ වෙතම මුදවා ගැනීමටත්, ඔවුන්ව තමන්වහන්සේ සමඟ සබඳතාවයට සහ නියෝජනයට ප්‍රතිෂ්ඨාපනය කරන පිණිසත් දෙවියන්වහන්සේ දූත මෙහෙවරක යෙදී සිටින සේක.

මෙහි දෙවියන්වහන්සේගේ සභාව සඳහා වූ උන්වහන්සේගේ අරමුණ ගැබ්ව ඇත. අපි, එනම් දැනටමත් මුදවා ගත් අය, මෙම මෙහෙයුමේ සේවකයෝ වන්නෙමු. අපි දෙවියන්වහන්සේගේ වචනය තුළින් උන්වහන්සේ සමග දිනපතා සම්බන්ධ වී සිටින විට සහ අප පෘථිවියේ සිටිමින්,

අපගේ පුද්ගලික සහ අද්විතීය කැඳවීම් වලදී උන්වහන්සේ නියෝජනය කරන විට, අපි දෙවියන්වහන්සේව මහිමයට පත් කරන අතර අනායයන් උන්වහන්සේ තුළ ප්‍රතිෂ්ඨාපනය කිරීමට ඇදගැනීමට උන්වහන්සේ විසින් භාවිතා කරනු ලැබෙනු ඇත. SCP හි අපි සන්තෘප්තිමත් එවැන්ජලිස්තවාදය ලෙස හඳුන්වන්නේ මෙයයි - එනම් සෑම නිවසක්ම, සේවා ස්ථානයක්, ප්‍රජාවක්, නගරයක් සහ සෑම ජාතියක්ම දෙවියන් වහන්සේගේ සෙනඟ හරහා ශුභාරංචිය සමඟ සංතෘප්ත කිරීම කළයුතු වේ.

පාවුල් එපීස 3:8-11 හි උන්වහන්සේගේ සෙනඟ සඳහා දෙවියන්වහන්සේගේ අරමුණ ප්‍රකාශ කරනු ලබයි: ***“අනුග්‍රහය දෙන ලදී . . . එසේ කළේ අපගේ ස්වාමිවූ ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ දෙවියන්වහන්සේ විසින් අභිප්‍රාය කරනලද සදාකාල අභිප්‍රාය ප්‍රකාරයට ස්වර්ගීය ස්ථානවල අධිපතීන්ටත් බලධාරීන්ටත් මේ කාලයේ සභාව කරණකොට ගෙන උන්වහන්සේගේ අනේක විධ ප්‍රඥාව දැනගන්ට ලැබෙන පිණිසය.”*** සදාකාලිකත්වය යනු යේසුස් වහන්සේ තුළ දෙවියන් වහන්සේගේ ආශ්වර්යමත් ක්‍රියාවන්හි ප්‍රේක්ෂකාගාරයක් වන අතර සභාව යනු අධ්‍යාත්මික පාලකයින්ට සහ බලධාරීන්ට මෙය ප්‍රදර්ශනය කිරීමට උන්වහන්සේ භාවිතා කරන වර්තමාන මෙවලමයි. මෙම භූමික ක්‍රියාවන් කාලය කෙරෙහි නොව සදාකාලිකත්වය කෙරෙහි අවධානය යොමු කරයි; ඔවුන් දෙවියන් වහන්සේගේ සදාකාලික අරමුණ තුළ මුල් බැස ඇත. SCP හි අපි සභාව ගැන කතා කරන විට, අපි සභාවේ ක්‍රියාදාමයක් ප්‍රතිනිර්මාණය කිරීමට උත්සාහ නොකරමු, ඒ වෙනුවට ශුද්ධ ලියවිල්ලේ කථා වස්තුව ගැන ඉබාගාතේ යන පරම්පරාවකට මතක් කිරීමට අප වෙර දරමු: එය අප ගැන නොවේ; එය දෙවියන් වහන්සේ සහ උන්වහන්සේගේ මිදීමේ ක්‍රියාවන් ගැන ය. සභාව, එසේ නම්, මෙම මිදීමේ ක්‍රියාව සහ ශුභාරංචිය තුළ ඇති ගැළවීම උන්වහන්සේගේ මැවිල්ලේ ඉතිරි කොටස වෙත සම්ප්‍රේෂණය කිරීමට දෙවියන් වහන්සේගේ වර්තමාන මෙවලම වේ. අපි නායකත්වය ගැන කතා කරන විට, අපි ඉබාගාතේ යන පරම්පරාවකට මතක් කර දෙන්නේ නායකත්වය පවතින්නේ එක් අරමුණක් සඳහා පමණක් බවයි: එය සභාව, මුළු ශරීරයක් ලෙස සහ තනි සාමාජිකයන් ලෙස, මෙම දෙවියන්ගේ සැලසුම තුළ පූර්ණ හා විශ්වාසවන්තව ගමන් කරවීමට වේ. අපගේ ලෝකයේ සෑම සන්දර්භයකම දෙවියන්වහන්සේගේ මෙම අරමුණ උපක්‍රමශීලීව ක්‍රියාවට නැංවීම ගැන කතා කරන විට, අපි එකිනෙකා සිටින ස්ථානවල දෙවියන් වහන්සේ නියෝජනය කිරීමට උත්සාහ කළ සේවය කිරීමට කැඳවා තිබූ විශ්වාසවන්ත අනුගාමිකයින්ගේ වෙනත් පරම්පරාවන්ගෙන් අප ඉගෙන ගත් දේ ලබා දෙන්නෙමු.

## දෙවියන්වහන්සේගේ සභාව මෙහෙයුම තුළ

නැවතත්, මෙම ඉගැන්වීම අලුත් දෙයක් නොවේ. වසර පනහකට ආසන්න මගේ මෙම භාරකාරත්වයට සහභාගී වී සිටින මට අවම වශයෙන් අපට පෙර ගිය සහ අප ඉගෙන ගත් තවත් පරම්පරා තුනක් සොයා ගත හැකිය. වසර පනහකට පෙර, කෙනත් ස්ට්‍රැචාන් වැනි මිනිසුන් සන්තෘප්ත එවැන්ජලිස්තවාදය ගැන කතා කළහ. සභාව නිශ්චිත ස්ථානයකට නිශ්චිත කාලයක් එකට තම උත්සාහයන් එක්රැස් කළේ නම්, ලෝකයට ශුභාරංචිය ගෙන යාමේ කාර්යය සම්පූර්ණ වී ඇති බව අපට දැකිය හැකිද? ඔහු බොහෝ දේ ඉගෙන ගත්තේය, ඔහු බොහෝ දේ ඉටු කළේය, නමුත් බොහෝ සේ ඉගෙන ගැනීමට ඉතිරි කර ගත්තේය. ඊළඟ පරම්පරාව මෙම අත්දැකීම ප්‍රතික්ෂේප කළේ නැත; ඔවුන් එයින් ඉගෙන ගෙන එම ඉගෙනුම දීර්ඝ කළහ.

මගේ ජීවිතයේ වසර හතළිහකට වැඩි කාලයක් තිස්සේ මිනිසුන්ගේ චලනයන් ගැන සිතීමට ඇදහිලිවන්තයන් කැඳවූ ඩොනල්ඩ් මැක්ගව්රන් වැනි මිනිසුන් විසින් සිතීමට සහ ඉගෙනීමට මා උත්තේජනය කර ඇත. රැල්ෆ් වින්ටර්, යේසුස්වහන්සේගේ අනුගාමිකයන්ව කැඳවූයේ ලෝකයේ තමන්ට ළඟා නොවූ කොපමණ ජනකායක් සිටිනවාද යන්න ගැන සිතා බැලීමටය. ජිම් මොන්ට්ගොමරි, දෙවියන් වහන්සේගේ සෙනඟට අභියෝග කළේ මිනිසුන් හෝ ස්ථානයක් ශුභාරංචිය සමඟ සංතෘප්ත කිරීම සෑම කුඩා ස්ථානයකම සභාවක් සිටුවීමෙන් ඵලදායී ලෙස ඉටු කළ හැකිද යන්න ගැන අසමින්ය. තවත් බොහෝ දෙනෙක් ඔවුන්ගේම සූක්ෂ්මතා සහ එකතු කිරීම් ගෙන ආ අතර, මම ඔවුන් සියල්ලන්ගෙන් ඉගෙන ගත්තෙමි. මෙම පසුගිය වසර හතළිහ තුළ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සභාව ලොව පුරා පෙර නොවූ විරූ වර්ධනයක් අත්විඳ ඇත. මීට වසර පනහකට පමණ පෙර මම මෙම භාරකාරත්වයේ මගේම ගමන ආරම්භ කළ විට, බොහෝ දෙනෙකුට හැඟී ගියේ එවැන්ජලිස්තකරණයේ වීදුරුව අඩක් හිස් වූවාක් මෙනි. තවත් බොහෝ පරම්පරාවන් සිහින මැවූ, ප්‍රතිචාර දැක්වූ සහ පරිත්‍යාග කර ඇති දේ දකින පරම්පරාවක කොටසක් වීමට ලැබීම ගැන අද මම ප්‍රීති වෙමි: ගෝලීය වශයෙන් ක්‍රිස්තුස් වහන්සේ වෙතට වැඩි වැඩියෙන් පිරිමින් සහ කාන්තාවන් පැමිණේ. අපි ජීවත් වන්නේ එම දර්ශනය තුළයි!

මගේ ජීවිත කාලය තුළ විශාල රැස්වීම් සහ එහි ප්‍රතිඵල වූ ක්‍රියාදාමයන් අද දවසේ ආශීර්වාදයට දායක වීමට දෙවියන් වහන්සේ විසින් භාවිතා කර ඇත. 1966 බර්ලිනයේ පැවති එවැන්ජලිස්වාදය පිළිබඳ ලෝක සමුළුව සභා සිටුවීමේ ව්‍යාපෘති මාලාවක් ආරම්භ කළේය. 'Dawn' දේවසේවයේ ජිම් මොන්ට්ගොමරි මෙම සම්මන්ත්‍රණය උපුටා දක්වන්නේ සමස්ත

ජාතීන් සඳහාම සහා සිටුවීමේ උපාය මාර්ගයක් සඳහා ඔහුගේ සෙවීමට එය හේතු වූ බව පවසමිනි. 1970 සහ 80 ගණන්වල බහුවිධ ලෝසාන් රැස්වීම් ලොව පුරා සිටින පිරිමින් සහ කාන්තාවන් කැඳවා ක්‍රිස්තුස් වහන්සේගේ ශරීරය තුළ ලෝකය සහ එයට ළඟා වීමට ගත යුතු දේ පිළිබඳව නව විඥානයක් ඇති කළේය. AD 2000, Aliance for Saturation Church Planting, unreached Peoples movement, සහ තවත් බොහෝ ව්‍යාපාර ඇති වූයේ දෙවියන්වහන්සේගේ මෙහෙයුමේ නිර්මාණය පෘථිවියේ කෙළවර දක්වා ව්‍යාප්ත කිරීමටයි.

එහෙත් මෙම කෙටි පනස් වසරක සමාලෝචනය පිළිබිඹු කරන්නේ පෘථිවියේ සභාවේ වසර දෙදහසක ජීවිතය හරහා ගමන් කර ඇති මිනිසුන් සහ ව්‍යාපෘතිවලින් කුඩා කොටසක් පමණි. මුල් සභාව විසිරී ගිය විට (ක්‍රියා 8:1 බලන්න), ප්‍රේරිතයන් මෙම ව්‍යාපාරය ආරම්භ කළේ, තෝමස් ඉන්දියාව දක්වා ශුභාරංචිය රැගෙන යමින් සහ පාවුල් මුළු රෝම අධිරාජ්‍යය එවැන්ජලිස්ත කිරීමත් සමඟය. පොලිකාර්ප්, උල්ෆිලාස්, පැට්රික් සහ කොලුම්බා වැනි අය හරහා මෙම ව්‍යාප්තිය වසර සිය ගණනක් පුරා පැවතුනි. රෝමානු කතෝලික සභාව තුළ සභාවේ අපෝස්තලික යැවීමේ ස්වභාවය තේරුම් ගත් අය නොමැතිව සිටියා නොවේ. බොනිෆේස්, රේමන්ඩ් ලල්, මැතිව් රිචි සහ තවත් බොහෝ දෙනෙක් ශුභාරංචිය ලෝකයට ගෙන යනු දැකීමට තම ජීවිතය කැප කළහ.

මොරවියන්වරු ප්‍රොතෙස්තන්ත ප්‍රතිසංස්කරණයෙන් පසු මුල් දිනවල නායකත්වය දුන් අතර වසර තුන්සියයක් පුරා පැවති නවීන මිෂනාරි ව්‍යාපාරය ස්ථාපිත කළහ. අද සභාව තනිව සිටින්නේ නැත. අපි හුදෙක් අනුප්‍රාප්තික පරම්පරාවක් වන අතර මිනිසුන් සබඳතාවයට සහ නියෝජනයට යළි පිහිටුවීම සඳහා දෙවියන් වහන්සේ තම මෙහෙවර ඉටු කිරීමට භාවිතා කරයි. අපි තවත් බොහෝ දෙනෙකුගේ උරහිස් මත සිටගෙන, ඔවුන්ගෙන් ඉගෙන ගනිමින්, ශුභාරංචිය ප්‍රකාශ කිරීමේ කර්තව්‍යය සම්පූර්ණ වී ධර්මිෂ්ඨකමේ ලෝකය පැමිණෙනු දකිමු!

SCP හි ඉගැන්වීමේදී අපි නොකඩවා අවධාරණය කරන පරිදි, දෙවියන් වහන්සේ ලෝකයේ කුමක් කිරීමට ගියත්, උන්වහන්සේ ක්‍රිස්තුස් වහන්සේගේ සියලු සෙනඟ හරහා එය කරන සේක. ක්‍රිස්තුස්වහන්සේගේ සෙනඟ යනු ලෝකයට සහ ස්වර්ගීය ස්ථානවල ප්‍රධානීන්ට සහ පාලකයන්ට අපව මවා ඇත්තේ උන්වහන්සේ උදෙසා සහ උන්වහන්සේගේ අරමුණු සඳහා බව ප්‍රකාශ කිරීම සඳහා දෙවියන්වහන්සේගේ ප්‍රාණවත් සැලසුම ය. දෙවියන් වහන්සේට බාධා නොපැමිණෙනු ඇත. උන්වහන්සේගේ පුත්‍රයා වන යේසුස් ක්‍රිස්තුස්ගේවහන්සේගේ මරණය, භූමදානය සහ නැවත නැඟිටීම තුළින් උන්වහන්සේගේ මුල් නිර්මාණය පුරුෂයන් හා ස්ත්‍රීන් තුළ ප්‍රතිෂ්ඨාපනය වනු ඇත.

කිතුනු ජීවිතය, නමස්කාරයේ ක්‍රියාවක් ලෙස, දෙවියන් වහන්සේගේ රාජ්‍යයට ආයෝජනය කළ යුතුය. නමුත් අපට එය ඵලදායී ලෙස ආයෝජනය කිරීමට නම්, අපගේ දෛනික ජීවිතය තුළ දෙවියන් වහන්සේගේ පරමාධිපත්‍යය යටතේ ජීවත් වීමට අප ඉගෙන ගත යුතුය! ශුද්ධාත්මයාණන් වහන්සේ අප තුළ පරිවර්තනයක් ක්‍රියා කරවන අතර, දෙවියන් වහන්සේගේ මිනිසුන් තුළ දෙවියන් වහන්සේගේ වචනය භාවිතා කරමින්, අපගේ ජීවිතයේ මෙම ආයෝජනය අපට පිරිනැමිය හැකිය. උන්වහන්සේ මෙය කරන්නේ දෙවියන් වහන්සේගේ මුල් සහ එකම අභිප්‍රාය වෙත අපව ප්‍රතිෂ්ඨාපනය කිරීමෙනි: එය නම් උන්වහන්සේ හා සමාන, උන්වහන්සේ වෙනුවෙන් ජීවත් වන සහ ලෝකයේ උන්වහන්සේව නියෝජනය කරන ජනතාවක් උන්වහන්සේ වෙනුවෙන් නිර්මාණය කිරීම වේ. දෙවියන් වහන්සේ අපව නිර්මාණය කර ඇත්තේ ක්‍රිස්තුස් වහන්සේගේ ශරීරයේ කොටසක් වීමට නිසා, මෙම පරිවර්තනය පැමිණෙන්නේ දෙවියන් වහන්සේ විසින්ම සාදාගත් ශරීරයක් තුළ අප වැනි අන් අය සමඟ ආශ්චර්යමත් ලෙස ඇසුරු කිරීමෙනි: එම ශරීරය සභාවය.

## දෙවියන් වහන්සේට වුවමනා මාර්ගය උන්වහන්සේට ලැබෙන විට

සෑම පරම්පරාවකටම "දෙවියන් වහන්සේ කර ඇති දේ බලන්න!" යනුවෙන් පැවසිට සිද්ධීන් සමුදායක් ඇත. අපගේ දෙවියන්වහන්සේ තම සෙනඟට සැපයීමේදී සහ ඔවුන් තුළින් අන් අයට උන්වහන්සේගේ ශුභාරංචිය පැහැදිලි කිරීමේදී සුළු හා විශාල හාස්කම් කරන්නාවූ දෙවි කෙනෙකු වන සේක. නමුත් අපි උන් වහන්සේගේ ශුභාරංචිය සියලු මිනිසුන් වෙත ගෙන යාමේ උන්වහන්සේගේ නියෝගය අනුව, ඉතිහාසයේ අන් කිසිවකට වඩා දෙවියන් වහන්සේ අපගේ පරම්පරාව තුළ බොහෝ දේ කරමින් සිටී.

දහසයවන සියවසේ ප්‍රතිසංස්කරණයේ අගේදී, ප්‍රොතෙස්තන්ත දූත මෙහෙවරේ නව රැල්ලක් දියත් කරන ලදී. දහඅටවන සියවසේ මැද භාගයේ සිට 1900 ආසන්න කාලය දක්වා යුරෝපීයයන් මෙම ව්‍යාපාරය මෙහෙයවීය. මෙම දූත මණ්ඩල රැල්ල දෙවන ලෝක සංග්‍රාමය දක්වාම පැවති අතර, සභාව මෙතෙක් දැක ඇති සංඛ්‍යාව අනුව, විශාලතම දූත මෙහෙවර යැවීමේ ප්‍රයත්නය ලෙස හැඳින්විය හැක.

නමුත් විසිවන ශතවර්ෂයේ අවසානය වන විට, ශුද්ධාත්මයාණන් වහන්සේ ගැඹුරු ලෙස අලුත් දෙයක් උපදවමින් සිටිසේක. බොහෝ ජාතීන්ගෙන් තවත් මිෂනාරිවරුන්, ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් බටහිර නොවන, ශුභාරංචිය බෙදා ගැනීමට ලොව පුරා යවන ලදී. යේසුස් වහන්සේගේ සභාව එහි යුදෙව් සහ පසුකාලීන යුරෝපීය මූලයන්ගෙන් ලොව පුරා ජාතීන් වෙත පැතිර ගියේය. මෙය ගෙන ආ ලොව පුරා සිටින මිලියන සංඛ්‍යාත කිතුනුවන් වසර

1900ක සභාව මින් පෙර කිසි දිනක සම්පූර්ණයෙන් නොදුටු දේ පෙන්නුම් කළේය: සෑම ගෝත්‍රයකින්ම, භාෂාවකින්ම සහ ජාතියකින්ම, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සභාව, ලොව පුරා බලයෙන් හා ස්ථිරභාවයෙන් රෝපණය විය.

මේ සඳහා හොඳ උදාහරණයක් වන්නේ ඉන්දියාවේ සභාවයි. 1987 දී සභා නායකයින් පනස්හත් දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් හමු වී මෙම ප්‍රශ්න දෙක ඇසුවහුය: දෙවියන් වහන්සේට ඉන්දියාව වෙනුවෙන් අවශ්‍ය කරන්නේ කුමක්ද? ඒ වගේම මේ ජාතියට දෙවියන්වහන්සේට අවශ්‍ය දේ උන්වහන්සේම කළා නම් එය කුමනකාර වනු ඇතිද? ශීඝ්‍රයෙන් වර්ධනය වන ජනගහනයට ශුභාරංචිය ගෙන ඒම සඳහා වසර දෙදහසක් තිස්සේ බොහෝ දෙනෙක් එම ජාතියේ වෙහෙස මහන්සි වී සිටියහ. මිලියන 850 ක ජනතාවක් සිටින ජාතියක අනෙක් පරම්පරාවල ශ්‍රමය මෙම නායකයින් පනස් හත් දෙනාගේ අවධානයෙන් ගිලිහී ගියේ නැත. මෙම නියෝජිතයින් නිගමනය කළේ දෙවියන් වහන්සේට අවශ්‍ය වූයේ ඉන්දියාවේ සෑම පිරිමියෙකුටම, ස්ත්‍රියකටම සහ දරුවෙකුටම තමා හා සමගි වීමට නැවත නැවතත් අවස්ථාව ලැබෙන බව දැකීම බවයි.

ඔවුන් මෙම කාර්යයට යොමු වූ විට, දෙවියන් වහන්සේට අවශ්‍ය දේ කළ විට එය කෙබඳුදැයි ඔවුහු සොයා ගත්හ. ඔවුන් මුහුණ දුන් අභියෝග නොතකා, දෙවියන් වහන්සේගේ ගැළවීම පිළිබඳ බලගතු පණිවිඩය සහ සියලු ජාතීන්ට ගෝලයන් කිරීමට අපගේ ස්වාමින්වහන්සේගේ අවසාන නියෝගය ඔවුන් අද්විතීය, දිව්‍යමය වශයෙන් ආරම්භ කරන ලද අවස්ථාවට ළඟා වී ඇති බව විශ්වාස කිරීමට ඔවුන්ව පොලඹවන ලදී. එබැවින් ඔවුන් දෙවියන් වහන්සේගේ කැඳවීම වැලඳ ගත් අතර ඉන්දියාවේ සෑම පුරුෂයෙකුටම, ස්ත්‍රියකටම සහ දරුවෙකුටම ශුභාරංචිය තේරුම් ගැනීමට සහ එයට ප්‍රතිචාර දැක්වීමට නැවත නැවතත් අවස්ථාවක් ඇති බවට වග බලා ගැනීමට ඔවුන්ගේ හදවත් සකස් කළහ. ඔවුන් මෙය කළේ නව සභා මිලියනයක් සිටුවීමට හෝ, ඔවුන් තේරුම් ගත් පරිදි, සෑම ගමකම සහ සෑම නගරයකම සෑම අසල්වැසි ප්‍රදේශයකම එක් සභාවක් සිටුවීමට අදහස් කිරීමෙනි. ඉන්දියාවට සම්පූර්ණයෙන්ම ළඟා වීමට නම්, සෑම පුරුෂයෙකුටම, ස්ත්‍රියකටම සහ දරුවෙකුටම පහසුවෙන් ප්‍රවේශ විය හැකි පරිදි යේසුස්වහන්සේගේ අනුගාමිකයන් පිරිසක් සිටිය යුතු බව ඔවුහු දැන සිටියහ.

ඔවුන්ගේ කීකරු ඇදහිල්ලේ ප්‍රතිඵල ප්‍රාතිහාර්යයකට වඩා අඩු දෙයක් නොවේ. පසුගිය දශක තුන තුළ, එම ජාතියේ පාපොච්චාරණය වූ කිතුනුවන්ගේ සංඛ්‍යාව ක්‍රිස්තියානි ඉතිහාසයේ විශාලතම සභාව බවට පත්ව ඇති බව පැවසීම අතිශයෝක්තියක් නොවේ, එය කිතුනුවන් මිලියන 25 සිට මිලියන 150 දක්වා සහ 1987දී සභාවන් 100,000 සිට 600,000 ඉක්මවා ඇත.

ජාතීන් ශුභාරංචිය සමඟින් ගසාගෙන යනු දැකීමට එවැනි දර්ශනයක් ක්‍රිස්තුස් වහන්සේගේ ශරීරයට අලුත් දෙයක් නොවේ. පසුගිය වසර හතළිහ තුළ පිලිපීනය, ඉන්දියාව, ග්වාතමාලාව සහ අනෙකුත් ජාතීන්ගේ ජාතික සභා විසින් සමාන දර්ශනයක් ලබාගෙන ඇත. නිදසුනක් වශයෙන්, 1974 දී පිලිපීනයේ සභාව ඔවුන්ගේ ජීවිත කාලය තුළ ඔවුන්ගේ ජාතියට ළඟා වන ලෙස දෙවියන් වහන්සේ ඔවුන්ගෙන් ඉල්ලා සිටින බව දැන සිටියහ. එකල ජාතියේ සභාවන් හාරදහසකට වඩා අඩු විය.

ඔවුන් තම රට සම්බන්ධයෙන් කළ දේ දැනගත් ඇදහිලිවන්තයන් ක්‍රි. ව 2000 වසර වන විට සභාවන් පිරිමින්, ස්ත්‍රිය සහ දරුවන් වෙතට ලඟාවීමට නම් සභාවන් 50,000ක් වත් තිබිය යුතු බව තේරුම් ගත්හ. ඇදහිල්ලෙන්, ඔවුන්ට දශක ගණනාවක වෙහෙස මහන්සි වී වැඩ කිරීමට ඇති බව දැන, ඔවුන් දර්ශනයට හිමිකම් කියමින් එය බැරෑරුම් ලෙස සැලකූහ. දෙවියන් වහන්සේට ප්‍රශංසා වේවා, ඔවුන් ක්‍රි. ව 2000 වන විට එම සභාවන් පනස් දහස රෝපණය කළහ![2]

**බටහිර සභාවට ඉගෙන ගත හැක්කේ කුමක්ද?**

බටහිර සභාව, අප සඳහන් කළ පරිදි, යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ශුභාරංචිය සමඟ මුළු ජාතීන්ටම ළඟා වීමට උත්සාහ කරන ආකාරයේ දර්ශනයකින් බොහෝ දුරට ඉබාගාතේ ගොස් ඇත. ඉන්දියාවේ සහ පිලිපීනයේ සභාවලට බටහිර රටවල සභාවට ඉගැන්විය හැකි සමහර ප්‍රතිපත්ති මොනවාද?

දෙවියන්වහන්සේ ජාතියක් තුළ ගමන් කරන විට, උන්වහන්සේ ස්වදේශිකයන් හරහා ගමන් කරයි. වෙනත් වචන වලින් කිවහොත්, දෙවියන් වහන්සේ ප්‍රාදේශීය සන්දර්භයන් තුළ ප්‍රාදේශීය මිනිසුන් භාවිතා කරයි. සංතෘප්ත සභා සිටුවීම (SCP) විවිධ සංස්කෘතීන් තුළ මිෂනාරිවරුන් මෙම සංකල්පය භාවිතා කර ඇත. ස්වදේශීන් හරහා ශුභාරංචිය පතුරුවා හැරීම දෙවියන් වහන්සේ ක්‍රියාත්මක වන වැදගත්ම ක්‍රමයයි. සෑම ගමකටම, සෑම අසල්වැසි ප්‍රදේශයකටම, සෑම නගරයකටම අවශ්‍ය වන්නේ යේසුස්ගේ කුරුසියෙන් පරිවර්තනය වූ සාමාන්‍ය මිනිසුන්ය. සෑම වෘත්තියකම සහ සෑම වීදියකම අපට අවශ්‍ය වන්නේ යේසුස් වහන්සේගේ ප්‍රේමය බෙදාගන්නා ක්‍රිස්තුස් අනුගාමිකයන්ය. මේ ආකාරයෙන් දෙවියන් වහන්සේ තම පුත්‍රයා තුළින් ඉදිරිපත් කරන ලද සංහිඳියාවේ පණිවිඩය රටක මානව සබඳතාවයේ සෑම සන්දර්භය තුළින්ම දැකීමට, ස්පර්ශ කිරීමට සහ ඇසීමට හැකිවේ. දෙවියන්

වහන්සේගේ සෙනඟ සොහොන් ගෙය සැබැවින්ම හිස්ව තිබූ බව ප්‍රකාශ වූ ශුභාරංචි කතාවේ ප්‍රතිරූපය බවට පත් වේ.

*දෙවියන් වහන්සේ ජාතියක් තුළ ගමන් කරන විට, උන්වහන්සේ විශාල පරිමාණ සභා ඒකත්වය හරහා ගමන් කරන සේක.* ඕනෑම ජාතියක සභාවේ බොහෝ ප්‍රකාශන බෙදිය හැකිය. නමුත් ඕනෑම ජාතික සභාවක් ජේසුස් වහන්සේගේ ශුභාරංචිය සමඟ තමන්ගේම සෙනඟව සම්පූර්ණයෙන්ම ගෝලයන් කරන්නේ එය සෑම සභාවක්ම තම දේශසීමා තුළ එක්සත් කරන සදාකාලික යථාර්ථයන් තේරුම් ගෙන ඇති බැවිනි. මෙය එක්සත් ජනපදයේ ද සැබෑවකි. කිසියම් ඉරිදා දිනයකදී ඇමරිකානුවන් මිලියන 52ක් පමණක් සභාවි සිටින්නේ නම් (පර්යේෂණ පෙන්වා දෙන පරිදි)[3] සහ ඊටත් වඩා අඩු ප්‍රතිශතයක් බයිබලයේ පිළිගෙන ඇති ක්‍රිස්තියානි ජීවිතයක් ගත කරන්නේ නම්,[4] මිලියන 300ක් පමණ ඇමරිකානුවන් එවැන්ජලිස්ත කිරීම හෝ නැවත එවැන්ජලිස්ත කිරීමට අවශ්‍යව සිටී. ගැඹුරු දේවධර්මවාදී විශ්වාසයන් පවතින තැන්වල පවා, ශුභාරංචිය සඳහා මිනිසුන්ගේ ඇති අවශ්‍යතාවයට සාපේක්ෂව එක්සත් ජනපදයේ සභාවන් බෙදන ගැටළු සුළුතර වේ.

*දෙවියන් වහන්සේ ජාතියක් තුළ ගමන් කරන විට, පවතින සභාවල ප්‍රමාණය වැඩි කිරීම පමණක් නොව උන්වහන්සේ නව සභා ගුණනය කිරීමෙන් ගමන් කරයි.* අපි මෙම පාඩම ඉගෙන ගන්නේ සභාවන් රෝපණය කිරීම උගන්වන්නේද විස්තර කරන්නේද නැති නමුත් එය නිතැතින්ම වනවා යැයි උපකල්පනය කරන ලද ක්‍රියා පොතෙන්ය! ප්‍රේරිතයන් සහ සභාවේ සාමාන්‍ය සාමාජිකයන් විසින් ශුභාරංචිය රෝමානු ලෝකයට ගෙන ආ විට, මිනිසුන් එයට ප්‍රතිචාර දැක්වූහ. මෙම පුද්ගලයින් පසුව සභාව ලෙස සලකනු ලැබූ අතර, ඔවුන් සභා හෝ සහභාගීකම් ලෙස හඳුන්වන නව ප්‍රජාවන් ලෙස සංවිධානය කිරීමට පියවර ගන්නා ලදී.

මෙම පාඩම වඩාත්ම පැහැදිලි වන්නේ ඉන්දියාවේ සහ පිලිපීනයේ ඵලදායි ලෙස රෝපණය කරන ලද දේශීය සභා ගුණනය වීම තුළය. මිනිසුන්ට ශුභාරංචියට ප්‍රතිචාර දැක්වීමට නම්, එය ඔවුන්ගේ ගමට පැමිණිය යුතුය. මෙය බොහෝ ආකාරවලින් සිදු විය හැක. කෙසේ වෙතත්, වඩාත් ඵලදායී ප්‍රවේශය නම්, සෑම විටම භූගෝලීය වශයෙන් සමීපව ජීවත් වන මිනිසුන් සඳහා - අසල ගමක හෝ නගරයක හෝ, නැතිනම් එකම නගරයක ලෙස - ශුභාරංචිය ඇසෙනු පමණක් නොව දැක අත්විඳින ලෙස ප්‍රාදේශීය සමූහයක් ලෙස ඇදහිල්ලෙන් ජීවත්වීමයි. යේසුස්වහන්සේගේ අනුගාමිකයින්ගේ ශරීරයක් ඔවුන් මධ්‍යයේ ශුභාරංචිය ප්‍රකාශ කරන විට ජාතියක සෑම පුරුෂයෙකුටම, ස්ත්‍රියකට සහ දරුවෙකුටම ළඟා විය හැකිය. ඔව්, සමහර

සභාවන් තරමක් විශාල වනු ඇත, නමුත් ඔවුන්ගේ ප්‍රමාණය ඔවුන්ගේම ප්‍රයෝජනය සඳහා නොවිය යුතුය. ඔවුන්ගේ විශාලත්වය, එහි විශාල සම්පත් සමඟ, ඔවුන්ට ළඟා විය හැකි වෙනත් ගම්වල සහ අසල්වැසි ප්‍රදේශවල සභා සිටුවීමට දෙවියන්ගේ අතේ මෙවලමක් බවට පත්විය යුතුය. මෑත කාලීන පර්යේෂණ පෙන්වා දී ඇත්තේ මෙවැනි ජීවිතයක් ප්‍රචාරය කරන සභාවන් සරලවම විශාල වන සභාවන්ට වඩා තුන් ගුණයකින් වේගයෙන් වර්ධනය වන බවයි!

*දෙවියන් වහන්සේ ජාතියක් තුළ ගමන් කරන විට, උන්වහන්සේ තම ප්‍රදේශය වෙනුවෙන් යාච්ඤා කිරීමට මිනිසුන්ව ආවේගශීලී කරමින් ගමන් කරන සේක.* අපි යම් ස්ථානයක් සඳහා යාච්ඤා කිරීම ආරම්භ කරන විට, එම ස්ථානය සඳහා පමණක් යාච්ඤා කරනවාට වඩා, අපි විශේෂිත පුද්ගලයන් සහ පවුල් සඳහා යාච්ඤා කිරීමට සහ රැකබලා ගැනීමට පටන් ගනිමු. නිශ්චිත ස්ථානයක නිශ්චිත පුද්ගලයන් වෙනුවෙන් යාච්ඤා කිරීමට අප කැප වූ විට, දෙවියන් වහන්සේ එහි කරන දේවල කොටසක් වීමට අපගේ හදවත් පෙලඹේ. ශුභාරංචිය සඳහා එම ස්ථානයේ සිටින මිනිසුන්ගේ අවශ්‍යතා සඳහා පිළිතුරේ කොටසක් වීමට අපට අවශ්‍යය. යාච්ඤාව බලවත් මෙවලමකි. නිශ්චිත ස්ථානයක් සහ එහි ජනතාව සඳහා වන යාච්ඤාව දැනටමත් එහි ඇති සභාවන් හරහා සෑම ගමකටම සහ අසල්වැසි ප්‍රදේශයකටම විනිවිද යාමට දෙවියන් වහන්සේ විසින් භාවිතා කරනු ලබන අතර, මිනිසුන් යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ශුභාරංචියට වඩාත් ප්‍රතිචාර දක්වනු ලැබේ.

මෙම ආකාරයේ යාච්ඤාව සභාව වඩාත් සමගිය කරා ගෙන යයි. ජේසුස් වහන්සේ තුළින් දෙවියන් වහන්සේ සමඟ සංහිඳියාව සඳහා තවමත් කැඳවීමට අවශ්‍ය සෑම ජාතියකම සිටින බොහෝ දෙනෙකුට සාපේක්ෂව අපගේ භේදවීම් සුළුතර වන බව එය නිරන්තරයෙන් අපට මතක් කර දෙයි.

**අපේ ජාතියේ ඉතිහාසය ලියමු**

එක්සත් ජනපදයේ සභාවට වඩා අද කිසිම ජාතියකට එහි සමස්ත ජනගහනය වෙත ළඟා වීමට අවස්ථාවක් නොමැත. ඓතිහාසික නිකායන් සහ ජාතිය තුළ ගොඩනැගෙන බොහෝ නව නිකායන් අතර සහයෝගීතාව පිළිබඳ අද දින වැඩිවන හැඟීම දෙවියන්ගේ අතේ ඇති විශිෂ්ට මෙවලමක් විය හැකිය. මෙය ඉල්ලා සිටින ආකාරයේ එකමුතුවක් සාක්ෂාත් කර ගැනීම ඇත්තෙන්ම ඉතා සරල ය:

ඇමෙරිකන් කිතුනුවන් එක්සත් ජනපදයේ සෑම පිරිමියෙකුටම, ස්ත්‍රියකට සහ දරුවෙකුටම දෙවියන් වහන්සේ සමඟ සමාදාන වීමට නැවත නැවතත් අවස්ථාව ලබා ගත හැකි ව්‍යාපාරයක් බවට පත්විය යුතුය.

අපට සලකා බැලිය යුතු වැදගත් යථාර්ථයන් කිහිපයක් ඉතිහාසය පෙන්නුම් කරයි.

පළමුව, සභාව අප සිතනවාට වඩා විශාල බව තේරුම් ගත යුතුය. ක්‍රිස්තුස් වහන්සේගේ ශරීරය සෑදී ඇත්තේ අප විසින්ම විශ්වාස කරන දේ හරියටම විශ්වාස කරන මිනිසුන්ගෙන් පමණක් නොවේ. ශුද්ධ ලියවිල්ල දේවානුභාවයෙන් ඇතිවූවකි, අපගේ දේවධර්මීය අභිමතය එසේ නොවේ. දෙවියන් වහන්සේ කියන දේ වැරදීමකින් තොරව පැමිණේ. මිනිසා දෙවියන් වහන්සේ ගැන පවසන දේ සෑම විටම යම් දෝෂයක් සමඟ පැමිණේ.

දෙවනුව, සභාවන් එකට යාච්ඤා කිරීමට කැමැත්තෙන් සිටිය යුතුය. අපගේ මුළු ජාතියටම ළඟා වීමේ ව්‍යාපාරයක් සඳහා අප ඉල්ලා සිටින්නේ අප වෙනුවෙන් නොව ජාතිය තුළ කළ යුතු දේ සඳහා ය. මෙයින් අදහස් කරන්නේ අප අසල්වැසි සභාවලට සහ නිකායන්ට ආශීර්වාද කිරීමට යාච්ඤා නොකරන බව නොව, අන් සියල්ලටමත් වඩා අපි සෑම පුරුෂයෙකුටම, ස්ත්‍රියකුටම සහ දරුවෙකුටම ඇසීමට, ස්පර්ශ කිරීමට, දැනීමට සහ ශුභාරංචියට ප්‍රතිචාර දක්වන්න අවස්ථාවක් ලැබීමට කැමති දෙවියන් වහන්සේගේ හදවත සමඟ අපගේ යාච්ඤාවලට එක්වන බවයි.

අපට එකට යාච්ඤා කළ හැකි බොහෝ ක්‍රම තිබේ. වඩාත්ම මූලික දෙය නම් අසල්වැසි ප්‍රදේශයක, නගරයක හෝ ගමක සිටින සභාවන්ට ඔවුන්ගේ නිශ්චිත ප්‍රදේශය සඳහා එකට යාච්ඤා කිරීම ආරම්භ කිරීම සඳහා සෑම සතියකම හෝ මාසයකම එක් දිනක් සොයා ගැනීමයි. තවද, සභා සහ නායකයින් විශාල සංඛ්‍යාවක් ඔවුන්ගේ නගර, සහ ගම් සඳහා පමණක් යාච්ඤා කිරීම සඳහා දිනකට හෝ ඊට වැඩි කාලයක් එක්වීමට අපට ඉදහිට දින සහ ස්ථාන සොයාගත හැකිය. අවසාන වශයෙන්, නිකාය නායකයින්ට ශුභාරංචිය දේශනා කළ යුතු ජාතියේ ස්ථාන සහ මිනිසුන් ගැන යාච්ඤා කිරීමේ එකම අරමුණ සඳහා වෙනත් නිකායන්ගේ නායකත්වය හමුවීමට කාලය වෙන් කළ හැකිය. තෙවනුව, අපට සහයෝගයෙන් ඉලක්ක හිමි කර ගත හැකිය. ඇමරිකානුවන් මිලියන 300ක් උන්වහන්සේ සමඟ සමාදාන වීමට නැවත නැවතත් අවස්ථා තිබෙනු දැකීමට දෙවියන්වහන්සේට අවශ්‍ය බව අප සෑමට එකට එකතු වී අපගේ විශ්වාසය තහවුරු කළ හැක.

අවසාන වශයෙන්, අපගේ ජීවිත කාලය තුළ එක්සත් ජනපදයට ශුභාරංචිය සම්පූර්ණයෙන්ම ලබා දීමට දෙවියන් වහන්සේ භාවිතා කරන මිනිසුන් අතර වීමට අපගේම උත්සාහයන් දෙගුණ කළ හැකිය. තවත් නව සභා රෝපණය කිරීමට අපට සභාවන් හට ඉගැන්විය හැකිය. නව සභා රෝපණය කිරීම ඔවුන්ගේ පළමු කැපවීම බවට පත් කිරීමට අපට තවත් නායකයින් පුහුණු කළ හැකිය. මෙම කාර්යය කෙරෙහි අවධානය යොමු කිරීම සඳහා අපගේ නිවේදන, දේශනා

සහ වැඩසටහන් භාවිතා කරමින්, පණිවිඩය බෙදා හැරීමට උපකාර කිරීමට අපගේ සියලු සම්පත් වැඩිදියුණු කළ හැකිය.

එක්සත් ජනපදයේ සහ බටහිර ලෝකයේ කාලය පැමිණ තිබේ. එවන් අවස්ථා කවුළුවක් සදහටම විවෘතව නොපවතිනු ඇත. ඉදිරි වසරවලදී මෙම කර්තව්‍යය සම්පූර්ණ කිරීම සඳහා දෙවියන් වහන්සේ තම ජනතාව අතර කැපවීම, එකමුතුකම සහ සම්පත් ගොඩනඟන ලෙස SCP හි අපි යාච්ඤා කරමු. මක්නිසාද යත් එය දැන් තරම් සත්‍යයක් ලෙස කවාදාවත් පැවතුනේ නැත - අපි අපේ ජාතියේ ඉතිහාසය ලියන්නෙමු.

# 2
# සභාවේ අරමුණ කුමක්ද?

අද ලොව පුරා සිටින මිනිසුන් අසන වැදගත්ම ප්‍රශ්නය නම්, සභාවේ අරමුණ කුමක්ද? බටහිර සභාවේ නායකත්වයේ බොහෝ දෙනෙක් පිළිතුර දැන ගැනීමට උපකල්පනය කරති. සෑම පුහුණු පාසලකම පාඨමාලා මාතෘකාව ආවරණය කරයි. ප්‍රාදේශීය සභා දේවගැතිවරු ඒ ගැන දේශනා කරති. උනන්දුව දක්වන පැරා-සභා සංවිධාන පිළිතුරු සහතික කරන බහු දින සම්මන්ත්‍රණ සඳහා ඇසුරුම් කරන ලද මිල අධික ද්‍රව්‍ය සමඟ දිලිසෙන වෙළඳ දැන්වීම් බෙදා හරිනු ලැබේ. මෙගා-සභාවන් නායකයින් ලොව පුරා සිටින නැතිවූ සහ කුසගින්නෙන් පෙළෙන අයට පැමිණ පිළිතුරු සෙවීම සඳහා සති අන්ත පෙන්වීමේ සහ කීමේ වැඩසටහන් සංවිධානය කරයි.

නමුත් බටහිර සභාව ලෝකයේ සභාවේ කාර්යභාරය සැබවින්ම තේරුම් ගත්තේ නම්, බටහිර ලෝකයේ බොහෝ අසතුටින් සිටින මිනිසුන් ක්‍රිස්තියානි ධර්මයට විරුද්ධ වන්නේ ඇයි? සංඛ්‍යාලේඛන රසවත් කතාවක් කීමට වඩා වැඩි යමක් කරයි. ඔවුන් හෙළිදරව් කරන ප්‍රවණතා, ඒවා නොවෙනස්වුවහොත්, බටහිර රටවල සංවිධානාත්මක ක්‍රිස්තියානි ප්‍රාදේශීය සභා ජීවිතයේ අනාගතය අදාළ නොවන දෙයක් නෙතට හෝ නැතිනම් නරකම ලෙස වඳ වී යන තත්වයකට ඇදී යන බවයි. මාව මෙතන වැරදියට තේරුම් නොගන්න. ශුභාරංචිය මිය යනු ඇතැයි හෝ බටහිර ජාතීන් තුළ යේසුස් වහන්සේගේ අනුගාමිකයින් සොයා ගැනීම නවත්වනු ඇතැයි මම නොකියමි. ඒ වෙනුවට, වසර සිය ගණනක් තිස්සේ අප දන්නා මහජන සහ සංවිධානාත්මක ස්වරූපයන් දැඩි දුෂ්කරතාවයකට පත්ව ඇත.

ඔබ මිෂනාරිවරයෙකු නම් හෝ බටහිරින් ඈත ජාතික සභාවක නායකයෙකු නම්, එහි ගැටළු පිළිබඳව, මෙය ගැන මට ඇති සම්බන්ධය කුමක්ද? යනුවෙන් ඔබ කල්පනා කරනවා විය හැකිය. සභාව පිළිබඳ බටහිර අදහස සහ භාවිතය වසර සිය ගණනක් තිස්සේ ලොව පුරා අපනයනය කර ඇති නිසා එය ඔබ සැලකිය යුතු දෙයකි. අප සතුව ඇති බීජය අපට ප්‍රජනනය කළ හැකි එකම බීජයයි. අපට ලොව පුරා තවත් දහස් ගණනක් නව සභා රෝපණය කිරීමට අවශ්‍ය නම්, බටහිර රටවල අප සතුව ඇති බීජය සත්‍ය වශයෙන්ම බයිබලානුකූල විය යුතු අතර දහස් වාරයක් ප්‍රතිනිෂ්පාදනය කිරීමට සමත් විය යුතුය. විශ්වාස කළ හැකි ප්‍රජනනයට එරෙහිව

සෘජුව ක්‍රියා කරන සහ ස්ථාවර, ඵලදායි ප්‍රතිඵල අපේක්ෂා කරන දුර්වල ගුණාත්මක බීජ රෝපණය කිරීමට අපට නොහැක.

**මගේ සෙවීම**

මගේ ගමන තුළදී මම සොයාගත් දෙය නම්, දෙවියන් වහන්සේ සභාව සෑම තැනකම ශුද්ධාත්මයාණන්ගේ ක්‍රියාකාරිත්වය තුළින් ස්වයංසිද්ධව ප්‍රතිනිෂ්පාදනය කිරීමට හැකි ජීවමාන ජීවියෙකු ලෙස වීමට අභිප්‍රාය කරන බවයි.

මට වයස අවුරුදු තිහක් වන විට, මගේ බිරිඳ, පැටී සහ මම සේවයේ වසර දහයකට ආසන්න කාලයක්, පළමුව ඇමරිකාවේ තරුණයන් සමඟ ප්‍රාදේශීය සභාවක වැඩ කරමින්ද, පසුව ලතින් ඇමරිකාවේ මිෂනාරිවරුන් ලෙසද සහ අවසානයේ වර්ධනය වෙමින් තිබෙන දකුණු කැලිෆෝනියාවේ සභාවක ගත කර තිබුණෙමු. මම මගේ සිහිනය තුළ ජීවත් වෙමින් සිටියෙමි- වචනය දේශනා කිරීම සහ සිය ගණනක් සභා ශරීරයට එකතු වනු දුටිමි. සභාව ගැන තේරුම්ගත් කෙනෙක් සිටියේද, ඒ මම යැයි මම සිතුවෙමි. ඇත්තෙන්ම, මම එපීස පොත ගැන ජනප්‍රිය ඉගැන්වීම් මාලාවක් අවසන් කළා නෙවේද?

නමුත් ඒ අවස්ථාවේදී දෙවියන්, අනාරාධිතව, මගේ තෘප්තිය ආක්‍රමණය කළ සේක. මේ සියලු දෙනා පැමිණෙන්නේ කොහෙන්ද යන්න ගැන ප්‍රශ්න ඇසීමට උන්වහන්සේ මට බල කළේය. මම පළමු වතාවට යමක් දුටු නිසා මගේ සොයාගැනීම් අපහසුතාවයට පත් විය. "ඩ්වයිට්, ඔබ මගේ සභාව මිනිසුන්ට ඔබ කතා කරනවාට ඇහුම්කන් දීමටත්, අනෙක් අය ගායනා කිරීමටත් සවන් දීමටත්, අන් අය දේවසේවයේ යෙදෙන ආකාරය දෙස බලා සිටීමටත් හැකි වන ආකාරයේ ගබඩාවක් බවට පත් කළාද?" කියා උන්වහන්සේ අසනු මට හැඟුණේය. "සභාවේ අරමුණ කුමක්ද" කියා දෙවියන් වහන්සේ මගෙන් අසනවා සේ මට දැනුනි.

මම ඇත්තටම එය නොදැන සිටි බව පිළිගැනීමට සිදු විය; මගේ සහෝදර දේවගැතිවරු මාව රවට්ටනවා නොවේනම්, ඔවුන්ගෙන් බොහෝ දෙනෙක්ද එය දන්නේ නැත. එපමණක් නොව, මෙම අත්දැකීමට වසර කිහිපයකට පෙර උපාධි අධ්‍යයන කටයුතුද මම අවසන් කෙරූ නිසා, මගේ බොහෝ මහාචාර්යවරුන් ද එය නොදැන සිටි බවට ඉඟියක් මට තිබුණි. මට ප්‍රශ්නයට සෘජුවම මුහුණ දීමට සිදු විය: ඇමරිකානු සභාව කුමක්ද, අප මෙහි සිටියේ කුමක් සඳහාද, සහ අප සභාව ව්‍යුහගත කළ ආකාරය කෙරෙහි මේ සියල්ල බලපාන්නේ කෙසේද? වැදගත්ම දෙය නම්, අප අපගේ ප්‍රජාවන් සහ සේවා ස්ථානවල විසිරී සිටින විට අප අවට සිටින මිනිසුන්ට මෙය ඇති කළේ කුමන බලපෑමක්ද?

දේශනා කිරීම, නමස්කාරය, කුඩා කණ්ඩායම් සහ එවැන්ජලිස්ත සේවය පවා වැදගත් වන තරමට, මේ දේවල් සභාවේ අරමුණ නොවන බව මට ඒත්තු ගියේය. මම කල්පනා කළ පරිදි, සභාව යනු කුමක්ද යන්න පිළිබඳ වඩා හොඳ අදහසක් මට ලැබුණි, නමුත් සභාවේ අරමුණ පිළිබඳව ගැඹුරු විශ්වාසයක් ලබා ගැනීමට වසර කිහිපයක් ගතවනු ඇත. මඟදී, නායකත්වය පිළිබඳ වැදගත් පාඩම් දෙවියන් වහන්සේ මට ඉගැන්වූ අතර, ඒවා මගේ දේවසේවයේ මුල් අවදියේදී සම්පූර්ණයෙන්ම අවශෝෂණය කර ගැනීමට මට නොහැකි තත්වයක සිටියෙමි.

මෙම ප්‍රශ්නය සම්බන්ධයෙන් දෙවියන් වහන්සේගේ ආත්මය සමඟ මගේ මීළඟ හමුවීම පැමිණියේ පළමු එකට වසර පහකට පමණ පසුවය. 1979 ඔක්තෝම්බර් මස මුලදී, පැටී සහ මම නව සභා ශාකයකට සම්බන්ධ ව සිටි අතර එය වේගයෙන් මිනිසුන් දහස් ගණනක් දක්වා වර්ධනය විය. අපි වසර දහයක් මෙම සභාවෙහි කොටසක් වූ අතර, අවසානයේදී අපි එහි සිට රෝපණය කරන ලද වෙනත් සභාවක නායකත්වයට පත් විය. අපි සෑම සතියකම පාහේ නව මිනිසුන් බව්තීස්ම කළ අතර, අපගේ සංඛ්‍යාව වැඩි විය. කෙටි වසර පහක් ඇතුළත අපි දෙදහස් දෙසිය දෙනෙකුගෙන් ඉහළට ගියෙමු. යමෙකුට දේශනා කිරීමට සහ සවන් දීමට සියගණනක් මිනිසුන් රැස්ව සිටීම සාර්ථකත්වයේ ලකුණක් සේ දකිත් නම්, දහස් ගණනක් සිටීමෙන් අදහස් කරන්නේ කුමක්ද? විශාල පූජාවන්, විශිෂ්ට නමස්කාර සේවා—ඕනෑම අලුත් සභාවකට අවශ්‍ය සෑම දෙයක්ම අපට තිබුණි. සමහර විට මගේ ජීවිතයේ පළමු වතාවට සභාවේ සැබෑ අරමුණ තේරුම් ගැනීමට මම ළං වෙමින් සිටින බව මට දැනුනි. සියල්ලට පසු, අපගේ සභාව වර්ධනය වෙමින් පැවතුනි, මිනිසුන් ගැලවීම ලබමින් සිටි අතර, ඇමරිකාව පුරා ඇති සභාවල ඊර්ෂ්‍යාවට හේතු විය හැකි දූත මණ්ඩල වැඩසටහනක් අපට තිබුණි.

කෙසේ වෙතත්, දෙවියන් වහන්සේගේ ආත්මය මා නැවත ප්‍රශ්න කිරීමට යොමු කිරීමට වැඩි කලක් ගත නොවීය. මා සමඟ දේවසේවයේ යෙදී සිටි අයගේ චේතනාවන් ගැන හෝ අපගේ සභාවේ බොහෝ යහපත් දේ ඉටු වූ බව මම කිසිසේත් ප්‍රශ්න නොකරමි. නමුත් “ඇත්තටම මෙතන මොකද වෙන්නේ?” කියා අසන්නට මට සිදු විය. මම කරුණු කිහිපයක් සොයා ගත්තෙමි: පළමුව, අපගේ සභාවට එකතු කරන ලද බහුතරයක් වෙනත් සභාවන්ගෙන් පැමිණි අය වන අතර, දෙවනුව, මිනිසුන් තම ගැලවුම්කරු ලෙස යේසුස් වහන්සේව විශ්වාස කරන බව ප්‍රකාශ කර මාස හයකට පසු, ඔවුන්ගෙන් විශාල සංඛ්‍යාවක් අපගේ සභාව තුළ සොයාගත නොහැකි විය.

මෙම කාලය තුළ අප ජීවත් වූ ප්‍රදේශයේ සභාව ගැන එකම ප්‍රශ්නය අසන නායකයින් කණ්ඩායමක මා කොටසක් වූ අතර අපගේ ඒකාබද්ධ සොයාගැනීම් අපගේම සභාවන් ගැන

අපගේ පුද්ගලික සොයාගැනීම් වලංගු කළේය. අප අවට සිටින ජනගහනයට සාපේක්ෂව අපගේ ප්‍රදේශයේ ඇදහිලිවන්තයන් සංඛ්‍යාව අඩුවෙමින් පවතින බව අපට පෙනී ගියේය. අපගේ ප්‍රදේශයේ ඒකාබද්ධ සභාවල වර්ධනයෙන් විශාල ප්‍රතිශතයක් සභා මාරු කිරීමෙන් පැමිණි බව අපි සොයා ගත්තෙමු. අවසාන වශයෙන්, අපගේ ප්‍රදේශයේ සභාවල ඒකාබද්ධ වර්ධනය අපගේ සභාවලට යන සෑම කෙනෙකුගේම දරුවන් යේසුස්වහන්සේගේ අනුගාමිකයින් බවට පත් වුවහොත් සිටිය යුතු ප්‍රමාණයට වඩා අඩු බව අපට වැටහුණි. නැවතත් අපි එම ප්‍රශ්නය ඇසුවෙමු, සභාවේ අරමුණ කුමක්ද?

මේ සියල්ල මගෙන් මෙතෙක් ගැලවී ගිය ක්‍රිස්තුස් වහන්සේගේ ශරීරයේ අරමුණ පිළිබඳ නිශ්චිත විශ්වාසයන් සොයා ගැනීමට දේවවචනය බැරෑරුම් ලෙස සෙවීමට මා නැවත යොමු කළේය. මම සෙවූ විට, දෙවියන්වහන්සේගේ සභාව සඳහා දෙවියන්වහන්සේගේ අරමුණ සොයාගැනීමට උත්සුක වූයේ මා පමණක් නොවන බව මට පෙනී ගියේය. ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය සඳහා දෙවියන්වහන්සේගේ අලංකාර සහ ඵලදායි නිර්මාණය සොයාගෙන ජීවත්වූ මිනිසුන්ගෙන් සහ ගැහැනුන්ගෙන් ඉතිහාසය පිරී ඇත. මා සොයාගත් දේ - මට පෙර අන් අය දැන සිටි සත්‍ය - සභාව පිළිබඳ මගේ දැක්ම සහ ලෝකය සඳහා දෙවියන් වහන්සේගේ සැලැස්මෙහි එහි වැදගත් භූමිකාව සදහටම වෙනස් කළේය. මගේ කතාවේ කණගාටුදායකම කොටස නම්, පිළිතුරු කිසිදා මගෙන් දුරස්ව නොතිබීමයි: පාවුල් එපිසවරුන්ට ඔහුගේ ලිපියේ අප දැනගත යුතු සෑම දෙයක්ම පාහේ පැහැදිලි කර ඇත.

**මා සොයාගත් දේ**

වසර දෙදහසකට පෙර දෙවියන් වහන්සේ ආශ්චර්යමත් ලෙස මිනිස් ඉතිහාසයට මැදිහත් වූ අතර, උන්වහන්සේගේ මැදිහත්වීම අංශ තුනකින් සමන්විත විය: ක්‍රිස්තුස් වහන්සේගේ මරණය, උන් වහන්සේගේ උත්ථානය සහ සභාව නිර්මාණය කිරීම.

මෙසියස් වහන්සේගේ පැමිණීමෙන් විමුක්තිය ලැබීමට උත්සුක වූ යුදෙව් ලෝකයකට, යේසුස් වහන්සේ මනුෂ්‍ය මාංසය රැගෙන පැමිණි සේක. උන්වහන්සේගේ කැපී පෙනෙන පැමිණීමේ ප්‍රීතිය වැඩි කල් පැවතියේ නැත, අඩුම තරමින් දේශපාලන නිදහස ගෙන ඒමට ප්‍රමාණවත් කාලයක් නොවීය. නමුත් පෙනෙන්නට තිබූ අසාර්ථකත්වය දෙවියන්වහන්සේගේ බීජ භූමිය විය. උන්වහන්සේගේ මරණය තුළ බොහෝ දෙනා හඳුනා නොගත්තද, යේසුස්වහන්සේ යුදෙව්වන්ගේ රජුට වඩා වැඩි කෙනෙකු බවට පත්වූ සේක. උන්වහන්සේ ලෝකයේ ගැලවුම්කරුවා බවට පත් විය. නමුත් නැවතත්, ප්‍රේරිතයන්ගේ සිත් තුළ නැවත වරක් ජයග්‍රහණය උදා වෙමින් ආ විට, යේසුස්වහන්සේ ඔවුන්ගෙන් ස්වර්ගයට ඔසවා ගනු ලැබූ

සේක. නමුත් එපීස 2:10-3:11 හි පාවුල් පැහැදිලි කරන පරිදි, ත්‍රිත්වය සම්පූර්ණ කරමින්, දෙවියන්වහන්සේගේ ආශ්චර්යමත් මැදිහත්වීමේ අවසාන කොටස වූයේ, සභාව නිර්මාණය කරමින් උන්වහන්සේගේ ඉවත්වීමයි. මෙම වාක්‍යයන් බයිබලයේ දක්නට ලැබෙන සභාව පිළිබඳ වඩාත් සවිස්තරාත්මක ප්‍රකාශනය සම්පාදනය කරයි.

එපීස 2:11-18 පදවල පාවුල් අපව සභාවට හඳුන්වා දෙයි. ඔහු තම විජාතික පාඨකයන්ට මතක් කර දෙන්නේ ඔවුන් කලින්, පොරොන්දු වූ ගැලවුම්කරුවෙකු සහ මෙසියස්වහන්සේ කෙනෙකු නොමැතිව ආත්මික මංමුලා සහගතව ජීවත් වූ බවයි. ඔවුන් දෙවියන් වහන්සේගේ තෝරාගත් සෙනඟගේ කොටසක් නොවූ බැවින් ඔවුන්ට “ජනතාව” පිළිබඳ හැඟීමක් නොතිබුණි. මෙම රික්තකය තුළ දෙවියන් වහන්සේ ආශ්චර්යමත් ලෙස මැදිහත් වී ඇත්තේ යුදෙව්වන් පමණක් නොව උන්වහන්සේගේ නාමයෙන් අයැදින සියල්ලන්ව ගලවා ගැනීම සඳහා යේසුස් වහන්සේව යැවීමෙනි. යේසුස් වහන්සේ තුළින් දෙවියන් වහන්සේ පෘථිවියේ කිසිවෙක් අපේක්ෂා නොකළ දේ කළ සේක: උන්වහන්සේ යුදෙව්වන් සහ අන්‍යජාතිකයන් යන දෙදෙනාම තමන් තුළම සමාදාන කර, එමගින් සභාව නිර්මාණය කළ සේක: "නමුත් වරක් දුර සිටියාවූ නුඹලා දැන් ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ තුළ උන්වහන්සේගේ ලේ කරණකොටගෙන, ළං කරනු ලැබුවහුය... දෙගොල්ල එක්කළ උන්වහන්සේම අපේ සමාදානයව සිටිනසේක.” (එපී. 2:13-15). සභාව ක්‍රිස්තුස් වහන්සේගේ නව මැවිල්ලයි; එය උන්වහන්සේට අයිතියි! පෘථිවියේ කිසිම මානව සංවිධානයකට දෙවියන්ට අයිති දේ නිර්වචනය කිරීමට හෝ පාලනය කිරීමට අනුමාන කිරීමට හෝ ඉඩ දිය නොහැක.

එපීස 2:19-22 පදවල දෙවියන් වහන්සේගේ නව මැවිල්ලේ අද්විතීය ස්වභාවය අපට පෙන්වීමට පාවුල් මෙම ආශ්චර්යමත් සත්‍යය ගොඩනඟයි:

**“ඒනිසා නුඹලා තවත් විදේශියෝවත්, අආගන්තුකයෝවත් නොව, ශුද්ධවන්තයන් සමඟ එක නුවර වැසියෝව දෙවියන්වහන්සේගේ අයවල්ව සිටින්නහුය. නුඹලා ප්‍රේරිතයන්ගෙත් ප්‍රොපේතවරුන්ගෙත් අත්තිවාරම පිට ඉදිකරනු ලැබ සිටින්නහුය. ක්‍රිස්තුස්වහන්සේම එහි ප්‍රධාන ගලව සිටිනසේක. උන්වහන්සේ තුළ මුළු ගොඩනැගිල්ල හොඳ හැටි එකතු කරනලදුව, ස්වාමීන් වහන්සේ තුළ ශුද්ධවූ මාළිගාවක්ව සෑදීගෙන් යන්නේය. උන්වහන්සේ තුළ නුඹලාත් ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන දෙවියන්වහන්සේගේ වාසය පිණිස එකට ගොඩ නඟන ලද්දේය.”**

මෙම පද හතරේ කෙටි කාල පරාසය තුළ, දෙවියන් වහන්සේගේ හස්ත කර්මාන්තය විස්තර කිරීමට පාවුල් රූපක හතරක් හරහා ගමන් කරයි: දෙවියන්වහන්සේගේ ආශ්චර්යමත්

මැදිහත්වීම යුදෙව්වන්ට සහ අන්‍යජාතිකයන්ට එකසේ නව ජාතියක් ලබා දී ඇත; ඔවුන් දෙවියන් වහන්සේගේ සෙනඟ ය. උන්වහන්සේ ඔවුන්ට නව පරම්පරාවක්, එනම් යේසුස් වහන්සේගේ ලේ පෙළපත ලබා දී ඇති අතර ඔවුන් එක් නව පවුලකි. උන්වහන්සේ ඔවුන්ගෙන් නව ගොඩනැඟිල්ලක් සාදා ඇත, ඇත්ත වශයෙන්ම, එය දෙවියන් වහන්සේම වාසය කරන දේවමාළිගාවකි. පැරණි ගිවිසුමේ නමස්කාර මධ්‍යස්ථානය සහ ක්‍රියාකාරකම් දෙවියන්වහන්සේගේ නව ශුද්ධස්ථානයට මාරු කරයි: ක්‍රිස්තුස් වහන්සේගේ ශරීරය, සභාවය!

උන් වහන්සේගේ සෙනඟ තුළ දෙවියන් වහන්සේගේ පදිංචියේ ස්වභාවය අද්විතීය ය. මෙම ශරීරය ගොඩනඟා ඇත්තේ දෙවියන්වහන්සේගේ ප්‍රේරිතයන්ගේ සහ අනාගතවක්තෘවරුන්ගේ දේව සේවය සහ ලියවිලි තුළින් උන් වහන්සේගේ වචනය තුළ එළිදරව් කිරීම මතය. මෙම නව දේවමාළිගාව කෙබඳු වනු ඇත්ද යන්න තීරණය කරන වාස්තු විද්‍යාත්මක රටාව යේසුස් වහන්සේම වේ. ක්‍රිස්තුස්වහන්සේගේ සියලුම සෙනඟ තනි තනිව (බලන්න 1 කොරි. 6:19) සහ සාමූහිකව (එපීස. 2:20-21 බලන්න) දෙවියන්වහන්සේගේ වාසස්ථානයයි. මෙම නව ආයතනික දේවමාළිගාව තුළ, දෙවියන් වහන්සේ එක් එක් පුද්ගලයා ඔහු හෝ ඇය සිටීමට කැමති තැන තබන සේක. එක් එක් පුද්ගලයා තුළ ගුණාත්මක විශේෂත්වයක් පවත්වා ගෙන යන අතරම, දෙවියන් වහන්සේගේ පරිපූර්ණ ගැලපීම එක් එක් පුද්ගලයාට උන්වහන්සේ කැමති පුද්ගලයා බවට වර්ධනය වීමට විශාලතම හැකියාව ලබා දෙන සේක. මිනිසුන්ට ඔවුන් ජීවත් වන සහ වැඩ කරන ඕනෑම තැනකට ඔවුන්ගේ අසල්වැසි ප්‍රදේශවලට සහ තමන්ගේ ක්‍රියාකාරි ක්ෂේත්‍රවලට ක්‍රිස්තුස් වහන්සේගේ ආලෝකය ගෙන ඒමට හැකි වේ.

ලොව පුරා ශුද්ධාත්මයාණන් වහන්සේ ක්‍රිස්තුස් වහන්සේගේ ශරීරයට එකතු කිරීම සඳහා පුද්ගලයන්, පවුල් සහ ප්‍රාදේශීය සභා භාවිතා කරන සේක. ක්‍රිස්තුස්වහන්සේගේ සෑම සෙනඟක් හරහාම ආත්මයාණන්වහන්සේ විසින් ජීවත්වූ සහ කථාකරන ලද මෙම ශුභාරංචියෙහි දේවසේවය එහි සම්පූර්ණ සහ පරිපූර්ණ මාර්ගය ක්‍රියාත්මක වන විට ක්‍රිස්තුස්වහන්සේ නැවත පැමිණෙනු ඇත (මතෙව්. 24:14 බලන්න).

ක්‍රිස්තුස්වහන්සේගේ සෙනඟ දෙවියන්වහන්සේගේ දේවමාළිගාව පිහිටුවීම සඳහා එකට එකතු වී සිටියද, එක් එක් පුද්ගලයා අද්විතීය ක්‍රමවලින් දිගටම වර්ධනය වෙමින් පරිණත වෙමින් සිටින පුද්ගලයෙකු ලෙස පවතී. මේ අනුව ක්‍රිස්තුස්වහන්සේගේ සෑම කෙනෙකුගේම වර්ධනය වන අධ්‍යාත්මික පරිණතභාවය සහ සමස්තයක් ලෙස පරිණත ශරීරය දෙවියන්වහන්සේගේ ශුභාරංචි පණිවිඩය ඉදිරිපත් කරන්නේ අප අවට ලෝකයේ සිටින සෑම පිරිමියෙකුටම, ස්ත්‍රියකටම සහ දරුවෙකුටම ඇසීමට, තේරුම් ගැනීමට සහ දෙවියන්වහන්සේගේ ශුභාරංචිය

පිළිගන්න හෝ ප්‍රතික්ෂේප කරන්න අවස්ථාව ලබා දීමටය. මෙම වර්ධනය වන අධ්‍යාත්මික පරිණතභාවය යනු සභාව් සංඛ්‍යාත්මක වර්ධනය සිදුවිය හැකි ඉරියව්වයි. දෙවියන් වහන්සේ තම ශරීරය නිර්මාණය කළ ආකාරය එයයි. එය සභාවේ ක්‍රියාකාරීත්වයට උන්වහන්සේ ගෙතූ ජානමය රටාවකි.

මෙය **ස්වභාවිකවම සභාව පිළිබඳ පාවුල්ගේ අවසාන සහ වැදගත්ම හෙළිදරව්ව වෙත යොමු කරයි: "එසේ කළේ අපගේ ස්වාමිවූ ක්‍රිස්තුස් යේසුස් වහන්සේ තුළ දෙවියන්වහන්සේ විසින් අභිප්‍රාය කරනලද සදාකාල අභිප්‍රාය හැටියට, ස්වර්ගීය ස්ථානවල අධිපතීන්ටත් බලධාරීන්ටත් මේ කාලයේ සභාව කරණකොටගෙන උන් වහන්සේගේ අනේකවිධ ප්‍රඥාව දැන ගන්ට ලැබෙන පිණිසය." (එපී. 3:8-11).** බොහෝ විට දෙවියන්වහන්සේගේ මෙම නව නිර්මාණයේ උදාර නමුත් සරල අරමුණ ඕනෑවට වඩා ව්‍යුහගත කළ වර්තමාන සභාව තුළ නැති වී ඇත. මෙහි පාවුල්ගේ ප්‍රකාශයෙන් අපට වැදගත් යථාර්ථයන් පහක් පෙනේ.

*දෙවියන් වහන්සේට ආරම්භයේ සිටම තිබුණේ එකම අරමුණකි.* පාවුල් දෙවියන් වහන්සේගේ අරමුණෙහි මෙම ඒකීයත්වය අවධාරණය කරයි - මිනිසුන්ව පාපයෙන් මුදවා ගැනීම සහ අතීතයේ දෙවියන් වහන්සේ සමඟ සබඳතාවයට ඔවුන්ව නැවත පිහිටුවීම සහ නියෝජනය කිරීම. එය අපැහැදිලි ලෙස පෙනිය හැකි වුවද, ආදම් සහ ඒව පව් කළ දා සිට එය ඉතිහාසය හරහා ක්‍රියාත්මක වෙමින් පවතී. මේ මොහොතට පෙර සිදු වූ සියල්ල සූදානම් වීම් වන අතර, ඊළඟට එන්නේ සියල්ල සම්පූර්ණ කිරීම් වේ.

පෘථිවියේ මේ කාලය සඳහා දෙවියන් වහන්සේට ඇත්තේ එකම උපකරණයකි: සභාව ය. දෙවියන් වහන්සේ ලෝකයේ අසල්වැසි ප්‍රදේශවල, නගරවල, ප්‍රාන්තවල සහ ජාතීන් තුළ පවා කුමක් කිරීමට ගියත්, උන්වහන්සේ එය ක්‍රිස්තුස් වහන්සේගේ සෙනඟ සියල්ලන් හරහාම කිරීමට යන සේක. ශුභාරංචි කතාන්දරය ජීවත්වීම හා පැවසීමෙන් කිසිවකුට ඉවත්විය නොහැක. දැන් යේසුස් වහන්සේ දෙවියන් වහන්සේගේ දකුණු පැත්තේ සිටින බැවින්, උන් වහන්සේ සිය අනුගාමිකයින් හරහා උන්වහන්සේගේ කරුණාවේ කතාව පවසනු ඇත. මෙම කාර්යයේ දී කිසිවෙකු නොවැදගත් නොවේ; කිසිවෙකු ඉවත් කළ නොහැක.

ක්‍රිස්තුස්වහන්සේ තුළ දෙවියන්වහන්සේගේ ක්‍රියාකාරකමේ සොයා දැනගත නොහැකි සම්පත (බලන්න එපී. 3:8) ක්‍රිස්තුස්වහන්සේගේ එක් එක් සෙනඟ හරහා විශේෂිත, අද්විතීය, සම්පූර්ණ සහ අවසානයේ විශ්වීය ප්‍රකාශනයක් සොයාගනු ඇත. ඇදහිලිවන්තයන්ගේ මෙම දේවසේවය ඔවුන්ගේ අනුග්‍රහක කථා ප්‍රකාශ කිරීම විශේෂ වන්නේ ක්‍රිස්තුස් වහන්සේගේ සෑම සෙනඟකටම එය ලැබී ඇති බැවිනි - වෙනත් වචන වලින් කිවහොත්, ක්‍රිස්තුස් වහන්සේගේ

සෑම අනුගාමිකයෙකුටම ඔහුගේ හෝ ඇයගේ කතාව අන් අය සමඟ බෙදා ගැනීමට කැඳවනු ලැබේ. එය අසහාය වන්නේ එක් එක් කෙනා එය තමාගේම ආකාරයෙන් ලබාගෙන ඇති බැවිනි. එක් එක් පුද්ගලයාගේ කතාව අන් කිසිවෙකුගේ මෙන් නොවේ; සෑම එකක්ම නොමැතිව එය අසම්පූර්ණ වන අතර, ඒ සියල්ල සමඟ එකතු වී එය දෙවියන් වහන්සේට පැවසීමට අවශ්‍ය මුළු කතාවම කියාපානු ඇත. මේ අනුව, සියලු තනි පුද්ගල කථා කවදා හෝ සම්පූර්ණ කතාවට එකතු වන බැවින් එය සම්පූර්ණ වේ. එය අවසානයේ විශ්වීය වන්නේ කරුණාවේ ශුභාරංචිය මුළු ලෝකයටම දේශනා කරන බැවිනි. සෑම ගෝත්‍රයකින්ම, භාෂාවකින්ම සහ ජාතියකින්ම මිනිසුන් එයින් වෙනස් වනු ඇත.

දෙවියන් වහන්සේගේ කරුණාවේ මෙම සුවිශේෂී, අද්විතීය, පරිපූර්ණ සහ විශ්වීය සංදර්ශනය කාලයෙන් ඔබ්බට අදෘශ්‍යමාන බලවේගයන්ට සදාකාලික අභිරහසකි. සාතන්ට එය නොතේරේ. සාතන් සහ ඔහුගේ පක්ෂයන් පාපය සහ හෙළාදැකීම දන්නා නමුත් ඔවුන්ට කරුණාව තේරුම් ගත නොහැක. කෙසේ වෙතත්, ගාබ්‍රියෙල් සහ දේවදූත සත්කාරකයා, දෙවියන් වහන්සේගේ පුත්‍රයා වන ක්‍රිස්තුස්වහන්සේව හඳුනන අතර, මිලියන ගණනක් වූ සභාවන් තුළ ක්‍රිස්තුස්වහන්සේගේ සෑම සෙනඟක්ම කරුණාවේ අභිරහස පිළිබඳ විශේෂිත සහ විශ්වීය ප්‍රකාශයක් බව ඔවුහු හඳුනාගනිති.

පාවුල්ගේ මෙම දර්ශනය, පාපය නිසා නරක අතට හැරුණු හොඳ සැලැස්මක් ගලවා ගැනීමට දෙවියන් වහන්සේ උත්සාහ කරන ප්‍රතික්‍රියාකාරී හදිසි උත්සාහයක් පෙන්නුම් නොකරයි. ඒ වෙනුවට, එය හරියටම දෙවියන් වහන්සේගේ සදාකාලික දේවල් පිළිවෙලින් අනුකූල වේ. සමිඳාණන් වහන්සේ කරුණාවේ අභිරහස ක්‍රිස්තුන් වහන්සේගේ එක් එක් සෙනඟ තුළින් ප්‍රත්‍යක්ෂ ලෙස ප්‍රදර්ශනය කරනවා පමණක් නොව, උන්වහන්සේ එය සදාකාලයටම ක්‍රියාත්මක කරයි.

**මගේ නිගමනයන්**

අවසානයේ දෙවියන්වහන්සේගේ සැලැස්ම දැකීමට මට හැකි විය! ක්‍රිස්තුස් වහන්සේගේ සභාව දේශනා කිරීමට හෝ නමස්කාර මෙහෙය සඳහා මිනිසුන් එක්රැස් කිරීමේ ගබඩාවක් නොවේ. හොඳ චරිත ගුණාංග ගැන මිනිසුන්ට උගන්වන්නාවූ වැඩසටහන් ඉදිරිපත් කරන සාරධර්ම සමාජයක් (club) නොවේ. අපට හොඳ මිතුරන් සහ මිත්‍රත්වයන් සොයා ගැනීමේ ක්ලබ් එකක්ද නොවේ. මේ සියල්ල සභා ක්‍රියාකාරිත්වය තුළ වලංගු ප්‍රතිඵල විය හැකි නමුත් ඒවා සභාවේ අවසාන අරමුණ විය නොහැක. අපගේ අරමුණ වන්නේ ක්‍රිස්තුස් වහන්සේගේ

සභාවේ සෑම සාමාජිකයෙකුම දෙවියන් වහන්සේ අපව කැඳවන ඕනෑම ස්ථානයක ශුභාරංචිය වෙනුවෙන් ජීවත් වීමයි.

බොහෝ ඇදහිලිවන්තයන් වික්ෂිප්ත වී ඇත්තේ සභාවේ දෙවියන් වහන්සේගේ සැලැස්මේ සංකීර්ණත්වය මත නොව එහි සරල බව මතය. මිනිසුන් සභාවේ සංවිධාන ව්‍යුහය සඳහා කැගැසීමට හේතුව එය තුළ ඔවුන් ආරක්ෂාවක් දකින නිසා වන අතර  නායකත්වය එයට එකඟවන්නේ එහි යම්කිසි වැදගත්භාවයක් සොයන නිසයි. ක්‍රිස්තුස් වහන්සේගේ ශරීරයට ව්‍යුහය අවශ්‍ය වන අතර ආරක්ෂාව සහ වැදගත්භාවය සෙවීම පාපය නොවේ. නමුත් ව්‍යුහය ආයතනයට මඟ පෙන්වන විට සහ මිනිසුන් ශුභාරංචිය ලෝකයේ අරමුණු සහගත ලෙස සම්බන්ධ වීමට වඩා ආරක්ෂාව තෝරා ගන්නා විට සහ නායකයින් ක්‍රිස්තුස් වහන්සේගේ සෙනඟගේ මනින ලද බලගැන්වීමට වඩා ආයතනික වැදගත්වය තෝරා ගන්නා විට, සභාව පාපයට යටත් වේ. නායකත්වය මෙය සිදුවීමට ඉඩ දෙන විට, ඔවුන් ශුද්ධාත්මයාණන්වහන්සේට අමතරව, ලෝකය සම්බන්ධ කර ගැනීමට දෙවියන් වහන්සේ අපට දී ඇති වඩාත්ම වැදගත් මෙවලම වන උන්වහන්සේගේ ජනතාව කපා දමන්නෝ වෙති.

මගේ සියලු සෙවීම්, ක්‍රිස්තුස්වහන්සේගේ සියලුම සෙනඟ බලමුලු ගැන්වීම, නව සභා රෝපණය කිරීම, සහ සෑම ප්‍රදේශයකම, නගරවලට සහ හෝ ජාතියක සිටින සෑම පිරිමියෙකුට, ස්ත්‍රියෙකුට සහ දරුවෙකුටම යේසුස් වහන්සේ තුළ දෙවියන් වහන්සේගේ කරුණාවට සවන් දීමට, තේරුම් ගැනීමට සහ ප්‍රතිචාර දැක්වීමට අවස්ථාව ලැබෙන බවට සහතික විය හැකි අත්තිවාරම් හතරකට මා ගෙන ගියේය.

**පළමුව,** දෙවියන් වහන්සේ ලෝකයේ කුමක් කිරීමට ගියත්, උන්වහන්සේ ඒ සියල්ල කරන්නේ ක්‍රිස්තුස් වහන්සේගේ සෙනඟ හරහා ය.

**දෙවනුව,** ක්‍රිස්තුස්වහන්සේගේ සියලු ජනතාව කරණකොටගෙන දෙවියන්වහන්සේ ලෝකයේ කුමක් කිරීමට ගියත්, ක්‍රිස්තුස්වහන්සේගේ සෙනඟව බලගැන්වීම ඔවුන්ගේ පළමු ප්‍රමුඛතාවය ලෙස සලකන නායකත්වය හරහා කරනසේක.

**තුන්වෙනුව,** ක්‍රිස්තුස්වහන්සේගේ සියලු ජනතාව කරණකොටගෙන දෙවියන්වහන්සේ ලෝකයේ කුමක් කිරීමට ගියත්, උන්වහන්සේ එය විමධ්‍යගත ව්‍යුහයක් හරහා සිදු කරනසේක.

**හතරවනුව,** දෙවියන් වහන්සේ ලෝකයේ කුමක් කිරීමට ගියත්, ශුභාරංචිය සහ එහි ව්‍යාප්ති වගකීමට සෘජුවම සම්බන්ධ වන්නාවූද, යාමට, යැවීමට, සහභාගී වීමට, සහයෝගයෙන් ක්‍රියා කරන ප්‍රාදේශීය සභාවන් හරහා උන් වහන්සේ කිරීමට යනසේක.

**වගවීමේ කවයක් නිර්මාණය කිරීම**

මගේ සෙවීම විසින් සභාව සහ නායකත්වයේ කර්තව්‍යය එහි දිව්‍යමය අරමුණ වෙත බලමුලු ගැන්වීම පිළිබඳ ක්‍රියා පටිපාටියේ තව එක් නිගමනයකට මා ගෙන ගියේය: එය නම් ක්‍රිස්තු සෙනඟ බලය ලබන පිණිස ක්‍රියාවේ යෙදෙන නායකත්වය පුද්ගලික මුළාවට හසුවීමේ ඉඩකඩ වැඩි බවය.

ක්‍රිස්තුස්වහන්සේගේ සෙනඟ සහ ලෝකයේ සිදුවන දේ ගොඩනැගිල්ලක හෝ වැඩසටහනක සිදුවන දෙයින් මැනිය හැකි බව විශ්වාස කරන තරමට බටහිර සභාවේ දේවධර්මය අසම්පූර්ණව සහ දුර්වල වී ඇත. මෙම මිත්‍යාව මිනිසුන් සහ නායකයින් එකසේ රවටන්නේ මිනිසුන් අපගේ සභාවට එකතු කරන්නේ නම් හෝ අපගේ මිනිසුන් සෑහීමකට පත්වේ නම් හෝ අපගේ සභාවන් ආත්මයෙන් පිරී තිබේ නම්, ක්‍රිස්තුස් වහන්සේගේ සභාව ලෙස අපි අපගේ අරමුණ ඉටු කරන බව අවංකව විශ්වාස කළ හැකි බව සිතීමට සැලැස්වීමෙනි.

ඇත්ත වශයෙන්ම, අද බටහිර රටවල අප දකින පරිදි, මිනිසුන්ට දෙවියන් වහන්සේ සමඟ ඇති සියලු සමීපභාවයන් අහිමි වෙමින් පවතී. අපගේ නගරවල සමස්ත සභාවන් සංඛ්‍යාවෙන් අඩු වුවද, අපගේම සභාව වර්ධනය වන්නේ නම් හෝ තෘප්තිමත් වන්නේ නම්, අපට ප්‍රශ්නයක් නැත යැයි අපි තර්ක කරමු. ඇත්ත වශයෙන්ම, අප හොඳින් යැයි සිතනවාට වඩා, අපගේ සභාව අන් අයට අනුකරණය කිරීමට ආදර්ශයක් යැයි විශ්වාස කිරීමට අපව රැවටී ඇත.

මම සභාව ගැන බයිබලානුකූල විශ්වාසයන් ලබා ගත් විට, යථාර්ථයේ දී අපගේ වර්ධනය නිකම්ම රංචු මනෝවිද්‍යාවක් සහ ගබඩා කිරන මානසිකත්වයක් මිස දෙවියන් වහන්සේගේ අරමුණ අප මධ්‍යයේ ඉටු වීමන බව සිතා මා රැවටීමෙන් වැළකී සිටීමට මට එම විශ්වාසයන් උපාය මාර්ගික ලෙස භාවිතා කිරීමට සිදු විය. මම මෙම උපායමාර්ගික යෙදුම "වගකීමේ කවයක්" ලෙස හැඳින්වීමට පැමිණියෙමි.

වගවීමේ කවයක් නිර්මාණය කිරීම යනු අපගේ ප්‍රාදේශීය සභාවන්ට අප වටා ඇති භූගෝලීය ක්ෂේත්‍රයක් ලබා දෙන ලෙස ශුද්ධාත්මයාණන්ගෙන් ඉල්ලා සිටීමයි. ඒ නිශ්චිත කාල රාමුවක් තුළ සෑම පුරුෂයෙකුටම, ස්ත්‍රියකුටම සහ දරුවෙකුටම යේසුස්වහන්සේව ගැලවුම්කරු ලෙස අසා තේරුම් ගෙන පිළිගැනීමට අවස්ථාවක් ලැබෙන පිණිසය.

ක්‍රිස්තුස් වහන්සේ තුළ ඇදහිල්ලට පැමිණෙන අයට ඔවුන්ගේම පූජකත්වය ප්‍රගුණ කිරීමට (1 පේතෘස්. 2:9 බලන්න) බලය ලබා දෙන ප්‍රාදේශීය සභාවක ජීවිතයට සම්බන්ධ කර ගැනීමට අපි බල ගැන්විය යුතුයි. දෙවියන් වහන්සේගේ ආත්මය ඔවුන්ට ලබා දී ඇති සියලු සම්බන්ධතා තුළ ඔවුන්ගේ අද්විතීය කරුණාව පිළිබඳ කථා පැවසීමට ඔවුන් වගකිව යුතු අතර, ඔවුන්ගේ අධ්‍යාත්මික දීමනා හඳුනාගෙන ඒවා සභාවේ සහ වඩාත්ම වැදගත් ලෙස ඔවුන් තම කාලයෙන් වැඩි කොටසක් ගත කරන ලෝකයේ භාවිතා කිරීමට පරිසරයක් සපයයි.

වගවීමේ කවයක් තිබීම මට උරුම වූ සභාවේ දේවධර්මයට කෙලින්ම විරුද්ධ ය. මගේ මුල්කාලීන චින්තනය අපගේ සභාවේ සඵලතාවය මනිනු ලැබුවේ මම "ඇතුළත-පිටත චින්තනය" ලෙස හඳුන්වන දෙයෙනි - එය රඳා පැවතියේ අපි විශාල වීම හෝ නොවීම මතය. මම අපේම සභාව මිනුම් දණ්ඩක් ලෙස භාවිතා කළ අතර සමහර අවස්ථාවලදී තෘප්තිමත්, ආරක්ෂිත සහ ආඩම්බර බවක් පවා දැනුනි. අපේ අය පැමිණියේ කොහෙන්ද සහ සභාවෙන් පිටත ඔවුන්ගේ සබඳතා කෙරෙහි විශ්වාසය තබා ඔවුන් කරන්නේ කුමක්ද යන්න දෙවනුව පැමිණි දෙයක් විය විය.

පිටතින්-ඇතුළට සිතීම, අනෙක් අතට, සභාවේ ශුභාරංචිය අරමුණට අනුකූලව, අප ජීවත් වන සමස්ත ප්‍රජාවේ යථාර්ථයන් මධ්‍යයේ සහ ක්‍රිස්තුස් වහන්සේගේ පුළුල් ශරීරය සමඟ සහයෝගීව අපගේ සභාව ඇගයීමට මට ඉඩ සැලැස්වීණි. මූලික ප්‍රශ්නය වූයේ, ‘‘අප ජීවත් වන ප්‍රජාවට අප මැනවින් ශුභාරංචිය ලබා දෙනවාද?’’ යන්නයි. එමෙන්ම එය මැනීමට පහසු ප්‍රශ්නයකි.

එසේ නම්, අපට ඉතිරිව ඇති එකම ප්‍රශ්නය නම්, අපගේ සභාවලට ගොස් තමන්ගේ ඇදහිල්ලෙන් කිසිවක් නොකර සිටින මිනිසුන් කොපමණ ප්‍රතිශතයකින් අප සෑහීමකට පත්වේද යන්නයි. එම ප්‍රශ්නයට අපගේ පිළිතුර අනුව අපගේ සභාවල සිටින ජනයා ඔවුන්ගේ අරමුණ ලෙස විශ්වාස කරන්නේ කුමක්ද සහ අපට කවදා හෝ අප ජීවත් වන ලෝකය සමඟ සැබවින්ම සම්බන්ධ විය හැකිද යන්න තීරණය කරනු ඇත.

# 3
# සභාව එහි සාර්ථකත්වය මැනිය යුත්තේ කෙසේද?

ආරම්භයේ දී දෙවියන් වහන්සේ මිනිසා සහ ස්ත්‍රිය මැවූයේ උන්වහන්සේගේම ස්වරූපයෙන් ය. විශ්වයේ කිසිවක් මානව මැවිල්ලේ අද්විතීය නිර්මාණය දරා නැත; සතුන්ට නැත, ස්වාභාවික ලෝකයේ නැත, දේවදූතයන් පවා නොවේ. විශ්වයේ ඇති සෑම දෙයකටම වඩා වෙනස්ව, දෙවියන් වහන්සේ ආදම් සහ ඒව සහ ඔවුන්ගේ දරුවන් නිර්හීත අරමුණු දෙකක් සඳහා මැව් සේක: එය නම්, උන්වහන්සේ සමඟ සබඳතා පැවැත්වීම පිණිස සහ උන්වහන්සේව නියෝජනය කිරීම පිණිසය.

සම්බන්ධතාවයේ සහ නියෝජනයේ මෙම පණිවිඩය බයිබලයේ පිටු පුරා දක්නට ලැබේ. ව්‍යවස්ථාව ලබා දීමේදී මෝසෙස් සම්බන්ධය ගැන මෙසේ ලිවීය: **“එම්බා, ඉශ්‍රායෙල්, අසාපන්න: අපගේ දෙවිවූ ස්වාමීන්වහන්සේය, එකම ස්වාමීන්වහන්සේය. නුඹේ දෙවිවූ ස්වාමින්වහන්සේට නුඹේ මුළු සිතෙන්ද නුඹේ මුළු ආත්මයෙන්ද නුඹේ මුළු ශක්තියෙන්ද ප්‍රේම කරපන්න" (ද්වි. 6: 4-5)**, සහ ලෝකයේ දෙවියන් වහන්සේගේ නියෝජනය ලෙස: **"නුඹට මෙන් නුඹේ අසල්වැසියාට ප්‍රේම කරපන්න. මම සමිදාණන් වහන්සේ වෙමි” (ලෙවී. 19:18).**

**“ආචාරිනි, ව්‍යවස්ථාවේ ඉතා උතුම් ආඥාව කොයි එකදැයි ඇසුවේය. උන්වහන්සේ ඔහුට කථාකොට තාගේ මුළු හෘදයෙන්ද, තාගේ මුළු ආත්මයෙන්ද තාගේ මුළු බුද්ධියෙන්ද තාගේ දෙවිවූ ස්වාමින්වහන්සේට ප්‍රේම කරව. මෙය ශ්‍රේෂ්ඨ සහ පළමු ආඥාවය මෙය හා සමාන දෙවෙනි එකක් තිබේ, එනම්, තට මෙන් තාගේ අසල්වැසියාට ප්‍රේම කරව යනුය. මේ ආඥා දෙක පිට මුළු ව්‍යවස්ථාවත් සහ අනාගතවාක්‍යයත් පිහිටා තිබේ.” (මතෙ. 22:36-40)** ප්‍රේරිත පාවුල් 2 කොරින්ති 5:17,20 හි ද පණිවිඩය පුනරුච්චාරණය කරයි: **“යමෙක් ක්‍රිස්තුස්වහන්සේ [සම්බන්ධතාවය] තුළ සිටී නම්, ඔහු අලුත් මැවිල්ලක්ය. පරණ දේ පහව ගියේය; මෙන්න සියල්ල අලුත්ව තිබේ....එබැවින්, දෙවියන්වහන්සේ අප ලවා ඉල්වන්නාක්මෙන් අපි ක්‍රිස්තුස්වහන්සේ වෙනුවෙන් [නියෝජනය] තානාපතියෝව සිට...”**

**සභාවේ ප්‍රාථමික හා වැදගත්ම** කර්තව්‍යය මිනිසුන් දෙව් පියාණන්වහන්සේ සමඟ සම්බන්ධතාවයේ වර්ධනය වනු දැකීමය. සභාව මෙම ප්‍රශ්නය නොඅසන විට, එය කෙතරම්

අම්හිරි හෝ අපහසු සහගත වුවද, සභාව තම ප්‍රාථමික කාර්යයේ අසාර්ථක වේ. සභාවක් තමන් කරන දෙය දෙවියන්වහන්සේගේ කාර්යය හා සමපාත වනවාද යන්න නිතර මැනීමට අපොහොසත් වූ විටද එය තම ප්‍රාථමික කාර්යයෙහි අසාර්ථක වේ.

**දෙවන කාර්යය** වන්නේ දෙවියන් වහන්සේව නියෝජනය කිරීමට ඇදහිලිවන්තයන් ශක්තිමත් කිරීම සහ සක්‍රිය කිරීමයි. එම නියෝජනය ජන ජීවිතයෙහි එකතුව ප්‍රකාශ කළ යුතුය. එය දෙවියන් වහන්සේ සමඟ ඇති ඔවුන්ගේ සම්බන්ධතාවයෙන් නැඟී, ඔවුන් තුළ ශුද්ධාත්මයාණන්ගේ පදිංචිය තුළින් වර්ධනය වේ. ඔවුන් ගන්නා තීරණවල එකඟතාව සොයා ගන්නා අතර ඔවුන් අවට ලෝකයේ මිනිසුන් සමඟ ඇති සබඳතා තුළ පැතිරෙනු ඇත. සභාව දෙවියන් වහන්සේ සමඟ සබඳතාවයේ සහ උන් වහන්සේ නියෝජනය කරන පුද්ගලයින්ට ඵලදායී ලෙස බල ගන්වන්නේද යන්න අප මැනිය හැක්කේ කෙසේද? පරිණත ඇදහිලිවන්තයෙකුගේ ජීවිතයේ "පර්යන්ත වටිනාකම්" ලෙස මා හඳුන්වන දේවලින් අවම වශයෙන් පහක් ශුද්ධ ලියවිල්ල හෙළි කරයි. පළමු එක සම්බන්ධකම් සමඟ කටයුතු කරයි; අවසාන හතර නියෝජනය ආමන්ත්‍රණය කරන්නේය. මෙම පර්යන්ත අගයන් ඉතා වැදගත් වන අතර ඒවා කේවල් කළ නොහැක. ඇත්ත වශයෙන්ම, සභාවක් ලෙස එකට එකතු වී සිටින මිනිසුන් ඔවුන්ගේ එදිනෙදා ජීවිතයේදී මෙම වටිනාකම් පෝෂණය කිරීමට ළදරු පියවරක් හෝ නොගන්නේ නම්, ඔවුන්ට ඇත්ත වශයෙන්ම සභාවක් නොතිබේවා. මිනිසුන් දෙවියන් වහන්සේගේ වචනය අභිබවා යන සාරධර්මවල අනුරූප හා මැනිය හැකි වර්ධනයක් පෙන්නුම් නොකර, හොඳ දේශනා කිරීම්, හොඳ නමස්කාරය, හොඳ වැඩසටහන් හෝ ලස්සන ගොඩනැඟිලි සඳහා සභාවට පැමිණේ නම්, ඔවුන්ට සභාවක් නොතිබේවා.

මෙම කේවල් කළ නොහැකි එළිපත්ත අගයන් පහේ රාමුව තුළ සභාවේ “සාර්ථකත්වය” මැන බැලීමෙන් අපට සැබවින්ම හුදෙක් ආගමික රැස්වීමක් පමණක් නොව එහි සභාවක් තිබේද යන්න තීරණය කරනු ඇත. මෙම සාරධර්ම පහ සභාව විසින් ක්‍රිස්තුස් වහන්සේගේ සෙනඟට මෙම වටිනාකම් අනුව ජීවත් වීමට සැබවින්ම බලය ලබා දෙනවාද නැතහොත් අද බහුලව පවතින "ඇවිත් බලන්න" ආදර්ශය යලි ස්ථාපිත කරනවාද යන්න මැන බැලීමක් ලෙසද ක්‍රියා කරයි. අපි ඒවා විමසා බලමු.

**එළිපත්ත 1: දෙවියන් වහන්සේ සමඟ සමීප සබඳතාවයක් වර්ධනය කිරීම**

ශුද්ධ ලියවිල්ලේ පළමු කැඳවීම සහ ඒ අනුව වැදගත්ම එළිපත්ත වන්නේ දෙවියන් වහන්සේ සමඟ සබඳතාවයක් වර්ධනය කිරීමයි. ඕනෑම ආකාරයක සම්බන්ධතාවයක් පමණක් නොව සමීප, සමීපම සම්බන්ධතාවයක්. දෙවියන් වහන්සේ සමඟ සම්බන්ධතාවයකින් තොරව, අප

අවට ලෝකයේ සිටින මිනිසුන්ට උන් වහන්සේව නියෝජනය කිරීමට අපට කිසිදාක ඉදිරියට යා නොහැක. සභාවක් මිනිසුන් දෙවියන් වහන්සේ සමඟ සමීප සබඳතාවයකින් ගමන් කිරීමට ආදර්ශන දෙමින් සහ අපේක්ෂා කරන විට, එය එහි කාර්යය ඉටු කරයි.

දෙවියන් වහන්සේ සමඟ සමීප සබඳතාවයකට අපව කැඳවනු ලැබේ:

**"මම ඉවසීමෙන් ස්වාමින් දෙස ගැන සිටියෙමි, උන්වහන්සේ කන් යොමා මාගේ මොරගැසීම ඇසූසේක. උන්වහන්සේ භයානක වළකින්, හැල්පතෙන්, මා ඔසවා, පර්වතයක් පිට මාගේ පා තබා මාගේ ගමන් ස්ථිර කළසේක. උන්වහන්සේ අලුත් ගීතිකාවක් එනම්, අපගේ දෙවියන්වහන්සේට ස්තුති ගීතිකාවක් මාගේ මුඛයෙහි තැබූසේක. බොහෝ දෙනෙක් එය දැක භයව ස්වාමින් කෙරෙහි විශ්වාස කරන්නෝය."  (ගීතා. 40:1-3)**

ගීතිකාකරුගේ මෙම ආරාධනය අපගේ පියාණන් වන දෙවියන් වහන්සේ සමඟ සදාකාලික සබඳතාවයකට ඇතුල් වීමට අපට අභියෝග කරයි. නමුත් බොහෝ විට අප අවට ලෝකය දෙවියන් වහන්සේ සමඟ සමීප සබඳතාවයක් අපේක්ෂා කරන අයගේ මනස් සහ හදවත් මත අබිං මෙන් ක්‍රියාකරයි. සමහර විට අද සංස්කෘතිය පෙර පැවති ඒවාට වඩා පව්කාර විය හැක, සමහර විට ජනමාධ්‍ය බහුල වීම නිසා විය හැකිය, නමුත් වෙන කවරදාටත් වඩා ඇදහිලිවන්තයන් දෙවියන් වහන්සේ සමඟ සබඳතා අර්බුද අත්විඳින බව මට පෙනේ.

මේ අයගෙන් සමහරක් නාමික කිතුනුවන් ය. **"මම ඔබව කිසි දිනක දැන සිටියේ නැත" (මතෙ. 7:23)** යනුවෙන් යේසුස් වහන්සේ යම් දවසක පවසනු ඇත්තේ ඔවුන් ගැන බව පෙනේ. ඔවුන් ක්‍රිස්තියානි ධර්මයේ ස්වරූපයන් අනුගමනය කරන නමුත් යේසුස්වහන්සේ විසින් පොරොන්දු වූ පරිවර්තනයක් හෝ බලයන් කිසිවක් ප්‍රදර්ශනය නොකරයි. මෙම පුද්ගලයින් එහි රැඳී සිටීමින් සැබවින්ම සභාවේ ජීවිතයට අනතුරක් නිර්මාණය කරන්නෝය. කලක් අප ඔවුන්ව ලිබරල් සභාවල පමණක් දැක ඇති අතර, අද ඔවුන් බොහෝ එවැන්ජලිස්ත සභා ද පුරවති.

වෙනත් අය සැබෑ ලෙසම දෙවියන් වහන්සේ සමඟ ගැඹුරු සබඳතාවයකට ආශා කරන නමුත් කාර්යබහුල වී ඇත. වස්තුකාමයට, ලෞකික බලපෑම්වලට, ලෝක සැලකිලිවලට හසුවෙමින් සංස්කෘතියේ අබිංවලට හසුවී මොවුන් වැඩිපුරම දුක් විඳින්නේ මොවුන්ය. ඔවුන්ගේ විපාකය ඔවුන් තවමත් තබාගෙන සිටින ශුද්ධ ලියවිල්ලේ සත්‍යය සමඟ වියළි බවක් වර්ධනය වන බවට ඇති හැඟීමකි. බොහෝ සභාවල වැඩසටහන් මගින් පිරිනමනු ලබන ක්‍රිස්තියානි ධර්මයට වඩා වැඩි යමක් අත්විඳීමට ඔවුන්ට අවශ්‍ය නම් ඔවුන්ගේ ජීවිත පිළිබඳ යථාර්ථ පරීක්ෂාවක් අවශ්‍ය වේ.

ඉතිරි ඇදහිලිවන්තයන්ට, දෙවියන් වහන්සේ වෙනුවෙන් තමන්ව අත්හැර දැමීමට කැඳවීම පොරොන්දු සහගත ආරාධනයක් ලෙස පවතී. ඔවුන් දෙවියන් වහන්සේ සමඟ ගත කළ අවස්ථා සිහිපත් කරන විට, ඔවුන් දිරිගැන්වීම, අභියෝග සහ උණුසුම් ලෙස තිබූ නිවැරදි කිරීම පවා සිහිපත් කරති. දෙවියන් වහන්සේ සම්පූර්ණයෙන්ම විශ්වාස කළ හැකි බවත්, අපව උන්වහන්සේ වෙනුවෙන් අත්හැරීම අවදානමක් නොවන දෙයක් බවත් එම අවස්ථා වලදී ඔවුන් තේරුම් ගනී.

නමුත් මෙම කැප වූ ක්‍රිස්තුස් අනුගාමිකයන් මෙම අත්හැරීම ගැඹුරු කිරීමට අවශ්‍ය කාලය සහ විනය නිරතුරුවම රැකගත යුතුය. දෙවියන් වහන්සේ සමඟ සබඳතාවයක් ගැඹුරු කිරීම සිදු වන්නේ නිකම්ම නොවේ. එය මත වැඩ කළ යුතුය. නීත්‍යානුකූලනීය ක්‍රිස්තියානි වැඩසටහන් වල සහ යේසුස් වහන්සේ සමඟ සබඳතාවක් ගොඩනගා ගැනීමට අවශ්‍ය විනය අතර පැහැදිලි වෙනසක් ඇති කිරීමට එය "මත වැඩ කිරීම" මිස "වෙත වැඩ කිරීම" යැයි මම නොකීවෙමි.

දෙවියන් වහන්සේ සමඟ සමීප සබඳතා ආරම්භ වන්නේ කොතැනින්ද? 2 කොරින්ති 5:20 හි පාවුල් අපට මෙසේ පවසයි: **"දෙවියන් වහන්සේ හා සමගි වෙයල්ලායැයි ක්‍රිස්තුස් වහන්සේ වෙනුවෙන් නුඹලාගෙන් ඉල්ලමුව."** දෙවියන් වහන්සේ සමඟ සමීප සබඳතාවයක් ආරම්භ වන්නේ අප මුලින්ම උන්වහන්සේගේ පුත්‍රයා මාර්ගයෙන් දෙවියන් වහන්සේ සමඟ සමාදාන විය යුතු බව පිළිගැනීමෙනි.

නැවතත්, මෙම පණිවිඩය සියලුම ශුද්ධ ලියවිල්ල ඉක්මවා යයි. එය මැවීමේ උත්පත්ති 1 කතාවට ආවේනික ය: මිනිසා උපත ලැබුවේ දෙවියන් වහන්සේ සමඟ සම්බන්ධතාවයක ය, නමුත් පාපය ඔහුව ස්වාමීන් වහන්සේගෙන් ඈත් කළේය; කෙසේ වෙතත්, දැන් යේසුස් වහන්සේ තුළ, අපට උන්වහන්සේ සමඟ සබඳතාවයට නැවත පැමිණිය හැකිය. යේසුස් වහන්සේගේ පණිවිඩයත් මෙයයි. අපි මෙය මතෙව් 20:20-28 සහ යොහන් 17 හි පැහැදිලිව දකිමු. පරණ ගිවිසුමේ ඇති වැදගත්ම ආඥාව නම් අපගේ මුළු හදවතින්ම, මනසින් සහ ආත්මයෙන් අපගේ දෙවි සමිඳාණන් වහන්සේට ප්‍රේම කිරීමයි, යේසුස් වහන්සේ පෘථිවියට පැමිණියේද ඒ වෙනුවෙන්ය: උන්වහන්සේව එවූ පියා සහ පුත්‍රයා අපට දැනගත හැකිය (යොහන් 17:3 බලන්න). ක්‍රිස්තියානි ධර්මය ආරම්භ වන්නේත් අවසන් වන්නේත් මෙම පදනමෙන් වේ. එසේ නොවේ නම් එය ක්‍රිස්තියානි ධර්මය ලෙස හැඳින්විය නොහැක. සභාව මෙය ව්‍යාපාරයේ පළමු අනුපිළිවෙල බවට පත් කළ යුතුය, නැතහොත් එය මිනිසුන්ගේ කාලය නාස්ති කරයි.

ප්‍රතිසන්ධානය අපව දෙවියන් වහන්සේ සමඟ සම්බන්ධතාවයකට ගෙන යන නමුත්, ඉන් පසුව අපි ගැටලුවකට මුහුණ දෙන්නෙමු: අපි දෙවියන් වහන්සේ සමඟ අපගේ සම්බන්ධතාවයට පාපය ගෙනෙමු. ඔව්, අපගේ පාපය ජේසුස් වහන්සේගේ මරණය, භූමදානය සහ නැවත නැඟිටීම තුළ ජය ගන්නා ලදී, නමුත් අප මිය ගොස් ස්වර්ගයට යන තුරු, අපගේ පව්කාර භාවයේ ඉතිරි කොටස දෙවියන් වහන්සේ අපව මැවූ විට අප වෙනුවෙන් සැලසුම් කළ සම්බන්ධතාවයට එරෙහිව සටන් කරයි. අපි ඊර්ෂ්‍යාව, ඕපාදූප, අපහාස සහ වෙනත් පරීක්ෂාවන් සමඟ සටන් කරන විට පාපය අපගේ දෛනික ජීවිතය විනාශ කරයි. මේවා අපේ පවුල්වල අය සමඟ පවා මිනිසුන් සමඟ ඇති අපගේ සබඳතාවලට හානි කරයි. මෙම සමහර පාපයන් අපගේ ජීවිතවල වැඩි කාලයක් පවතින තරමට, ඒවායින් කැළැල් ඇති කරයි. නමුත් අද අපට ජය ගැනීමට මෙන්ම අතීතයේ සිදු වූ හානියෙන් සුවය ලැබීමට අවශ්‍ය පිළියම දෙවියන්වහන්සේ සතුව ඇත.

ඕනෑම සම්බන්ධතාවයකදී මෙන්, දෙවියන් වහන්සේ සමඟ අපගේ සම්බන්ධතාවය පවත්වා ගැනීමට සහ ශක්තිමත් කිරීමට අවශ්‍ය විනය ඉල්ලා සිටී. ගැලවීමේ මොහොතේ බලය අභිබවා යාම අපගේ ක්ෂණික සම්මතය බවට පත් වී අතීතයෙන් සිදු වූ සියලු හානිය අතුගා දැමුවේ යැයි අපි ප්‍රාර්ථනා කළ හැකිය. නමුත් එය දෙවියන් වහන්සේගෙන් පොරොන්දුවක් නොවේ. ශුද්ධ ලියවිල්ලේ එය දෙවියන් වහන්සේ සමඟ ගැඹුරු සමීප සම්බන්ධතාවයක් සඳහා අපගේ ආශාව ශක්තිමත් කිරීමට අත්‍යවශ්‍ය සම්බන්ධතා විෂයයන් අවම වශයෙන් හතරක්වත් මම දකිමි.

***පළමු විනය*** ඉතිරි සියල්ල සඳහා වේදිකාව සකසන අතර දෙවියන් වහන්සේ අපගේ ජීවිතයට ගෙන ඒමට අවශ්‍ය සුවය සඳහා පදනම වේ: *එය දෙවියන් වහන්සේගේ වචනය තුළ ගත කරන කාලය වේ.* දෙවියන්වහන්සේගේ වචනය වෙනත් ඕනෑම ලිඛිත වචනයකට වඩා වෙනස් ය: **"මක්නිසාද දෙවියන්වහන්සේගේ වචනය ජීවමානය, බලවත්ය, කොයිම දෙමුහත් කඩුවකටත් වඩා තියුණුය, ප්‍රාණය සහ ආත්මයද සන්ධි සහ ඇටමිදුළුද වෙන්කරන තරමටම කා වදින්නේය." (හෙබ්‍රෙ. 4:12).**

දෙවියන් වහන්සේගේ වචනය ජීවමාන වන්නේ එය දෙවියන් වහන්සේ විසින් පවසන ලද බැවිනි. මේ අනුව එයට ප්‍රවේශ වන අයගේ ජීවිත තුළ එය අඛණ්ඩව ක්‍රියාකාරී වේ. දේව වචනය සරලව කියවීම මගින් පාඨකයාගේ හදවතේ සහ මනසෙහි ක්‍රියාකාරී බීජයක් රෝපණය කරනු ලබන්නේය. නොඇදහිලිවන්තයා තුළ මෙය වෙනත් අයෙකුගෙන් ආදානයක් නැතුවම වුවද විශ්වාසය, පසුතැවීම සහ ගැලවීම කරා ගෙන යා හැකිය,. දැනටමත් දෙවියන් වහන්සේ සමඟ සමාදාන වී ඇති නමුත් උන් වහන්සේ සමඟ අපගේ සම්බන්ධතාවය

ගොඩනඟා ගැනීමට අවශ්‍ය අප වැනි අයට මෙයින් පුනර්ජනනීය ක්‍රියාව සිදු වේ. හෙබ්‍රෙව් ලේඛකයා පැහැදිලි කරන පරිදි, අපගේ කියවීමෙන් සහ අධ්‍යයනයෙන් නිතිපතා අප තුළ රෝපණය කරන ලද වචනය, අපගේ සැබෑ ස්වභාවය හෙළි කරයි. දෙවියන් වහන්සේ අපව දකින ආකාරයටම - සන්ධි සහ ඇටමිදුළු, ආත්මය සහ ආත්මය - දැකීමට වචනය අපව නිදහස් කරන්නේය.

බොහෝ දෙනෙකුට මෙම දර්ශනය බියෙන් වැසී ඇති දෙයකි. දෙවියන්වහන්සේගේ විනිවිද යන ඇසට එතරම් නිරාවරණය වීම, අප ගැන පැහැදිලි චිත්‍රයක් ලබා ගැනීම, අපට හසුරා ගත නොහැකි තරම් වැඩි ය, එබැවින් අපි සැඟවී සිටිමු. බොහෝ විට අපි සභාවට යාම වැනි යහපත් දේවල සැඟවී සිටිමු. අප සමඟ සම්බන්ධකම් ඇති කර ගැනීමට වඩා වෙනත් කෙනෙකු ගායනා කිරීම හෝ සම්බන්ධතාවය ගැන දේශනා කිරීම අපට වඩාත් පහසු ය. අප ගැන එතරම් ගැඹුරු දැනුමක් ඇති කිසිවෙකු, දෙවියන්වහන්සේද ඇතුළුව කිසිවෙකු විශ්වාස කළ නොහැකි යැයි හෝ අප වචනය දෙස බලන විට අප දකින දේට අප අකමැති වනු ඇතැයි අපි බිය වෙමු. ඉතින් අපි අවමානයෙන් සැඟවෙමු.

නමුත් සැඟවීම අපගේ වේදනාව තවත් උග්‍ර කරන අතර, අපගේ කැළැල් සණ්හවණය කිරීමට සමත් වනු ඇත, එහි නරකම දෙය නම්, අපව සුව කිරීමෙන් වැළක්වීමයි. දෙවියන්වහන්සේගේ වචනය තුළින් මෙන් අපව සුවපත් කිරීමට මෙලොව අන් කිසිවකට නොහැක. කිසිවක් නැත! හෙබ්‍රෙව්වරුන්ගේ පොරොන්දුව මෙයයි. අප දැනගත යුතු දේ මෙන්න: කීකරුකමේ පූර්වගාමී ආකල්පයකින් දේවවචනය නිතිපතා කියවීමට යටත් වීමෙන් ලැබෙන අපව හෙළිදරව් කිරීම සැමවිටම අපගේ උත්තම පූජකයා වන යේසුස්වහන්සේ සමඟ උන්වහන්සේගේ ධර්මිෂ්ඨකම පැළඳ සිටී. උන්වහන්සේගේ වස්ත්‍රවලින් සැරසුනු විට, අපව නිරාවරණය කරනු ලබන නමුත් හෙළා දැකීමක් සිදු නොවේ. යේසුස් වහන්සේ අප වෙනුවෙන් සියලු හෙළාදැකීම් දරා ඇත.

එබැවින් දෙවියන්වහන්සේගේ වචනය නිතිපතා කියවීමේදී, අප දෙවියන්වහන්සේගේම අභිමුඛයට පැමිණෙන ආකාරයට අපට ආරාධනා කරනු ලැබේ. එම අභිමුඛයේදී අපට අවශ්‍ය දේ ලැබේ: දයාව, යේසුස් වහන්සේ තුළ අපට ඇති සමාව සහ කරුණාව, දෙවියන් වහන්සේගේ සුව කිරීමේ බලය අපගේ ජීවිතවලට අදාළ වේ.

මෙම ක්‍රියාවලිය එකවර සිදු නොවේ. එය කෙසේ විය හැකිද? අපගේ ජීවිතයේ ඇති සියලුම කැළැල් වලට දෙවියන් වහන්සේ ඕනෑම මොහොතක අපව නිරාවරණය කළහොත්, අපට එය හසුරාගත හැකිද? අපි දෙවියන් වහන්සේගේ වචනය තුළ කාලය දෙවියන් වහන්සේ සමඟ ස්ථාවර සම්බන්ධතා විනයක් බවට පත් කළ යුතුය. බොහෝ විට දෙවියන් වහන්සේ අපට

දිරිගැන්වීම සහ ප්‍රීතිය ලබා දෙන අතර, උන්වහන්සේ හොඳින්ම දන්නා බැවින්, උන්වහන්සේ අප කවුරුන්ද යන්න සහ අපට තවමත් සුවය අවශ්‍ය තැන හෙළි කරනු ඇත.

දෙවියන් වහන්සේ සමඟ ඇති සම්බන්ධය ජීවමාන දෙයකි. වචනය කියවීමෙන් අපට ස්වාමීන් වහන්සේ සමඟ ඇති සබඳතාව විටින් විට නොසලකා හැරීමට ඉඩ සලසන දැනුම් පදනමක් අපට ලබා නොදේ. දෙවියන් වහන්සේ සමඟ ඇති සම්බන්ධතාවයේ මෙම මූලික විනය පෝෂණය කිරීමට අප අසමත් වූ විට, අපි පසුගාමී වෙමු. සත්‍යය අත්‍යවශ්‍ය වේ, නමුත් එයට සම්බන්ධතාවය ප්‍රතිස්ථාපනය කළ නොහැක. එපමණක් නොව, එයට දෙවියන්වහන්සේම අපට දෙන ප්‍රාණවත්වීම නැතිවීම හෝ අවශ්‍ය සුවය ලබාදීම කළ නොහැක. මේ දේවල් අපේ ස්වර්ගික පියාණන් සමඟ සමීප සබඳතාවයකින් පෝෂණය කළ යුතුයි.

***දෙවන සම්බන්ධතා විනය නම් නිශ්ශබ්දතාවයයි.*** නික්මයාම 14:14 හි මෝසෙස් ඊශ්‍රායෙල් දරුවන්ට මතක් කර දුන්නේ, **"ස්වාමීන්වහන්සේ නුඹලා උදෙසා සටන් කරනසේක. නුඹලා නිශ්ශබ්දව සිටිය යුතුයයි සෙනඟට කීවේය."** ගීතාවලිය 37:7 හි ගීතිකාකරු අපට මතක් කර දෙන්නේ, **"ස්වාමීන් වහන්සේ කෙරෙහි රඳා ඉවසිල්ලෙන් උන්වහන්සේ කෙරෙහි බලා සිටුව. තමාගේ මාර්ගයේ දියුණුවන්නාද, නපුරු ප්‍රයෝග නිසාද කළනොකිරව."** ගීතාවලිය 46:10 හි අපට නැවත වරක් පවසා ඇත්තේ, **"නිශ්චලව සිට, මා දවියන් වහන්සේ බව දැනගනින්න."**

අපගේ ඝෝෂාකාරී ලෝකයේ, බොහෝ විට පෙනෙන්නේ නිස්කලංක ස්ථාන නොපවතින බවයි. නමුත් අපි එය තෝරා ගන්නේ නම් නිශ්ශබ්දතාවය සෑම පැත්තකින්ම අපට ලබා ගත හැකි වනු ඇත. කාර්යබහුල ගුවන් තොටුපලක පවා මට නිශ්ශබ්දතාවයක් සොයාගත හැකි බව මම සොයාගෙන ඇත. මට මාර්ගයක ගමන් කිරීමට හෝ මාර්ගයෙන් පිටත ස්ථානයක වාඩි වීමට සිදු විය හැකිය, නමුත් මට අවශ්‍ය වන්නේ නිශ්ශබ්දතාවය නම්, මට එය සොයාගත හැකිය.

නිශ්ශබ්දතාවය තේරීමකි. එයින් අදහස් කරන්නේ අපගේ අවධානය සඳහා කෑගසන අප අවට ලෝකයේ ශබ්දය නිවා දැමීමට තෝරා ගැනීමයි. රූපවාහිනිය, ගුවන්විදුලිය, හොඳ පොත් සහ මිනිසුන් සඳහා වේලාවන් තිබේ. නමුත් ගැඹුරු චින්තනය සහ පරාවර්තනය වර්ධනය විය හැක්කේ නිශ්ශබ්දතාව තෝරා ගැනීමට සහ පුහුණු වීමට ඉගෙන ගත් විට පමණි.

නිශ්ශබ්දතාවය තුළ අපි නව සතුට සොයා ගනිමු. නිදසුනක් වශයෙන්, දේවවචනය කියවීමේ විනය තුළින් අපගේ හදවත් තුළ රෝපණය කර ඇති වචන අපගේ හදවත් සහ මනස නව අර්ථයකින් පිරී යාමට අවස්ථාවක් ඇත. අප වටා ඇති දෙවියන් වහන්සේගේ ලෝකයේ

අලංකාරය උන්වහන්සේගේ බලය සහ පරමාධිපත්‍යය අපට කථා කරයි. සියල්ලටම වඩා, අපි නැවත වරක් දෙවියන් වහන්සේගේ අභිමුඛය සමඟ ප්‍රමෝදයට පත් වෙමු.

වැඩි කාලයක් නිශ්ශබ්දතාවයකින් තොරව දෙවියන් වහන්සේ සමඟ ඇති සම්බන්ධතාවයේ අභිරහසට ඇතුළු වීමට මට මාර්ගයක් හමු නොවීය. නිශ්ශබ්දතාවය පුරුදු නොකිරීමට අපට විවිධ හේතු සොයාගත හැකි නමුත් නැවතත්, නිශ්ශබ්දතාවය තේරීමකි. අපි උන් වහන්සේ සමඟ නිතිපතා නිශ්ශබ්දව සිටීමට ඉගෙන ගන්නා තෙක් දෙවියන් වහන්සේ සමඟ සම්බන්ධ වීම අසම්පූර්ණ වනු ඇත.

***තෙවන සම්බන්ධතා විනය හුදකලාවයි.*** මතෙව් 14:23 යේසුස් වහන්සේම තනිව සිටීමට තෝරා ගත් ස්ථාන ගණනාවකින් එකකි: **"සමූහයා විසිරී ගිය පසු, උන්වහන්සේ තනිවම සිට යාච්ඤා කිරීමට කන්දට නැගී සේක. උන්වහන්සේ රාත්‍රිය දක්වා එහි තනිව සිටිසේක."** සමහර විට මෙයට වඩා වැඩි යමක් පැවසිය යුතු නැත: යේසුස්වහන්සේම හුදකලාව සෙව්වේ නම්, එය අපට අඩු අවශ්‍යතාවයක්ද?

අපේ සංස්කෘතිය තුළ අපට නිහඬව සිටීම දුෂ්කර නම්, තනිව සිටීම සමහර විට ඊටත් වඩා දුෂ්කරය. දෙවියන්වහන්සේගේ වචනයෙන් දෙවියන්වහන්සේට ඇහුම්කන් දීමේ දීර්ඝ කාලයක් අප අසමත් වී ඇත්නම්, එය සැබවින්ම අප සමඟ තනිව සිටීමට අපට අවශ්‍ය නොවීම විය හැක. සමහර විට ස්වයං සොයාගැනීම් පිළිබඳ බිය අපව තනිව සිටීමට ඇති ආශාවෙන් වළක්වයි. එසේත් නැතිනම් සමහර විට එය අප වටා ඇති සංස්කෘතියේ විනෝදාස්වාදය තුළ අපගේ විශාලතම "ප්‍රීතිය" සොයා ගැනීමයි. අපගේ කරදරකාරී සංස්කෘතිය ප්‍රායෝගිකව අපට තනිව කාලය ගත කිරීම, නිශ්ශබ්දව සිටීම සහ එහි ප්‍රතිඵලයක් ලෙස අපගේ සංස්කෘතිය දුම් සහ කණ්ණාඩි වලට වඩා වැඩි දෙයක් නොවන බව පරාවර්තනය කිරීමේදී තේරුම් ගැනීම අවහිර කරයි.

හුදකලාව තුළ අපට නිශ්ශබ්දතාවයට ඉඩක් මෙන්ම දේව වචනයට ක්‍රියාශීලීව සවන් දීමට කාලය ද ලැබේ. හුදකලාව තුළ අපට අපගේ කුඩා බව සහ මෙම ග්‍රහලෝකයේ අපගේ තාවකාලික තත්වය සිහිපත් වනු ඇත. වඩා වැදගත් වන්නේ හුදෙකලාව තුළදී අපට මතක් වන්නේ අප මේ ලෝකය සඳහා නිර්මාණය කර නොමැති බවයි. පාපයේ බලපෑම් මේ පොළොව පාලනය කරයි. උත්පත්ති 1 හි දෙවියන් වහන්සේ මැවූ ලෝකය අප වෙනුවෙන් මවන ලද අතර එය තුළ අපව ප්‍රතිෂ්ඨාපනය කරනු ලැබිය. හුදකලාව අපගේ ජීවිතයේ මාලිමාව යළි පිහිටුවීමට අවශ්‍ය අවස්ථා සපයයි. නමුත් වඩාත්ම වැදගත් දෙය නම්, හුදකලාව තුළ අප තනිව නැති බව සොයා ගැනීමයි. ඇත්ත වශයෙන්ම දෙවියන් වහන්සේ එහි සිටින සේක.

***අවසාන සම්බන්ධතා විනය නම් යටත් වීමයි.*** දෙවියන් වහන්සේ සමඟ ඇති අපගේ සම්බන්ධතාවයට යටත් වීම අත්‍යවශ්‍ය මෙන්ම එයින් එය සාරවත් වේ. හෙබ්‍රෙව් 12:9 අපට මතක් කර දෙන්නේ **"තවද අපට දඬුවම් කරන ආත්මීක පියවරු අපට සිටියෝය. අපි ඔවුන්ට ගෞරව කළෙමුව. ඊට බොහෝ වැඩියෙන් අප විසින් ආත්මවල පියාණන්වහන්සේට යටත්ව ජීවත්වන්ට යුතු නොවේද?"** යනුවෙන්ය. හෙබ්‍රෙව් 5:7 හි අපට මතක් කර දෙන්නේ, **"උන්වහන්සේ මාංසමත්ව සිටි දවස්වලදී, තමන්වහන්සේ මරණයෙන් ගලවාගන්ට පුලුවන්වූ, තැනන්වහන්සේට බලවත් හැඬීමෙන් හා කඳුළුලෙන් යුක්තව යාච්ඤා සහ කන්නලව් ඔප්පුකර තමන්ගේ දේවභය නිසා උත්තර ලැබ..."** යේසුස් වහන්සේගේම වචනවලට යටත් වීමේ වැදගත්කම විදහා දක්වයි: **"ස්වර්ගයේ සහ පොළොවේ සියලු බලය මට තිබේ. එබැවින් නුඹලා ගොස් සියලු ජාතීන් ගෝලයන් කරපල්ලා; පියාණන්ගෙත්, පුත්‍රයාගෙත්, ශුද්ධාත්මයාණන්ගෙත් නාමයට ඔවුන් බෞතිස්ම කරපල්ලා. මා විසින් නුඹලාට අණකළ සියල්ලම පවත්වාගන්ට ඔවුන්ට උගන්වාපල්ලා." (මතෙ. 28:18-20).**

"යටත් වීම" යන වචනය වරදවා වටහා ගැනීම් සහ බිය සමඟ ආරෝපණ වේ. තමා යේසුස් වහන්සේගේ වහලෙකු බව කළ පාවුල්ගේ ප්‍රකාශයද ඒ හා සමානව වරදවා වටහාගෙන ඇත. උත්පත්ති පොතේ ප්‍රකාශ කරන පරිදි දෙවියන් වහන්සේ මෙම ග්‍රහලෝකයේ ස්වෛරී මැවුම්කරු නම්, ගීතිකාකරු ප්‍රකාශ කරන පරිදි, උන්වහන්සේ අපව බියෙන් හා පුදුම සහගත ලෙස නිර්මාණය කර තිබේ නම්, සහ උන්වහන්සේගේ මැවිල්ල උන්වහන්සේගේ ආදරණීය ප්‍රඥාවට ප්‍රතිචාර දක්වනු ඇතැයි අපේක්ෂා කිරීමට මැවුම්කරුට අයිතියක් තිබේ නම්, එය එසේ වන්නේ කෙසේද? උන්වහන්සේට මුළු හදවතින්ම සහ කැමැත්තෙන්ම යටත් වීම උන්වහන්සේ සමඟ ඇති අපගේ සම්බන්ධතාවයේ ස්වාභාවික ගලායාමක් වනු ඇතැයි අපි බලාපොරොත්තු නොවන්නෙමුද?

යේසුස්වහන්සේ සහ පාවුල් යන දෙදෙනාම යටත් වීමේ සැබෑ ස්වභාවය තේරුම් ගත්හ. ඔවුන්ගේ යටත් වීම ඔවුන් සමීපව දැන සිටි තැනැත්තා සමඟ ඇති සම්බන්ධතාවයේ සහ විශ්වාසයේ යථාර්ථය තුළ ය.

දෙවියන් වහන්සේ අපට ආරාධනා කරන්නේ උන්වහන්සේව විශ්වාස කරන ලෙසයි. ශුද්ධ ලියවිල්ලේ ශික්ෂාවන් වන, නිශ්ශබ්දතාවය සහ හුදකලාව පුහුණු කිරීම විශ්වාසය වැඩි කරයි; ඇත්ත වශයෙන්ම, බයිබලයෙන් අප සොයාගත් තැනැත්තා විශ්වාස කිරීම ස්වාභාවිකය. අප අපගේ ජීවිතය තුළ උන් වහන්සේගේ කැඳවීම බේරුම් කර ගන්නා අතරේ, නිතැතින්ම දෙවියන් වහන්සේට යටත් වීම අපගේ ප්‍රතික්‍රියාව වන තත්වයකට පැමිණීම අපගේ ඉලක්කය

විය යුතුය. එය දෙවියන් වහන්සේගේ වචන අප වෙත පැමිණෙන විට කීකරු ලෙස ප්‍රතිචාර දැක්වීමට අපගේ හිතාමතා නැඹුරුවාවක් පමණක් නොව අපගේ චිත්තවේගීය ප්‍රතිචාරයක් ලෙස කීකරුකම ඉගෙන ගැනීමට ඇති කැමැත්ත ද ඉල්ලා සිටී.

දෙවියන් වහන්සේ තම වචනයෙන් හෙළි කර ඇති දේවල සත්‍යය සහ විශ්වසනීයත්වය පිළිබඳ ඒත්තු ගැන්වීම අපගේ මනසෙහි කීකරුකමේ නැඹුරුතාවයක් ඇති කරයි. නමුත් දෙවියන්වහන්සේගේ වචනයෙන්, නිශ්ශබ්දතාවයෙන් සහ හුදකලාව තුළ දෙවියන්වහන්සේට සවන් දීමට ඉගෙන ගැනීම අපගේ හදවත් තුළ උන්වහන්සේට අවශ්‍ය කීකරු ප්‍රතිචාරය වැඩි කිරීමට ක්‍රියා කරයි.

අප අවට ලෝකය සහ අප තුළ ඇති මාංසය, සාතන් සහ ඔහුගේ ගෝලබාලයන් විසින් කලබලයට පත් කර, ස්වර්ගික පියා සමඟ ඇති සම්බන්ධතාවයේ අභිරහසට අපව නිදහස් කර නොගැනීමට කුමන්ත්‍රණය කරයි. නමුත් වසර දහස් ගණනක් පුරා පෙනෙන අවදානම ගැනීමට කැමති අයගේ ජීවිත තුළ, දෙවියන් වහන්සේ වෙනුවෙන් අපව අත්හැරීමට ආරාධනාව පවතී.

**එළිපත්ත 2: අපගේ කරුණාවේ කථා පැවසීම**

නව ගිවිසුමේ දෙවන එළිපත්ත අගය එපීස 3:1-11 හි දක්නට ලැබේ: අපගේ දෛනික ජීවිතයේදී අප අවට සිටින මිනිසුන්ට අපගේ කරුණාවන්ත කථා වාචිකව ප්‍රකාශ කිරීම. කාලය සහ සදාකාලිකත්වය සඳහා සභාවේ අරමුණ පිළිබඳ පැහැදිලි හා සරල ප්‍රකාශය අපට මෙහි දක්නට ලැබේ: මෙම කරුණාව ලබා දුන්නේ, ක්‍රිස්තුස්වහන්සේගේ සෙවිය නොහැකි ධනය අන්‍යජාතීන්ට දේශනා කිරීමටත්, අභිරහසෙහි සැලැස්ම කුමක්ද යන්න සෑම කෙනෙකුටම හෙළි කිරීමටත් ය. **"ක්‍රිස්තුස්වහන්සේගේ සොයා දැනගත නොහැකිවූ සම්පත ගැන අන්‍ය ජාතීන්ට දේශනා කරන්ටත් සියල්ලම මැවුවාවූ දෙවියන්වහන්සේ තුළ සියලු කාලවල පටන් සැඟවී තිබුණාවූ රහසේ නියමය කිමෙක්ද කියා සියල්ලන්ට පෙන්වන පිණිසත්ය."** ( එපීස. 3:8-10 ).

මේ කොටසේ වැදගත්කම අපි මේ පොතේ 2 වෙනි පරිච්ඡේදයෙන් දුටුවෙමු. එම සභාවේ පරමාර්ථය වන්නේ අප එදිනෙදා ජීවත් වන මිනිසුන්ට ශුභාරංචිය ප්‍රකාශ කිරීම වන අතර, සෑම ඇදහිලිවන්තයෙකුම මෙය කරන්නේ ඔහුගේ හෝ ඇයගේ අද්විතීය කරුණාවේ කතාව හෝ දෙවියන් වහන්සේ ඔහුගේ හෝ ඇයගේ ජීවිතය තුළ කර ඇති දේ පිළිබඳ පුද්ගලික සාක්ෂිය බෙදා ගනිමිනි.

පාවුල් විසින් ඉතා පැහැදිලිව විස්තර කරන ලද සභාවේ අරමුණ සදාකාලික ප්‍රේක්ෂකයින් සඳහා භූමික වේදිකාවේ වාදනය කරන්නේ නම්, එක් එක් පුද්ගලයාගේ සහභාගීත්වය සුළු කළ නොහැක. දෙවියන් වහන්සේගේ ආත්මයාණන් වහන්සේ අපව ගෙන යන ඕනෑම සහ සෑම සම්බන්ධතාවයකටම එක් එක් පුද්ගලයාගේ කරුණාවේ කතාව වර්ධනය වන ප්‍රකාශනය තුළ ප්‍රාදේශීය සභාවේ සඵලතාවයේ දෙවන මිනුමක් සොයාගත යුතුය. සභාවට යන බහුතරයක් දෙනා මෙම සීමාව තුළ වර්ධනය නොවන්නේ නම්, සභාව එහි කාර්යය කරන්නේ නැත.

**එළිපත්ත 3: අපගේ ආත්මික දීමනා ප්‍රගුණ කිරීම**

අධ්‍යාත්මික දීමනා ලබා දීමේදී දෙවියන් වහන්සේගේ ආත්මය පරමාධිපත්‍යය දරන්නේ නම්, එසේම මිනිසුන් මෙම දීමනා පිළිබඳ ඔවුන්ගේ අවබෝධය සහ භාවිතයේ තුළ වර්ධනය නොවන්නේ නම්, නැවත වරක් සභාව, දෙවියන් වහන්සේ විසින් ලබා දී ඇති කාර්යය ඉටු නොමැත. යේසුස්වහන්සේට කිරීමට අවශ්‍ය බොහෝ සේවාවලට දෙවියන්වහන්සේගේ සෙනඟ හරහා උපායමාර්ගික ප්‍රකාශනයක් ලබා දීමට ශුද්ධාත්මයාණන්වහන්සේ දීමනා භාවිතා කරනසේක. සභාවේ සහ ලෝකය තුළ ඔහුගේ හෝ ඇයගේ යෙදවීමේදී එක් පුද්ගලයෙකුගේ පවා පරිණතභාවය අහිමි වීම යනු දෙවියන් වහන්සේ තම ජනතාව සඳහා නිර්මාණය කර ඇති නිර්මාණශීලී ප්‍රතිභාවය හීනවී යෑමකි. මේ අනුව තුන්වන එළිපත්ත අගය වන්නේ අපගේ නිවෙස්වල සහ සේවා ස්ථානවල ආත්මීක දීමනා ජීවත් කරවීමයි.

එපමණක් නොව, මෙම දීමනා වඩාත් නිවැරදිව විස්තර කරන්නේ නම් ආත්මයාණන් වහන්සේ අප හරහා සුවිශේෂී ආකාරවලින් ක්‍රියා කරන බව යන්නෙන් ඇඟවෙන්නේ ඒවා අවදිව ඇති සෑම මොහොතකම ක්‍රියාත්මක වන බවය. මන්ද අප යේසුස් වහන්සේ තුළින් දෙවියන් වහන්සේ හා සම්බන්ධ වූ මොහොතේ අප ජීවමාන දෙවියන් වහන්සේගේ මාලිගාව වන බැවිනි. මෙම දීමනා ලබා දී ඇත්තේ සභාවේ *වැඩසටහන්* බලගැන්වීම සඳහා නොවන අතර, සභාව සඳහා දෙවියන් වහන්සේගේ *අරමුණ* බලගැන්වීමටය.

දෙවියන්වහන්සේගේ ප්‍රතිභාව පෙනෙන්නේ ආත්මයාණන් වහන්සේ එකිනෙකාට අද්විතීය ලෙස හා බලගතු ලෙස දීමනා දෙන අතරේ ක්‍රිස්තුස්වහන්සේගේ සෙනඟ ඔවුන්ගේ අසල්වැසි ප්‍රදේශවල සහ ලොව පුරා ඇති සෑම තලයන් වෙතටම දිනපතා බෙදාහරිනු ලැබීමේදීය. විශේෂිත ස්ථානයක් හෝ වෘත්තියක් වැදගත් නොවේ. දෙවියන් වහන්සේගේ ගැළවීම පිළිබඳ පොරොන්දුව උන් වහන්සේගේ සියලු ජනතාව තුළ ස්පන්දනය වන බැවින්, අප ජීවත් වන සහ වැඩ කරන සෑම ස්ථානයක්ම සාක්ෂිකරුවන් සඳහා ස්ථානයක් සහ ගැලවීමේ පොරොන්දුවේ එක් එක් පුද්ගලයාගේ අද්විතීය කොටස් ජීවත් වීමක් බවට පත් වේ. සෑම ඇදහිලිවන්තයෙකු

තුළින් සහ හරහා සේවය කරනු ලබන ආත්මයේ දීමනා ආත්මයාණන්වහන්සේ විසින් පාලනය කරනු ලැබේ.

සමහර කිතුනුවන්ට මෙය අමුතු දෙයක් විය හැකිය, නමුත් ඒ බොහෝ දෙනෙක් අපගේ ජීවිතයේ ආත්මයේ මෙම විශේෂිත ප්‍රකාශනය වැරදි ලෙස වටහාගෙන ඇති නිසා පමණි. එවැනි ඇදහිලිවන්තයන් අපව දෙවියන් වහන්සේගේ ස්වරූපයෙන් මවා ඇති ඇති බවත්, උන්වහන්සේගේ මැවිල්ල ගැන සැලකිලිමත් වීම සහ උන්වහන්සේ අපගේ අතට පත් කරන සියල්ල භාරකාරත්වය සඳහා උන්වහන්සේව නියෝජනය කිරීමට කැඳවනු ලබන බවටත් ඇති යථාර්ථය ගැන ඇති දේවධර්මයට සම්බන්ධය නැති කරගෙන ඇත. ඔවුන්ට සදාකාලිකත්වයට ඇති සම්බන්ධය නැති වී ඇති අතර, එමගින් දෙවියන් වහන්සේ නියෝජනය කිරීමේ වැදගත්කම, උන්වහන්සේගේ වත්කම් භාරගැනීම සහ උන්වහන්සේගේ මහිමය සහ උන්වහන්සේගේ පොරොන්දුව ඔවුන්ගේ ජීවිතයේ කේන්ද්‍රස්ථානය ලෙස පෙන්වීමේ වැදගත්කම ඔවුන්ට අහිමි වේ. මේ සියල්ල බොහෝ දුරට අනෙකුත් කිතුනුවන් සඳහා වන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය බලය ලෙස දීමනා පිළිබඳ සහාවේ අවබෝධය පහත දමා ඇත.

මෙය නිසා අපගේම ජීවිත සහ, වඩාත්ම වැදගත් ලෙස, දෙවියන් වහන්සේගේ සෙනඟ හරහා ප්‍රක්ෂේපණය කරන ලද දෙවියන් වහන්සේගේ ප්‍රතිරූපය පාඩු විඳී.

### ඵලිපත්ත 4: ආත්මයේ ඵල ප්‍රදර්ශනය කිරීම

හතරවන ඵලිපත්ත අගය වන්නේ අප එකිනෙකා හා ලෝකය තුළ ඇති සබඳතාවලදී ආත්මයේ ඵල ප්‍රදර්ශනය කිරීමයි. පාවුල් ගලාති 5:22-23 හි මෙම අන්තර් පුද්ගල ගුණාංග ලැයිස්තුගත කරයි: **"ආත්මයේ ඵල නම් ප්‍රේමය, ප්‍රීතිය, සමාදානය, ඉවසීම, කරුණාව, යහපත්කම, විශ්වාසවන්තකම, මෘදුකම, ආත්ම දමනය; මෙබඳු දේවලට විරුද්ධව ව්‍යවස්ථාවක් නැත."** මේවා ක්‍රිස්තුස් වහන්සේගේ සෙනඟ තුළ ආත්මයේ ජීවත්වීමේ ස්වභාවික ප්‍රතිඵල වන අතර පරිණතභාවයෙන් හා ප්‍රකාශනයේ අඛණ්ඩව වර්ධනය විය යුතුය.

ආත්මයේ ඵලයෙන් වැඩෙන්නාවූ පුද්ගලයන් ඔවුන්ගේ විවාහයන්, පවුල් සහ සහාවන් තුළින් යේසුස්වහන්සේ තම ජනතාව තුළ ජීවමානව සිටින බවට පෘථිවියේ බලවත්ම සාක්ෂිය ප්‍රකාශ කරති. මෙම සාමාන්‍යයෙන් අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රහේලිකාවක් වන අන්තර් පුද්ගල සබඳතාවන්හි ඔවුන්ගේ වර්ධනය වන ප්‍රකාශනයන් ඔවුන් තුළ ජීවත් වන්නාවූ අද්විතීය බලය පෙන්නුම් කරයි.

මෙම ඵලයේ ප්‍රකාශනය ක්‍රිස්තුස්වහන්සේගේ සෙනඟ තුළ ශරීරගත වී ඔවුන් අවට ලෝකය තුළ දැකිය හැකි වූ විට එයට බලගතු බලයක් ගැබ්වේ. යාකොබ්ගේ අදහස මෙයයි: **"අපගේ පියවූ දෙවියන් වහන්සේ ඉදිරියෙහි පිරිසිදුවූ නොකිළිටිවූ භක්තිය නම්, මව්පියන් නැති දරුවන්ද, වැන්දඹුවන්ද ඔවුන්ගේ විපත්තියේදී බලා ගැනීමත්, ලෝකයෙන් කිළිටි නොවන ලෙස තමාම ආරක්ෂා කර ගැනීමත්ය"** (යාකොබ් 1:27). ඉතිහාසය පුරාම සභාව, එය එහි ස්වාමියා මූර්තිමත් කළ විට, ලෝකයට ප්‍රහේලිකාවක් බවට පත් විය. ලෝකය අනාරක්ෂිත වූවන් කෙරෙහි සුළුතර අවධානයක් ලබා දෙයි, නමුත් සභාව සියළුම මිනිසුන් තම ලෝකයට ඇතුළත් කිරීමට ක්‍රම සොයා ගන්නා අතර ඇත්ත වශයෙන්ම සියළු මිනිසුන්ට සුවය ලබා දීමට උනන්දුවෙන් ක්‍රියා කරයි. මෙය ලෝකයේ එවැන්ජලිස්ත සේවය සඳහා වඩාත්ම බලගතු පදනමකි.

ක්‍රිස්තුස් වහන්සේගේ නැවත පැමිණීමට පෙර ලෝකයේ පද්ධතිමය ගැටලු අපට අවශ්‍යයෙන්ම සුව කළ හැකි බව ශුද්ධ ලියවිල්ලේ කොතැනකවත් මම නොදකිමි. නමුත් ඉතාම දරුණු මිනිස් පද්ධතීන් තුළ සිරවී සිටින පුද්ගලයන් ස්පර්ශ කිරීමට, සුවපත් කිරීමට සහ ගලවා ගැනීමට අප බැඳී සිටින බව පැහැදිලිය. සභාවේ බලය මෙයයි. ප්‍රාදේශීය සභාව අනාථ නිවාස, මත්ද්‍රව්‍ය පුනරුත්ථාපන මධ්‍යස්ථාන සහ පෝෂණ වැඩසටහන් පවත්වාගෙන යමින් මහා ආඥාව තම තමන් සිටින ස්ථානවල පවත්වාගෙන යාම පුදුමයක් නොවේ.

ප්‍රදේශයේ සභාවන් තම ජනයාගේ ආත්මික අන්තර් පුද්ගල වර්ධනයට සහ මැනීමට ප්‍රමුඛත්වය දිය යුතු අතර එසේ නොවූවහොත් ඔවුන් ස්වර්ගයේ කැඳවීමෙන් මඳක් පමණක් ජීවත් වන අතරේ තමන් ස්වර්ගයට බැඳී සිටින බව පවසමින් ඔවුන්ගේ මිනිසුන් ගොදුරු බවට පත් වනු ඇත විශේෂයෙන්ම එහි බහුතර ජනතාවක් සම්බන්ධ වන ඕනෑම ආකාරයක කුඩා කණ්ඩායම් සේවයක් තිබේ නම්, කැමැත්තෙන් සිටින ප්‍රාදේශීය සභාවකට මෙය කිරීම අපහසු නැත. එවැනි පුද්ගලයන් කේන්ද්‍ර කරගත් තත්වයක් තුළ සභාව තුළ සබඳතා තුළ ක්‍රියාත්මක වන ආත්මයේ ඵල දැකීමට අප අපේක්ෂා කළ යුතුය. සභාවන් අපගේ සහභාගීකම් පිහිටා ඇති නගරවල සහ අසල්වැසි ප්‍රදේශවල අවශ්‍යතා ද ඉටු කළ යුතු අතර ඔවුන්ගේ ජනතාව ඔවුන්ගේ ප්‍රදේශයේ සෑම උප කණ්ඩායමකටම සේවය කරනු දැකීමට අපේක්ෂා කළ යුතුය. මෙය සිදු නොවන විට, යමක් දැඩි ලෙස වරදට පත් වී ඇත.

### එළිපත්ත 5: අපගේ ජීවිත ගැන ගබඩාකාරී වීම

පස්වන එළිපත්තේ අගය වන්නේ පෘථිවියේ දෙවියන් වහන්සේගේ රාජ්‍යය ව්‍යාප්ත කිරීම සඳහා අපගේ ජීවිත, සබඳතා සහ වත්කම් භාර ගැනීමයි. පළමු එළිපත්ත මෙන්, මෙයට

සවිස්තරාත්මක පැහැදිලි කිරීමක් අවශ්‍ය වේ. මේ අනුව අපි එය 4 වන පරිච්ඡේදයෙන් ආමන්ත්‍රණය කරන්නෙමු.

# 4

# අපගේ ජීවිත ගැනවූ ගබඩාකාරීත්වය

අපි පළමු එළිපත් අගයන් හතර පරීක්ෂා කර ඇත්තෙමු: **දෙවියන් වහන්සේ සමඟ සමීප සබඳතාවයක් වර්ධනය කිරීම, අපගේ කරුණාවේ කථා පැවසීම, අපගේ ආත්මික දීමනා ප්‍රගුණ කිරීම සහ ආත්මයේ ඵල ප්‍රදර්ශනය කිරීම**. දැන් අපි පස්වන එක කෙරෙහි අවධානය යොමු කරමු: දෙවියන් වහන්සේගේ රාජ්‍යයේ ව්‍යාප්තිය සමඟ සම්පූර්ණයෙන්ම සහයෝගයෙන් කටයුතු කිරීම සඳහා **අපගේ ජීවිත ගැන ගබඩාකාරකම දැරීමය**. මුදල්, පිරිසිදුකම, විවාහය, පවුල, මිතුරන්, සභාවේ ශරීරය සහ වෙළඳපොළ වැනි ඔවුන්ගේ පෞද්ගලික තීරණ මත මිනිසුන්ගේ ඇදහිල්ලේ බලපෑම මැනිය හැකි අවසාන මාර්ගය මෙයයි. අපි මෙය ජීවිතයේ භාරකාරත්වය ලෙස හැඳින්විය හැකිය, මන්ද එය අපගේ කාලය, මුදල් සහ අපේක්ෂාවන් සමඟ අප කරන දේ ඇතුළත් වේ.

යේසුස්වහන්සේ මතෙව් 6:24 හි පවසන්නේ, **"දෙවියන් වහන්සේට සහ වස්තුවට සේවය කිරීමට නුඹලාට නුපුළුවන"** යනුවෙනි. යේසුස්වහන්සේ මුදල් ගැන සඳහන් කරන අතරම, උන්වහන්සේ ප්‍රකාශ කරන මූලධර්මය මුළු ජීවිතයටම අදාළ වේ: අපි මරණයෙන් ජීවනයට මාරු වූ පසු මරණය සහ යේසුස් සමඟ නැවත නැඟිටීම තුළින්, දෙවියන් වහන්සේ අප තුළ තැන්පත් කරන නව හදවත සැලසුම් කර ඇත්තේ දෙවියන් වහන්සේව කේන්ද්‍ර කර ගැනීමටය.

මුදල් හෝ වෙනත් වස්තුවක් පුද්ගලයෙකුගේ හදවතේ ආධිපත්‍යය සොයා ගන්නේ නම්, දෙවියන් වහන්සේ එම ජීවිතය තුළ නොමැත. එවිට මිනිස් කැදරකම් හැම දෙයක් තුළින්ම විකාශනය වනු ඇත. නැතහොත්, මතෙව් 6:23 හි යේසුස් වහන්සේ පවසන පරිදි, පුද්ගලයෙකුගේ **"මුළු ශරීරයම අන්ධකාරයෙන් පිරී යනු ඇත."** මිනිසුන් තම ආගමික හා මානුෂික ක්‍රියාවන්හිදී දේව විඥානය ලෙස පෙනී සිටියද, මුදල් ඔවුන්ගේ හදවත් පාලනය කරන්නේ නම්, ඔවුන් තුළ පරිවර්තනයක් සිදු නොවේ.

පරිවර්තනය වූ හදවත තුළ, දෙවියන් වහන්සේ නිර්මාණය කර ඇති ඉඩ එක් පදිංචිකරුවෙකු සඳහා පමණි: ඒ උන්වහන්සේමය! මෙම ඉරියව්වෙන් අපට පෘථිවියේ අපගේ ජීවිතයේ

භාරකාරත්වය තේරුම් ගැනීමට පටන් ගත හැකිය. මතෙව් 6:19-34 හි යේසුස්වහන්සේ අපට ලෞකික වස්තුවලට අපගේ චින්තනය ආධිපත්‍යය කිරීමට ඉඩ නොදීමට හේතු පහක් සපයයි.

**පළමුව,** ඒවා කුණු වී හෝ අතුරුදහන් වනු ඇත: **"පොළොවෙහිදී නුඹලාට වස්තු රැස් කර නොගනිල්ලා. එහිදී කාවෝද මලකඩද ඒවා නාස්ති කරති, සොරුද උමං කැන සොරා ගනිති"** (මතෙ. 6:19). නවතම මෝටර් රථ, ඇඳුම් පැළඳුම් සහ වෙනත් අයිත්තම් සියල්ල අභාවයට යනු ඇත. මම පසුගිය වසරවල පරිපූර්ණත්වයට නැඹුරු වුණෙමි. මා මිලදී ගත් දෙයක් පරණ වූ විට, සීරීම්වලට ලක් වූ විට හෝ භාවිත කළ බවට පෙනෙන පෙනුමක් ඇති වූ විට, මගේ කලකිරීම ඉහවහා ගිය බව මට තවමත් මතකය. වරක් මා අගය කළ දෙයක් සොරකම් කරන ලදී; අහිමි වීමේ හැඟීම ශක්තිමත් විය. යේසුස් වහන්සේ නිවැරදි බව අපි දනිමු, නමුත් සදාකාලිකව නොනැසී නොපවතින දේවල් අගය කිරීමට අප අවට සංස්කෘතියට බොහෝ සෙයින් බලපෑම් කර ඇති අතර සමහර අවස්ථාවලදී පොළඹවා ඇත.

**දෙවනුව,** යේසුස්වහන්සේ පවසන්නේ අප **". . . ස්වර්ගයේ වස්තු රැස්කරන්න"** කියාය (මතෙ. 6:20) අප ආදරය කරන දේවල් තැන්පත් කිරීමට වඩාත්ම විශ්වාසදායක ස්ථානය එය වේ. යේසුස්වහන්සේ යොමු කරන්නේ බාහිර දේවල්වලට වඩා වැඩි යමකි; අර්ථය, වැදගත්කම සහ ඉටුවීම වැනි අප අගය කරන අභ්‍යන්තර දේවල් ගැනද උන්වහන්සේ කතා කරයි.

**තෙවනුව,** අපගේ හදවත් ආධිපත්‍යය දරන දෙය අපව අයිති කර ගනී: **"ඔබේ වස්තුව කොතැනද, ඔබේ හදවතද එහි වේ"** (මතෙ. 6:21). බොහෝ දේවල් නරක නැත, නමුත් ඒවායින් අපගේ හදවත් සහ ක්‍රියාවන් කෙරෙහි ඇති කළ හැකි බලපෑම බරපතල ය. දෙවියන්වහන්සේගේ ප්‍රතිවිරෝධීව අපගේ සංස්කෘතියේ වටිනාකම් පිළිබඳ නිර්වචනය විසින් හදවත සහ ඇස අල්ලාගෙන ආධිපත්‍යය දරයි. සැබෑ වටිනාකම සහ සැබෑ ජීවිතය, ව්‍යාජ, මතුපිටින් පෙනෙන සහ භයානක ආකල්ප සහ ක්‍රියාවන් මගින් නැවත අර්ථකථනය වේ.

**හතරවනුව,** අපගේ හදවත් අවධානයෙන් තොර වූ විට, **"ඇස ශරීරයේ පහන"** (මතෙ. 6:22) නිසා අපගේ පෙනීමේ හැකියාව දුර්වල වේ. වලාකුළු පිරුණු හදවතට සැබෑ විවේකයක් සහ ආශීර්වාදයක් ගෙන ඒම ලෙස දෙවියන් වහන්සේ අදහස් කළ ආකාරයට දේපළ ගැනත් එසේ දැකීම අතිශය දුෂ්කර ය. එවැනි වලාකුළු සහිත හදවතක් අන්ධකාරය ඇති කරයි. අවම වශයෙන් පෙනෙන බහුලත්වය මධ්‍යයේ පවා එය අසතුට, සැකය සහ මානසික අවපීඩනය ඇති කිරීමට සමත් වනු ඇත.

**පස්වනුව,** අපට විරුද්ධ බලවේග දෙකකට සේවය කළ නොහැක: **"කිසිවෙකුට ස්වාමිවරුන් දෙදෙනෙකුට සේවය කළ නොහැක, මක්නිසාද ඔහු එක් කෙනෙකුට වෛර කර අනෙකාට ප්‍රේම කරනු ඇත, නැතහොත් ඔහු එක් කෙනෙකුට ඇලුම් වී අනෙකා හෙළා දකිනු ඇත" (මතෙ. 6:24).** දෙවියන්වහන්සේගේ නව මැවිල්ලට ඇත්තේ එකම නිවැසියෙකු පමණි: ඒ දෙවියන් වහන්සේමය. මුදා නොගත් මිනිසා මෙය සෘණාත්මක තේරීමක් ලෙස සලකයි, නමුත් දෙවියන් වහන්සේ එය අනතුරු ඇඟවීමක් ලෙස නොව පොරොන්දුවක් ලෙස ඉදිරිපත් කරයි.

**අවසාන වශයෙන්,** දෙවියන් වහන්සේගේ සැලැස්මට පක්ෂව අප අවට සංස්කෘතියේ ඉල්ලීම් ප්‍රතික්ෂේප කර අපගේ ධනය උන්වහන්සේගේ රැකවරණයෙහි තබන විට, අපි තවමත් කනස්සල්ලට පත් විය හැකිය. ස්තුතිවන්ත වෙන්න, දෙවියන් උදව් කරන බවට යේසුස් පොරොන්දු වන සේක: **"එහෙයින් 'කුමක් කමුද', 'කුමක් බොමුද', 'කුමක් අදිමුද' කියමින් කනස්සල්ලු නොවෙල්ලා. මක්නිසාද මේ සියල්ල අන්‍ය ජාතිහු සොයති." (මතෙව් 6:31-32).** උන් වහන්සේට කුරුල්ලන්ට ආහාර දීමට හැකි නම්, කෙතේ සුන්දරත්වය ගැන වගබලාගත හැකි නම්, අපේ අවශ්‍යතා ඉටු කිරීමටද හැකිය. අපට නොපෙනෙන නමුත් විශ්වාස කිරීමට කැඳවා ඇති දෙයට වඩා අපට දැකිය හැකි දේ අගය කළ හැකි බව කාංසාව හෙළි කරයි. මෙයින් අදහස් කරන්නේ අප පියාණන් ලෙස හඳුන්වන තැනැන්වහන්සේ සමඟ ප්‍රමාණවත් කාලයක් ගත කර නොමැති බවයි.

### දෙවියන් වහන්සේගේ රාජ්‍යය සොයන්න

අප කනස්සල්ලට පත් නොවිය යුතු බවට පැවසූ උන්වහන්සේගේ ඉගැන්වීමේදී යේසුස් වහන්සේ අපට ප්‍රතිකාරය ලබා දුන්සේක: **"නුමුත් පළමුකොට දෙවියන් වහන්සේගේ රාජ්‍යය සහ උන්වහෙන්සේගේ ධර්මිෂ්ඨකම සොයාපල්ලා, එවිට මේ සියල්ල නුඹලාට දෙනු ලැබේ" (මතෙ. 6:33).** එසේය, අපි මේ ලෝකයේ ජීවත් වන විට, අපට මුදල් සහ වෙනත් භෞතික දේවල් අවශ්‍ය වේ, නමුත් අපි දෙවියන් වහන්සේගේ රාජ්‍යය සහ උන්වහන්සේගේ ධර්මිෂ්ඨකම සොයන්නේ නම් අපට අපගේ මුදල් සහ දේපළ සාර්ථකව භාර ගත හැකිය. අපි මෙය කරන්නේ කෙසේද?

අපි අප අවට සංස්කෘතියට එරෙහි නිර්මාණාත්මක ප්‍රතිවිරෝධතාවක් තුළ ජීවත් විය යුතුය. මෙයින් අදහස් කරන්නේ අප සංස්කෘතිය තුළ සිටිය යුතු අතර ඒ අනුව අපගේ සංස්කෘතිය තුළ ධනාත්මක මෙවලම් ලෙස අප සිටින අතරේ සංස්කෘතියෙන් යේසුස්වහන්සේ තුළ අපගේ

ජීවිතයට බලපෑම් ඇති වන්නේ අවම ලෙසින් බවයි. මෙම සමතුලිතතාවය පවත්වා ගැනීම පහසු නැත.

ප්‍රේරිත පාවුල් මෙම ආතතිය තේරුම් ගත් අතර, දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ ආයෝජනය කරන අතරතුර අපට මේ ලෝකයේ ධනය හසුරුවන්නේ කෙසේද යන්න පිළිබඳව තිමෝතිට උපදෙස් දුන්නේය:

**"මේ ලෝකයේ ධනවතුන් උඩඟු සිත් ඇත්තන් නොවී, වස්තුවේ අස්ථිර කම මත නොව, සියල්ල භුක්ති විඳීන ලෙස අපට බහුල ලෙස සපයන්නාවූ දෙවියන් වහන්සේ කෙරෙහි බලාපොරොත්තුවෙන් සිටින්ටත්, යහපත කරන්ටත් උතුම් ක්‍රියාවලින් ධනවත් වෙන්ටත්, ත්‍යාගවන්තව, බෙදා දීමට ලැදිව සිටින්ටත්, සැබවින් ජීවනයවූ ඒ ජීවනය අල්ලා ගන්නා පිණිස මතු කාලයට යහපත් අත්තිවාරමක් තබා ගන්ටත් ආඥා කරපන්න" (1 තිමෝ. 6:17-19).**

පාවුල් මෙහි ධනයේ අන්තරායන් ප්‍රකාශ කරන්නේ එහි තිබෙන බොරුවේ ත්‍රිත්වයක් හෙළිදරව් කරමිනි. **"ධනයෙහි සැඟවුණු අන්තරායන් ගැන විමසිල්ලෙන් සිටින්න,"** ඔහු පවසන්නේය. **"ඒ වෙනුවට දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ ආයෝජනය කරන්න!"**

**ඔහු මුලින්ම** තිමෝතිට පවසන්නේ, **"උඩඟු නොවී සිටීමට ඔවුන්ට අණ කරන්න"** කියාය. සෑම ආකාරයකම වෙළඳ ප්‍රචාරණයක් හරහා මෙම ලෝක දැක්ම මහා පරිමාණයෙන් අලෙවි කිරීමත් සමඟ, බටහිර මිනිසුන් සම්පූර්ණයෙන්ම ඉල්ලුම් කරන පාරිභෝගිකයන් බවට පත්ව ඇත. මෙම මුළාව අපගේ අපේක්ෂාවන් සුසර කර ඇති අතර අපට ධනය ලැබිය යුතු බව පවසන බොරුවේ සියුම්කමට වෙතට අපේ අපේක්ෂාවන් දැඩි වී ඇත.

**දෙවනුව,** පාවුල් තිමෝතිට අනතුරු අඟවන්නේ ධනය පෙනෙන තරම් ස්ථිර නොවන හෙයින් ඇදහිලිවන්තයන් "ධනය පිළිබඳ අවිනිශ්චිතභාවය මත බලාපොරොත්තු තබා නොගත යුතු" බවයි. "තිස් අවුරුදු ණය", "ජීවිත කාලය වගකීම්" සහ "කල් පවතින සේ ගොඩනගා ඇත" යන සියල්ලම දෙවන බොරුවක් විශ්වාස කිරීමට මිනිසුන් පොළඹවා ගැනීමට අදහස් කරන සටන් පාඨ වේ. නමුත් කිසිවක් කල් පවතින ලෙස ගොඩනඟා නැත.

**අවසාන වශයෙන්,** ලෞකික ධනය සදාකාලික බලාපොරොත්තුව සඳහා ආදේශකයක් නොවන නිසා "දෙවියන් වහන්සේ කෙරෙහි" ඔවුන්ගේ බලාපොරොත්තු තැබීමට පාවුල් ඇදහිලිවන්තයන් දිරිමත් කරයි. මෙම බොරුවලින් වඩාත්ම හානිකර වන්නේ මනුෂ්‍ය ජීවිතයේ

ගැඹුරුම අවපාතය තුළ යම් දෙයකට සැබවින්ම දෙවියන්වහන්සේගේ ස්ථානය ගත හැකි බව ප්‍රකාශ කිරීමය.

මෙම ලෝක දර්ශනයේ ඇදීමට එරෙහිව අපට සටන් කළ හැක්කේ කෙසේද? පාවුල් තිමෝතිට පිළිතුරක් ලබා දෙයි: අපි දෙවියන් වහන්සේගේ දීමනා වැලඳගෙන ඒවා භුක්ති විඳිය යුතුය, මන්ද "අපට භුක්ති විඳීමට සියල්ල බහුල ලෙස සපයන දෙවියන් වහන්සේය."

නමුත් අපගේ වැටුණු සංස්කෘතියේ අදහස් මත පදනම්ව එම පොරොන්දුව වැරදි ලෙස භාවිතා නොකිරීමට, පාවුල් එකතු කරන්නේ ඒවා "යහපත් කිරීමට" යොදා ගැනීමෙන් අප ඒවා භුක්ති විඳිය යුතු බවයි. යහපත් ක්‍රියාවක් යනු කුමක්ද? පාවුල් 1 තිමෝති 5:10 හි විශිෂ්ට නිර්වචනයක් ලබා දෙයි: **"දරුවන්ට, ආගන්තුකයන්ට, වෙහෙසට පත් වූ ක්‍රිස්තියානීන්ට, රිදුණු අයට සහ කරදරයට පත් වූවන්ට උපකාර කිරීමෙන් කීර්තියක් ලද"**...මෙම ක්‍රියාවන් එතරම් වැදගත් වන්නේ ඇයි? මක්නිසාද යත්, මතෙව් 5:16 හි යේසුස්වහන්සේ ප්‍රකාශ කළ පරිදි, ඔවුන් ප්‍රබල නිරීක්ෂණය කළ හැකි ඇදහිල්ලක් නිර්මාණය කරයි, එමඟින් මිනිසුන්ට ශුභාරංචිය දැකීමට සහ තේරුම් ගැනීමට හැකි වේ:

දැන් මම ඔබව කඳු මුදුනක, ප්‍රදීපාගාරයක් ලෙස තබා ඇත්තෙමි - බැබළෙන්න! නිවස විවෘතව තබමින් ත්‍යාගශීලී වන්න. අන් අයට විවෘත කිරීමෙන්, ස්වර්ගයේ සිටින මෙම ත්‍යාගශීලී පියා වන දෙවියන් වහන්සේ සමඟ විවෘත වීමට ඔබ මිනිසුන්ව පොළඹවනු ඇත.

පාවුල් තිමෝතිට පවසන්නේ යහපත කිරීමට මාර්ග තුනක් ඇති බවයි.

**පළමුව,** අප "යහපත් ක්‍රියාවලින් පොහොසත්" විය යුතුය - වෙනත් වචනවලින් කිවහොත්, අපගේ වත්කම් අන් අයගේ ප්‍රයෝජනයට පරිවර්තනය කළ යුතුය. අප සතු සියල්ල අන් අයගේ යහපත සඳහා යෙදවිය යුතුය. **දෙවනුව,** අප අපගේ වත්කම් දෙවියන් වහන්සේගේ රාජ්‍යයට ආයෝජනය කළ යුත්තේ යම් ප්‍රමාණයක් ලබා දීමෙනි - අපි "ත්‍යාගශීලී" විය යුතුය. ක්‍රියා 20:35 හි පැහැදිලිව පවසන පරිදි පාවුල්ට තවමත් යේසුස්ගේ වචන ඇසීමට හැකිය: "මේ ආකාරයෙන් වෙහෙස මහන්සි වී වැඩ කිරීමෙන් අපි දුර්වලයන්ට උපකාර කළ යුතු අතර, යේසුස් ස්වාමීන්වහන්සේම පැවසූ ආකාරයට, 'ලැබීමට වඩා දීමෙන් ආශීර්වාද ලැබේ.'"

**අවසාන වශයෙන්,** අපගේ වත්කම් සමඟ "යහපත්කම්" කිරීමේ දුෂ්කරම ක්‍රමය ඒවා බෙදා ගැනීමයි. අප තවමත් යම් භාණ්ඩයක් සම්බන්ධයෙන් ක්‍රියාශීලී භාරකාරත්වයක් දරන අතරම, එම පුද්ගලයා එය ඇත්ත වශයෙන්ම භාවිතා කරන ආකාරය පිළිබඳව කිසිදු පාලනයක්

පවත්වා නොගෙන, වෙනත් කෙනෙකු එය භුක්ති විඳිනු දැකීමෙන් අප ප්‍රීතිමත් ආකල්පයක් වර්ධනය කරගත යුතුය. ඔහු හෝ ඇය එය අපිරිසිදු කිරීමට, සීරීමට හෝ කඩා දැමීමට පවා හැකිය.

පාවුල් තිමෝතිට කළ අභියෝගය නිගමන දෙකකින් අවසන් කරයි. අපි අපගේ සැබෑ නිවසෙහි අපගේ ධනය ආයෝජනය කළ යුතු අතර, **"මෙසේ [අපට] අනාගතය සඳහා හොඳ අත්තිවාරමක් ලෙස නිධානයක් රැස්කරගනිමු" (1 තිමෝ. 6:19).** තවද අපි සැබෑ ජීවිතය සඳහා ආයෝජනය කළ යුතු වන්නේ **"[අපි] සැබෑ ජීවිතය වන දේ අල්ලා ගන්නා පිණිස" (1 තිමෝ. 6:19).** ක්‍රිස්තුස් වහන්සේගේ සෙනඟගේ බලය ලොවට වැඩියෙන්ම දැනෙන්නේ ක්‍රිස්තුස්වහන්සේගේ ජනතාව තුළ දේව රාජ්‍යයේ ආයෝජනය කිරීමේ මෙම ආකල්පය දකින්නට ලැබෙන විටය. විශේෂයෙන් අද දින තමන් සතු දේ තුළ අවසාන වැදගත්කම සොයාගත හැකි බව අලෙවි කරන සංස්කෘතියක් තුළ අප ජීවත් වන්නේ කෙසේද යන්න දෙවියන් වහන්සේගේ ආත්මයේ බලවත් මිදීමේ මෙවලමක් වනු ඇත.

**දෙවියන් වහන්සේගේ ධර්මිෂ්ඨකම සොයන්න**

අපි දෙවියන් වහන්සේ සමඟ සම්බන්ධකම තුළට පැමිණි විට, ශුද්ධාත්මයාණන් වහන්සේගේ පදිංචිය තුළින් උන් වහන්සේ අප තුළ තැන්පත් කරන නව ජීවිතයකට අපි නැවත ඉපදෙමු. මෙම නව ජීවිතය තුළින් අපට ලෝකයේ අප සඳහා දෙවියන් වහන්සේගේ අරමුණ සමඟ එකඟව ජීවත් විය හැකිය: ඒ උන්වහන්සේගේ රාජ්‍යය පමණක් නොව උන්වහන්සේගේ ධර්මිෂ්ඨකම ද සොයමින්ය. දෙවියන්වහන්සේගේ රාජ්‍යය සහ උන්වහන්සේගේ ධර්මිෂ්ඨකම නව ගිවිසුමේ වෙන් කළ නොහැකි ලෙස බැඳී ඇත.

යේසුස්වහන්සේ මතෙව් 6:1 හි සැබෑ ධර්මිෂ්ඨකම විස්තර කරයි: **"අන් අයට පෙනෙන පිණිස ඔවුන් ඉදිරියෙහි ඔබේ ධර්මිෂ්ඨකමේ හැසිරීමෙන් පරෙස්සම් වන්න."** අප කරන්නේ දෙවියන් වහන්සේගේ ඇස් සඳහා පමණක් කළ යුතු දෙයකි. වෙනත් ඕනෑම දෙයක් ප්‍රතිනිර්මාණය නොවූ හදවතකින් පැමිණෙන අතර එහි එකම විපාකය ලැබෙන්නේ අන් අය විසින් නිරීක්ෂණය කරනු ලැබීමෙනි. මෙම සැබෑ ධර්මිෂ්ඨකම මගින් අපගේ අධ්‍යාත්මික ජීවිතය විවිධ ආකාරවලින් අප විසින් මෙහෙයවන ආකාරය පාලනය කරයි.

**පළමුව,** අපි දෙන විට (මතෙ. 6:2-4 බලන්න), දෙවියන් වහන්සේ අපට පවසන තරමට සහ උන්වහන්සේ අපට පවසන ඕනෑම කෙනෙකුට අප දිය යුතුය. දෙවියන් වහන්සේ අන් අයගේ අවශ්‍යතා දන්නා අතර අද, හෙට සහ ඉන් පසු සෑම දිනකම අපට අවශ්‍ය දේ ද උන්වහන්සේ

දන්නා සේක. අප උන්වහන්සේ සමඟ නිරන්තර සම්බන්ධකම් පවත්වන්නේ නම්, උන්වහන්සේ අපට ලබා දී ඇති වත්කම්වලට කීකරු වීමට කැමති නම්, ඒවා ආයෝජනය කිරීමට සහ බෙදා හැරීමේදී උන්වහන්සේ විශ්වාසවන්තව අපව මෙහෙයවනු ඇත. ඇත්ත වශයෙන්ම, ශුද්ධාත්මයාණන්ගේ මඟ පෙන්වීම යටතේ දීම කොතරම් ස්වභාවිකද යත්, අපගේ දකුණු අත කර ඇති දේ අපගේ වම් අත නොදැනිය යුතුය. එය වෙනත් ආකාරයකින් කිවහොත්, දීම අපගේ ජීවිතයේ නිතැතින්ම යථාර්ථයක් වනු ඇත.

**දෙවනුව,** අප යාච්ඤා කරන විට (මතෙ. 6:5-15 බලන්න), අප කතා කළ යුත්තේ අප ඇත්ත වශයෙන්ම දෙවියන් වහන්සේ සමඟ කතා කිරීමටය. එසේ කරන්නේ, යාච්ඤාව නරඹන මහජනතාවගේ ප්‍රයෝජනය සඳහා පමණක් වන විට, එය කුහකකමකි. අව්‍යාජ යාච්ඤාව ඇතුල් කාමරයේ කිරීම ප්‍රමාණවත් බව හඟවා ඇත. සැබෑ යාච්ඤාව ආරම්භ වන්නේ දෙවියන් වහන්සේ අපගේ අවශ්‍යතා කල් ඇතුවම දැන සිටියද, දෙවියන් වහන්සේ අපට සවන් දෙන බව දැන සිටීමෙනි.

යාච්ඤාව සම්බන්ධයෙන් යේසුස්වහන්සේගේ ආදර්ශය අපට උගන්වන්නේ

• <u>දෙවියන්වහන්සේගේ පරමාධිපත්‍යය පිළිගැනීමට.</u>

<u>• උන්වහන්සේගේ නාමය වෙන් කිරීමෙන් උන්වහන්සේගේ පරමාධිපත්‍යයට යටත් වෙන්න.</u>

<u>• උන්වහන්සේගේ රාජ්‍යයට ප්‍රිය කරන්න.</u>

<u>• උන්වහන්සේගේ කැමැත්තට කැමති වන්න.</u>

<u>• උන්වහන්සේගේ දෛනික සැපයුම සඳහා අපගේ අවශ්‍යතාවය පිළිගන්න.</u>

<u>• දෛනික ක්‍රියාවක් ලෙස සමාව ලබාගැනීම.</u>

<u>• දෛනික ක්‍රියාවක් ලෙස සමාව දෙන්න.</u>

<u>• පරීක්ෂාවෙන් ආරක්ෂාව සොයන්න.</u>

<u>• දුෂ්ටයාගෙන් ආරක්ෂාව පතන්න.</u>

සමාව දීම, එය ජීවන මාර්ගයක් ලෙස අවශ්‍ය වන හෙයින්, එහි වැදගත්කම යේසුස්වහන්සේ අවධාරණය කරන්නේ එය දෙවරක් කීමෙන්ය. එය අපගේ ස්වර්ගික පියාණන්ගේ හදවත පිළිබිඹු කරන නිසා එය ප්‍රධාන තැනක් ගන්නේය.

තෙවනුව, අපි නිරාහාරව සිටින විට (මතෙ. 6:16-18 බලන්න), අපි නිරාහාරව නොසිටින්නාක් මෙන් එය කළ යුතුයි. කුහකයින් දැකීමට ප්‍රියව උපවාස කරති. අනෙක් අතට, සැබෑ නිරාහාරයේදී මුහුණේ පෙනුම නිරෝගීව තබා ගැනීම ගැන සඳහන් කර ඇත. එය මගින් ස්වර්ගික පියාණන් කෙරෙහි අවධානය යොමු කරන අතර, අනෙක් අතට, ස්වර්ගික පියා විසින් විපාක දෙනු ලැබේ.

**අවසාන වශයෙන්,** අපි දෙවියන් වහන්සේට අන් අයගේ විනිශ්චයකරු වීමට ඉඩ දිය යුතුය (මතෙ. 7:1-6 බලන්න). අපි විනිශ්චයකරුවන් ලෙස අපව පිහිටුවා ගත්තොත්, දෙවියන් වහන්සේ අපව මනිනු ලබන්නේ අපගේම ප්‍රමිතිවලට අනුවය. තවත් කෙනෙකුට උපකාර කිරීමට පෙර අපට පැහැදිලිව දැකීමට හැකි විය යුතුය. අපි දෙවියන් වහන්සේගේ දැකීමඉ සඳහා පමණක් අපගේ යහපත් ක්‍රියා කරන විට, අපි උන්වහන්සේගේ ධර්මිෂ්ඨකම සොයන්නෙමු.

### දෙවියන් වහන්සේගේ ධර්මිෂ්ඨකම අපගේ ප්‍රමිතියයි

අපට ගැටලුවක් ඇති බව වටහා ගැනීමට කන්ද උඩ දේශනාවේ ජේසුස් වහන්සේගේ වදන් වැඩිපුර කියවීමට අවශ්‍ය නොවේ: යේසුස් වහන්සේගේ වචන තුළ මෙලොව අපගේ ජීවිත භාර ගැනීම සඳහා සැලකිය යුතු සදාචාරාත්මක ඇඟවුම් ඇති අතර, ඒවා ඉතා දැඩි ව පෙනෙන හෙයින් ඒවා තුළ ජීවත් වීම අපට කළ නොහැකි දෙයක් බවට හැඟේ. යේසුස් වහන්සේ අතිශයෝක්තියක් භාවිතා කරමින් සිටියා විය යුතුය, නැතහොත් උන්වහන්සේ සැබවින්ම අදහස් කළේ අප මුලින්ම උන්වහන්සේගේ රාජ්‍යය සහ උන්වහන්සේගේ ධර්මිෂ්ඨකම සෙවිය යුතු බවයි. යේසුස්වහන්සේගේ වදන්වලට අනුව ජීවත් වීමේ දුෂ්කරතාව මතෙව් 5:19-20 හි දැකිය හැකිය:

**"එබැවින් මෙම ආඥාවලින් ඉතා සුළු එකක් හෝ කඩ කරන්නාවූ කඩ කරන ලෙස මනුෂ්‍යයන්ට උගන්වන්නාවූ කවරෙක් නමුත්  ස්වර්ග රාජ්‍යයේ ඉතා සුළුයැයි කියනු ලබන්නේය. නමුත් ඒවා පවත්වන්නාවූ උගන්වන්නාවූ ස්කවරෙක් නමුත් ස්වර්ග රාජ්‍යයේ ශ්‍රේෂ්ඨයන්යැයි කියනු ලබන්නේය. මක්නිසාද නුඹලාගේ ධර්මිෂ්ඨකම ලියන්නන්ගේ සහ ඵරිසිවරුන්ගේ ධර්මිෂ්ඨකමට වැඩි නොවී නම්, නුඹලා කිසිසේත් ස්වර්ග රාජ්‍යයට ඇතුල් නොවන්නහුය."** යැයි කීසේක.

නමුත් අපිට ඉටු කිරීමය නොහැකි අණක් දීම යේසුස්වහන්සේගේ අරමුණ විය. හේතුව, උන්වහන්සේට අවශ්‍ය වූයේ, දෙවියන් වහන්සේ ආදම් සහ ඒව සහ ඔවුන්ගේ සියලු දරුවන්

සඳහා නිර්මාණය කර ඇති ජීවිතය ගත කිරීමට මනුෂ්‍යයන්ගේ ආගමික උත්සාහය ප්‍රමාණවත් නොවන බව පැහැදිලි කිරීම පිණිසය. කන්ද උඩ දේශනාව කියවීමට අවශ්‍ය වන්නේ පාපයෙන් දූෂිත වී ඇති මෙම වර්තමාන ජීවිතය ගැන විස්තරයක් ලෙස නොව - නමුත් දෙවියන් වහන්සේ ආරම්භයේ දීම එය සම්පූර්ණයෙන්ම යථා තත්ත්වයට පත් කරනු පිණිස කළ සැලසුමක් ලෙසය.

මතෙව් 5:48 ඉහත යේසුස්වහන්සේගේ වචනවල ඇති අභියෝගයට පිළිතුර සපයයි. මෙම පදයෙන් යේසුස්වහන්සේ කන්ද උඩ දේශනාවට අනුව අපගේ ජීවිත භාර ගැනීමේ යතුර අපට ලබා දුන් සේක: **"එබැවින් ඔබගේ ස්වර්ගික පියා සර්ව සම්පූර්ණ බැවින් ඔබද පරිපූර්ණ විය යුතුය."** බොහෝ අය මෙම වචන අභියෝගයක් ලෙස හෝ, වඩාත් නරක ලෙස, තර්ජනයක් ලෙස දකිනු ඇත. කෙසේ වෙතත්, දෙවියන් වහන්සේ නිර්මාණය කර ඇති පරිදි ජීවිතය ගත කිරීමට ඒවා යතුරු වේ.

අපගේ පියාණන්ට සමාන වන්න යන ආඥාවෙන් අඟවන්නේ අප අපගේ පියාණන්ගෙන් වූ යමක් අප තුළ අප දරා සිටින බවයි. යේසුස් වහන්සේ තුළ ගැළවීමට පෙර, අප දරා සිටියේ අපගේ භූමික පියා වන ආදම්ගේ ස්වභාවය පමණි. එම ස්වභාවය, දෙවියන් වහන්සේගේ ස්වරූපයෙන් වුවද, පාපයෙන් විකෘති වී දූෂිත වූ අතර, ඒ අනුව, දෙවියන් වහන්සේ එය සැලසුම් කළ ආකාරයට එය නොවීය. එහෙත් අප යේසුස් වහන්සේගේ මරණය, භූමදානය සහ නැවත නැඟිටීම සමඟින් නැවත ඉපදුනු විට, අපගේ පැවැත්මේ වඩාත්ම කේන්ද්‍රීය කොටසෙහි අපට නව බීජයක් ඇත - අපගේ ස්වර්ගීය පියාණන්ගේ වංශය - සහ යොහන් 1 යොහන් 3: 9 හි අපට පවසන්නේ **“දෙවියන් වහන්සේගෙන් උපත ලැබ සිටින කිසිවෙකු පව් නොකරයි. මක්නිසාද ඔහු තුළ උන්වහන්සේගේ බීජය පවතින්නේය. දෙවියන් වහන්සේගෙන් ඉපදී සිටින බැවින් පව් කරන්ට ඔහුට නුපුළුවන.”**

මතෙව් 6 සහ 7 හි පළමු කොටසේදී, යේසුස් වහන්සේ දෙවියන් වහන්සේ සමඟ අපගේ නව ජීවිතය විස්තර කළ ආකාරය අපි දුටුවෙමු: දීම, යාච්ඤා කිරීම, නිරාහාරව සිටීම සහ නිවැරදිව විනිශ්චය කිරීම. දැන් මතෙව් 5:1-48 හි අපට පෙනෙන්නේ මේ ජීවිතය, ආරම්භයේ දී එය ජීවත් වීමට දෙවියන් වහන්සේ අපව නිර්මාණය කළ ලෙසත්, දැන් අප තුළ ජීවත් වන ශුද්ධාත්මයාණන් සමඟ සහයෝගයෙන් ගෙවන ජීවිතය ලෙසත්, මිනිස් ඉතිහාසය අවසන් වූ විට හෝ මේ පෘථිවියේ අවසාන විනිශ්චය පවතින විට ඇති ජීවිතය ලෙසත් ය. මෙම ඡේදය දෙවියන් වහන්සේගේ රාජ්‍යය ඉදිරියට ගෙන යාම සඳහා අපගේ ජීවිත භාරකාරත්වය පිළිබඳ

පරිපූර්ණ චිත්‍රයක් පින්තාරු කරයි - මෙම පස්වන එළිපත් අගය සභාව දෙවියන් වහන්සේගේ අරමුණට අනුව ජීවත් වන්නේද යන්න මැන බලයි.

අපි ආරම්භ කරන මතෙව් 5:1-12, මෙම ජීවිතය සැබවින්ම අප අවට ඇති සම්මතයට වඩා වෙනස් බව අපට පෙනේ. දෙවියන් වහන්සේගේ සෙනඟ අන් අයගේ චින්තන ක්‍රියාවලීන්ට වඩා වෙනස් චින්තන ක්‍රියාවලීන් මගින් සංලක්ෂිත වේ:

• ඔවුන් ඔවුන්ගේ අවශ්‍යතා හඳුනා ගනී (ආත්මයෙන් නිහතමානීය).

• ඔවුන් ඔවුන්ගේ "අහිමිකම" ගැන වැලපෙයි.

• ඔවුන් දෙවියන් වහන්සේ ඉදිරියෙහි නිහඬය (යටහත්ය).

• ඔවුන් සම්පූර්ණ වීමට (ධර්මිෂ්ඨකම සඳහා) කුසගින්නේ සිටිති.

• ඔවුන් දයාව ලබා දෙයි.

• ඔවුන් පිරිසිදු චේතනාවන් ඇත (සිතෙන් පිරිසිදුයි).

• ඔවුන් සාමය පුවර්ධනය කරයි (සාම ඇති කරන්නන් වේ).

• ඔවුන් පරිපූර්ණ (ධර්මිෂ්ඨකම නිසා පීඩා විඳිති) වීම නිසා හිරිහැර විඳිති.

• යේසුස් වහන්සේට ඔවුන් දක්වන පක්ෂපාතිත්වය නිසා ඔවුන් ප්‍රතික්ෂේප කරනු ලැබේ (පීඩා සහ තමන් ගැන නරක ලෙස කතා කරනු ලැබීම).

කෙසේ වෙතත්, ඔවුන්ගේ විපාක බොහෝ ය:

• ඔවුන්ට දෙවියන් වහන්සේගේ රාජ්‍යය ලැබේ.

• ඔවුන්ගේ අහිමි භාවයෙන් ඔවුන් සැනසේ.

• ඔවුන්ට ලෝකය ලබා දී ඇත.

• ඔවුන් පූර්ණත්වයෙන් පිරී ඇත.

• ඔවුන්ට දයාව ලැබේ.

• ඔවුහු දෙවියන්වහනසේව දකී.

• <u>ඔවුන් දෙවියන්ගේ දරුවන් ලෙස හැඳින්වේ.</u>

• <u>ඔවුන් අනාගතවක්තෘවරුන් දෙස බලන විට සහ ඔවුන්ගේ සමානකම් දකින විට ඔවුන්ගේ ඇදහිල්ල තහවුරු වේ.</u>

මතෙව් 5:13-20 හි යේසුස් වහන්සේ මෙම ජීවන රටාව අවට ලෝකයට ඇති බලපෑම විස්තර කරයි. දෙවියන්වහන්සේගේ සෙනඟ අවට ලෝකය තුළ ශුභාරංචිය ප්‍රකාශ කිරීමට මේ ආකාරයෙන් අත්‍යවශ්‍ය වේ.

ලුණු ලෙස, ඔවුන් පෘථිවියට විනිවිද යන අතර, මිනිස් වර්ගයා තුළ තවමත් දෙවියන් වහන්සේගේ සමානත්වයේ කුමන මට්ටමක් ඉතිරිව ඇතිද ඔවුන් එය ආරක්ෂා කරයි. මෙය කොතරම් වැදගත්ද යන්න ඔවුන් වටහාගෙන ඔවුන්ගේ ලුණු ගතිය ආරක්ෂා කර ගැනීමට වෙහෙස මහන්සි වී වැඩ කළ යුතුය. එසේ නොවුවහොත්, ලුණු කිසිවක් සඳහා හොඳ නොවන අතර එය බලපෑම් කිරීමට අදහස් කළ ලෝකය විසින් එය නොසලකා හරිනු ලැබේ.

ඔවුන් කන්දක් උඩ නගරයකින් එන ආලෝකය මෙන් දීප්තිමත්ය. එවැනි ආලෝකය දුර සිට සංචාරකයින්ට පැහැදිලිව දැකගත හැකිය. ඔවුන්ගේ ආලෝකය සැඟවීමට නොව සෑම කෙනෙකුටම ආලෝකය ලබා දෙමින් ස්ථාවර ආලෝකයක් ලෙස ප්‍රදර්ශනය කෙරේ. **"ඔබේ ආලෝකය බබළවන්න" (මතෙව් 5:16)** යනුවෙන් යේසුස් වහන්සේ අපව දිරිමත් කරයි. අනිත් අය පියාණන්ව දකිනද එසේය. අපි එළිදරව්ව, ඒත්තු ගැන්වීම සහ බලාපොරොත්තුව ලෝකයට බබළවන්නෙමු. අපගේ ආලෝකයේ නිරීක්ෂණ හැකියාව ආරක්ෂා කර ගැනීමට අප සුපරීක්ෂාකාරී විය යුතුය.

දෙවියන්වහන්සේගේ සෙනඟද රාජ්‍යයේ සත්‍යයේ ජීවත් වෙති. යේසුස්වහන්සේ පැමිණියේ දෙවියන්වහන්සේගේ ධර්මිෂ්ඨ සැලැස්ම ඉවතලෑමට නොවේ; උන්වහන්සේ පැමිණියේ එය ඉටු කිරීමටයි. උන්වහන්සේ අපට පැහැදිලිව පවසන්නේ, “ව්‍යවස්ථාව හෝ අනාගතවාක්‍යය හෝ අවලංගු කරන පිණිස මා ආවෙමියැයි නොසිතල්ලා. මම ආවේ ඒවා සම්පූර්ණ කිරීමට මිස ඒවා අවලංගු කිරීමට නොවේ” (මතෙ. 5:17). මෙම ප්‍රදානයෙන් ඉවත් වීමට උත්සාහ කරන අය ප්‍රතික්ෂේප කරනු ලැබේ; ඒවා ඉටුකරන්නෝ ශ්‍රේෂ්ඨයෝය. ඕනෑම පරම්පරාවක නාමික ආගම්වාදීන්ට එරෙහිව, මෙම නිගමනය බලගතු ය: අපගේ ධර්මිෂ්ඨකම ඵරිසිවරුන් සහ නීති ගුරුවරුන් ඉක්මවා නොයන්නේ නම්, අපි ස්වර්ග රාජ්‍යයට ඇතුළු නොවන්නෙමු.

මතෙව් 5:21-47 හි, යේසුස් වහන්සේ මිනිසා සහ ස්ත්‍රිය මැවීමේදී දෙවියන්වහන්සේගේ සැලසුම විස්තර කරයි. පළමුව, 21-26 පදවල, උන්වහන්සේ ඔවුන්ගේ පෞද්ගලික සබඳතා

ගැන කතා කරන්නේ කෙනෙකුගේ සහෝදරයා කෙරෙහි කෝපය සහ වෛරය මිනීමැරීමක් තරම් නරක බව පවත්වාගෙන යමිනි. මිනිස් සබඳතාවල නරකම සැලකීම ලෙස ලෝකය මිනීමැරුම් දකින නමුත් අන්තර් පුද්ගල සම්බන්ධතා සඳහා දෙවියන් වහන්සේගේ කැඳවීම අපව නව තලයකට ගෙන යයි. නින්දාව, නොසලකා හැරීම සහ කෝපයද විනිශ්චයට යටත් වේ. ආගමික වතාවත් සිදු කිරීමට පෙර අප සමඟ වරදක් ඇති ඕනෑම අයෙකු සමඟ සමාදාන වීමට අප සැලකිලිමත් වීම ඉතා වැදගත් වේ.

27-30 පදවල, යේසුස් වහන්සේ ස්ත්‍රී පුරුෂ සම්බන්ධතා දෙවියන් වහන්සේ අදහස් කළ ආකාරයට විස්තර කරන අතර, රාගයෙන් යුත් බැල්මක් කාමමිථ්‍යාචාරයට සමාන වන බව අවිවාදයෙන්ම ප්‍රකාශ කළ සේක. ලෝකයා සිතන්නේ කාමමිථ්‍යාචාරය යනු විවාහයක නරකම පාවාදීම බවයි, නමුත් ස්ත්‍රී පුරුෂ සම්බන්ධතා සඳහා දෙවියන්වහන්සේගේ කැඳවීම නැවතත්, අපට වඩාත් උසස් ප්‍රමිතියකට අභියෝග කරයි. තවත් පුද්ගලයෙකු කෙරෙහි ඇති තෘෂ්ණාව මනුෂ්‍ය වර්ගයා සඳහා දෙවියන්වහන්සේගේ සැලසුමට පටහැනි වේ. ඒ නිසා අපි අපේ ඇස පාලනය කළ යුතුයි හෝ එය ඉවත් කළ යුතුයි; අපි අපේ දෑත් පාලනය කළ යුතුය, නැතහොත් ඒවා ඉවත් කළ යුතුයි. පැහැදිලිවම, ඇස හෝ අත ඉවත් කිරීම විසඳුම නම්, ඇස් දෙකම සහ අත් දෙකම ඉවත් කිරීමට යේසුස්වහන්සේ ඉල්ලා සිටිනු ඇත. නමුත් දෙවියන් වහන්සේ පිරිමින් සහ කාන්තාවන් අතර සබඳතා ඇති කළ ආකාරය පිළිබඳ අතිශය වැදගත්කම උන්වහන්සේගේ උපමාව අවධාරණය කරයි. ඔවුන් විවාහ සබඳතාවයකට එළඹෙන තුරු ලිංගික ප්‍රකාශනයේ ඉඟියක් නොමැතිව, මනසින් සහ ක්‍රියාවෙන් පිරිසිදු භාවයෙන් සංලක්ෂිත විය යුතුය.

31-32 වාක්‍යවල යේසුස් වහන්සේ විවාහය සම්බන්ධයෙන් ස්ත්‍රී පුරුෂ සබඳතා ගැන වඩාත් නිශ්චිතව කථා කරන අතර, **"වෛශ්‍යාකම හැර වෙන කාරණයකට තම බිරිඳ අත හරින කවරෙකු නමුත්, ඇය කාමමිත්‍යාචාරයට පමුණුවන්නේය. යමෙක් අත් හරිනු ලැබූ ඇය විවාහ කර ගන්නේ නම්, ඔහුත් කාමමිථ්‍යාචාරය කරන්නේය."**

දික්කසාදය උන්වහන්සේගේ සැලසුම පාවා දෙන බව දෙවියන් වහන්සේ ශුද්ධ ලියවිල්ලේ නැවත නැවතත් ප්‍රකාශ කරයි. උන්වහන්සේ උත්පත්ති 2:18-24 හි එම නිර්මාණයේ අලංකාරය විස්තර කරයි: යෙහෝවා දෙවියන් වහන්සේ පැවසූ ආකාරයට, **"මිනිසා තනිව සිටීම හොඳ නැත. මම ඔහුට සුදුසු සහකාරියක් සාදන්නෙමි. . . . එවිට ස්වාමිවූ දෙවියන් වහන්සේ මිනිසාට බරවූ නින්දක් පැමිණෙවූ සේක. ඔහු නිදා ගත්තේය; උන්වහන්සේ ඔහුගේ ඉල ඇටවලිනි එකක් ගෙන, එම ස්ථානය මාංසයෙන් පිරෙවූසේක. ස්වාමිවූ දෙවියන්**

**වහන්සේ මනුෂ්‍යයාගෙන් ගත් ඉළ ඇටයෙන් ස්ත්‍රියක් සාදා ඇය  මනුෂ්‍යයා වෙත පැමිණෙවූ සේක. එවිට මනුෂ්‍යයා කතාකොට; මැ මාගේ ඇටවලින් ඇටය, මාගේ මාංසයෙන් මාංසයය; මැ මනුෂ්‍යයාගෙන් ගන්නා ලද හෙයින්,  මනුෂ්‍යය දූ යැයි කියනු ලබන්නීයයි කීහ. එබැවින් පුරුෂ තෙමේ  තම පියාද මවුද අත්හැර තම භාර්යාවට ඇලුම් වන්නේය. ඔවුහු එක මාංසයක් වන්නෝය.''**

දෙවියන් වහන්සේ සැලසුම් කර ඇති විවාහ බැඳීම කෙතරම් ශක්තිමත්ද යත්, එම සමිතිය බිඳ දැමිය හැක්කේ අනාචාරයට (හෝ මරණයට) පමණක්ය. එකමුතුව කොතරම් ශක්තිමත්ද යත් දික්කසාදය ඇත්ත වශයෙන්ම කාමමිථ්‍යාචාරයට හේතු වන බව යේසුස්වහන්සේ නිගමනය කළ සේක.

33-37 පදවල යේසුස්වහන්සේ මිනිසුන් අතර විශ්වාස සබඳතා ගැන කටයුතු කරයි. උන්වහන්සේ අපට අණ කරන්නේ දිවුරුම් නොදී, අපගේ වචනවල එකඟත්වය ඔව් ලෙසද අපගේ විරුද්ධතාවය නැත ලෙසද තිබීමට ඉඩ දෙන ලෙසයි. **"මෙයට වඩා වැඩි දෙයක් ඇද්ද එය  නපුරාගෙන්ය" (මතෙව් 5:37)**. එය යේසුස්වහන්සේ මෙසේ පැවසුවාට සමානය, “ඔබ කවුරු කියලද හිතන්නේ? ඔබ එකිනෙකා සමඟ ඇති සබඳතා කෙතරම් පළුදු වී ඇත්ද යත්, ඔබට බැරැරුම් ලෙස යමක් ගැනීමට අවශ්‍ය වූ විට, ඔබ පූජනීයත්වය මත දිවුරුම් දී, මගේ පරමාධිපත්‍යය ගැන උපකල්පනය කර, ඔබට කිසිසේත් පාලනය කළ නොහැකි භාරයක් කරනවා.

දිවුරුමක් අව්‍යාජ සහ දැඩි කැපවීමක් ලෙස ලෝකය විශ්වාස කරයි, නමුත් දෙවියන් වහන්සේ මිනිසාට එවැනි ස්වෛරීභාවයක් ලබා නොදේ. මිනිසා තම දිවුරුමෙහි ඇති විය හැකි අංග පාලනය කළ හැකිදැයි නොදනී; ඔහු ජීවතුන් අතර සිටීද යන්න ගැන ඔහුට පාලනයක් නැත. එබැවින් යේසුස්වහන්සේ පැවසුවේ, **“කිසිසේත් දිවුරන්න එපා; ස්වර්ගයෙන්වත් පොළොවෙන්වත් යෙරුසලමෙන්වත් ඔබේම හිස ගැනවත් නොදිවුරන්න. ඒ වෙනුවට, ඔබේ වචනයෙන් ඔබට ඇත්ත වශයෙන්ම ඇති එකම පරමාධිපත්‍යය පිළිබිඹු කිරීමට ඉඩ දෙන්න - එය ඔව් සහ නැත යනුවෙන්ය.''**

38-42 පදවල යේසුස්වහන්සේ විස්තර කරන්නේ අහඹු වැරදි - අප නොදන්නා සහ හුදෙක් එදිනෙදා ජීවිතයේ කොටසක් විය හැකි මිනිසුන්ගෙන් එන වැරදි අප හැසිරවිය යුතු ආකාරයය: **“යමෙක් ඔබට දකුණු කම්මුලට ගැසුවොත්, ඔහුට අනෙක් කම්මුලද හරවන්න. යමෙක්  නඩු කියා නුඹේ අඳනය  ගැනීමට කැමති වී නම, නුඹේ උතුරු සළුවද ඔහුට ගන්ට ඉඩ හැරපන්න.**

**යමෙක් ඔබට සැතපුමක් යන්නට බල කරන්නේ නම්, ඔහු සමඟ සැතපුම් දෙකක් පලයන්න" (මතෙ. 5:39-41).** ලෝකය සිතන්නේ පළිගැනීම පිළිගත හැකි, සමහර විට වඩාත් ප්‍රියවූ දෙයක් ලෙසය. නමුත් දෙවියන් වහන්සේ නපුරු මිනිසුන් සමඟ කටයුතු කරනු ඇත, එබැවින් අපි ඔවුන්ට විරුද්ධ නොවිය යුතුය. ඇත්ත වශයෙන්ම, ඔවුන් අපෙන් ඉල්ලන දේට වඩා වැඩි යමක් අප ඔවුන්ට ලබා දිය යුතුය. දෙන්න, දෙන්න, දෙන්න! අපි විටින් ට අවදානම් ගැනීමට බිය විය යුතු නැත.

43-47 පදවල යේසුස්වහන්සේ අහඹු වැරදි ක්‍රියා තවත් පියවරක් ඉදිරියට ගෙන ගොස් අපට හානියක් කිරීමට කැමති අප දන්නා මිනිසුන් තුළ ඒවා පුද්ගලීකරණය කළ සේක: **"ඔබේ අසල්වැසියාට ප්‍රේම කරන්න, ඔබේ සතුරාට වෛර කරන්න කියා පැවසූ බව ඔබ අසා ඇත. ඔබට කියන්න, ඔබේ සතුරන්ට ප්‍රේම කරන්න, ඔබට පීඩා කරන්නන් වෙනුවෙන් යාච්ඤා කරන්න, එවිට ඔබ ස්වර්ගයේ සිටින ඔබේ පියාණන්ගේ පුත්‍රයින් වනු ඇත" (මතෙ. 5:43-45).** ලෝකය සලකන්නේ තම මිතුරන් ගැන පමණි. නමුත් දෙවියන් වහන්සේගේ ආදර්ශය ප්‍රතිවිරුද්ධයයි: අපි අපගේ සතුරන්ට ප්‍රේම කළ යුතු අතර, ඇත්ත වශයෙන්ම, ඔවුන් වෙනුවෙන් යාච්ඤා කළ යුතුය. අපි අපේ ස්වර්ගික පියාණන්ගේ දරුවන් විය යුතුයි. දෙවියන් වහන්සේගේ යහපත්කම හොඳ සහ නරක යන දෙඅංශයෙන්ම මුළු පෘථිවියටම යන්නේය, එබැවින් අපගේ සතුරන්ට පවා ප්‍රේම කළ හැකි උන්වහන්සේගේ ප්‍රේමය අපට ලබා දෙයි. දෙවියන්වහන්සේගේ සෙනඟ සැමට ප්‍රේමකර ආචාර කළ යුතුය, විශේෂයෙන්ම අපට පෞද්ගලිකව ලබා ගැනීමට කිසිවක් නොමැති විටදී පවා.

මෙම නව භාරකාරත්වයේ ජීවිතය ගත කිරීම සඳහා වැදගත් යතුර සමඟින් යේසුස් 48 පදයෙන් අවසන් කරයි: **"එබැවින් ඔබගේ ස්වර්ගීය පියාණන් සර්වසම්පූර්ණ බැවින් ඔබද පරිපූර්ණ විය යුතුය."** සහාව ජීවත් වීමට කැඳවා ඇති ආකාරයට ජීවත් වීමට අපට ඇති හැකියාව අපගේ පියාණන්ගේ පරිපූර්ණ ධර්මිෂ්ඨකම තුළ පමණක් දක්නට ලැබේ. දෙවියන් වහන්සේ තම දරුවන් තුළ තබන නව උපත අපට මේ ආකාරයෙන් ජීවත් වීමට ඉඩ සලසයි. අපේ පියාණන් වහන්සේ පරිපූර්ණය, අපිව නිර්මාණය කර තිබෙන්නේ උන්වහන්සේ හා සමාන වීම පිණිසය.

## පාවුල්ගේ වචන වලින්

එපීස 4:17-6:9 හි පාවුල්ගේ වචනවල පාවුල් මෙම 'භාරකාරත්වයේ ජීවිතය' විස්තර කරන්නේය. මුලින්ම 4:17-5:7 හි, යේසුස්වහන්සේ පැවසූ පරිදි, මෙම ජීවිතය අප අවට ඇති සම්මතයට වඩා වෙනස් ලෙස පෙනේ. අපේ පියා ආදම්ගෙන් උරුම වූ චින්තනයේ

නිෂ්ඵලභාවය තුළ අපට ලෝකය මෙන් ජීවත් විය නොහැක. එම සිතුවිල්ල අඳුරු වී, දෙවියන්ගේ සිතීමේ ක්‍රමයෙන් වෙන් වී, සංවේදීතාවයෙන් තොර සහ සම්පූර්ණයෙන්ම තමාට සහ එහි තෘප්තියට පවරා ඇත. ක්‍රිස්තුස් වහන්සේ වෙතට අපගේ පැමිණීම මේ සඳහා ඉඩ නොදෙනු ඇත. ඒ වෙනුවට, සැබෑ ධර්මිෂ්ඨකම හා ශුද්ධකම තුළ දෙවියන් වහන්සේ මෙන් අපව අලුතින් මවා ඇති ආකාරයටම අප සිටිය යුතුය. අප උන්වහන්සේගේ පුත්‍රයා වන යේසුස්වහන්සේ මෙන් විය යුතුය, මන්ද අප නැවත ඉපදී ඇත්තේ එලෙසය. අපි **"ක්‍රිස්තුස් වහන්සේ අපට ප්‍රේම කළ සේම, දෙවියන් වහන්සේට සුවඳවත් පූජාවක් සහ පූජාවක් ලෙස අප වෙනුවෙන් තමන්ම පාවා දුන් ආකාරයටම ප්‍රේමයෙන් ගමන් කළ යුතුය" (එෆී. 5:2).**

පාවුල් කන්ද උඩ දේශනාවේ යේසුස්වහන්සේගේ වචනවලට ගැලපෙන ලෙස පැවසුසේක. මෙම නව ජීවිතය අවට ලෝකය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කරයි (බලන්න 5:8-17). එය දෙවියන් වහන්සේ විසින් පුරුෂයා සහ ස්ත්‍රිය පුද්ගලික සබඳතා තුළ මැවීම (බලන්න 5:18-21), විවාහ සබඳතා (බලන්න 5:22-33), පවුල් සබඳතා (6:1-4 බලන්න) සහ ක්ෂේත්‍රයේ සබඳතා (බලන්න) තුළ දෙවියන් වහන්සේගේ සැලසුම ප්‍රකාශ කරයි. 6:5-9 බලන්න). මෙම පද වලින් බොහෝ දේ ගත හැකි නමුත් මම වැදගත් නිගමන කිහිපයක් ඉස්මතු කරමි.

පළමුව, මෙම ජීවිතය යේසුස් වහන්සේ තුළ අපට ලබා දී ඇත. උන් වහන්සේ සමඟ අපගේ මරණය, භූමදානය සහ නැවත නැඟිටීම නොමැතිව නව ජීවිතයක් පැවතිය නොහැක. යොහන් 3 හි නිකොදේමස්ගේ අභිරහස මෙයයි. යේසුස්වහන්සේ ඔහුට පැවසූ පරිදි, "සැබවක්, සැබවක් මම නුඹලාට කියමි, යමෙක් ජලයෙන් හා ආත්මයෙන් උපත නොලබන්නේ නම්, ඔහුට දෙවියන් වහන්සේගේ රාජ්‍යයට ඇතුළු විය නොහැක" (යොහන් 3:5), නිකොදේමස් පිළිතුරු දෙමින්, "මේ දේවල් කෙසේ විය හැකිද?" (යොහන් 3:9).

දෙවනුව, මෙම ජීවිතය අප අවට ලෝකයේ ජීවිතයට නොගැලපේ. අප ක්‍රිස්තුස් වහන්සේ වෙතට පැමිණි විට, අපගේ සියලු මනුෂ්‍ය සම්බන්ධතා වෙනස් වේ; නිහතමානීකම දැන් ඒ හැමෝගෙම මධ්‍යය වී ඇත. අප **"ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි ඇති ගෞරවයෙන් එකිනෙකාට යටත් විය යුතු"** බව පාවුල් පවසන්නේ එබැවිනි (එෆීස. 5:21). අන්‍යෝන්‍ය යටත්වීම සම්බන්ධතා අන්තර් රඳා පැවැත්මේ අභිරහස නිර්මාණය කරයි: ස්වාමිපුරුෂයන් තම භාර්යාවන්ට තම ශරීරයට මෙන් ආදරය කළ යුතුය; භාර්යාවන් තම ස්වාමිපුරුෂයාට නිදහසේ තම ගෞරවය ලබා දිය යුතුය. දරුවන් තම දෙමාපියන්ට ගෞරවය හා කීකරුකම ලබා දිය යුතුය. ක්ෂේත්‍රවලදී පවා, අයිතිකරුවන් තම සේවකයන්ට (වහල්ලාට) ගෞරවයෙන් සලකන

විට සහ සේවකයින් ඔවුන්ගේ අයිතිකරුවන්ට කරන සේවය දෙවියන් වහන්සේට කරන සේවයක්සේ සලකන විට ව්‍යාපාරික පිළිවෙත් උඩු යටිකුරු වනු ඇත.

තෙවනුව, මෙම ජීවිතය අප විසින් තෝරා ගත යුතුය. දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ ව්‍යාප්තිය සඳහා අපගේ ජීවිත භාරගැනීමේ හැකියාව දෙවියන්වහන්සේ විසින් උන්වහන්සේගේ පුත්‍රයාණන් එවීමෙන් සහ පුත්‍රයාණන් තුළ සොයාගත් ගැළවීම ලබන්නන් තුළට උන්වහන්සේගේ ආත්මය ඇතුල්කිරීමෙන් අපට ලබාගත හැකිවී ඇත. කෙසේ වෙතත්, අප එය මත ක්‍රියා කළ යුතුය. පාවුල් රෝම 6:11-14 හි මෙය පැහැදිලි කරයි:

**“එලෙසම නුඹලාත් පාපයට මැරී සිටියවුන් කොටද යේසුස් ක්‍රිස්තුස් වහන්සේ තුළ දෙවියන් වහන්සේට ජීවත්ව සිටින්නන් කොටද  සිතා ගනිල්ලා. එබැවින් නුඹලා  නුඹලාගේ මරණීය ශරීරය තුළ පාපයට තෘෂ්ණාවලට කීකරු වන පිණිස, පාපය එහි අධිපතිකම් නොකෙරේවා. නුඹලාගේ අවයවයන් අධර්මිෂ්ඨකමේ ආයුධයක් ලෙස පාපයට භාර නොදී, නුඹලාම මළවුන්ගෙන් ජීවත්ව සිටින්නන් මෙන් දෙවියන් වහන්සේට භාර වී, නුඹලාගේ අවයව ධර්මිෂ්ඨකමේ ආයුධ කොට දෙවියන් වහන්සේට භාර දීපල්ලා. මක්නිසාද නුඹලා ව්‍යවස්ථාව යටතේ නොව අනුග්‍රහයේ යටතේ සිටින බැවින්, පාපය නුඹලා කෙරෙහි අධිපතිකම් නොකරන්නේය”.**

## ලුහුබැඳිය යුතු ධර්මිෂ්ඨකම

යේසුස්වහන්සේ අප ලුහුබැඳිය යුතු ධර්මිෂ්ඨකම ගැන කතා කර ඇත- **"පළමුකොට දෙවියන්වහන්සේගේ රාජ්‍යය සහ උන්වහන්සේගේ ධර්මිෂ්ඨකම සොයන්න" (මතෙව් 6:33)-** සහ අපට ලබා දී ඇති ධර්මිෂ්ඨකම: **"එබැවින් නුඹලාගේ ස්වර්ගීය පියාණන්  සම්පූර්ණව සිටින්නාක් මෙන්, නුඹලාත් සම්පූර්ණව සිටපල්ලා." (මතෙ. 5:48).** උන්වහන්සේ දැන් මතෙව් 7:7-28 හි කන්ද උඩ දේශනාව සම්පූර්ණ කරන්නේ දෙවියන්වහන්සේට සම්බන්ධව මෙම ධර්මිෂ්ඨකම ලුහුබැඳිය යුතු ආකාරය විස්තර කරමිනි. 7-11 පදවල යේසුස්වහන්සේ පවසන්නේ, **“ඉල්ලන්න, එවිට ඔබට දෙනු ලැබේ; සොයන්න, එවිට ඔබට සම්බ වනු ඇත; තට්ටු කරන්න, එවිට එය ඔබට විවෘත වනු ඇත. මක්නිසාද ඉල්ලන සෑම කෙනෙකුටම ලැබේ, සොයන තැනැත්තා සොයා ගනී, තට්ටු කරන්නාට දොර විවෘත වනු ඇත. එසේත් නැතිනම් ඔබගෙන් කවරෙක්, ඔහුගේ පුත්‍රයා ඔහුගෙන් රොටි ඉල්ලුවොත්, ඔහුට ගලක් දෙන්නේද? නොහොත් මාළුවෙක් ඉල්ලුවොත් සර්පයෙක් දෙනනව ඇතිද? එසේ නම්, නපුරු වූ ඔබලා,**

**ඔබලාගේ දරුවන්ට යහපත් දීමනා දෙන්න දන්නේ නම්, ස්වර්ගයේ සිටින ඔබේ පියාණන් තමන්ගෙන් ඉල්ලන අයට කොපමණ වැඩියෙන් යහපත් දේ ලබා දෙන සේක්ද!''**

දෙවියන් වහන්සේ උන්වහන්සේගේ ධර්මිෂ්ඨකම ලෙස ජීවත් වීමට කැමති අයට උන්වහන්සේගේ අභිමුඛත්වය සහ මඟ පෙන්වීම ලබා දෙන සේක. තට්ටු කරන්නා දොර විවර වනු ඇත, ඉල්ලන්නාට ලැබේ, සොයන්නාට සම්භ වේ. අපි ප්‍රේම කරන අයට අපි හොඳ තෑග්ගක් දෙනවා නම්, දෙවියන් වහන්සේ අපට කොපමණ ආශීර්වාද කිරීමට කැමතිදැයි සිතන්න. ඒ සියල්ල පැමිණෙන්නේ ඔවුන් අපට කරනවාට අප කැමති ලෙස අන් අයට කිරීමෙන්ය.

13-14 පදවල යේසුස්වහන්සේ අපට අනතුරු අඟවන්නේ උන්වහන්සේගේ ධර්මිෂ්ඨකම ලුහුබැඳීමට නම්, අපි **"පටු දොරටුවෙන් ඇතුල් විය යුතු බවයි. මක්නිසාද විනාශයට යන දොරටුව පුළුල්ය, මාර්ගයද පහසුය, එයින් ඇතුල් වන්නෝ බොහෝය. මක්නිසාද ජීවනයට යන දොරටුව පටුය, මාර්ගයද දුෂ්කරය, එය සොයාගන්නෝ ස්වල්ප දෙනෙක්ය."** විනාශයට යන මාර්ගය පුළුල් හා අධික ජනාකීර්ණ නිසා අපි පවු මාර්ගයේ සිටිය යුතුය. ජීවිතයට යන මාර්ගය පටු වන අතර හුදකලා එකක්ද විය හැකිය.

15-23 පදවල යේසුස්වහන්සේ තවත් අනතුරු ඇඟවීම් දෙකක් ලබා දුන් සේක: අපි "බොරු අනාගතවක්තෘවරුන්ගෙන්" සහ ක්‍රිස්තුස්ව හඳුනනවා යැයි කියන නමුත් එසේ නොකරන සාමාන්‍ය මිනිසුන්ගෙන් පරෙස්සම් විය යුතුය: **"ස්වර්ගයේ සිටින මාගේ පියාණන්ගේ කැමැත්ත නොකර, මට 'ස්වාමීනි, ස්වාමීනි' කියා පවසන සැවොම ම රාජ්‍යයට ඇතුල් නොවනු ඇත." (මතෙව් 7:21).** යේසුස් වහන්සේගේ අවවාදය පැහැදිලිය: රැවටීමෙන් පරෙස්සම් වන්න.

මිනිසුන් කණ්ඩායම් දෙකකින් රැවටිය හැකිය. පළමුව, ආගමික නායකයන් ලෙස පෙනී සිටින පුද්ගලයින්ගෙන්. අවාසනාවකට මෙන්, මෙම පුද්ගලයින් විනාශ කිරීමට අරමුණු ඇත්තන් බවට බොහෝ දෙනා විසින් අවබෝධ කර නොගෙන ඇත. භයානක මිනිසුන් ඉක්මනින් හෝ පසුව ඔවුන්ගේ ජීවිතයේ ඵලවලින් සොයාගත හැක. නමුත් සැබෑ අනුගාමිකයින් ලෙස පෙනී සිටින පුද්ගලයන්ගෙන් ද අනතුරු දායකය. අපව ආරක්ෂා කර ගැනීම සඳහා, අපි දෙවියන් වහන්සේගේ කැමැත්ත කරන ඇදහිලිවන්තයන් සොයා බැලිය යුතුය - එනම් දෙවියන් වහන්සේ දන්නා බව පෙන්වන සහ ගැන කතා කිරීම පමණක් නොකරන අයවලුන් වේ.

යේසුස් වහන්සේ 24-27 වාක්‍ය වලින් උන්වහන්සේගේ කැඳවීම අවසන් කළ සේක:

**“එවිට මාගේ මේ වචන අසා ඒවා කරන සෑම කෙනෙකුම පර්වතය මත තම නිවස ගොඩනඟා ගත් ප්‍රඥාවන්ත මිනිසෙකු හා සමාන වනු ඇත. වර්ෂාව වැටී ගංවතුර ඇති විය, සුළඟ හමා ගොස් ඒ නිවසට පහර දුන්නේය, නමුත් එය පර්වතය මත පිහිටුවා තිබූ බැවින් එය වැටුණේ නැත. තවද මාගේ මේ වචන අසා ඒවා නොකරන්නාවූ සියල්ලෝ වැලි මත තම ගෙය ගොඩනඟාගත් මෝඩ මිනිසෙකුට සමාන වන්නේය. වර්ෂාව ඇද හැළී ගංවතුර ඇති විය, සුළඟ හමා ගොස් එම නිවසට පහර දුන්නේය, එය වැටුණි, එහි වැටීම විශාල විය.”**

දෙවියන්වහන්සේගේ වචන අසා ඒවා ක්‍රියාවට නැංවීමෙන් අප නැණවත්ව ගොඩනැගිය යුතුය. අපි මෙය කළහොත්, අපි කුණාටුවෙන් ආරක්ෂා වනු ඇත. පුරුද්දේ පදනමක් නැති ජීවිතය කෙසේ වෙතත් කඩා වැටෙනු ඇත.

සභාව අධ්‍යාත්මික පරිණතභාවයට කැඳවනු ලැබේ - දෙවියන් වහන්සේගේ රාජ්‍යය සහ උන්වහන්සේගේ ධර්මිෂ්ඨකම සඳහා අපගේ ජීවිතයේ සෑම අංශයක්ම භාර ගැනීමටය. දෙවියන්වහන්සේගේ සෙනඟ සැබවින්ම ශුද්ධවූ ජීවිත ගතකරන විට, ඔවුන් තුළ ශුද්ධාත්මයාණන් විසින් බලගන්වන ලද විට, ඔවුන් තම පරම්පරාව තුළ දෙවියන්වහන්සේගේ අරමුණ ඉටුකිරීමට ඵලදායී වනු ඇත: එය සෑම පුරුෂයෙකුටම, ස්ත්‍රියකටම සහ ළමයෙකුටම ඔවුන් ජීවත් වන ස්ථාන වල සම්බන්ධතාවය සහ නියෝජනය පිළිබඳ උන්වහන්සේගේ ශුභාරංචිය ප්‍රකාශ කිරීම වේ.

# කොටස 2

# සභාව එහි අරමුණ සඳහා ජීවත් වීමට බලය ලබා දීම

# 5

# යේසුස් වහන්සේ උන්වහන්සේගේ සභාවට නායකත්වය ලබා දුන්සේක

දෙවියන් වහන්සේගේ සභාව සඳහා වූ උන්වහන්සේගේ අරමුණ ගැන අපි විස්තරාත්මකව සාකච්ඡා කළෙමු: සෑම ඇදහිලිවන්තයෙකුම ආත්මයේ දීමනා සහ ඵල සහ ඔවුන්ගේ කරුණාවේ කථා පැවසීමෙන් සෑම පුරුෂයෙකුටම, ස්ත්‍රියකට සහ දරුවෙකුටම ශුභාරංචිය ඇසීමටත්, යේසුස් ක්‍රිස්තුස් වහන්සේව පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට අවස්ථාව ලැබෙන පිණිස තමාගේ ස්ථානයේ ශුභාරංචිය ප්‍රදර්ශනය කරමින් ජීවත් විය යුතුය. අප දැන් ඇසිය යුතු ප්‍රශ්නය නම් මෙය සිදු කරන්නේ කෙසේද යන්නයි.

දෙවියන් වහන්සේ සභාවට තම සෙනඟව ඔවුන්ගේ කැඳවීමේදී සන්නද්ධ කිරීම සඳහා මිල කළ නොහැකි සම්පතක් සපයා ඇත: නායකත්වය. පාවුල් මෙහිදී පැහැදිලි විය:

**"උන්වහන්සේ සමහරුන් ප්‍රේරිතයන්ද, අනාගතවක්තෘවරුන්, සමහරුන් එවැන්ජලිස්තවරුන්ද, සමහරුන් එඬේරුන්ද සමහරුන් ගුරුවරුන්ද කොට දුන්සේක. එසේ දුන්නේ ඇදහීමේද, දෙවියන් වහන්සේගේ පුත්‍රයා පිළිබඳ දැනගැනීමේ එකමුතු කමටත්, ක්‍රිස්තුස් වහන්සේගේ සම්පූර්ණවූ උස මහතේ ප්‍රකාරයට අප සියල්ලන්ම පැමිණෙනතෙක් ශුද්ධවන්තයන්ගේ සම්පූර්ණ වීම සඳහා සේවය කිරීම වැඩය පිණිසත් , ක්‍රිස්තුස් වහන්සේගේ ශරීරයේ වර්ධනය වීමත් සඳහාය. (එපීස. 4:11-13)**

ප්‍රාදේශීය සභාවල නායකත්වය සඳහා දෙවියන්වහන්සේගේ සෙනඟ සඳහා වූ අරමුණ පැහැදිලිවම තහවුරු කිරීමට වඩා වැදගත් කාර්යයක් නැත. මිනිසුන්ව ආකර්ෂණය කර දෙවියන්වහන්සේගේ ආශාව තුළ ගමන් කිරීමට ආකර්ශනය කෙරෙන පරිසරයන් නිර්මාණය කිරීමෙන් එම සභතිකය තුළ මිනිසුන් වර්ධනය වීමට නායකත්වය වග බලා ගත යුතුය. දෙවියන් වහන්සේ ඔවුන්ව යේසුස් වහන්සේ තුළින් නව උපතකට ගෙන ආ පසු දෙවියන් වහන්සේ සැලසුම් කර ඇති සියලු මාර්ගවල ගමන් කිරීමට ඔවුන්ට උපකාර කිරීමට සූදානම් නොවී, මතුපිටට පෙනෙන ලෙස ඇදහිල්ලට පැමිණෙන මිනිසුන් ගැන පමණක් කල්පනාකාරී වීම මාරාන්තික වැරැද්දකි.

නායකත්වයේ වගකීම වන්නේ දෙවියන්වහන්සේගේ සෙනඟ ඔවුන්ගේ කැඳවීමෙහි රැඳී සිටින බව සහතික කිරීම සඳහා වැරදි හඳුනාගෙන ඒවා වළක්වා ගැනීමට උපකාර කිරීමයි.

යේසුස්වහන්සේගේ අනතුරු ඇඟවීම නැවත නැවත කීම වටී:

**"බොරු අනාගතවක්තෘවරුන්ගෙන් ප්‍රවේශම් වෙයල්ලා, ඔව්හු බැටළු වේෂයෙන් නුඹලා ළඟට එති, නමුත් ඇතුළතින් ඔව්හු ඇතුළතින් කෲර වෘකයයෝය. ඔවුන්ගේ ඵලවලින් නුඹලා ඔවුන් හැඳිනගන්නහුය. මනුෂ්‍යයෝ කටු ගස්වලින් මුද්‍රික ඵලවත් ගොකටුවලින් අත්තික්කා ඵලවත් නෙළ ගනිත්ද? එසේම සියලු හොඳ ගස් හොඳ ඵල දරයි. නමුත් නරක ගහ නරක ඵල දරයි. හොඳ ගහක නරක ඵලවත්, නරක ගහක හොඳ ඵලවත් හටගන්න බැරිය. හොඳ ඵල නොදරන සියලු ගස් කපනු ලැබ ගින්නට දමනු ලැබේ. එබැවින් ඔවුන්ගේ ඵලවලින් ඔවුන් හැඳින ගන්නහුය." (මතෙ. 7:15-20)**

මගේ දේවධර්ම පුහුණුවේ සිට වසර ගණනාවක් තුළ, මට ලබා දී ඇති විශ්වාසයන් සහ සම්ප්‍රදායන් ගැන මම මෙනෙහි කර ඇත්තෙමි. ඒවා වැරදි නැත, නමුත් සරලවම අසම්පූර්ණ හෝ අවධානයෙන් තොර ඒවා විය. විසිඑක්වන ශතවර්ෂයේ සභාවේ ඉතිහාසය අද්විතීය වන්නේ මිනිසාගේ දර්ශන නිසා නොවේ, නමුත් එය බටහිර සභාවේ ඓතිහාසික "ඇවිත් බලන්න" දිශානතියේ වැරදි බව හෙළිදරව් කර ඇති නිසාය.

සභාවේ ජීවිතයට මෙම "ඇවිත් බලන්න" ප්‍රවේශය "සභාව මිනිසුන් එක්රැස් කිරීම" ලෙස ගෝලත්වයේ නිර්වචනයට වැඩි බරක් තබා ඇත. එහි ප්‍රතිඵලය, බොහෝ විට බලාපොරොත්තු නොවූ දෙයක් නම්, සභාවට යේසුස්වහන්සේගේ අනුගාමිකයෙකු වීම යන්නෙහි සාරය නැති වී යනු ඇත. සභාව පැවතීමට ඇති සියලුම හේතු අපට බොහෝ දුරට අහිමි වී ඇත: එනම් මිනිසුන් දෙවියන් වහන්සේට සම්බන්ධ වී ජීවත් වීමට සහ ලෝකය තුළ උන් වහන්සේව නියෝජනය කිරීමට උන්වහන්සේව සොයා ගැනීමය. සභාවේ නායකත්වයේ කර්තව්‍යය වන්නේ දෙවියන් වහන්සේගේ ප්‍රාථමික කැඳවීම සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමයි - උන් වහන්සේගේ සෙනඟ පෝෂණය කිරීම සඳහා ඔවුන් මෙම අරමුණු තුළ වර්ධනය වේ: පළමුව, ඔවුන් පියාණන් වන දෙවියන් වහන්සේ සමඟ අඛණ්ඩ හා වර්ධනය වන සම්බන්ධතාවයක සිටීම සහ දෙවනුව ඔවුන් ලෝකය තුළ පියාණන්ව විශ්වාසවන්තව නියෝජනය කිරීම ය.

දෙවියන් වහන්සේ මුලින්ම මගෙන් මෙම විස්මිත ප්‍රශ්නය ඇසූ විට, එනම්,"ඔබේ කතාවලට සවන් දීමට මිනිසුන්ගෙන් පිරී සිටීමට මගේ සභාව ඔබට ගබඩාවක් යැයි ඔබ සිතනවාද?" යන්නෙන් ඇසූ විට, සභාව ගැන මගේ අදහස වැරදිය යන යථාර්ථය ගැන මම ගැඹුරින් කම්පා

වුණෙමි. බයිබලය ඉගැන්වීම හෝ එය දේශනා කිරීම ඇසීමට මිනිසුන් එක්රැස් කිරීම වැරදි බව පැවසීමක් නොවේ, නමුත් උන්වහන්සේගේ ප්‍රශ්න කිරීම්වලදී, දෙවියන් වහන්සේ මට විශාල වැරදි මත දෙකක් හෙළි කළ සේක: එකක්, සභාව මිනිසුන්ගේ රැස්වීමක් බවත්, දෙක, යමෙකු දේශනා කිරීම ඇසීමට එක්රැස් වූ මිනිසුන් ප්‍රමාණය නායකයෙකුගේ කාර්යක්ෂමතාවය මැනීම වන බවත්ය.

දෙවියන් වහන්සේ මගෙන් එම ප්‍රශ්නය ඇසීමෙන් පසු වසර ගණනාවක් පුරා, ක්‍රිස්තුස් වහන්සේගේ සෙනඟ සේවය සඳහා බලගැන්වීම නායකත්වයේ මූලික කැඳවීම නම්, බටහිර නායකයින් ඔවුන්ගේ වරම සහ ඵලදායිතාව වැරදි මෙවලමකින් මැනීමට පුහුණු කර ඇති බව මම සොයා ගතිමි. මිනිසුන් අපේ සභාවලට පැමිණෙනවාද, එසේත් නැතිනම් ඔවුන් පැමිණෙන විට ඔවුන්ට හැඟෙන්නේ කෙසේද කියා ඇසීම ඉතා රැවටිලිකාර ප්‍රතිඵල ගෙන දෙයි. කී දෙනෙක් ආවාද වැනි ආකර්ශනීය ප්‍රශ්නවලින් නායකයන් නිහඬව කල් ගෙවයි. ඔවුන් කීයක් දුන්නාද? ඔවුන් සතුටින් සිටිනවාද? මෙම ප්‍රශ්න ක්‍රිස්තුස් වහන්සේගේ සෙනඟ ලෙස විශ්වාස කිරීමට ප්‍රකාශ කරන සියලුම සභාවන්ට විශාල හානියක් සිදු කරයි, මන්ද ඒවා දෙවියන් වහන්සේ කිසි විටෙකත් තම සභාව සඳහා අදහස් නොකළ අරමුණක් කෙරෙහි අවධානය යොමු කරන බැවිනි.

දෙවියන්වහන්සේට උන්වහන්සේගේ සෙනඟට අවශ්‍ය කුමක්ද යන්න සහ පසුව මිනිසුන් මේ දේවල් තුළ වර්ධනය වීමට වග බලා ගන්නේ කෙසේද යන්න මෙන්ම ඇදහිලිවන්තයන් ඔවුන් තුළ ගමන් කිරීමට ආකර්ශනය වන පරිසරයන් ගොඩනඟන්නේ කෙසේද යන්න ගැන නායකත්වය මුලින්ම ඉගෙන ගත යුතුයි. සභාව සඳහා දෙවියන් වහන්සේගේ අරමුණෙහි ගමන් කිරීමට මිනිසුන් බලගැන්වීම සඳහා කැපවීමකින් තොරව, තමන් ක්‍රිස්තුස් අනුගාමිකයින් ලෙස හඳුන්වන මිනිසුන්ගේ අනුප්‍රාප්තික පරම්පරාවන් නාමිකවාදීන්ට වඩා වැඩි පිරිසක් නොවනු ඇත.

ඇදහිලිවන්තයන් යැයි කියාගන්නා අය වසර ගණනාවක් පුරා කොපමණ බයිබල් දැනුමක් ලබා ගත්තද යන වගවත්, සත්‍යය බෙදා දීම පමණකුත් ප්‍රමාණවත් නොවේ. කොච්චර ආශ්වාදයක් දුන්නද නමස්කාරය පමණකුත් ප්‍රමාණවත් නොවේ. නාට්‍ය හෝ වෙනත් නිර්මාණාත්මක අදහස් හරහා අදාළත්වය පිළිබඳ නව අවධාරණය පමණකුත් ප්‍රමාණවත් නොවේ. මෙම යහපත් ක්‍රියාකාරකම් සියල්ල ක්‍රියාශීලීව සහ ජ්වලිත ලෙස ශුද්ධ ලියවිල්ලේ පැහැදිලිව දැකගත හැකි ජීවමාන මූලික කරුණු වෙත මිනිසුන් යොමු නොකරන්නේ නම් ඒවා නිෂ්ඵල වේ.

දෙවියන් වහන්සේ තම දරුවන් සඳහා නියම කර ඇති නව ජීවිතය ගැන පාවුල් රෝම 6 හි පැහැදිලිව ලියයි: **"එසේ නම් අප කුමක් කිව යුතුද? අනුග්‍රහය බහුල වන පරිදි අප දිගටම පාපයේ සිටිය යුතුද? කිසිසේත් නැත! පාපයට මිය ගිය අප තවමත් එහි ජීවත් වන්නේ කෙසේද? ක්‍රිස්තුස් යේසුස් තුළට බව්තීස්ම වූ අප සියල්ලන්ම උන්වහන්සේගේ මරණයට බව්තීස්ම වූ බව ඔබ දන්නේ නැද්ද? එබැවින් ක්‍රිස්තුස් වහන්සේ පියාණන් වහන්සේගේ මහිමයෙන් මළවුන්ගෙන් උත්ථාන වූවාක් මෙන්, අප ද ජීවිතයේ නවකමින් ගමන් කරන පිණිස, බව්තීස්ම වීමෙන් මරණයට පත් වීමෙන් උන්වහන්සේ සමඟ අපිව තැන්පත් කරනු ලැබුවෙමු. මක්නිසාද අපි උන්වහන්සේ හා සමාන මරණයකදී උන්වහන්සේ සමඟ එක්සත් වී ඇත්නම්, උන්වහන්සේ හා සමාන නැවත නැඟිටීමකදී අපි උන්වහන්සේ සමඟ එක්සත් වන්නෙමු. අපගේ පැරණි ආත්මය උන්වහන්සේ සමඟ කුරුසියේ ඇණ ගසනු ලැබුවේ පාපයේ ශරීරය නැති කර දැමීම සඳහා බවත්, අප තවදුරටත් පාපයට වහල් නොවී සිටින බවත් අපි දනිමු.**

**මක්නිසාද මිය ගිය තැනැත්තා පාපයෙන් නිදහස් කර ඇත. දැන් අපි ක්‍රිස්තුස් වහන්සේ සමඟ මිය ගියා නම්, අපි උන්වහන්සේ සමඟ ජීවත් වන බව අපි විශ්වාස කරමු. ක්‍රිස්තුස් වහන්සේ මළවුන්ගෙන් උත්ථාන වී නැවත කිසිදා නොමැරෙන බව අපි දනිමු. මරණය තවදුරටත් උන්වහන්සේ කෙරෙහි ආධිපත්‍යය නැත. උන්වහන්සේ මැරුණු මරණයෙන් එක්වරක් පාපයට මළ සේක, නමුත් ජීවත් වන ජීවිතයෙන්දෙවියන් වහන්සේට ජීවත්වන සේක." (රෝම 6:1-10)**

මේ සියල්ල සලකා බැලීමේදී ප්‍රධාන ප්‍රශ්න සමහරක් මතු වේ. සභාවේ නායකත්වය ශරීරයේ ජීවිතයේ මෙම යථාර්ථය ඵලදායී ලෙස ජය ගන්නා පරිසරයක් නිර්මාණය කර තිබේද? දෙවියන් වහන්සේ සමඟ ඔවුන්ගේ සබඳතාවයේ වර්ධනය වීමට ඉඩ සලසන සම්පත් ඔවුන් මිනිසුන්ගේ අතට පත් කර තිබේද? සභාවේ වැඩසටහන් දැනුවත්ව හෝ නොදැනුවත්වම මිනිසුන්ගේ දෙවියන් වහන්සේ සමඟ සම්බන්ධතාවයක් සඳහා පුද්ගලික ලුහුබැඳීම වෙනුවට ආදේශ වී ඇත්ද? අවශ්‍ය නම් සභාවේ නායකත්වය නොමැතිව ශරීරයේ සාමාජිකයින්ට දෙවියන් වහන්සේ සමඟ ඔවුන්ගේ සම්බන්ධතාවය පවත්වා ගත හැකිද?

මක්නිසාද යත් නායකත්වය උන්වහන්සේගේ සෙනඟ සඳහා දෙවියන් වහන්සේගේ බයිබලානුකූල අරමුණට වඩා අඩු දෙයක් ආශා කිරීම පිළිගත නොහැකි දෙයකි. මෙම කැඳවීම සඳහා දෙවියන්වහන්සේගේ සෙනඟ බලගැන්වීමට වඩා අඩු දෙයකට තමන් වගවීම පිළිගත නොහැකිය.

## දෙවියන්වහන්සේගේ නායකත්ව ආදර්ශය

සභාව ඒ සඳහා දෙවියන්වහන්සේගේ කැඳවීම අනුගමනය කරන්නේද නැද්ද යන්න තක්සේරු කිරීමේදී නායකත්වය තමන්ගෙන්ම ආරම්භ විය යුතුය. සභාවේ නායකත්වය වෙනත් කිසිදු ආයතනයක් අතර මෙන් එකක් නොවේ. යේසුස්වහන්සේ මෙය මතෙව් 20:25-28 හි තම ගෝලයන්ට පැහැදිලි කළ සේක: **"අන්‍යජාතිකයන්ගේ පාලකයන් ඔවුන් කෙරෙහි ආධිපත්‍යය දරන බවත්, ඔවුන්ගේ ශ්‍රේෂ්ඨයන් ඔවුන් කෙරෙහි බලය ක්‍රියාත්මක කරන බවත් ඔබ දන්නවා. ඔබ අතරේ එසේ නොවනු ඇත. නුමුත් මනුෂ්‍ය පුත්‍රයා පැමිණියේ සේවය ලැබීමට නොව සේවය කිරීමටත් බොහෝදෙනෙකුගේ මිදීමේ මිලයක් ලෙස තම ජීවිතය දීමටත් පැමිණියාක් මෙන්, ඔබ අතරේ ශ්‍රේෂ්ඨ වීමට කැමති තැනැත්තා ඔබේ සේවකයා විය යුතුය."**

මේ ලෝකයේ සියලුම නායකත්වයන් එක් මට්ටමකට හෝ තවත් මට්ටමකට දූෂිතය. මාංසය එය එසේ කරයි, මන්ද එය යේසුස්වහන්සේ නැති අය මත ආධිපත්‍යය දරන බැවිනි. යේසුස් ක්‍රිස්තුස් වහන්සේ තුළ මුදවාගත් අය තුළ පවා, මාංසය අප තුළ සිටින දෙවියන් වහන්සේගේ ආත්මයට එරෙහිව සටන් කරයි. පාවුල් මෙම සටන රෝම 6-8 දක්වා ගෙනහැර දක්වන අතර, ඔහු පවසන්නේ දෙවියන් වහන්සේ උන්වහන්සේගේ පුත්‍රයා වන අපගේ ස්වාමීන් වන යේසුස් ක්‍රිස්තුස් වහන්සේ තුළ අපට ලබා දී ඇති ධර්මිෂ්ඨකමේ ජීවමාන උපකරණ ලෙස අපගේ ශරීර ආත්මයාණන්වහන්සේට දෙන විට අප එය ජය ගන්නා බවයි. කෙසේ වෙතත්, අප අපගේ හදවත් සහ මනස ආරක්ෂා නොකරන විට, මාංසය අප දැන් ඇති ආලෝකයට හා ජීවිතයට ප්‍රතිවිරුද්ධව අකීකරු ක්‍රියාවන් බිහි කරන අතර අපගේ අභිප්‍රේරණ සහ ක්‍රියාවන් දූෂණය කරයි.

දෙවියන්වහන්සේගේ ආදර්ශය තුළ, නායකත්වය ලෝකයේ නායකත්වයට වඩා වෙනස් වන්නේ හේතු කිහිපයක් නිසාය. පළමුව, එය අදහස් කරන්නේ අන් අයට සේවය කිරීමට පමණි, පුද්ගලික අලාභයක් දක්වා පවා. දෙවනුව, මිනිසුන්ට අන් අයට නායකත්වය දීමට වගකීම පැවරෙන විට, ඔවුන්ට සැලකිය යුතු තනතුරක් ලැබෙනවා නොවේ; ඔවුන්ව සරලව කැඳවනු ලබන්නේ දෙවියන් වහන්සේව උන්වහන්සේගේ ජනතාව තුළ සහ ඔවුන් අතර නියෝජනය කිරීමට විශ්වාසවන්තව සිටීමටය. තෙවනුව, නායකත්වය යනු දෙවියන් වහන්සේගේ අනුගාමිකයන්ට සේවය කිරීම යනු දෙවියන් වහන්සේට දිය හැකි, ඇත්තවශයෙන්ම ලබා දෙන්නාවූද ආරක්ෂාව හෝ සාමය හෝ ප්‍රතිපාදන වැනි දේ ඉදිරිපත් කිරීමෙන් නොව දෙවියන් වහන්සේට අවශ්‍ය මිනිසුන් බවට ඔවුන් පරිණත කර උන්වහන්සේ ඔවුන්ව නිර්මාණය හේතුවූ දේවල් කිරීමට ඔවුන්ට උපකාර කිරීමෙනි.

නායකත්වය එහි කාර්යය නිවැරදිව ඉටු කරන විට, ඔවුන් දිනපතා සහ ප්‍රායෝගිකව දෙවියන් වහන්සේගේ වචනයට සහ උන්වහන්සේගේ ශුද්ධාත්මයාණන්ට යටත් වීමට මිනිසුන් යොමු කරයි. අවසාන වශයෙන්, හොඳ සභාවක නායකයන් අන් සියල්ලටම වඩා වින්නඹු මාතාවන් වැනිය - ඔවුන් සැබවින්ම නව ජීවිතයක් බිහි නොකරයි; ඔවුන් හුදෙක් ක්‍රියාවලිය පහසු කිරීමට උපකාර කරයි. එහෙත් නායකත්වය තවමත් අවශ්‍ය ය; ඇත්තවශයෙන්ම, එය යේසුස්වහන්සේ විසින් සභාවට ලබා දෙන ලද්දකි.

නායකත්වය යනු *කුමක්ද?* ඔහු අවසාන තීරණය ප්‍රකාශය කිරීමට යුතු කෙනා නොවේ. එමෙන්ම ඒ වඩාත්ම වාචික දක්ෂතා ඇති හෝ වඩාත්ම උපායමාර්ගික කෙනාද නොවේ! අප දැක ඇති පරිදි, යේසුස්වහන්සේ සම්පූර්ණයෙන්ම වෙනස් ප්‍රමිතියක් පනවයි. මතෙව් 20:26-28 හි යේසුස්වහන්සේ තම සෙනඟට නායකත්වය දෙන අය සඳහා ප්‍රමිති තුනක් ලබා දෙයි. උන්වහන්සේගේ නායකත්වයේ සිටින අය අන් අයගේ සේවකයන්, හෙවත් "*ඩයකොනෝස්*" විය යුතු බව උන්වහන්සේ පවසන සේක. ඔවුන් "*ඩුවෝලෝ*" එනම්, වහලුන්ද විය යුතුය. අවසාන වශයෙන්, ඔවුන් යේසුස්වහන්සේ මෙන් අන් අය වෙනුවෙන් තම ජීවිතය පූජා කළ යුතුයි. "ඔබ අතර එසේ නොවේ" යනු ලෝකයේ මෙන් නොවන නායකත්වයක් සඳහා වන කැඳවීමකි, නමුත් එය ඉල්ලා සිටින්නේ මිනිසුන්ට සැබවින්ම දෙවියන් වහන්සේගේ සභාවට නායකත්වය දීම සඳහා ය.

එපීස 4:11-16 හි පාවුල් නායකත්වය විස්තර කරන්නේ ක්‍රිස්තුස් වහන්සේ විසින් සභාවට දෙන ලද පුද්ගලයන් කණ්ඩායමක, ඔවුන් කරන දෙයින් නොව ඔවුන්ගේ සම්පූර්ණ ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලක් ලෙසයි.

**"උන්වහන්සේ සමහරුන් ප්‍රේරිතයන්ද, අනාගතවක්තෘවරුන්, සමහරුන් එවැන්ජලිස්තවරුන්ද, සමහරුන් එඬේරුන්ද සමහරුන් ගුරුවරුන්ද කොට දුන්සේක. එසේ දුන්නේ ඇදහීමේද, දෙවියන් වහන්සේගේ පුත්‍රයා පිළිබඳ දැනගැනීමේ එකමුතු කමටත්, ක්‍රිස්තුස් වහන්සේගේ සම්පූර්ණවූ උස මහතේ ප්‍රකාරයට අප සියල්ලන්ම පැමිණෙනතෙක් ශුද්ධවන්තයන්ගේ සම්පූර්ණ වීම සඳහා සේවය කිරීම වැඩය පිණිසත් , ක්‍රිස්තුස් වහන්සේගේ ශරීරයේ වර්ධනය වීමත් සඳහාය. තවද අපි තවමත් මනුෂ්‍යයන්ගේ වංචාවෙන්ද ප්‍රයෝගයෙන්ද රැවටිලි සහිත උපමාරුවෙන්ද හටගන්න සියලු ආකාර ඉගෙන්වීම් නමැති සුළඟින් ඈත මෑත විසිවෙමින් ගෙනයනු ලබන්නාවූ බාලයන් නොවන පිණිසත්, ප්‍රේමයෙන් යුක්තව ඇත්ත කතා කරමින්, හිසව ක්‍රිස්තුස් වහන්සේ උදෙසා සියලු දේවලදී වැඩෙන පිණිසත්ය. උන්වහන්සේගෙන් මුළු ශරීරය සන්ධි කර ලැබ සවිවී, එක එක කොටඨාසයේ ප්‍රමාණයේ**

**ක්‍රියා කිරීමේ හැටියට සහකාරවූ එක එක සන්ධිය කරණකොටගෙන ප්‍රේමයෙන් වර්ධනය වන ලෙස ශරීරය වැඩෙන්නේය. (එපීස 4:11-16)**

මෙම ඡේදය ගැන අපට පැවසිය හැකි සියලු දේවලින්, අවම වශයෙන් හතරක්වත් කැපී පෙනේ: යේසුස්වහන්සේ සභාවට දෙන නායකත්වය සෑම විටම එක් පුද්ගලයෙකුට වඩා වැඩි ය; එය මිනිසුන් සමූහයකි. එසේම, ක්‍රිස්තුස්වහන්සේගේ ජනතාව සවිබල ගැන්වීමේ සංකීර්ණ කාර්යය ඉටු කිරීම සඳහා, නායකත්ව කණ්ඩායමේ විවිධ සාමාජිකයින් එකිනෙකාගෙන් වෙනස් විය යුතුය. මෙම විවිධත්වය ශරීරයට විශේෂිත අවධාරණයක් සහ බලපෑමක් ඇති කරයි. අවසාන වශයෙන්, අපි ත්‍රිත්වය තුළ දකින පරිදි, පාවුල් විසින් ලැයිස්තුගත කර ඇති මෙම විවිධ පුද්ගලයින්, එක් එක් විවිධ කාර්යයන් නියෝජනය කරයි (ප්‍රේරිත, අනාගතවක්තෘ, එවැන්ජලිස්ත, දේවගැති සහ ගුරුවරයා) එසේම ඔවුන් එකිනෙකා මත රඳා පැවතිය යුතුය.

**නායකත්වය සඳහා දෙවියන්වහන්සේගේ අරමුණ**

යේසුස්වහන්සේ තම සෙනඟට නායකත්වය දුන්නේ ඇයි? ශරීරයේ නායකත්වයේ කාර්යභාරය, අප දැක ඇති පරිදි, දෙවියන් වහන්සේගේ නිර්මාණාත්මක අරමුණ තුළ ගමන් කිරීමට ක්‍රිස්තුස් වහන්සේගේ සෙනඟට බලය ලබා දීමයි. ක්‍රිස්තුස් වහන්සේගේ සෑම සෙනඟක්ම දෙවියන් වහන්සේ සමඟ වැඩෙන හා සමීප සබඳතාවයක සිටිය යුතුය. ඒ හා සමානව, ඔවුන් සමිඳාණන් වහන්සේ ලෝකයේ ඔවුන්ට ලබා දෙන සියලු සම්බන්ධතා වලදී නියෝජනය කළ යුතුය. එසේනම්, සභා නායකත්වයේ සඵලතාවයේ මිනුම නම්, ක්‍රිස්තුස්වහන්සේගේ සෙනඟ සැබවින්ම මෙම නිර්මාණාත්මක අරමුණ ඉටුකරන ආකාරයයි.

ඔවුන්ගේ ජීවිතයේ නිත්‍ය කොටසක් ලෙස මනුෂ්‍යයන්ව දෙවියන් වහන්සේ සමඟ සම්බන්ධ කර ගැනීමට මග නොපෙන්වන ක්‍රියාකාරකම්, පෞරුෂයන් සහ වැඩසටහන් ව්‍යාජ ය වන අතර දෙවියන් වහන්සේගේ කැඳවීම සඳහා භයානක ආදේශකයකි. ක්‍රිස්තුස් වහන්සේගේ සෙනඟට උපකාර නොවන ක්‍රියාකාරකම් සහ වැඩසටහන් දෙවියන් වහන්සේගේ සෙනඟ තුළ ක්‍රිස්තුන් වහන්සේගේ සෙනඟට උන් වහන්සේ ගෙනෙන සියලු සම්බන්ධතා වළක්වාලන අතර, ඔවුන් ලෝකයේ ඇවිද යන විට දෙවියන් වහන්සේගේ නිර්මාණාත්මක අරමුණු සඳහා ආදේශක බවට පත්වන අතර, දෙවියන්වහන්සේගේ සෙනඟගේ අර්ථය නැති කරන අතර තමන් තුළ දෙවියන්වහන්සේගේ පැවතීම ඔවුන්ගෙන් සොරකම් කරයි.

නායකත්වයේ කර්තව්‍යය, කෙටියෙන් කිවහොත්, ඔවුන්ගේ දෙවියන්වහන්සේ විසින් නිර්මාණය කරන ලද අරමුණට පහසුකම් සැලසීම සඳහා නායකත්වය වුවමනා වීම ශීඝ්‍රයෙන්

අඩුවන අවශ්‍යතාවයක් වූ මනුෂ්‍යයන්ගේ සභාවක් වර්ධනය කිරීමයි. මෙම අවස්ථාවෙහිදී, ඔවුන් ඔවුන්ගේම පූජකයන් බවට පත් වනු ඇත (බලන්න 1 පේතෘ. 2:9) ක්‍රිස්තුස් ඔවුන්ගේ උත්තම පූජකයා ලෙසත්, ශුද්ධාත්මයාණන් ඔවුන්ගේ වාසය කරන ගුරුවරයා ලෙසත්, ලෝකය ඔවුන්ගේ කීකරුකම තුළ දෙවියන් වහන්සේ ඔවුන් තුළින් උන්වහන්සේව නියෝජනය කරමින් උන්වහන්සේව පින්තාරු කරන කැන්වසය බවට පත් වනු ඇත.

නව ගිවිසුමේ නායකත්වයේ බයිබලානුකුල ස්වරූපය එතරම් වැදගත් වන්නේ ඇයි? හේතු ගණනාවක් නිසාය.

*බයිබලානුකුල නායකත්වයෙන් පිළිබිඹු වන්නේ ත්‍රිත්වාකාර දෙවියන් වහන්සේ සෑම පුද්ගලයෙකු තුළම මැවූ රූපයයි.* අප තුළ සිටින දෙවියන් වහන්සේගේ ප්‍රතිරූපය පිළිබිඹු කරන්නේ සබඳතාව (අපි කවුද? අපි උන්වහන්සේගේ ය) සහ නියෝජනයය (අපි පවතින්නේ ඇයි? අප සිටින්නේ අප අවට ලෝකයට උන්වහන්සේව නියෝජනය කිරීමට); එය අන්තර් යැපීම ද පිළිබිඹු කරයි (අපි තනිවන විට අසම්පූර්ණයි). අප තුළ ඇති උන්වහන්සේගේ ප්‍රතිරූපය ද ප්‍රේමයද (අන් අයගේ ප්‍රයෝජනය සඳහා අපව දීම) පිළිබිඹු කරයි.

*බයිබලානුකුල නායකත්වය අපි පුද්ගලයන් වශයෙන් අපගේ අසම්පූර්ණත්වය වැළඳ ගන්නා විට එන ඒකාබද්ධ බලයක් පිළිබිඹු කරයි.* අපට පාපයක් නොතිබුණද, අප සෑම කෙනෙකුම තනි තනිව තවමත් අසම්පූර්ණ වනු ඇත. නායකත්වය සඳහා දෙවියන් වහන්සේ සභාවට දෙන සෑම පුද්ගලයෙකුම සමස්තයේ රටාව සහ බලය පිළිබිඹු කිරීම සඳහා අන් අය සමඟ මිශ්‍ර වී සමමුහුර්ත වීමට අදහස් කර ඇත. 1 කොරින්ති 12:12-27 හි අපට පෙනෙන පණිවිඩයේ හරය මෙයයි: ශරීරයේ කිසිදු කොටසක් අනවශ්‍ය නොවේ; ශරීරයේ කිසිම කොටසක් අනෙක් කොටසට වඩා වැදගත් නොවේ. අප සභාව ශරීරයක් ලෙස හැඳින්වීමට නම්, අවශ්‍ය සියලුම කොටස් ඉදිරිපත් විය යුතුය, ක්‍රියාත්මක විය යුතුය, සහ අනෙක් අය සමඟ සමමුහුර්ත එකඟතාවයකින් සිටිය යුතුය.

*බයිබලානුකුල නායකත්වය උන්වහන්සේගේ සෙනඟගේ මනා වටකුරු සහ පරිපූර්ණ බලගැන්වීමක් සඳහා දෙවියන් වහන්සේගේ හොඳම විධිවිධානය පිළිබිඹු කරයි.* එපීස 4:11 දෙවියන්වහන්සේගේ සෙනඟව ඇදහිල්ලෙන් සහ ජීවිතයෙන් සවිබල ගැන්වීම සඳහා යේසුස්වහන්සේ ශරීරයට දී ඇති මිනිසුන් වර්ග පහක් ගෙනහැර දක්වයි: අපෝස්තුළුවරුන්, අනාගතවක්තෘවරුන්, එවැන්ජලිස්තවරුන්, දේවගැතිවරුන් සහ ගුරුවරුන්. මෙම පංචවිධ මිනිසුන්ගේ ආයතනික දේවසේවය තුළින්, දෙවියන්වහන්සේගේ සෙනඟ බඩගා යන මිථ්‍යාදෘෂ්ටිකත්වයෙන් ආරක්ෂා කර ඇති අතර, චංචල වීමේ අන්තරාය ජය ගන්නා

පරිණතභාවයක් ලබා දෙනු ඇත. එහි විශිෂ්ට ප්‍රතිඵලය නම්, **"අපි සියල්ලෝම දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන්ගේ ඇදහිල්ලේ එකමුතුකමටත්, පරිණත මනුෂ්‍යත්වයටත්, ක්‍රිස්තුස්වහන්සේගේ පූර්ණත්වයේ උස ප්‍රමාණයටත් ළඟාවීමයි" (එපී. 4:13)**.

මම නායකත්වයේ මෙම පැති පහ "කාර්යයන්" ලෙස හඳුන්වමි, ක්‍රිස්තුස්වහන්සේගේ ජනයාට අවශ්‍ය සියල්ල සැපයීමට ඒවායින් පහම එකිනෙකට පරායත්ත ක්‍රියාකාරකම්වල යෙදිය යුතුය. අපෝස්තලික කර්තව්‍යය සභාව් අපෝස්තලික අරමුණ පිළිබඳ මතක් කිරීමක් සපයයි: අප මෙහි සිටින්නේ අප වෙනුවෙන් හෝ ලෝක ඉතිහාසයේ සලකුණක් තැබීමට නොව, නමුත් ආරම්භයේ දී දෙවියන් වහන්සේ විසින් සංවිධානය කරන ලද, ඉතිහාසයේ මංපෙත් තුළින් ගෙනා සහ යේසුස් වහන්සේ තුළ ඉටු වූ උන්වහන්සේගේ නැවත පැමිණීමේදී සම්පූර්ණ වන දෙවියන් වහන්සේගේ ගැලවීමේ පොරොන්දුව සඳහා ය. අනෙකුත් කාර්යයන් හතර නිවැරදි කිරීම, එවැන්ජලිස්ත ආශාව, රැකවරණය හෝ ඉගැන්වීමේ සේවා සපයයි. නමුත් අවසානයේදී සභාවට ක්‍රිස්තුස් වහන්සේගේ ත්‍යාගයේ සම්පූර්ණ අභිප්‍රාය ක්‍රියාත්මක කිරීම සඳහා ක්රියා පහේම බලපෑම අවශ්‍ය වේ.

*ශුභාරංචියේ පාර්ශ්වික ව්‍යාප්තියේදී සහ එම නිසා සභාවේ වර්ධනයේදී ආත්මය සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට හොඳම මාර්ගය බයිබලානුකූල නායකත්වයයි.* සභාවේ අත්‍යවශ්‍ය උපායමාර්ගික ස්වභාවය සැමවිටම අපෝස්තලිකයි! වෙනත් වචන වලින් කිවහොත්, දෙවියන්වහන්සේගේ සෙනඟ යවන ලද සෙනඟක් වන අතර, අපෙන් ඕනෑම අයෙකු කොහේ ගියත්, තමන්ව ප්‍රතික්ෂේප කිරීමට, තමන්ගේම ජීවිතය රැගෙන උන්වහන්සේව අනුගමනය කිරීමට මිනිසුන්ට ආරාධනා කිරීමට යේසුස්වහන්සේ විසින් අපට නියෝග කර ඇත. එම ඇමතුම දෙවියන් වහන්සේට ප්‍රතිචාරයක් වනු ඇත, ශුද්ධාත්මයාණන් එය ඔවුන්ට පැහැදිලි කරයි, නමුත් දෙවියන් වහන්සේගේ සෙනඟ උන්වහන්සේගේ සැලසුමට ප්‍රධාන වේ. දෙවියන් වහන්සේ සැලසුම් කර ඇත්තේ ක්‍රිස්තුන් වහන්සේගේ සියලු මිනිසුන් තුළින් ශුභාරංචිය ලොව පුරා සිටින මිනිසුන්ට දැකීමට, ඇසීමට සහ අවබෝධ කර ගැනීමට ය. සභාව අපගේ කීකරු ගමනේදී සෑම කෙනෙකුටම ශුභාරංචිය වෙත ප්‍රවේශය ලබා දෙයි.

*ගෞරවනීය නායකයින්ගේ සෞඛ්‍යයට අහිතකර අනුගාමික රටාවන්ට ආවේණික වූ අන්ත අන්තරාය වළක්වා ගැනීමට හොඳම ක්‍රමය බයිබලීය නායකත්වයයි.* බොහෝ විට, ඔවුන්ගේ නායකයින්ගේ ආදර්ශය නිසා ක්‍රිස්තුස් වහන්සේව අනුගමනය කරනවාට වඩා, මිනිසුන් නායකත්වයේ සිටින ඇතැම් පුද්ගලයින් අනුගමනය කරයි, ඔවුන් සභාවට සේවකයන් ලෙස පමණක් ලබා දී ඇත (මතෙ. 20:25-28 බලන්න).

මේ අනුව ක්‍රිස්තුස් වහන්සේගේ ශරීරය තුළ නායකත්වය, සෑම විටම පුද්ගලයන් කිහිප දෙනෙකුගෙන් සමන්විත විය යුතුය, සෑම විටම එකිනෙකාට වෙනස් මිනිසුන් භාවිතා කරමින්, සෑම විටම අනෙක් සෑම නායකයෙකු සමඟම අන්‍යෝන්‍ය වශයෙන් ජීවත් වන, දෙවියන් වහන්සේගේ සෙනඟ ඔවුන්ගේ අරමුණ තුළ පරිණත කිරීම කෙරෙහි සැමවිටම අවධානය යොමු කරන, තම ස්වාමියාගේ ශුභාරංචිය අවට ලෝකයට ගෙනයාමට සහ නායකත්වයේ සිටින අයට වඩා සැමවිටම ස්වාමීන් වහන්සේව මහිමයට පත් කරන කායකත්වයක් විය යුතුයි. අද බටහිර ලෝකයේ සභාවට එවැනි බයිබල් නායකත්වයක් අවශ්‍ය වේ.

# 6

# සභා නායකත්වය තුළ අන්තර් යැපීම

නව ගිවිසුමේ නායකත්වයේ හරය වන අන්තර් යැපීම එය නව ගිවිසුමේ මූලික ඉගැන්වීමක් සහ සභාව සඳහා දිව්‍යමය සැලැස්මේ කොටසක් වුවද නායකයින්ට ගිල ගැනීමට පහසු පෙත්තක් නොවේ. නායකත්වය පුරුදු පුහුණු කර ඇත්තේ ශුද්ධ ලියවිල්ලට වඩා සම්ප්‍රදායෙන් සහ අප අවට ලෝකයෙන් එන ක්‍රමයකින්ය. එහෙත්, **"ඔබ අතරේ එසේ නොවනු ඇත" (මතෙ. 20:26)** යනුවෙන් යේසුස් වහන්සේ පැවසූ විට එය උන්වහන්සේ අවධාරණය කළ සේක.

ගෝලයන්ගේ නායකත්වය පිළිබඳ අදහස් ඔවුන් වටා ඇති යුදෙව් සහ රෝම සංස්කෘතීන් විසින් ගොඩනගා තිබූ අතර, ඒ දෙකම ඉහළ සිට පහළට වූ අතර ඉහළින් සිටින අයට බලය සහ ඒ සමඟ ඇති සියලු පහසුකම් ලබා දුන්නේය. නමුත් යේසුස්වහන්සේ ඉගැන්වූ සහ ජීවත් වූ නායකත්වය පෞද්ගලික ලෞකික බලය හෝ උගුල් ගැන නොව අන් අයට සේවය කිරීම - දෙවියන් වහන්සේ විසින් නිර්මාණය කරන ලද ඔවුන්ගේ ත්‍යාග, හැකියාවන් සහ අවශ්‍යතා වර්ධනය කර ගැනීම- සම්බන්ධව විය. එමනිසා, මතෙව් තවදුරටත් පවසන පරිදි, ක්‍රිස්තුස් වහන්සේගේ ගෝලයන් සේවකයන් සහ වහලුන් විය යුතු අතර, යේසුස්වහන්සේගේ ආදර්ශය අනුගමනය කළ සහ අන් අය වෙනුවෙන් තමන්වම කැප කළ යුතු මිනිසුන් විය.

සැබවින්ම අන්තර් පරායත්ත නායකත්වය කෙබඳු දැයි අපි තවමත් අපේ පරම්පරාව තුළ සම්පූර්ණයෙන් දැක නැත. නමුත් එය එහි දිව්‍යමය සැලැස්ම හෝ දෙවියන්වහන්සේගේ අපේක්ෂාව වෙනස් නොකරයි. එසේ නම් නායකත්වය තුළ එකිනෙකා මත යැපීම යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?

### අන්තර් යැපීම: එය නොවන්නේ කුමක්ද සහ එය කුමක් වන්නේද?

SCP නායකත්වයේ අන්තර් යැපීම ගැන කතා කරන විට, අප අදහස් නොකරන අවම වශයෙන් කරුණු දෙකක් තිබේ.

පළමුව, අප අදහස් කරන්නේ අන්තර් යැපීම යනු නායකත්වයේ සිටින අය අතර චිත්තවේගීය හැඟීමක් හෝ, වෙනත් වචනවලින් කිවහොත්, ඔවුන් හුදෙක් එකිනෙකාට කැමති බව නොවේ. එය දැඩි ලෙස සරල කිරීමක් වනු ඇත. ඇත්ත වශයෙන්ම, නායකයින්ට ඔවුන් සමඟ වැඩ කරන පුද්ගලයින්ට කැමති *නොවන* නමුත් ප්‍රේමයේ මාර්ගය තෝරා ගැනීමටත්, එකිනෙකා සමඟ පොහොසත් අන්තර් රඳා පැවැත්මක් වර්ධනය කර ගැනීම සඳහා ඔවුන් සමඟ වැඩ කිරීමට දෙවියන් වහන්සේගේ ආයාචනය පිළිගැනීමටත් හැකි විය හැකිය. අපි අපේ හැඟීම්වලට වුවමනාවට වඩා බලපෑමට ලක් වූ පරම්පරාවක්ය. ඇත්ත වශයෙන්ම, අපගේ පරම්පරාව අපට උගන්වා ඇත්තේ සත්‍යයට, නැතහොත් කිතුණුවන්ට අනුව, නම් දෙවියන් වහන්සේගේ වචනයට වඩා හැඟීම්වලට අනුව ක්‍රියාකරන ලෙසය. යාකොබ් සහ යොහන් මතෙව් 20:20-28 හි යාකොබ් සහ යොහන් යේසුස් වහන්සේගේ දකුණු සහ වම් දෙතින් වාඩි වීමට කැමති බව ගෝලයන් දස දෙනෙකුට ආරංචි වූ විට, ඔවුන් එකිනෙකාට අකමැති වූවා පමණක් නොව; යාකොබ් සහ යොහන්ගේ ක්‍රියා නිසා ඔවුන් කෝපයටද පත් වූහ. කෙසේවෙතත්, අවට ලෝකය ප්‍රදර්ශනය කළාට වඩා වෙනස් ප්‍රතිචාරයක් සහ ක්‍රියාවක් සඳහා ඔවුන්ව කැඳවනු ලැබූ බව යේසුස්වහන්සේ ඔවුන්ට මතක් කර දුන් සේක.

දෙවනුව, අන්‍යෝන්‍ය වශයෙන් යැපීම අනිවාර්යයෙන්ම සම්බන්ධතාවය හෝ මිත්‍රත්වය සමඟ සම්බන්ධයක් ඇති බව අපි අදහස් නොකරමු. බොහෝ අය පවසන්නේ, "අපි එකිනෙකාට කැමතියි, එකිනෙකා සමඟ හොඳ මිතුරන්; ඒ නිසා අපි හොඳ කණ්ඩායමකි." ඇත්ත වශයෙන්ම, කීකරුකම සහ දේවසේවය සඳහා ක්‍රිස්තුස් වහන්සේගේ සෙනඟට පහසුකම් සැලසීම ලුහුබැඳීමේදී මම සම්බන්ධතාවය අඩුවක් ලෙස නොපවසමි. මම සරලවම පවසන්නේ නායකයින් ලෙස අපව වඩා ඵලදායී කරන්නේ සබඳතා පැවැත්වීම පමණක් නොවන බවයි. ඒ වෙනුවට, අප එකිනෙකා සමඟ සම්බන්ධතා පවත්වන්නේ අප සෑම කෙනෙකුම දෙවියන් වහන්සේගේ දරුවෙකු වන නිසාත්, නායකත්වයේ දී දෙවියන් වහන්සේගේ දරුවන් සහ උන්වහන්සේගේ ලෝකයේ ඔවුන්ගේ වගකීම භාර ගැනීමට අප එකට කැඳවනු ලැබන නිසාත්ය.

සභාවේ නායකත්වය සඳහා දිව්‍යමය සැලසුමේ අංගයක් ලෙස අන්‍යෝන්‍ය යැපීම ඇතැයි අප පවසන විට අප අදහස් කරන්නේ කුමක්ද? අන්‍යෝන්‍ය වශයෙන් යැපීම දේවත්වයේ ස්වභාවයයි. දෙවියන් වහන්සේ පියාණන් වහන්සේ, පුත්‍රයා වන දෙවියන් වහන්සේ සහ ශුද්ධාත්මයාණන් වහන්සේ වන දෙවියන්වහන්සේ එකිනෙකා අතර යැපීම සඳහා නායකත්වය දෙන අතර එම නිසා මෙම ගුණාංගය පෙනෙන්නේ කෙසේද සහ එය ක්‍රියා කරන ආකාරය

පිළිබඳ අපගේ හොඳම උදාහරණයයි. දෙවියන් වහන්සේගේ දරුවන් වශයෙන්, අපව නිර්මාණය කර ඇත්තේ දෙවියන් වහන්සේගේ ස්වරූපය සහ සමානත්වය දැරීමට වන අතර, නායකත්ව කණ්ඩායමක සාමාජිකයින් එක්ව ක්‍රිස්තුස් වහන්සේගේ සෙනඟ මෙහෙයවන ආකාරය තරම් දිව්‍යමය සැලසුම පිළිබිඹු කිරීමේදී කිසිවක් උපායමාර්ගික වැදගත්කමක් නොදරයි. බයිබලයේ කථාන්දරය යනු සියලු මැවිල්ල තමා වෙත ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා ඒකපාර්ශ්විකව ක්‍රියා කරන පියාණන් වන දෙවියන්ගේ කතාවයි - උන්වහන්සේ එසේ කරන්නේ මුළු ත්‍රිත්වයේ අන්තර් ක්‍රියාවෙන්ය. පියාණන් වන දෙවියන් වහන්සේ පුනරුත්ථාපනය කිරීමට කැමැත්තක් දක්වයි, යේසුස් වහන්සේ මනුෂ්‍ය මාංසය ලබා ගැනීමෙන් පියාණන්ට කීකරු වේ, ආත්මයාණන් වහන්සේ දෙවියන් වහන්සේගේ සෑම දරුවෙකුටම පුත්‍රයාගේ මරණය, භූමදානය සහ නැවත නැඟිටීම අදාළ කරයි. ත්‍රිත්වයේ දෙවියන්වහන්සේගේ මෙම දිව්‍යමය සැලැස්ම බොහෝ විට ශුද්ධ ලියවිල්ල පුරා අන්තර් රඳා පැවැත්මෙන් ක්‍රියා කරන බව අපි දකිමු.

මෙම නිර්මාණයම වෙනත් සබඳතාවල දැකිය හැකිය. නිදසුනක් වශයෙන්, ලෝකය ගොඩනඟා ඇත්තේ මිනිස් ජීවය පවත්වා ගැනීමට දන්නා එකම ග්‍රහලෝකය වීමට පෘථිවියට ඉඩ සැලසීමට ප්‍රමාණවත් තරම් භෞතික අන්තර් රඳා පැවැත්මක් මත ය. දෙවියන් වහන්සේ විසින් ලබා දී ඇති විවාහය, පුරුෂයා සහ ස්ත්‍රිය එකිනෙකාට වෙනස් නමුත් මෙම සම්බන්ධතාවය පිටුපස ඇති දිව්‍යමය සැලසුම ඉටු කිරීමට ඉඩ සලසා දීම සඳහා ප්‍රමාණවත් ලෙස පුරුෂයා සහ ස්ත්‍රියගේ අන්තර් යැපීමක වේ: ප්‍රජනනය, සමීප සබඳතාව, රැකියාවේ හවුල්කාරිත්වය, සහ ස්වාමිපුරුෂයා සහ භාර්යාව ලෙස දෙවියන් වහන්සේගේ මහිමය ඉටු කිරීම දෙවියන් වහන්සේගේ දයාවේ මෙහෙයුමට සහභාගී වේ. ශරීරය තුළ ඇදහිලිවන්තයන් අතර ඇති සම්බන්ධතාවයේ හරය ද අන්තර් යැපීම වේ:

**"මක්නිසාද ශරීරය එකක්ව බොහෝ අවයව ඇතිවාක්මෙන්ද, ශරීරයේ සියලුම අවයව සියල්ල බොහෝ වුවත් එක ශරීරයක් තිබෙන්නාක් මෙන්ද, ක්‍රිස්තුස් වහන්සේත් එමේව සිටින සේක. මක්නිසාද යුදෙව්වරු නැතහොත් ග්‍රීකවරු වෙත්වා, දාසයෝ නෙහොත් නිර් දාසයෝ වෙත්වා අපි සියල්ලෝම එකම ආත්මයාණන් තුළ ශරීරයකට බව්තීස්ම කරනු ලැබ, සියල්ලෝ එකම ආත්මයකින් පොවනු ලැබිමුව. මක්නිසාද ශරීරය එක් අවයවයකින් නොව බොහෝ අවයව වලින් සමන්විත වේ." (1 කොරි. 12:12-14)**

ත්‍රිත්වයේ දෙවියන් වහන්සේ ශරීරයේ සෑම අවයවයකටම ශරීරය තුළ ඔහුගේ හෝ ඇයගේ සැලසුම් කළ අරමුණ ඉටු කිරීමට අවශ්‍ය සියල්ල ලබා දීමට එකිනෙකා මත රඳා පවතී:

**"ඉතින් නානා ප්‍රකාර දීමනා තිබේ , නමුත් එකම ආත්මයාණන් වහන්සේය; නානා ප්‍රකාර සේවය කිරීම් ඇත්තේය, නමුත් එකම ස්වාමීන්වහන්සේය. නානා ප්‍රකාර ක්‍රියා කිරීම් ඇත්තේය, නමුත් සියල්ලන් තුළෙහි සියල්ල කරන්වන්නේ එකම දෙවියන් වහන්සේය." (1 කොරි. 12:4-6)**

අන්‍යෝන්‍ය වශයෙන් යැපීම අදහස් කරන්නේ ප්‍රාදේශීය සභා තුළ පමණක් නොව ක්‍රිස්තුස්ගේ සමස්ත ශරීරය තුළත්ය. අද අපි සභාවක් ලෙස හඳුන්වන දෙය වඩාත් සුදුසු ලෙස සමූහයක් ලෙස හැඳින්විය හැක, එය සභාව ලෙස හඳුන්වන විශාල භූගෝලීය ආයතනයක සාමාජිකයෙකි. වෙනත් වචන වලින් කිවහොත්, නගරයක හෝ ප්‍රදේශයක ඇති එක සභාවක් එකිනෙකට යැපෙන සහා කිහිපයකින් සමන්විත විය යුතුය. ඇත්ත වශයෙන්ම, අපෝස්තුළුවරුන්ගේ ඉගැන්වීම් බොහොමයක් මෙම විශාල අන්‍යෝන්‍ය ආලෝකයෙන් දැකිය යුතුය, නැතහොත් දීමනා හෝ කාර්යාල හෝ මූල්‍ය භාරකාරත්වය පිළිබඳ නව ගිවිසුමේ ඉගැන්වීම එහි යෙදීම් ඒවා පැවැත්වීමට නොහැකි තරම් කුඩා පෙට්ටිවලට - එනම් ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ අනෙකුත් කොටස් වලින් හුදකලා වූ ප්‍රාදේශීය සභාවන් වලට - සරිලන සේ සකස් කිරීමට උත්සාහ කරමින් සිටිමු.

එපමණක් නොව, එපීස 4:11 හි ලැයිස්තුගත කර ඇති නායකත්වයේ කාර්යයන් පහ සැබවින්ම අර්ථවත් වන්නේ සභාව පිළිබඳ වඩා විශාල අදහස ගැන මිස අද අප සභාව කියා හඳුන්වන, නමුත් සැබවින්ම "සමූහයක්" වන දේ ගැන නොවේ. එපීස 4:12-16 පැහැදිලිව පවසන පරිදි, පුළුල් භූගෝලීය විශාල න්‍යාසය හරහා පමණක් තේරුම් ගත හැකි මෙම කාර්යයන්, කාර්යයන් කිරීමට හෝ කිසිවකුගේ වැදගත්කම ඉහළ නැංවීමට එතරම් දෙයක් ලබා නොදෙන නමුත්, පවතින සභාවල අන්තර් රඳා පැවතීම් හරහා ක්‍රීඩාව හරහා විශාල භූගෝලීය සභාව තුළ, දේවසේවයේ කාර්යය කිරීමට ශුද්ධවන්තයන්ට බලය ලබා දීම සහ බයිබලානුකූල සත්‍යයට බැඳී සිටීමට ඔවුන්ට උපකාර කිරීම සඳහා ලබා දී ඇත. නායකත්වය මේ ආකාරයෙන් ක්‍රියාත්මක වන විට, මිනිසුන් තමන් කියන සහ කරන සෑම දෙයකදීම දෙවියන් වහන්සේගේ නියෝජිතයන් වීමට දෙවියන් වහන්සේ විසින් නියම කරන ලද සැලසුමට කීකරු වෙමින් වර්ධනය වේ.

ඩී. ඒ කාර්සන් යේසුස්වහන්සේ තම අනුගාමිකයන්ට අවනතව ගමන් කරන විට, ආත්මාරක්ෂාව පසෙකට දමා දෙවියන් වහන්සේගේ කැඳවීමේ පූර්ණත්වය වැලඳ ගන්නා විට ලබා දෙන ප්‍රීතිය ගැන අදහස් දක්වයි:

වැටී ඇති ලෝකයක මිනිස් ප්‍රීතිය හොඳම ලෙස තාවකාලික, නොගැඹුරු, අසම්පූර්ණ වනු ඇත. ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ තුළ දෙවියන් වහන්සේගේ ප්‍රේමයේ අත්දැකීම, අපව මවනු ලැබූ ප්‍රේමය, සංයමයකින් තොරව කීකරුකමෙන් නිකුත් වන අන්‍යෝන්‍ය ප්‍රේමය, මිනිස් පැවැත්ම අභිබවා යයි. පුත්‍රයාණන් තම ගෝලයන්ට තම ප්‍රීතිය ලබා දෙන්නේ විවික්ත පැකේජයක් ලෙස නොවේ. උන්වහන්සේ තම ප්‍රීතිය බෙදාගන්නේ ඔවුන් උන්වහන්සේගේ කීකරුකම, ස්වාර්ථය වෙනුවෙන් කැමැත්තෙන් මරණයට මුහුණ දෙන කීකරුකම බෙදාගන්නා තාක්කල්ය. 1

### අන්‍යෝන්‍ය යැපුම් ක්‍රියාකාරිත්වය වැඩි දියුණු කිරීම

නායකත්වයට යම් යම් ගුණාංග ඇති විට අන්තර් යැපීම වඩාත් පහසු වේ.

*අධ්‍යාත්මිකව පරිණත පුද්ගලයන් තුළ අන්තර් යැපීම ඵලදායී වේ.* පරිණත නායකයන් යනු අවධානයෙන් යුත් කනකින් සහ කීකරු හදවතකින් දේවවචනය තුළ කාලය ගත කර ඇති අතර මාංසයේ ව්‍යසනකාරී ආශාවන්ට එරෙහිව සටන් කිරීමේ හැකියාවෙන් වැඩෙන අයයි. **පාවුල් තිමෝතිට ලියන ලද ඔහුගේ පළමු ලිපියේ එවැනි නායකයින් විස්තර කරයි:**

**"මෙම කියමන විශ්වාසදායක ය: යමෙක් සභාවේ නායක තනතුරට ආශා වන්නේ නම්, ඔහු යහපත් වැඩකට ආශාවන්නේය යනු විශ්වාසනීය කියමනක්ය. එබැවින් නායකයෙකු තෙමේ නිර්දෝෂවූ, එක භාර්යාවකගේ ස්වාමිපුරුෂයාවූ, සිහියද පිළිවෙළක්ද ඇත්තාවූ , ආගන්තුක සත්කාරයට ලැදි, ඉගැන්වීමට සමර්ථව කෙනෙක්ව සිටින්ට ඕනෑය. ඔහු බේබද්දෙක් නොවූ, ගහගන්නෙක් නොවූ, ඉවසිලිවන්තවූ, ධබරකාරයෙක් නොවූ, වස්තු තෘෂ්ණාව නැත්තාවූ, තමාගෙම නිවස හොඳින් හසුරුවන්නාවූ, සියලු ආකාර සන්සුන්කම අත්තාවූ, ස්වකීය දරුවන් හික්මවා ගන්නාවූ තැනැත්තෙක්ව සිටිය යුතුය.(නමුත් යමෙක් තමාගේම පවුල හසුරුවා ගන්ට නොදන්නේ නම්, ඔහු දෙවියන් වහන්සේගේ සභාව රැකබලා ගන්නේ කෙසේද? ) ඔහු උඩඟු වී යක්ෂයාට පැමිණි දඬුවමට නොවැටෙන පිණිස අලුත් ගෝලයෙක් නොවිය යුතුය. ඇරත් නින්දාවටද, යක්ෂයාගේ මලපතටද නොවැටෙන පිණිස, ඔහු පිටස්තර අයවලුන්ගෙන් යහපත් සාක්ෂියක් ඇතුව සිටින්ට ඕනෑය." (1 තිමෝ. 3:1–7)**

නායකත්වය දරන අයට වගකීම අවශ්‍යය, ඔව්. කෙසේ වෙතත්, මෙම ආශාව දෙවියන් වහන්සේ විසින් මෙහෙයවිය යුතුය, නැතහොත් එය සැබවින්ම දූෂිත වනු ඇත.

ඉහත ඡේදයේ පරිණත නායකත්වයේ අනෙකුත් ගුණාංග පාවුල් විස්තර කරයි. නායකත්වයේ සිටින යමෙක් නින්දා අපහාසවලට වඩා ඉහළින් සිටිය යුතුය - සර්ව පරිපූර්ණ කෙනෙකු නොවිය හැකි නමුත් සැකය, අනුමාන ගති ඇති,චෝදනා ලබපු කෙනෙක් නොවිය යුතුය. 1 තිමෝති 5:19 හි පාවුල් මෙම කරුණට එකතු කරයි, සාක්ෂිකරුවන් නොමැතිව වැඩිමහල්ලෙකුට එරෙහිව චෝදනාවක් ඉදිරිපත් නොකරන ලෙස තිමෝතිට පවසයි. නායකයෙකු එක බිරිඳක් ඇති කෙනෙක් විය යුතුය; ඔහුගේ පක්ෂපාතිත්වය, විශ්වාසවන්තකම සහ ඔහුගේ භාර්යාව කෙරෙහි ඇති සැලකිල්ල පැහැදිලි විය යුතුය. ලෙහෙසියෙන් කෝපයට පත් නොවන නමුත් තමා සහ අන් අය සමඟ පවා හැසිරෙන මෘදු පෞරුෂයක් ඔහුට තිබිය යුතුය. සමහර දේවල් වලින් ඈත් වෙලා අනිත් දේවල් වලට වැඩ කරන තමන්ව පාලනය කරගන්න පුළුවන් විය යුතුයි. ඔහු අන් අය විසින් ගරු කළ යුතුය (මෙය සැමවිටම කැමති බව අදහස් නොවේ). ඔහු තම නිවස සහ පෞද්ගලික ස්ථාන අන් අය සමඟ බෙදා ගැනීමට කැමති විය යුතු අතර අන් අයට දෙවියන් වහන්සේගේ වචනය තේරුම් ගැනීමට උපකාර කිරීමට හැකි විය යුතුය, ඔහුගේ වගකීමේ කේන්ද්‍රස්ථානයක් ලෙස ඔවුන්ගේ පූජකත්වයේ ඇදහිලිවන්තයන් සවිබල ගන්වයි. ඔහු මත්පැන් පානය නොකරන කෙනෙක් විය  යුතුය. ඔහු මිනිසුන් සමඟ රළු නොවිය යුතුය, නමුත් සෑම අවස්ථාවකදීම මෘදු විය යුතුය (මෘදුකම සියල්ල විඳවීම යන අදහස නොව නොවේ). ඔහු වාද විවාදශීලී නොවිය යුතු අතර, ඔහු මුදල් හා එහි කීර්තිය, බලය සහ ආත්ම තෘප්තියට ආදරය නොකළ යුතුය. අධිකාරියට ප්‍රතිචාර දක්වන දරුවන් විසින් පෙන්නුම් කරන පරිදි ඔහුගේම පවුල හොඳින් කළමනාකරණය කිරීමට ඔහුට හැකි විය යුතුය.

මේ සියල්ල සිත්ගන්නාසුලු නිගමන දෙකකට යොමු කරයි: නායකයා ඇදහිල්ල තුළ නවකයෙකු නොවිය යුතු අතර, සභාවෙන් පිටත සිටින අය සමඟ පවා ඔහුට හොඳ නමක් තිබිය යුතුය. නායකයෙකු තරුණ ඇදහිලිවන්තයෙකු නොවිය යුත්තේ ඇයි? මක්නිසාද යත් ඉහත ගුණාංග ලබා ගැනීමට අවශ්‍ය පුද්ගලික අධ්‍යාත්මික ශික්ෂාවන් වර්ධනය කිරීමට කාලය ගතවන බැවිනි.

අපගේ සදාකාලික ඉරණම නොමේරූ නායකයින් වෙත යොමු නොකිරීමට සහ වැරදි සඳහා විශාල ඉඩක් නිර්මාණය නොකිරීමට අපි තරුණ ඇදහිලිවන්තයන්ට වර්ධනය වීමට කාලය ලබා දිය යුතුය. පාවුල් තිමෝතිට ලැයිස්තුගත කළ ගුණාංග නායකත්වයේ සහ පරිණතභාවයේ පවතින විට, පිටස්තරයින් පවා ඒවා හඳුනා ගනී. නායකත්වය කැඳවීම වෙතට සාතන්ගෙන් විශේෂ අන්තරායන් ඇති බැවින් සභාව නායකයින් තෝරා ගන්නා ආකාරය ගැන සැලකිලිමත් විය යුතුය. නායකයෙකුට මුල් සහ මාරාන්තික පාපය වන උඩඟුකම තුළ යෙදීමට පහසු අවදානමක් ඇත: දෙවියන් වහන්සේ මෙන් වීමට හෝ, වඩාත් පැහැදිලිව, දෙවියන් වහන්සේ

වීමට අවශ්‍යය (එසකියෙල්. 28:2 බලන්න). සංහාරයන් හා විනාශය ඇති කිරීමට සාතන්ට ඇති හොඳම මාර්ගය නම් ඇදහිල්ල පිළිබඳ පුද්ගලයෙකුගේ කීර්ති නාමය විනාශ කිරීමයි, විශේෂයෙන්ම ඇදහිල්ල වැඩිපුරම නියෝජනය කරන පුද්ගලයින් සම්බන්ධව.

*සේවයේ අවසාන ප්‍රතිඵලය කෙරෙහි අවධානය යොමු කළ හැකි සහ පක්ෂපාතී පුද්ගලයන් තුළ අන්තර් යැපීම ඵලදායී වේ.* එවැනි පුද්ගලයින්ට අන් අයගේ විවිධ දීමනා සහ කාර්යයන් අගය කිරීමට සහ වැලඳ ගැනීමට වඩා හොඳ හැකියාවක් ඇත. මම කතා කරන්නේ අන්ධ පක්ෂපාතිත්වය හෝ ක්‍රිස්තුස් වහන්සේ හැර වෙනත් පුද්ගලයෙකුට පක්ෂපාතීත්වය ගැන නොව, දෙවියන් වහන්සේගේ සභාව සඳහා දෙවියන් වහන්සේගේ සැලැස්ම - එය ලෝකයේ දෙවියන් වහන්සේගේ ප්‍රතිරූපය බව තේරුම් ගැනීමෙන් ඇති වන පක්ෂපාතිත්වයකි. එවැනි පක්ෂපාතීත්වයක් නායකයෙකුට ඔහුගේ සෙනඟ තුළ සිටින දෙවියන් වහන්සේගේ සියලු බුද්ධිමතුන් ලෝකයට මුදා හැරීම කෙරෙහි පැහැදිලිව සහ අඛණ්ඩව අවධානය යොමු කරවයි. නායකයෙකුට මෙවැනි පක්ෂපාතිත්වයක් තිබීම මඟින් මිනිසුන්ට නායකත්වය දීම එක් මිනිසෙකු, එක් ත්‍යාග කට්ටලයක් හෝ එක් කාර්යයක් ක්‍රියාත්මක කිරීමකට වඩා දේවල් අවශ්‍ය කාර්යයක් බව තේරුම්ගනු ඇත. ඇත්ත වශයෙන්ම, භූගෝලීය විෂය පථය පුළුල් වන තරමට, යේසුස් වහන්සේ මෙන් වීමට, එවැන්ජලිස්ත කිරීමේ කාර්යය කිරීමට සහ නව සභා වැඩි කිරීමට දැනට පවතින සභා සම්පූර්ණයෙන් බලමුලු ගැන්වීම සඳහා සියලුම කාර්යයන් පහම අවශ්‍ය වේ.

*සභාව හරහා ලෝකයේ දේව මෙහෙවර වන දේව මෙහෙවර ඔවුන්ගේ අන්තර් රඳා පැවැත්මේ වැදගත්ම ප්‍රතිඵලය බව තේරුම් ගන්නා පුද්ගලයන් තුළ අන්තර් යැපීම ඵලදායී වේ.* අනෙකුත් සියලු අපේක්ෂිත ප්‍රතිඵල, ලෝකය තුළ ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රතිරූපය බවට පත්වීමෙන් සහ දෙවියන් වහන්සේ ලෝකය මැවූ කාර්යය අවසන් කිරීමට එරෙහිව සභාව ව්‍යාකූල කරයි, දූෂණය කරයි, හෝ බාධා කරනු ඇත.

මගේ අධ්‍යාත්මික උපදේශකයින්, මම 1 වන පරිච්ඡේදයේ සඳහන් කළ පරිදි, මගේ පදනම සහ අභිප්‍රේරණය ලෙස ශුද්ධ ලියවිල්ල වෙත නිරන්තරයෙන් මට පෙන්වා දුන්හ. සභාව සඳහා දෙවියන්වහන්සේගේ අරමුණ මුල් බැසගෙන ඇත්තේ දෙවියන්වහන්සේගේ බයිබලානුකූල කථා වස්තුව තුළ පුරුෂයන් හා ස්ත්‍රීන් උන්වහන්සේගේ දිව්‍යමය සබඳතාවයක් සහ නියෝජනයක් වෙතට ප්‍රතිෂ්ඨාපනය කිරීමට උත්සාහ කිරීම තුල බව ඔවුහු වටහා ගත්හ. කෙසේ වෙතත්, අද සභාවේ සිටින විශාල බහුතරයකට, සභාව පිළිබඳ සහ එහි අරමුණ සඳහා

ඔවුන්ගේ මැදිහත්වීම මත පදනම්ව වැරදි අපේක්ෂාවන් සහ අදහසක් තුළ මුල් බැස ගැනීමට නායකත්වය විසින් ඉඩ ලබා දී ඇත.

මුල් සභාව නිර්වචනය කරන කිසිම දෙයක් ගැන මොවුන් බලාපොරොත්තු නොවෙති. ඒ වෙනුවට ඔවුන් නායකත්වයෙන් බලාපොරොත්තු වන්නේ ඔවුන්ට සභාවේ සිටීමට උනන්දුව ඇතිවන සේ සිතෙන හෝ අවශ්‍ය වන පරිදි ඕනෑම දෙයක් සහ සෑම දෙයක්ම කිරීමටය. වාහන නැවැත්වීමේ ව්‍යුහයන්, විශාල ගොඩනැඟිලි, පුළුල් වැඩසටහන් සහ උද්යෝගිමත් නමස්කාරය සහ ඉගැන්වීම් සේවා හරහා, බටහිර සභාව බොහෝ විට මිනිසුන්ට උගන්වා ඇත්තේ ඒ සියල්ල ඔවුන් ගැන බවය. මෙහි දී සභාව මිනිසාගේ ආවේණික ස්වච්ඡන්දවාදය සහ අපගේ සංස්කෘතියේ වැඩෙන ස්වයං කේන්ද්‍රීයත්වය සමඟ සහයෝගයෙන් කටයුතු කර එය උග්‍ර කර ඇත. යේසුස් වහන්සේගේ වදන් අනුව ක්‍රියා කිරීමට නායකත්වය දැන් මිනිසුන් කැඳවිය යුතුය.

මෙය පහත දේ ගැබ්වන්නාවූ දිගු මාර්ගයක් ගැන අදහස් කරනු ඇත

<u>• නාමිකව පමණක් නොව ඇත්ත වශයෙන්ම ඇදහිලිවන්තයන් නොවන බොහෝ මිනිසුන් වෙත නැවත ශුභාරංචිය ප්‍රකාශ කිරීම,</u>

<u>• බොහෝ දෙනෙකුට ඔවුන් තේරුම් ගත් පරිදි ඇදහිල්ල වැරදි බව අවබෝධ කර ගැනීමට උපකාර කිරීම සහ</u>

<u>• සියලු මිනිසුන් ඔවුන්ගේ ජීවිතයේ දෛනික කටයුතු වල කේන්ද්‍රයේ දෙවියන් වහන්සේ සමඟ ඇති සම්බන්ධය තැබීම සඳහා නැවත හැඩගැස්වීම.</u>

*අධ්‍යාත්මික ප්‍රායෝගිකත්වය එහි හරය බව වටහා ගන්නා පුද්ගලයන් තුළ අන්තර් යැපීම ඵලදායී වේ.* නායකත්ව කණ්ඩායමේ අය අතර මිත්‍රත්වය සහ සබඳතාව වැදගත් නමුත් අවසානයේ නායකත්වය දිව්‍යමය අරමුණක් සඳහා කැඳවා දෙවියන්ට අයත් මිනිසුන් මැද වගකීම පවරා ඇත. නායකයින්ගේ කර්තව්‍යය වන්නේ, පළමුව දෙවියන් වහන්සේගේ සෙනඟ සමඟත්, පසුව උන්වහන්සේ අපට ජීවත් වීමට දුන් ලෝකය සමඟත් යමක් කර ගැනීමයි.

නායකයින් යනු දෙවියන් වහන්සේගේ සෙනඟව උන්වහන්සේගේ මුල් සැලසුමට පෝෂණය කරන්නන්ය: උන්වහන්සේ සමඟ සම්බන්ධතාවය සහ උන්වහන්සේව නියෝජනය කිරීම. යේසුස් ක්‍රිස්තුස් වහන්සේ තුළ මෙම මුල් සැලසුම ප්‍රතිෂ්ඨාපනය කරන ලදී, මන්ද උන්වහන්සේ නව ලෝකය ගෙන එන විට එය වඩාත් සම්පූර්ණ වනු ඇත. උන්වහන්සේගේ සෙනඟ තුළ ශුද්ධාත්මයාණන් වාසය කරන අතර, එබැවින් උන් වහන්සේට අවශ්‍ය පුද්ගලයන්

බවට පූර්ණ ලෙස වැඩීමට උන්වහන්සේ සමඟ සහයෝගයෙන් කටයුතු කළ හැකිය. කෙටියෙන් කිවහොත්, දෙවියන් වහන්සේගේ සෙනඟට ඔවුන්ගේ ගැලවුම්කරු වන යේසුස් ක්‍රිස්තුස්ගේ මාර්ගය අනුගමනය කළ හැකි අතර පරිත්‍යාගශීලී හා සේවයේ ජීවිතයක් ගත කළ හැකි අතර, නායකත්වයේ කර්තව්‍යය වන්නේ එය කිරීමට ඔවුන්ට උපකාර කිරීමයි. ආත්මයාණන් වන දෙවියන්වහන්සේ මෙය කුඩා පුද්ගල ජීවිතවල මෙන්ම විශාල සභා සහ සභාවල උන්වහන්සේගේ පණිවිඩය වැඩි කිරීමට සහ අන්‍යයන් තමන් වෙතට ගෙන ඒමට භාවිතා කරයි.

අවසානයේදී, නායකත්වය කැඳවනු ලබන්නේ ජේසුස් වහන්සේගේ අනුගාමිකයින්ට ඔවුන් පාපොච්චාරණය කර ඇති ඇදහිල්ලට අනුකූලව ජීවත් වීමට උපකාර කිරීම සඳහා ය. නව ගිවිසුමේ සහ ග්‍රීක විශාරද මෙරිල් ටෙනී යොහන් පොතෙන් නිරීක්ෂණය කරන්නේ අප ප්‍රකාශ කරන ඇදහිල්ල සහ අප ජීවත් වන ජීවිත අතර සියුම් නර්තනය පිළිබඳ මෙම ප්‍රබල අවබෝධයය: [ඇදහිල්ල සඳහා] යටින් පවතින ග්‍රීක් වචනය වන pisteuo, (පිස්ටෙයෝ) ශුභාරංචියේ වාර අනූඅටකට නොඅඩු ලෙස භාවිතා වේ සහ චාරිත්‍රානුකූලව විශ්වාස කිරීම ලෙස පරිවර්තනය කර ඇතත්, අවස්ථා කිහිපයකදී එය විශ්වාසය හෝ කැපවීම ලෙසද නිර්වචනය කර ඇත. කිසිවිටෙක එය ප්‍රස්තුතයකට හුදු අනුමැතියක් අදහස් නොකරයි. එය සාමාන්‍යයෙන් අදහස් කරන්නේ යම්කිසි පුද්ගලික හිමිකම් පෑමක් හෝ යම් පරමාදර්ශයක් හෝ පුද්ගලයෙකුට සම්පූර්ණ පුද්ගලික කැපවීමක් පවා පිළිගැනීමයි. යොහන්, ඓතිහාසික කථාංග වූ සහ ඒවා පිටුපස ඇති අධ්‍යාත්මික යථාර්ථය ද ඇඟවුම් කරන සැබෑ සංඥා මත පදනම් වූ ස්ථාවර ඇදහිල්ලකට තම පාඨකයන්ව යොමු කිරීමට උත්සාහ කළේය.

මෙම අවසානය ජීවිතය යන වචනයෙන් ප්‍රකාශ කර ඇත. ජීවිතය, zoe, හතරවන ශුභාරංචිය තුළ, සත්ව ජීව ශක්තිය හෝ මිනිස් පැවැත්මේ ගමන් මගට වඩා වැඩි යමක් අදහස් කරයි. එය යොහන් 17:3 හි ජේසුස් වහන්සේ විසින් ප්‍රවේශමෙන් අර්ථ දක්වා ඇත. . . . එසේ නිර්වචනය කර ඇති ජීවිතයට විවිධ අංග ඇත. එය විඥ්ඥාණය ඇඟවුම් කරයි: සවිඥ්ඥාණික පැවැත්මෙන් තොරව දැනුමක් නොමැති බැවිනි. තවද, එය ස්පර්ශය සංකේතවත් කරයි: යමෙකුට ඍජු හෝ වක්‍ර සම්බන්ධතා නොමැති දේවල් අල්ලා ගත නොහැක. නැවතත්, එයට අඛණ්ඩතාව හෝ කාලසීමාව ඇතුළත් වේ, මන්ද දෙවියන් වහන්සේ පිළිබඳ දැනුම උන්වහන්සේ සමඟ සහජීවනය පූර්වාදර්ශණය කරයි. අවසාන වශයෙන්, එය සංවර්ධනය උපකල්පනය කරයි, මන්ද දෙවියන් වහන්සේ පිළිබඳ දැනුම වර්ධනය විය යුතු අතර ස්ථිතික

දෙයක් නොවේ. සදාකාලික ජීවිතය, මිනිසාගේ සම්පූර්ණ ඉරණම, මෙම ශුභාරංචියේ ඉගැන්වීමේ පරමාර්ථය වේ. [2]

අන්තර් පරායත්ත නායකත්වය ශුභාරංචිය සමඟ ලෝකයට ළඟා වීමේ වරම පැහැදිලිව දකින අතර එය ඉටු කිරීමට අවශ්‍ය ඕනෑම දෙයක් කිරීමට ප්‍රායෝගිකව ගමන් කරයි. ඔවුන් මුදල්, දේපළ, මිනිසුන් සහ අවස්ථා ආයෝජනය කරන්නේ මෙම ප්‍රතිඵලය අනුව සහ ශුද්ධාත්මයාණන්ගේ දෛනික මඟ පෙන්වීම යටතේය. කීර්තිය අත්කර ගැනීම, මිනිසුන්ගේ කැමැත්ත ලබාගැනීම, ප්‍රීතිමත් මිනිසුන් සහතික කිරීම සහ අපමණ දේපළ අත්පත් කර ගැනීම යන සියල්ල සභාවේ වැදගත්ම කර්තව්‍යයේ අවධානය වෙනතකට යොමු කරයි: එය නම් දෙවියන් වහන්සේගේ දිව්‍යමය සැලැස්ම සහ අපගේ ගැලවුම්කරුවාගේ අවසාන නියෝගය ඉටු කිරීම වේ.

*නායකත්ව කණ්ඩායම් ගොඩනඟන්නේ ශුද්ධාත්මයාණන් බව වටහා ගන්නා පුද්ගලයින් තුළ අන්තර් යැපීම ඵලදායී වේ.* නායකත්ව කණ්ඩායම නිර්මාණය කළ යුත්තේ සභාවක් විසින් තමන්ගේම දැක්ම පුළුල් කිරීමට හෝ, වඩාත් නරක ලෙස එහි වැඩසටහන් මෙහෙයවීමට උපකාර කිරීමට අපේක්ෂාවෙන් නොවේ. සභාව විසින් නායකත්වය සඳහා කැඳවීමට නියමිතව ඇත්තේ උත්පත්ති පොතේ සිට එළිදරව්ව දක්වා දෙවියන් වහන්සේගේ දිව්‍ය ප්‍රතිභාව අල්ලාගෙන උන් වහන්සේට කීකරුව සිටින අයයි. ආත්මයාණන්වහන්සේ තුළින් ඔවුන්ව එකතු කරන්නේ දෙවියන් වහන්සේ බව සභාව අවබෝධ කර ගත යුතු වුවද, මිනිසුන්ට සම්බන්ධතාවය සහ නියෝජනය ප්‍රතිෂ්ඨාපනය කිරීමේ දෙවියන් වහන්සේගේ අරමුණ වැළඳ ගන්නා අය ගැන එය විමසිල්ලෙන් සිටිය යුතුය. නායකත්වය ගොඩනැගීම සම්බන්ධයෙන් සභාව බොහෝ විට හොඳ තත්වයක නොසිටියේය, නමුත් නායකත්වය සඳහා දෙවියන් වහන්සේ විසින් කැඳවන ලද අය ලොව පුරා විසිරී සිටින අතර, අන් අය තමන්ව හඳුනා ගැනීමට, දර්ශනය කිරීමට, පුහුණු කිරීමට සහ නිදහස් කිරීමට තමන්ව අඳුනා ගන්නා තුරු බලා සිටිති. අපගේ අරමුණ ආත්මයාණන්වහන්සේ ඔවුන් වෙතට අපව ගෙන යාමට ඉඩ දීමයි.

### නායකත්වය වෙතට අද්විතීය කැඳවීම

අන්‍යෝන්‍ය යැපීම ඵලදායි කිරීමට උපකාරී වන නායකත්වය සඳහා වූ අද්විතීය ඇමතුම වඩාත් විස්තරාත්මකව සලකා බැලිය යුතුය. *1 කොරින්ති 12 හි සඳහන් පරිදි ආත්මයේ දීමනා සියල්ලන්ට ලබා දී ඇති ක්‍රිස්තුස් වහන්සේගේ සෙසු සෙනඟ සමඟ ඔවුන්ට සාපේක්ෂව ස්වල්ප දෙනෙකුගෙන් පමණක් සමන්විත, එපීස 4:11 හි ක්‍රියා පහ ඇති අය පටලවා නොගන්නා පුද්ගලයින් තුළ අන්තර් යැපීම ඵලදායී වේ.* නායකත්ව ක්‍රියාකාරකම් ඇති අය සහ ක්‍රිස්තුස්

වහන්සේගේ ශරීරයේ අනෙකුත් සාමාජිකයන් අන්‍යෝන්‍ය වශයෙන් යැපෙමින් ක්‍රියා කළ යුතුය, නමුත් එපීස 4:11 හි කාර්යයන් ඉටු කරන අය ශරීරයේ අනෙක් සියල්ලන්ට වඩා වෙනස්ව සංකල්ප තුනක් දරයි.

පළමුව, එපීස 4:11 නායකත්වය ක්‍රියාත්මක කිරීමට කැඳවූ අය, අප සටහන් කර ඇති පරිදි, ක්‍රිස්තුස් වහන්සේ විසින් සභාවට දෙනු ලබන්නේ දේවසේවයේ කාර්යයේ දී සභාව සවිබල ගැන්වීම සඳහා සහ ක්‍රිස්තුස් වහන්සේ සහ උන් වහන්සේ තුළ සහ උන්වහන්සේගේ වචනය තුළ වැඩෙන දැනුවත්භාවය සහ ජීවිතය තුළ මුල් බැස ගැනීමට මිනිසුන්ට උපකාර කිරීම සඳහා සිටිති: **"උන්වහන්සේ සමහරුන් ප්‍රේරිතයන්ද, සමහරුන් අනාගතවක්තෘවරුන්ද, සමහරුන් ශුභාරංචිය ප්‍රකාශ කරන්නන්ද, සමහරුන් සභා පාලකයන්ද, සමහරුන් ගුරුවරුන්ද කොට දුන්සේක. එසේ දුන්නේ ඇදහීමේද දෙවියන් වහන්සේගේ පුත්‍රයා දැනගැනීමේද එකමුතුකමටත්, සම්පූර්ණ පුරුෂකමටත්, ක්‍රිස්තුස් වහන්සේගේ සම්පූර්ණවූ උස මහතේ ප්‍රමාණයටත් අප සියල්ලන් අප සියල්ලන් පැමිණෙනතෙක්..." (එපීස 4:11-12)**.

දෙවනුව, ආත්මයාණන් වහන්සේ කාර්යයන් පහක් ඇති අයට දීමනා ලබා දෙයි. මන්ද මෙම පුද්ගලයින් මුල් ක්‍රිස්තුස් අනුගාමිකයන් වන අතර, ශුද්ධාත්මයාණන්ගෙන් පිරී ඇත. එබැවින් සෑම නායකයෙකුටම කාර්යයක් ඉටු කරන අතරම, සෑම කෙනෙකුටම ඔහුගේ හෝ ඇයගේ දේවසේවයදී සුවිශේෂී වන දීමනා ද ඇත. නායකත්ව කණ්ඩායමේ දීමනා පසුව එකට එකතු වී, අද්විතීය ලෙස මිශ්‍ර කර, නිර්මාණය කර, ශරීරය තුළ ආත්මයාණන්වහන්සේ විසින් සවි කර ඇති පියාණන්ගේ කැමැත්ත වඩාත් හොඳින් ඉටු කිරීම සඳහා ලෝකයේ තබා ඇති විවිධාකාර දීමනා බවට පත්වේ. දීමනා යනු නායකත්වයට එහි කාර්යයන් ඉටු කිරීමට හැකි වන එන්ජිම බව අපට පැවසිය හැකිය.

*අපෝස්තලික කර්තව්‍යය* විශේෂයෙන්ම නව ස්ථානවල ශුභාරංචියේ නිරන්තර ව්‍යාප්තියට හේතු වන අතර සහ එහි ප්‍රතිඵලයක් ලෙස නව සභා රෝපණය වේ. *ප්‍රොපේතමය කාර්යය* මගින් ශරීරයට කීකරුකමට කැඳවීමට මෙවලම ලෙස සම්පූර්ණ කරන ලද දැනුම භාවිතා කරමින් ක්‍රිස්තු ශරීරයේ අනතුර සහ නිවැරදි කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව සභාව දැනුවත් කරයි. *එවැන්ජලිස්ත කාර්යය* ශුභාරංචියේ ස්වභාවය ශරීරය තුළට සහ ශරීරය හරහා ගමන් කරවයි; මෙම කාර්යය ඇති අය ක්‍රිස්තුස් වහන්සේ වෙතට නව මිනිසුන් දිනා ගැනීම දැකීමට මඟ පෙන්වන අතර, ඒ හා සමානව වැදගත් ලෙස, එක් එක් පුද්ගලයාගේ සාක්ෂිය පිළිබඳව ශරීරය දැනුවත්ව හා අවධානයෙන් තබා ගනී. *එඬේර කාර්යය* මිනිසුන්ගේ රැකවරණය එකිනෙකාගේ අවශ්‍යතා ගැන ශරීර සාමාජිකයන් තුළින්, හරහා සහ ගැන පියවර ගනිමින්

මෙහෙයවයි. *ඉගැන්වීමේ කාර්යය* එක් එක් සාමාජිකයා බැඳී ඇති පදනම සහ ඔහු හෝ ඇය ජීවත් වන සීමාව ලෙස බයිබලානුකූල සත්‍යය තබා ගැනීමේ අවශ්‍යතාවය ගෙන යයි. එහෙත් නායකත්ව කණ්ඩායමේ දීමනා අද්විතීය හා විවිධාකාර බැවින්, එක් එක් පුද්ගලයා ඔහුගේ හෝ ඇයගේ කාර්යය ඉටු කරන ආකාරය වෙනස් වේ.

තෙවනුව, අප දැක ඇති පරිදි, කාර්යයන් පහක් ඇති අය, සභාවේ බොහෝ සාමාජිකයන් මෙන් සභාවේ ප්‍රාදේශීය ප්‍රකාශනවලට පමණක් නොව, ක්‍රිස්තුස් වහන්සේගේ ශරීරයේ වඩා පුළුල් ජීවිතයක් වෙතට ලබා දී ඇත. පාවුල්, යොහන්, පේතෘස් සහ යාකොබ් වෙනත් කණ්ඩායම් ඔවුන් සමඟ ඕනෑම වේලාවක වැඩ කළ අතර පෙනෙන පරිදි කිසි විටෙකත් එකම වේලාවක එක් ස්ථානයක නොසිටියෝය. (එපීස 4:11 සඳහන් ක්‍රියාවන් ඇත්තාවූ අද ක්‍රියාත්මක වන අයවළුන් ක්‍රිස්තුස් වහන්සේ විසින් සෘජුවම තෝරනවා නොව සභාව හරහා උන් වහන්සේ විසින් යවනු හෝ තෝරනු ලබයි.) එබැවින් මෙම විශාල භූගෝලීය කාර්යයන් කරගෙන යාමට ක්‍රිස්තුස් වහන්සේ ලබා දුන් නායකත්වය අද අපි ප්‍රාදේශීය සභාවන් ලෙස හඳුන්වන නායකත්වය තුළ පවතින නායකත්වය සමඟ පටලවා නොගැනීමට අප වගබලා ගත යුතුය.

එපීසවරුන්ගේ සහ විශේෂයෙන් එපීස 4 ගැන විවරණ සහිතව අවබෝධයක් තිබීම, කාර්යයන් පහ යනු ප්‍රාදේශීය සභා නායකත්වය සඳහා පමණක්ය ලෙස ලෙස සිතීම අවම කරයි. පාවුල්, බානබස්, පේතෘස් සහ වෙනත් අය සමඟ අපට පෙනෙන පරිදි, නායකත්වය එක් ප්‍රදේශයකට කාලයකට සම්බන්ධ කළ හැකි වුවද, ඔවුන්ගේ දේවසේවය සැබවින්ම භූගෝලීය වශයෙන් වඩා පුළුල් ය. නව ගිවිසුමේ නායකයින් මුළු රෝම අධිරාජ්‍යය සහ ඉන්දියාවේදී තෝමස් මෙන් මුළු ලෝකයම කෙරෙහි අවධානය යොමු කර ක්‍රියාකාරී විය. බොහෝ දෙනා සිතනවාට වඩා කාර්ය පහක් ඉටු කිරීමට කැඳවනු ලැබූ පිරිස ඉතා අඩු බව මම විශ්වාස කරමි. ඔවුන්ගේ භූමිකාවන්හි පහසුකම් සපයන්නාවූ සහ පුළුල් භූගෝලීය ස්වභාවය, අන් අය සමඟ ඒකාබද්ධ වූ විට, ඔවුන් බොහෝ දෙනෙකුගෙන් ලෝකය ආවරණය කිරීමට ඉල්ලා සිටීමක් නොවනු ඇත.

ක්‍රිස්තුස් වහන්සේගේ සියලු මිනිසුන් මෙන්ම, ක්‍රියාවන් ඇති පුද්ගලයන්ට ආත්මයාණන් විසින් දෙන ලද දීමනා ද ඇති බැවින්, ඔවුන්ගේ බොහෝ කාර්යයන් ප්‍රාදේශීය මට්ටමින් ඔවුන්ගේ දීමනා හරහා ඉටු කළ හැකිය. නිදසුනක් වශයෙන්, සභාවේ අපෝස්තලික ස්වභාවය පිළිබඳ දැඩි අවබෝධයක් ඇති නායකයෙකුට නිවසට ආසන්න භූගෝලීය ක්ෂේත්‍රයක ව්‍යාප්ති දේවසේවයක් සිදු කළ හැකි අතර නව සභා රෝපණය කළ හැකිය. ශුභාරංචිය ප්‍රකාශ කිරීමේ දීමනාවක් ඇති නායකයෙකුට නිවසට කිට්ටුවෙන් දේවසේවයේ යෙදිය හැකි අතර මිනිසුන්

ක්‍රිස්තුස් වහන්සේ වෙනුවෙන් ජයග්‍රහණය කරනු දැකීමට සහ ශරීරය එහි සාක්ෂි වරම පිළිබඳව දැනුවත් කළ හැකිය.

සභාව තුළ එපීස 4:11 ක්‍රියාවන් අවබෝධ කර ගැනීමේදී සහ ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේදී අද දින විශාල සංකීර්ණ සාධකයක් වන්නේ සභාව ඛණ්ඩනය වීමයි. බොහෝ අය බොහෝ දුරට ප්‍රාදේශීය සභාවන් සලකන්නේ ක්‍රිස්තුස් වහන්සේගේ ශරීරයේ පූර්ණ හා ස්වාධීන ප්‍රකාශනයන් ලෙස ය. මේ අනුව ප්‍රාදේශීය සන්දර්භය තුළ අවශ්‍ය ප්‍රාථමික ස්ථාන අන්තර් යැපීම - නැති වී ගොස් සභාව කොටස් මිලියනයකට බෙදී ඇත. නමුත් නව ගිවිසුම වඩා විශාල සභාව තුළ අන්තර් රඳා පැවැත්ම පෙන්නුම් කරයි.

ගෝලයන්ගේ ලිපි ලියා තිබුනේ අද අප සභාව ලෙස හඳුන්වන දෙයට නොව, නගරයක හෝ ප්‍රදේශයක විශාල සභාවන් සමූහයක් ලෙස අපට හඳුනා ගත හැකි දේවල එකතුවකට ය. මෙම සභාවල සේවය කරනු ලැබුවේ වැඩිමහල්ලන් සහ උපස්ථායකයන් විසිනි. ඔවුන්ගෙන් කිහිප දෙනෙක් සමහරවිට ප්‍රාදේශීය සන්දර්භයට වඩා තරමක් පුළුල් ලෙස වැඩ කරති. මේ අනුව, ප්‍රේරිතයන් සමඟ වැඩ කරන පුද්ගලයින්ගේ කණ්ඩායම්, බොහෝ දුරට පුළුල් භූගෝලීය ක්ෂේත්‍රය තුළ ශුභාරංචියේ උපායමාර්ගික අපෝස්තලික ව්‍යාප්තියක, ශුභාරංචිය පැවති හෝ රෝපණය කිරීමට අවශ්‍ය වූ බොහෝ ප්‍රදේශවලින් පැමිණ ගියහ. එම ස්ථානවල ඔවුන් මෙම ස්ථානවල සභාවලට දෙවියන් වහන්සේගේ වචනය සහ ඔවුන් කැඳවා ඇති යේසුස් වහන්සේගේ ජීවිතය පිළිබඳ අවබෝධය වැඩි කිරීමට අවශ්‍ය සියල්ල පුරවා ඇත. මෙම එවන ලද අය මිථ්‍යාදෘෂ්ටික හා මිථ්‍යාදෘෂ්ටිකයන්ගෙන් ශරීරය ආරක්ෂා කිරීමට අවශ්‍ය බයිබලානුකූල සීමාවන් අවබෝධ කර ගැනීමට සභාවලට උපකාර කළ අතර සභාවන්හි මිනිසුන්ගේ ජීවිත සහ සාක්ෂිය තුළින් ශුභාරංචිය අඛණ්ඩව ඉදිරියට ගෙන ගියහ.

කාලය, ඉතිහාසය, නිකායවාදය, ඕනෑවට වඩා ව්‍යුහගත සභා ජීවිතය සහ මානව උඩඟුකම එක්සත් ජනපදයේ සභාව මෙම බයිබල් ව්‍යුහයෙන් වෙන් කර ඇත. එය නැවත පිහිටුවනු අපට කවදා හෝ දකින්න ලැබේවිද? මම නොදනිමි, නමුත් එය වඩා හොඳින් අවබෝධ කර ගැනීම දෙවියන් වහන්සේව විශ්වාස කිරීමට සහ එය ගෙන ඒමට උත්සාහ කිරීමට අපට ආරාධනා කරයි.

එසේ නම්, අන්‍යෝන්‍ය යැපීම යනු, ත්‍රිත්වාකාර දෙවියන්වහන්සේගේ ස්වභාවය අනුව ක්‍රියා කරන සභාවේ නායකත්වය වන අතර, ඒ සෑම එකක්ම එකිනෙකට වෙනස් කාර්යයක් ඉටු කරන නමුත් ප්‍රතිඵලයේ දී අනෙක් සියල්ලන් සමඟ එක්සත් වේ. භාරව සිටින්නේ කවුරුන්ද යන්න හෝ වඩාත්ම වැදගත් කෙනා හෝ වඩාත්ම උපායමාර්ගික වන්නේ කවුදැයි විමසීම

බයිබලානුකූලව තේරුමක් නැති දෙයකි. සෑම නායකයෙකුගේම වැදගත්කම නිර්වචනය කරනු ලබන්නේ ඔහු හෝ ඇය දෙවියන් වහන්සේ විසින් උන්වහන්සේගේ සභාවට දුන් දීමනාවක් වීමෙනි. එබැවින්, මෙය එක් එක් නායකයාගේ භූමිකාව සහ වඩාත්ම වැදගත් ලෙස, ඔහුගේ හෝ ඇයගේ දෙවියන් වහන්සේ විසින් ලබා දුන් දර්ශනයේ ප්‍රතිඵලය නිර්වචනය කරයි.

දෙවියන් වහන්සේ තම දරුවන් තුළ උපත සහ විශ්වාසය වර්ධනය කිරීම සඳහා උන්වහන්සේගේ සෙනඟ මැද නායකත්වය තබා ඇත. නායකත්වය ගැලවීම නිපදවන්නේ නැත - එය කරන්නේ දෙවියන් වහන්සේ පමණි - නමුත් ඒවා අන් අයට තේරුම් ගැනීමට, පිළිගැනීමට සහ ඇදහිල්ල වර්ධනය කිරීමට දෙවියන් වහන්සේ භාවිතා කරන උපකරණ වේ. අවසාන ප්‍රතිඵලය- මුළු ලෝකය පුරා පැතිරී ඇති දයාව- වඩාත්ම ඵලදායි වන්නේ දෙවියන්වහන්සේගේ සෙනඟ වෙළඳපොලේ, විවාහ, පවුල් සහ සභාවල දෙවියන්වහන්සේ සමග ඔවුන්ගේ සබඳතාවන්හි පරිණත වන විට සහ උන් වහන්සේව නියෝජනය කිරීමේ ඔවුන්ගේ කාර්යක්ෂමතාවයෙන් වැඩෙන විටය.

“ඔබ අතරේ එසේ නොවේ” කියා යේසුස්වහන්සේ තම ගෝලයන් සමඟ එසේ අවධාරණය කිරීම පුදුමයක් නොවේ!

# 7

# ඇමරිකානු සභාව ගැන දැන් කුමක් ද?

ඉතින් අපි කුමක් කරන්නද? ඇමරිකාවේ සභාවේ ව්‍යුහයේ ඇති ප්‍රධාන ගැටළු දෙස බැලීමෙන් පසු, අපට මෙම කාරණා ආමන්ත්‍රණය කර දෙවියන් වහන්සේගේ අරමුණට අනුව සභාවක් බවට පත්විය හැක්කේ කෙසේද?

මම ඇමරිකානු සභාවේ සෑම දෙයක්ම තොග වශයෙන් වෙනස් කිරීම වෙනුවෙන් පෙනී නොසිටිමි, නමුත් අපගේ වර්තමාන බටහිර සභාවේ ව්‍යුහයන් ඇදහිලිවන්තයන් සිතන ආකාරය කෙරෙහි වැඩි බලපෑමක් ඇති කරන බවත්, අවසානයේ අප සාමාන්‍යයෙන් සිතනවාට වඩා ක්‍රියා කරන බවත් සලකා බැලිය යුතු බව මම විශ්වාස කරමි. අපට නිවැරදි පණිවිඩය තිබියදී පවා, අපි දේවල් කරන්නේ *කෙසේද* යන්න අප පවසන දේවල් වියවුල් කළ හැකිය.

මෑත වසරවලදී බටහිර ලෝකයේ සභාවේ විශාලතම දෝෂයක් පවතින්නේ ඔවුන් අදාළ වීමට දරන උත්සාහය තුළය. අප අවට සිටින මිනිසුන් වෙතට අපට වඩාත් අදාළ විය හැකි නම්, නිසැකවම ඔවුන් යේසුස් වහන්සේ සහ සභාව කෙරෙහි වැඩි උනන්දුවක් දක්වනු ඇතැයි පැවසෙන තර්කය බොහෝ දෙනා මිල දී ගෙන ඇත (සමහර විට දෙවැන්න මිනිසුන්ගේ මනසෙහි වැඩි ඉඩක් ගෙන ඇතැයි මම බිය වෙමි)! අපේ කාලයේ සභාවේ මූලික අවශ්‍යතාවය අදාළත්වය නොවේ. අපට ඇත්තටම අවශ්‍ය වන්නේ මිනිසුන්ට ශුභාරංචිය වෙත *ප්‍රවේශ වීමේ* හැකියාව ඇතුව තිබීමයි. මෙහි ඇති ප්‍රහේලිකාව නම් සභාව, බයිබලානුකූලව සහ උපායමාර්ගිකව, බහුතරයක් මිනිසුන්ට දැනටමත් භෞතිකව ප්‍රවේශ විය හැකි දෙයක් වී තිබීමයි; කිතුනුවන් සෑම භූගෝලීය ස්ථානයකම වැඩ, අධ්‍යයනයන් කරමින්, නිවාඩු ගෙවමින් සහ ජීවත් වෙමින් සිටිති. ප්‍රශ්නය නම් ක්‍රිස්තු අනුගාමිකයින්ගෙන් බහුතරයක් දෙවියන්වහන්සේගේ අරමුණ තේරුම් නොගැනීම හෝ ඔවුන් වටා සිටින අය සමඟ සම්බන්ධ වීමට අකමැති වීමයි. එසේ වුවද, ක්‍රිස්තුස් වහන්සේ වෙතට පැමිණෙන බහුතරයක් දෙනා එසේ කරන්නේ ස්වාමින් වහන්සේ සහ උන් වහන්සේගේ පණිවිඩය ඔවුන්ට ලබා දී ඇති කිතුනුවකු සමඟ ඇති සබඳතාවයකින් බව තවමත් සත්‍යයකි.

ඔවුන් සේවය කරන නමස්කාරය, දේශනා කිරීම, ගොඩනැඟිලි, නායකයින් සහ වාහන නැවැත්වීමේ දී පවා අදාළත්වය පිළිබඳ නූතන සභාවේ තර්කය නැති වූ අය ගෙන ඒමට වඩා අනෙකුත් කිතුනුවන් අපගේ වෙළඳ නාමයට ආකර්ෂණය කර ගැනීමටත් සහ අප සතුව ඇති අය තබා ගැනීමට උත්සාහ කිරීමක් බව මම සැක කරමි. අපි ගොඩක් අලස මිනිසුන් වෙමු. අපට ක්‍රීඩාවන් එපා වී ඇත, එබැවින් නිෂ්පාදකයින් එය සෑම වසරකම ඉහළ නංවති. අපිට අපේ රැකියාවන් එපා වී ඇත, ඒ නිසා අපි අලුත් ඒවා සොයමු. අපට අපගේ නිවෙස් එපා වී ඇත, එබැවින් අවශ්‍යතා ලෙස සැරසී ඇති අපගේ ආත්මාර්ථකාමී අපේක්ෂාවන් වඩා හොඳින් හැසිරවීමට අපි නව ඒවා මිලදී ගනිමු. අපට අපගේ සභාවන් එපා වී ඇත, එබැවින් අපි නව උද්යෝගිමත් "අදාළ" සභාවන් සොයමු. වඩා හොඳ නමස්කාරයන්, වඩා හොඳ දේශනාවන්, වඩා හොඳ ළමා වැඩසටහන් සහ හමුවීමට වඩා හොඳ ගොඩනැඟිලි සඳහා අප වැය කරන මුළු කාලයම (එයට වියදම් කරන මුදල්ද) සැබැවින්ම යෙදෙන්නේ අප වෙනුවෙන්ය.

අදාළත්වයෙන් පසුපස සභාවේ හඹායෑම තිබියදීත්, පර්යේෂණයන් විශේෂයෙන්ම පැහැදිලි යථාර්ථයන් තුනක් පෙන්නුම් කරයි. එකක්, බටහිර රටවල නිතිපතා සභවන්ට යන අයගේ මුළු සංඛ්‍යාව මෑත වසරවලදී වේගයෙන් අඩු වී ඇත. දෙක, අප අල්ලා ගැනීමට උත්සාහ කරන පාවෙන මිනිසුන්, වෙනත් උද්වේගකරයට වඩා අඩු සභාවක තරමක් ක්‍රියාශීලී අය හෝ අලුතින් "ප්‍රති-සභාගත" වූවන් ලෙස නම් කරන ලද අය, ඇත්ත වශයෙන්ම නව සභාවක වසර හතරකට වඩා වැඩි කාලයක් රැඳී නොසිටිති. ඉන්පසු ඔවුන් නැවත ඉවතට යති! බොහෝ අය, සමහර විට, මෙම හැරයාම් දෙකක් හෝ තුනකට පසුව, අවසානයේ "ප්‍රති-සභාගත" පිරිසට එකතු වී ඉවත් වෙති. තුන, තමන් යේසුස් වහන්සේට අයිති යැයි පවසන මිනිසුන් තුළ මැනිය හැකි දේව භක්තියක් වැඩි වී නැත. සදාචාරය ඉහළ යන්නේ නැත, විවාහය තුළ විශ්වාසවන්තභාවය වැඩි නොවේ; සංඛ්‍යාවෙන් වැඩි වෙමින් ඇති සභා නායකයින් පවා සදාචාරාත්මක පිපිරීමක සිටිති.

මෙම අවසාන ප්‍රදේශය ගැන මා වඩාත්ම කරදර වෙමි, මන්ද අදාළ වීමට වඩා මිනිසුන්ට ප්‍රවේශ විය හැකි වීම අපගේ මූලික අවශ්‍යතාවය නම්, පාපොච්චාරණය කළ කිතුනුවන් ජීවත් වන ආකාරය සදාකාලික වැදගත්කමක් ඇති දෙයක් වන අතර, මේ ලෝකයේ එයට එවැන්ජලිස්තකරණය සඳහා ප්‍රායෝගික වැදගත්කමක්ද ඇත. ගැටලුවේ හරය මෙයයි: බටහිර සභාව විසින්ම ව්‍යුහගත කර ඇති ආකාරය, “අපි ඔබේ අපේක්ෂාවන් සපුරාලන්නෙමු” යන අදාළත්වයක් නිර්මාණය කිරීම නිසා, ඇත්ත වශයෙන්ම ක්‍රිස්තියානීන් ප්‍රවේශවීමේ උපකරණ

බවට පත්වීම සඳහා පාපොච්චාරණය කිරීම වෙනුවෙන් දෙවියන් වහන්සේ සභාව නිර්මාණය කළ බවට ඇති පණිවිඩය සම්පූර්ණයෙන්ම මකා දමා ඇත.

**අදාළත්වය සහ එහි ප්‍රතිඵල**

අදාළ වීමට උත්සාහ කිරීමෙන් ඇති වන දුෂ්කරතාවය අවම වශයෙන් දෙයාකාරය.

පළමුව, අපගේ සභාව අපගේ සංස්කෘතිය තෘප්තිමත් කිරීමට අපේක්ෂා කරන ආහාර රුචිය පෝෂණය කරන විට, ශුභාරංචියේ අත්‍යවශ්‍ය පණිවිඩය විකෘති වී අපැහැදිලි වේ. බයිබලයේ ශුභාරංචිය ගැලවීම පිළිබඳ පොරොන්දුවක් මත ගොඩනගා ඇති අතර, එම පොරොන්දුව ශුභාරංචියේ අත්‍යවශ්‍ය වූ අවධානය නාභිගත කරයි. උත්පත්ති පොතේ මුල් පරිච්ඡේදවල මැවීමේ කතාවෙන් සහ වැටීමෙන් නැගෙන පොරොන්දුව නම්, මිනිසාගේ අකීකරුකමේ ප්‍රතිඵල දෙවියන් වහන්සේම අහෝසි කරන බවයි. දෙවියන් වහන්සේ ආදම් සහ ඒව සහ අමතර වශයෙන් ඔවුන්ගේ සියලු දරුවන් උන්වහන්සේට සම්බන්ධ වීමට සහ උන්වහන්සේව නියෝජනය කිරීමටත් මැවූ සෙක. අවසාන ආදම් වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ, දෙවියන් වහන්සේ විසින් එම සැලසුම් දෙක උන්වහන්සේව විශ්වාස කරන ආදම් සහ ඒවගේ දරුවන්ට ප්‍රතිෂ්ඨාපනය කරයි. එබැවින් සභාවේ අවධානය පැහැදිලිය: අපි මිනිසුන්ගෙන් ඇසිය යුත්තේ, "ඔබට දෙවියන් වහන්සේ සමඟ සබඳතාවක් අවශ්‍යද, එසේ නම්, ඔබ උන්වහන්සේව නියෝජනය කිරීමට අවශ්‍යද?" පුද්ගලයෙක් නැතැයි පිළිතුරු දෙන්නේ නම්, ඔහුට හෝ ඇයට ශුභාරංචිය අවශ්‍ය නැත!

දෙවනුව, බොහෝ දේශකයන් විසින් ශුභාරංචියේ කේන්ද්‍රීය අවධානය දූෂිත කර, ශුභාරංචිය එහි පණිවිඩය වැරදි ලෙස අර්ථකථනය කරන සහ බොහෝ විට මිය ගිය දරුවන් බිහි කරන හරයකට හරවා යවා ඇත.

ඇත්ත වශයෙන්ම ප්‍රාදේශීය සභාවක රැඳී සිටින මළවුන් මෙන් සිටින ජනතාව සභාවකට පීඩනයක් එල්ල කරයි. ඔවුන් "කරුණාකර අපට සුවපහසු හැඟීමක් ඇති කරන්න" කියන්නාවූ වාතාවරණයක් නිර්මාණය කරයි, එබැවින් සභාව බොහෝ විට සැබෑ බයිබලානුකූල අධ්‍යයනය සහ අභියෝගයන් ගැන අලසවී සිටින මෙම මළවුන් සඳහා සංස්කෘතික අදාළත්වයක් ඇති කරයි. ඔවුන්ගේ පැමිණීම නිසා බයිබලානුකූල අන්තර්ගතය වඩාත් රසවත් කිරීම සඳහා විකෘති කිරීම් කිරීමට ඇතැමුන් පෙලඹේ. කෙසේවෙතත්, බයිබලය කිසිවිටෙක නැවත උත්පාදනය නොකරන මිනිසුන්ට රසවත් වීමට අදහස් කළ දෙයක් නොවේ. එය ඔවුන්ව වරදකරුවන් කිරීමට හෝ, ඩියෙට්‍රිච් බොන්හෝෆර් ඔහුගේ 'Ethics පොතේ ලියන

පරිදි, දෙවියන් වහන්සේගෙන් ඈත් වීම යනු දෙවියන් වහන්සේ අපව මැවූ මනුෂ්‍යයෙකුට වඩා අඩු කෙනෙකු බව වටහා ගැනීමට ඔවුන් ලජ්ජාවට පත් කිරීමට අදහස් කරන ලදී.

මේ සියල්ල සභාවේ ව්‍යුහයත් සමඟ ඇති සම්බන්ධය කුමක්ද? ප්‍රධාන සිතිවිලි කිහිපයක් හිතට පැමිණේ. පළමුව, අදාළත්වය වෙත කේන්ද්‍රීය අවධානය ඇත්ත වශයෙන්ම විනෝදාස්වාදය සඳහා උත්සාහයක් නම්, සභාවේ පණිවිඩය සහ සන්දර්භය දෙවියන් වහන්සේට ප්‍රතිවිරෝධී සහ කැරලිකාර සංස්කෘතියකට අනුකූල වී ඇත. දෙවියන් වහන්සේ බයිබලයේ ප්‍රකාශ කර ඇති සහ සුරක්ෂිත කර ඇති දේ උන්වහන්සේට වඩා හොඳින් අපට ප්‍රකාශ කළ හැකි බව සැබෑවක්ද? බයිබලය ඇත්ත වශයෙන්ම දෙවියන් වහන්සේ ප්‍රාශ්වාස කළ, දෙවියන් වහන්සේගේ ආනුභාවයෙන් සහ "ඕනෑම දෙබිඩි කඩුවකට වඩා තියුණු" දෙයක් නම් (හෙබ්‍රෙ. 4:12), අපගේ කාර්යය එය "වඩාත් හොඳ" කිරීමද එසේත් නැතිනම් සරලව පැහැදිලි කිරීමද? අද බොහෝ දේශනා සමන්විත වන්නේ දෙවියන් වහන්සේ දැනටමත් පවසා ඇති දේ පැහැදිලි කිරීමට වඩා මිනිසුන්ගේ උනන්දුව වැඩි කිරීමට අදහස් කරන සණීකෘත, කප්පාදු කරන ලද, මනඃකල්පිත, වාචාල කතා වලින් ය.

දෙවනුව, අදාළ වීමට අප දරන උත්සාහය ස්වාභාවිකවම, අපගේ සභා පරිසරයද අදාළ වන පරිදි ව්‍යුහගත කිරීමට හේතු වේ. අපි පැහැදිලිවම බයිබලයේ ඉගැන්වීම් දෙස පැහැදිලි සහ නොවෙනස්ව බැලුවහොත්, සභාව තුළ පරිසරය සම්බන්ධයෙන් ගන්නා තීරණ බොහෝමයක් දෙවියන්වහන්සේගේ පණිවිඩයට සෘජුව පටහැනි බව සභාවට පෙනී යනු ඇත.

අදාළවන පරිසරයක් නිර්මාණය කිරීමේ වඩාත් පැහැදිලි උත්සාහයන් සමහරක් හඳුනා ගැනීම පහසුය. නිදසුනක් වශයෙන්, රන්වන් දිව් ඇති ගුරුවරුන්, සාමාන්‍ය නිරීක්ෂකයෙකුට පවා, අප මධ්‍යයේ දෙවියන්වහන්සේගේ තනතුරට ප්‍රතිවිරුද්ධ වන තරම් ඉහළ තනතුරු දරති. එවැනි අය සහ ඔවුන්ගේ උපකාරක නමස්කාර කණ්ඩායම් වලට වඩාත් හොඳින් දියුණු විය හැකි පරිසරයන් සොයන පිණිස සභාව ක්‍රියාකිරීම නිසා, සභා රැස්වීම්වලදී ඒවා යේසුස්වහන්සේගේ අනුගාමිකයන්ගේ රැස්වීම්වලට වඩා රොක් සංගීත ප්‍රසංගවලට සමාන පෙනුමක් ගෙන ඇත. එවැනි වාතාවරණයක් තුළ, දුම, අඳුරු ආලෝකය, නමස්කාර කණ්ඩායමේ කටහඬවල් සහ එක් කථිකයා වෙත යන කේන්ද්‍රීය වේලාව සහ අවධානය යන සියල්ල නිසා, යේසුස් වහන්සේ අනුගමනය කරන බව ප්‍රකාශ කරන දෙවියන් වහන්සේගේ ආත්මයට සවන් දීම අවම වී ඇත. සභාවන් ඔවුන්ගේ ජීවිතවල ශුද්ධකම හෝ ඔවුන්ගේ යථාර්ථවාදී චේතනාවන් පවා පිළිබිඹු නොකරන ගීත ගායනා කරයි. මිනිසුන් ඔවුන්ට සැබවින්ම නොඇසෙන නමුත් හාස්‍යජනක විහිළුවක් හෝ ආකර්ශනීය කතාවක් හෝ පිළිවෙලට සැදූ වීඩියෝවක් නිසා කතාන්දර වලට

සවන් දෙති. මෙම “අදාළ” සන්දර්භයට පණිවිඩය හරහා පැමිණිය හැකි ඕනෑම බලගතු සිතුවිල්ලක් ඉවත් කළ හැකිය.

හොඳම සහ විශ්වාසවන්ත බයිබලානුකූල සන්නිවේදකයන් පවා මෙම යථාර්ථයට ගොදුරු විය හැක. නමුත් වඩා හොඳ වාහන නැවැත්වීමේ ස්ථාන, ප්‍රබෝධමත් කරන ලද නමස්කාරය, අතිනවීන සන්නිවේදන ක්‍රම සහ රොක්- සංගීත ප්‍රසංග පරිසරයක් ඇති කර මිනිසුන්ගේ සියලු අපේක්ෂාවන් පෝෂණය කරන මේ සියල්ල කළ පසු ඔවුන්ට යේසුස්වහන්සේගේ මෙම වචන කිව හැකි බව අප සැබවින් සිතනවාද?: **“ඔබ මට ප්‍රේම කරනවා නම්, ඔබ මාගේ ආඥා පිළිපදින්නෙහිය” (යොහන් 14:15)**

සදාකාලිකව වැදගත් යැයි අප විශ්වාස කරන පණිවිඩයේ හරය ලෙස අප තෝරා ගන්නා ආකෘති අපගේ දේවසේවයේ ප්‍රතිඵලයට බලපායි. මාංසය පෝෂණය කිරීම සහ මිනිසුන්ට සම්පූර්ණ ශුභාරංචිය පිරිනැමීමට උත්සාහ කිරීම නොගැලපේ. ශුද්ධ ලියවිල්ලේ පැහැදිලි ඇඟවුම් වලින් අප බොහෝ දුරට අපගමනය වී ඇති එක් අංශයක් වන්නේ “අදාළ” කම පැවැත්වීමට අප සහ නඩත්තු කිරීමට අප වැය කරන මුදල් ප්‍රමාණයයි. ඇමරිකාවේ ලෝක ජනගහනයෙන් සියයට 5 කටත් අඩු ප්‍රමාණයක් සිටින විට සහ ඇමරිකානු සභාව ගෝලීය සභාවෙන් යන්තම් සියයට 1 ක් පමණ වන විට, අපට මෙම වියදම් සාධාරණීකරණය කළ හැකිද? වැඩි වැඩියෙන් පාපොච්චාරණය කරන කිතුනුවන් මෙම ස්ථාන වෙතට අඩුවෙන් හා අඩුවෙන් පැමිණෙන විට, අපට මෙම වියදම් සාධාරණීකරණය කළ හැකිද? සභාව දැනටමත් යේසුස්වහන්සේගේ අනුගාමිකයෙකු පිළිබඳ බයිබලානුකූල නිර්වචනයක මිනුමකට නොගැලපෙන විට, අපට මෙම වියදම් සාධාරණීකරණය කළ හැකිද? යේසුස් වහන්සේගේ ජීවිතයේ සහ පණිවිඩයේ හරය ඉතා සරල, පරිත්‍යාගශීලී සහ අනෙකුත් අය වෙතට අවධානය යොමු කර ඇති එකක් වන විට, අපට මෙම ස්වයං කේන්ද්‍රීය වියදම් සාධාරණීකරණය කළ හැකිද? සභාවේ ස්වභාවය එහි මිනිසුන් දේවසේවයේ කාර්යය ඉටු කළ යුතු විට, දෙවියන් වහන්සේගේ සෙනඟ "බලගැන්වීම" සඳහා විශාල කාර්ය මණ්ඩලයකට ගෙවීම සාධාරණීකරණය කළ හැකිද?

පැහැදිලිවම, මේ සෑම ප්‍රශ්නයකටම පිළිතුර නැත යන්න විය යුතුය. නමුත් ඔවුන් නියෝජනය කරන අදහස් දිගටම වැඩීමට ඉඩ ලබා දෙන අතර, වඩාත් නරක ලෙස, අපගේ ව්‍යුහය එය එසේ විය යුතු බව ඉල්ලා සිටින බැවින් එය දෙවියන් වහන්සේටද ආරෝපණය කරයි (දෙවියන් වහන්සේ එය කිරීමට අපව මෙහෙයවීය කියා!).

## අදාළත්වයේ ඔටුනු ගැලවීම

කෙසේ වෙතත්, ශුභාරංචිය අපගේ නූතන අදාළත්වය සොයන සභා ව්‍යුහයන් ඉල්ලා නොසිටින අතර ලිපිවල විස්තර කර ඇති පරිදි සභාව ඉල්ලා සිටින්නේ නැත. අපට අවශ්‍ය නම් සෑම ඇදහිලිවන්තයෙකුටම 24-7 ජේසුස් වහන්සේගේ ජීවිතය ප්‍රමුඛස්ථානයේ තබා ගනිමින්, අපව සංවිධානය කර ගැනීමට වඩා හොඳ ක්‍රම ගැන සිතා බැලිය හැකිය, නමුත් බටහිර සභාව දැන් මරණ ගමනක් සහ බයිබලානුකූල සදාචාරාත්මක පිපිරීමක් වෙත ගමන් කරන නිසා, අපට එය කිරීමට සරලවම අවශ්‍යතාවයක් නැති බව මට නිගමනය කිරීමට සිදුවේ. සභාවේ බොහෝ දෙනෙක් තක්සේරු කිරීමට, පාපොච්චාරණයට සහ ප්‍රතිසංස්කරණවලට වඩා අකීකරුකම දිගටම කරගෙන යාමට කැමැත්තෙන් සිටිති.

ඇත්ත වශයෙන්ම සැලකිල්ල දක්වන ඇදහිලිවන්තයන් ප්‍රමාණවත් තරම් තවමත් සිටින බවත්, දෙවියන් වහන්සේ තවමත් බටහිර සභාව සම්පූර්ණයෙන්ම ඔවුන්ටම අතහැර නැති බවත් උපකල්පනය කිරීමෙන්, උන්වහන්සේ සැබවින්ම අපව හික්මවනු ඇතැයි අපට අපේක්ෂා කළ හැකිය, **“මක්නිසාද ස්වාමීන් වහන්සේ ප්‍රේම කරන අයටඋන්වහන්සේ දඬුවම් කරනසේක. උන්වහන්සේ පිළිගන්න සියලු පුත්‍රයන්ට තලන සේක යනුයි. නුඹලා ඉවසන්නේ දඬුවම් පිණිසය; දෙවියන් වහන්සේ පුත්‍රයන්ට මෙන් නුඹලා කෙරෙහි ක්‍රියා කරන සේක. මක්නිසාද පියා දඬුවම් නොකරන පුත්‍රයා කවුද? ”(හෙබ්‍රෙ. 12:6-7).**

කෙසේ වෙතත්, ඇමරිකානු සභාවේ අපට අපවම හික්මවා ගැනීමට සමහර දේවල් කළ හැකිය. පළමුව, පාපොච්ඡාරිත ක්‍රිස්තියානීන් ඉවත් වන බව අදහස් කළත්, බයිබලයේ පැහැදිලි, අපිරිසිදු නොවූ ප්‍රකාශය අපගේ සියලුම රැස්වීම්වලට නැවත ඇතුළත් කළ හැකිය. දෙවනුව, නිවාස කණ්ඩායම්, තමන් නියැළෙන ක්ෂේත්‍ර කණ්ඩායම් සහ වෙනත් පුද්ගලයින් විසින් මෙහෙයවන සේවා නිර්මාණය කිරීමෙන් නායකත්ව ව්‍යුහය විමධ්‍යගත කිරීමට අපට වැඩි උත්සාහයක් ගත හැකිය.

තෙවනුව, මිනිසුන් එක් සුපිරි තරුවකට අසීමිත ලෙස සහ නුසුදුසු ලෙස නොගැලපෙන පරිදි ඇළුම් වීම වැළැක්වීමට සන්නිවේදකයන් කිහිපදෙනෙකු ඇතුළත් කිරීමට අපට ඉගැන්වීමේ සහ දේශනා කිරීමේ වගකීම් නැවත සකස් කිරීම කළ හැකිය. හතරවනුව, අපට අපගේ සභාවල ප්‍රමාණය සීමා කළ හැකි අතර, පවතින කුලී අවකාශයන් භාවිතා කිරීමෙන් සහ ඒවායින් වැඩි ප්‍රමාණයක් විවෘත කිරීමෙන් සභාවට මෙම දේපල ව්‍යාපාරයෙන් ඉවත් විය හැක. අපි අයිති යේසුස්වහන්සේටය, ඒ අනුව අපි උන්වහන්සේගේ සෙනඟ ලෙස ජීවමාන

දෙවියන්වහන්සේගේ දේවමාළිගාව වමු. දෙවියන් වහන්සේ තමන්ගේ ප්‍රජාව තුළ එහා මෙහා යමින් සිටිය යුතුයැයි බලාපොරොත්තු මිනිසුන් නවාතැන් ගැන්වීමට අපට නවීන විසිඑක්වන සියවසේ දේවස්ථාන සෑදීම අවශ්‍ය නොවේ. පස්වනුව, අපට මිනිසුන්ගේ අපේක්ෂාවන් ප්‍රතිව්‍යුහගත කළ හැකි අතර, අප රැස්වන විට අවශ්‍ය සේවාවල නායකත්වය දීමටත් අපගේ පවතින ව්‍යුහයන් සජීවීව තබා ගැනීමටත් අප වැය කරන පුද්ගලයින් සහ මුදල් ප්‍රමාණය අඩු කරමින් තවත් ස්වේච්ඡා සේවකයන් මත විශ්වාසය තැබිය හැකිය.

අපට තවත් බොහෝ අදහස් සලකා බැලිය හැකිය, නමුත් දෙවියන් වහන්සේ සෑම ප්‍රදේශයකම දේවභක්තික පුරුෂයන් සහ ස්ත්‍රීන් බලාපොරොත්තු වන්නේ තම සියලු ජනයා ජීවත්වීමට සහ ශුභාරංචිය ප්‍රකාශ කිරීමට වඩාත් හොඳින් යොමු කරන්නේ කෙසේද යන්න පිළිබඳව ආත්මයේ මනස සෙවීමයි. ඇත්ත වශයෙන්ම, ශුද්ධ ලියවිල්ල ලබා දී ඇති කරුණු කිහිපයක් සන්නිවේදනය කරන නමුත් යේසුස් වහන්සේව පාපොච්චාරණය කරන අයට ඔවුන්ගේ දෛනික සන්දර්භය තුළ ශුභාරංචිය ආදේශ කළ යුතු බවට පවසන පැහැදිලි ඉගැන්වීමෙන් ඔබ්බට, එය බොහෝ දේ නොපවසයි. ක්‍රිස්තුස්වහන්සේගේ සෙනඟගේ බලගැන්වීම ප්‍රශස්ත කරන, සෑම ඇදහිලිවන්තයෙකුගේම පූජකත්වය ඉස්මතු කරන, අප වෙනුවෙන්ම අඩු මුදලක් වැය කිරීමට අපට උපකාර කරන, වේදිකා ආලෝකය රන්වන් භාෂාවක් ඇති පුද්ගලයන්ගෙන් ඉවතට සහ ශුද්ධ ලියවිල්ලේ සන්නිවේදනය වෙතට අවධානය යොමු වන පරිදි අපගේ වර්තමාන සියලුම සභාවේ ව්‍යුහයන් නැවත සකස් කළ හැකිය. තම සෙනඟ තුළ ඇති ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රතිරූපය පෘථිවියේ සිටින සෑම පිරිමියෙකුටම, ස්ත්‍රියකට සහ දරුවෙකුටම ප්‍රවේශ විය හැකි ලෙස තබමු!

**වෙනස් කිරීම පහසු නොවනු ඇත**

එබැවින් බටහිර සභාව ප්‍රතිසංස්කරණය කිරීමට අවශ්‍ය වේ! සභාව යනු යා යුතු ස්ථානයක් ලෙස ඇති පැරණි අදහස යහපත් දෙයක් නොවනු ඇත. අප කරන්නේ කුමක්දැයි සහ ඊටත් වඩා අප සිතන ආකාරය ප්‍රශ්න කිරීමේ දැඩි සහගත අවශ්‍යතාවයක් අපට ඇත. ගැටලුව වන්නේ අපගේ සිතීමේ රටාවන් ප්‍රතිසංස්කරණය කිරීම සෑමවිටම පහසු දෙයක් නොවීමයි.

එක් දෙයක් නම්, සභාව පිළිබඳ අපගේ ඓතිහාසික දේවධර්මය අපට බාධා කිරීමයි. බටහිර ලෝකයේ සභාව, ඇදහිල්ලේ භාවිතයන් තුළ වර්ධනය වීමට සහ සභාව ගැන දෙවියන්වහන්සේගේ අරමුණෙහි සහභාගී වී ඇදහිලිල පුහුණුවෙමින් වර්ධනය වන ස්ථානයකට වඩා රැස්වීම් භූමියක් ලෙස දැකීමට බටහිර සභාව අනුගත වී ඇත. මෙය සියලු ආකාරයේ කලකිරීම් සහ වැරදි සඳහා සභාව සකස් කරයි. සභාව ගැන බයිබලීය අදහසට වඩා

අඩු දෙයක, එනම් සරලවම දේවසේවයට සහභාගී වීමට, එක්රැස් විය යුතු ස්ථානයක් ලෙස සිතමින් ජනතාවට විවේකව සිටීමට නායකත්වය ඉඩ දී ඇත. මෙයින් වසර ගණනාවකට පසු නායකත්වය ඉඩ දී ඇති දෙයට ජනතාව දැඩි ලෙස අනුගත වීම පුදුමයක් නොවේ! නමුත් දැන්, ක්‍රිස්තුස් වහන්සේට, උන් වහන්සේගේ ශුභාරංචියට, උන් වහන්සේගේ අපේක්ෂාවන්ට සහ උන් වහන්සේගේ සෙනඟ තුළ උන් වහන්සේගේ ජීවිතයට එරෙහි සතුරුකම අපගේ සංස්කෘතිය තුළ වර්ධනය වන විට, දෙවියන් වහන්සේගේ සෙනඟට ගමන් කිරීමට නොහැකි තරම් ය.

යේසුස් වහන්සේ පවසන්නේ, **"ඔබ මට ප්‍රේම කරනවා නම්, ඔබ මාගේ ආඥා පවත්වන්නහුය" කියාය. (යොහන් 14:15).** බොහෝ පාපොච්චාරණය කරන කිතුනුවන්ට මෙම වචන විකල්පයක් වී ඇත. *එය සැබවින්ම කැප වූවන් සඳහා ය,* සමහරු සිතිය හැකිය. එසේත් නැතිනම්, *යේසුස් වහන්සේ පවසන්නේ එය බව මම දනිමි, නමුත් මම එවැනි කැපවීමකට සූදානම් නැත.* නැත්නම් ඊටත් වඩා බරපතළ ලෙස සමහරු සිතන්නේ, *මම එය කිරීමට කැමති නැහැ* ලෙසයි. නමුත් සභාව යනු දෙවියන් වහන්සේ සමඟ සම්බන්ධකම් ඇති ජනතාවක් වන අතර උන්වහන්සේව නියෝජනය කිරීමට සැලසුම් කර ඇත. අප කොහේ ගියත්, එම ගමනේදී අප කුමක් කළත්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සභාව එවන ලද සෙනඟකි. ඊට අඩු දෙයක් ප්‍රමාණවත් නොවනවා පමණක් නොව එය මිත්‍යාදෘෂ්ටියකි.

සභාවේ චින්තනය ප්‍රතිසංස්කරණය කිරීමෙන් වළක්වන තවත් ගැටලුවක් වන්නේ නායකත්වයේ බොහෝ දෙනෙකුගේ ආත්මාර්ථකාමීත්වයයි! සභාව එක්රැස් කිරීමේ ස්ථානයක් ලෙස දැකීම නිසා එය මෙහෙයවන අයට එය ගැන එතරම් පෞද්ගලික අර්ථයක් ඇත්තේ මන්දැයි බැලීම පහසුය, විශේෂයෙන් බොහෝ මිනිසුන් එකතු කිරීමට ඔවුන්ට හැකි වී තිබේ නම්. එම මිනිසුන් තම නායකයින්ට "ආදරය" කිරීමට, ඔවුන්ව අගය කිරීමට සහ වැදගත්කම සහ මූල්‍ය ප්‍රතිලාභ පවා ඔවුන්ට ලබා දීමට ඉගෙන ගනී.

නමුත් නායකත්වය සැබෑ ලෙසම මෙහෙයවනු ලබන්නේ යේසුස්වහන්සේ විසින් උන්වහන්සේගේ සභාව මෙහෙයවීමට කැඳවනු ලැබූවන්ට දෙන ලද බලගැන්වීමේ වරම මගින් නම්, ඔවුන්ගේම වැදගත්කම දෙවියන්වහන්සේ සමග පුද්ගලික, දෛනික, සමීප සබඳතාවයට ඉඩ දෙමින් ඉවත් වේ. නායකයන් යනු දෙවියන්වහන්සේගේ සෙනඟට සත්‍යය ජීවත්වීමට සහ සත්‍යය දෙන්නා සමඟ අර්ථවත් සබඳතාවයක් ගොඩනඟා ගැනීමට උපකාර කිරීමට කැඳවා ඇති වින්නඹු මාතාවන් පමණි! මෙම ඉරියව්වෙන් ඔවුන් කැමැත්තෙන් තමන්ව අඩු කරයි, මන්ද උන්වහන්සේ වැඩිවිය යුතු නිසාය.

අවසාන වශයෙන්, අපගේ චින්තනය ප්‍රතිසංස්කරණය කිරීම අපට අපහසු වන්නේ, අප කලින් සඳහන් කළ පරිදි, අද සභාවේ සිටින විශාල බහුතරයක් සභාව සහ එහි අරමුණ සඳහා ඔවුන්ගේ මැදිහත්වීම පිළිබඳ වැරදි අදහසක් වර්ධනය කර ගෙන ඇති බැවිනි. අද දින ඇදහිලිවන්තයන් බලාපොරොත්තු වන්නේ සභාවට පැමිණීම ආකර්ශනීය හා පහසු කිරීමට අවශ්‍ය ඕනෑම දෙයක් තමන් වෙනුවෙන් කිරීමට නායකත්වයෙන් කටයුතු කිරීම දැකීමයි. මෙම නායකත්වය තුළ මිනිසාගේ සහ අපේ සංස්කෘතියේ ආවේනික ආත්මාර්ථකාමීත්වය දිරිමත් කර ඇත.

යේසුස් වහන්සේගේ වදන් අනුව ක්‍රියා කරන ලෙස දැන් මිනිසුන් කැඳවීමට දීර්ඝ ප්‍රතිසංස්කරණ මාර්ගයක් අවශ්‍ය වේ.

**ප්‍රතිසංස්කරණය කිරීම වැලඳ ගැනීම**

එසේනම් සභාව ලෙස අප කරන දේ පමණක් නොව අප සිතන ආකාරය නැවත නැවත ඇගයීමට ලක් කරන්නේ කෙසේද?

පළමුව, අපි සභාව සඳහා දෙවියන් වහන්සේගේ අරමුණ වැලඳ ගත යුතු අතර එය ඉටු වන බව දැකීමට ඉලක්ක තැබිය යුතුය. දෙවියන් වහන්සේගේ සභාව සඳහා දෙවියන් වහන්සේගේ පැහැදිලි බයිබල් අරමුණ සම්බන්ධ කිරීම, භූගෝලීය වගවීමේ කවයක් නිර්වචනය කිරීම සඳහා ශුද්ධාත්මයාණන් සමඟ සංවාදයක් ආරම්භ කිරීම සහ සෑම පිරිමියෙකුටම, ස්ත්‍රියකටම සහ දරුවෙකුටම දැකීමට, ඇසීමට සහ ශුභාරංචිය ස්පර්ශ කර ක්‍රිස්තුස් වහන්සේ වෙනුවෙන් තීරණයක් ගැනීමට අවස්ථාවක් ලබා දීම සිදුවන බව දැකීමට අපගේ සියලු සම්පත් යොමු කිරීම වැනි තව කිසිවක් නැත.

දෙවනුව, අපගේ වගවීමේ කවයේ සිටින අයව සම්පූර්ණයෙන්ම එවැන්ජලිස්තකරණය කිරීම සඳහා අපි උපාය මාර්ග ගොඩනගා ගත යුතුය. නායකත්වයට දෙවියන්වහන්සේගේ සෙනඟ ඕනෑවට වඩා දිරිමත් කළ නොහැක. නායකත්වය ඔවුන්ගේ මිනිසුන්ට ඉගැන්විය යුතුය, ඔවුන්ව නිදහස් කළ යුතුය, දෙවියන් වහන්සේ ඔවුන්ව රැගෙන යන සෑම තැනකම ඔවුන් පරිවර්තනය කළ ජීවිතයේ උපකරණ බවට පත්වනු ඇතැයි අපේක්ෂා කළ යුතුය.

තෙවනුව, සභාව සිරස් අතට නොව පාර්ශ්වීයව වර්ධනය වීමට කැපවිය යුතුය - උස් ගොඩනැගිලි ඉදි කිරීමට සහ මිනිසුන් අප වෙත ආකර්ෂණය කර ගැනීමට වඩා අපගේ ප්‍රජාවන් පුරා ස්ථාන වලට පිටතට විහිදීමටය. අපි එක තැනකට දෙතුන් සියයකට වඩා වැඩි පිරිසක් රැස් නොකළ යුතුයි. අපට හිමි නොවිය යුතු දේ අප සතු නොවිය යුතුය. මිනිසුන්ට කළ

හැකි හා කළ යුතු දේ කිරීමට අප කාර්ය මණ්ඩලයකට ගෙවිය යුතු නැත. දෙවියන් වහන්සේ අපට දෙන දේ අප පිළිගත යුතුය.

පාර්ශ්විකව වර්ධනය වීමට උත්සාහ කිරීමේදී සභාවට කළ හැකි වැදගත්ම දෙය වන්නේ නායකයින් පුහුණු කිරීමයි. අපගේ ඉතිහාසයේ ප්‍රධාන අංගයක් වී ඇති සිරස්, ආකර්ශනීය නායකත්ව ආකෘතියට වඩා වැඩි එක් එක් පුද්ගලයාගේ විශේෂිත පුද්ගලික සහ ආයතනික ස්ථානවල දෙවියන් වහන්සේට අවශ්‍ය දේ කිරීමට සහ උන්වහන්සේගේ සෙනඟ හරහා කිරීමට කැපවූ අයවළුන් සභාවට අවශ්‍ය වනු ඇත. (මම මෙහි සඳහන් කරන්නේ වැටුප් සහිත කාර්ය මණ්ඩලය ගැන නොවේ, එය අඩු විය යුතුය, නමුත් සේවා භූමිකාවන්හි සේවය කිරීමට කැමති පුහුණු ස්වේච්ඡා සේවකයන් ගැනය.) සභාවේ ජීවිතයේ සෑම තරාතිරමකම වින්නඹු මාතාවන්ගේ සේවයේ නායකත්වය සමඟ සම්බන්ධ වීමට මිනිසුන්ගේ මෙම පුහුණුව අපගේ විමධ්‍යගත නායකත්ව ක්‍රියාකාරකම් දෙසට කරන උත්සාහයට උපකාරී වනු ඇත. නායකත්වයට ඕනෑවට වඩා පුහුණු කිරීම කළ නොහැක.

සභාව තමන් සහ එහි ජනතාව නිවැරදිව ව්‍යුහගත කරන්නේ නම්, අනෙකුත් නායකයින් පිහිටුවීම සඳහා පවතින නායකත්වයට සැලකිය යුතු කාලයක් ගත කිරීමට එය ලබා දෙනු ඇත. අනාගත නායකයන් මුහුණට මුහුණ ලා හොඳ කාලයක් ගත කිරීම මගින් ඔවුන්ට මෙය තේරුම් ඇති ආකාරයෙන් කළ හැකිය. මෙම පුද්ගලික කාලය පුළුල් කාණ්ඩ තුනක් කෙරෙහි අවධානය යොමු කළ යුතුය (පුද්ගලික අධ්‍යාත්මික ජීවිතය, පුද්ගලික දේවසේවයේ අවබෝධය සහ නිතිපතා බයිබලානුකූල අධ්‍යයනය තුළින් දේවධර්මීය පරිණතභාවය) සහ හැකි තරම් නවක වූ නව නායකයින් සමඟ ආරම්භ කළ යුතුය. ගොඩනැගීම ආරම්භ වන්නේ: ඔවුන්ගේ පුද්ගලික අධ්‍යාත්මික ගොඩනැගීම යන මෙම වැදගත්ම කාරණයෙනි. තරුණ නායකයින් දෙවියන් වහන්සේගේ වචනයෙන් දෙවියන් වහන්සේ සමඟ සබඳතාවයක් ඇති කර ගැනීමට කලින් ඉගෙන නොගන්නේ නම් සහ උන්වහන්සේ සමඟ නිතිපතා කතා කිරීමට පෙලඹෙන්නේ නැතිනම්, ඔවුන් දිව්‍යමය නිර්මාණයේ සාරය මග හැරගන්නවා පමණක් නොව, දෙවියන්වහන්සේගේ සෙනඟ වෙත විශ්වාසවන්ත නොවනු ඇත. නිතිපතා කුඩා හා විශාල කණ්ඩායම් රැස්වීම් මෙහෙයවීම සහ ශරීරයේ අරමුණ, වටිනාකම් සහ අපේක්ෂිත ප්‍රතිඵල පිළිබඳව උගන්වමින් පවතින නායකත්වයට නව නායකයින් සංවිධානාත්මකව පුහුණු කළ හැකිය.

හතරවනුව, අපි වෙනත් සභාවන් සමඟ මිත්‍රත්වයක් ඇති කර ගත යුතුය. මම මෙය අවධාරණයෙන් පවසන අතරම, බයිබලානුකූල එකමුතුකම යනු කුමක්ද සහ එය නොවන්නේ

කුමක්ද යන්න ගැන ගැඹුරින් සිතා බැලිය යුතුය, අප එයට උත්සාහ කරන අතරම, එයින් පැමිණිය හැකි වඩා ප්‍රායෝගික හවුල්කාරිත්වයකින් දෙවියන් වහන්සේ කුමක් කළ හැකිද යන්න ගැන දකින්නට උත්සාහ කරමු.

සියල්ලන්ම *එක් ජීවියෙකු* වීම තුළ එකමුතුකමක් ඇත. අපි ක්‍රිස්තුස් වහන්සේ තුළ සිටින නිසාත් උන් වහන්සේ අපව එකක් කර ඇති නිසාත් දෙවියන් වහන්සේගේ සියලුම සභාවන් එකකි. යොහන් 17:20-23 හි, යේසුස් වහන්සේ පවසන්නේ,

**"මොවුන් ගැන පමණක් නොව, මොවුන්ගේ වචනය කරණකොටගෙන, මා කෙරෙහි විශ්වාස කරන්නවුන් ගැනත් ඔවුන් සියල්ලන් ඒකත්වය වන පිණිස පියවූ ඔබ මා තුළෙහිද, ඔබ මා තුළෙහිද සිටින්නාක් මෙන්ම, ඔබ මා එවූ බව ලෝකයා විශ්වාස කරන පිණිසත්, අප තුළ ඔවුන් ඒකත්වය වන පිණිස ඔබ මට දුන් මහිමය මම ඔවුන්ට දුනිමි, මෙසේ කළේ මම ඔවුන් තුළෙහිද ඔබ මා තුළෙහිද සිටීමෙන්, ඔවුන් ඒකත්වයට සම්පූර්ණයෙන් පැමිණෙන පිණිසත්, ඔබ මා එවූ බවද මට ප්‍රේම කළාක්මෙන් ඔවුන්ටත් ප්‍රේම කළ බවද ලෝකයා දැනගන්නා පිණිසය."**

ශුභාරංචිය තුළ *හවුල්කාරිත්වය තුළ* එකමුතුවක් ද ඇත. මෙයින් අදහස් කරන්නේ දෙවියන් වහන්සේගේ ආත්මයාණන් විසින් අපව කැඳවා ඇති යම් ව්‍යාපෘතියක එකට වැඩ කිරීමේ එකමුතුකමයි. පිලිප්පි 1:3-5 මේ ආකාරයේ හවුල්කාරිත්වයක් ගැන සඳහන් කරයි: **"නුඹලා මට සිහිවෙන හැම වේලේම නිතරම මාගේ සියලු යාච්ඤාවලදී නුඹලා සියල්ලන් උදෙසා ප්‍රීතියෙන් යාච්ඤාව ඔප්පු කරමින්, පළමුවෙනි දවස පටන් අද දක්වා ශුභාරංචියේ වර්ධනය සඳහා තිබෙන නුඹලාගේ පංගුකාරකම ගැන මාගේ දෙවියන්වහන්සේට ස්තූති කරමි."**

සෑම සභාවක්ම ශුභාරංචිය ප්‍රකාශ කිරීමේ කාර්යයේ කොපමණ ප්‍රමාණයක් කරනවාද යන්න පැහැදිලි නැත, නමුත් ඔවුන්ගේ හවුල්කාරිත්වය පාවුල්ට සහ ඔහු සමඟ වැඩ කළ අයට දෙවියන් වහන්සේ ලබා දුන් සේවය කෙරෙහි අවධානය යොමු කර ඇත. මෙවැනි හවුල්කාරිත්වයකට ප්‍රාදේශීය සභාවකින් වැඩි අවධානයක් අවශ්‍ය නොවේ. කෙසේ වෙතත්, පුදුමයට කරුණක් නම්, ව්‍යාපෘතියක මෙම පහසු හවුල්කාරිත්වය වත් සොයාගන්නේ සභාවන් කිහිපයක් පමණි.

අවසාන වශයෙන්, ශුභාරංචිය *උදෙසා හවුල්කාරිත්වයේ* එකමුතුවක් ඇත. මේ ආකාරයේ එකමුතුකම පෙර දෙකට වඩා බෙහෙවින් ගැඹුරු ය. ඔවුන්ගේ පුද්ගලික අසම්පූර්ණත්වය පිළිගන්නා නමුත් ඔවුන්ගේ ස්ථානවලට ළඟා වීමේ ඔවුන්ගේ පුද්ගලික වගකීම ද වැළඳ

ගන්නා ප්‍රාදේශීය සභාවන් ළං කිරීමෙන්, ප්‍රදේශයක් සම්පූර්ණයෙන් එවැන්ජලිස්තකරණය කිරීම කෙරෙහි එය අවධානය යොමු කරයි. එවැනි සභාවන් සදාකාලිකත්වය විසින් නිර්වචනය කරන ලද කාලය අගය කරන අතර දෙවියන් වහන්සේ ශුභාරංචිය තුළ කර ඇති ගැලවීමේ පොරොන්දුව සම්පූර්ණ කිරීම සඳහා ඔවුන්ගේ සියලු වත්කම් ආයෝජනය කිරීමට කැමැත්තෙන් සිටිති. මේ නිසා, ඔවුන් කොපමණ කාලයක් ගත වුවද, ඔවුන්ගේ ස්ථානවල සිටින සෑම පිරිමියෙකුටම, ස්ත්‍රියකට සහ දරුවෙකුටම ශුභාරංචිය ප්‍රවේශ කිරීමට වෙනත් කැමැත්තෙන් සිටින සභාව සමඟ මාර්ග සහ විධි සොයා ගනු ඇත. හවුල්කාරිත්වය මෙවන් ගැඹුරකට ළඟා වන තුරු, අපි සැබවින්ම ශුභාරංචිය සඳහා හවුල්කාරිත්වයක් නොදකිමු.

එකමුතුකමේ පළමු මට්ටම් දෙක මගින් දෙවියන්වහන්සේ විසින් තම සෙනඟ සඳහා මැවූ සහ අදහස් කළ මෙම තුන්වන ආකාරයේ එකමුතුකම ඵලදායී ලෙස ප්‍රතිෂ්ඨාපනය කිරීමට සභාව මෙහෙයවිය හැක. නමුත් බොහෝ විට, සමහර විට සෑම විට පවා, එය එසේ සිදු නොවේ. මේ අනුව, දෙවියන් වහන්සේ ලෝකය සඳහා කර ඇති ගැළවීමේ පොරොන්දුව ඉටු කිරීමට සහ එක් එක් සභාව එය සැබවින්ම පවතින ස්ථානයට එය ගෙනයාමට එබැවින් ඒවා ප්‍රමාණවත් නොවී ඇත.

දෙවියන් වහන්සේ, අපගේ ස්වාමීන් වන යේසුස් ක්‍රිස්තුන් වහන්සේ තුළ, එකමුතුකමේ අංශ තුනම අපට ලබා දෙන අතර, ඒවා සියල්ලම සභාව සඳහා වූ උන් වහන්සේගේ අභිප්‍රාය මත පදනම් වේ. එය දෙවියන් වහන්සේ විසින් යේසුස් ක්‍රිස්තුස් වහන්සේ තුළ උන්වහන්සේගේ *ඒකත්වය වන්නේ* අපව උන්වහන්සේ කැඳවාගත් අය ලෙස ලෝකයට එවා ඇති නිසාත් දෙවියන්වහන්සේගේ මුල් ආකෘතියට අපව හැඩගස්වා ඇති නිසාත්ය. එය යේසුස් වහන්සේ මඟින් උන්වහන්සේ *තුළ* එකමුතුකම වන්නේ අපව උන්වහන්සේගේ කැඳවනු ලැබූවන්, උන්වහන්සේගේ සභාව ලෙස, ලෝකයට යවා ඇති නිසා ය. යේසුස්වහන්සේ තුළ ජීවිතය තේරුම්ගත් විට, දෙවියන් වහන්සේ සභාව තුළ සැලසුම් කර ඇති මිනිසුන් බලමුලු ගැන්වීමේ ප්‍රමාණය සහ සෑම පිරිමියෙකුටම, ස්ත්‍රියකටම සහ දරුවෙකුටම ශුභාරංචිය වෙත ප්‍රවේශය ඇති කිරීමට සභාවේ වගවීම පිළිබඳව අප සම්පූර්ණයෙන් අවබෝධ කරගෙන වැළඳ ගත් විට *එකමුතුකම වෙත* යන්න ඇතිවේ. සෑම අංශයකටම අපෙන් වෙනස් යමක් අවශ්‍ය වේ. *වීම* යනු, සාමයේ බැඳීම තුළ අපි ආත්මයේ එකමුතුකම ආරක්ෂා කිරීමය. *ඒකත්වය* ඇතිවන්නේ, අපි සියලු දෙනාම අවසානයේ ලෝකයේ සභාවේ ස්වභාවයට සහ දෙවියන් වහන්සේගේ අපෝස්තලික ඇමතුමට නැමෙනු ඇතැයි යන අපේක්ෂාවෙන් අපගේ දෑත් අඛණ්ඩව විවෘතව තබා ගැනීම තුළය. එකමුතුකම *සඳහා*, අපි මුළු සභාවේ යහපත අපට කාලයකට තනියම ගමන් කිරීමට සිදු වුවද සඳහා දෙවියන් වහන්සේට කීකරුව වැඩ කළ යුතුය.

පස්වනුව, නායකත්වය විසින් තම සෙනඟව ශුභාරංචිය රෝපණය කිරීමට අවශ්‍ය ස්ථානවලට සහ නව සභා එයින් පිටතට පැමිණෙන පිණිස දෙවියන් වහන්සේගේ මිනිසුන් හට මූල්‍යමය සම්පත් දීමට සූදානම් කළ යුතුය. අප සතු සෑම දෙයක්ම දෙවියන් වහන්සේට අයත් වේ, මන්ද උන්වහන්සේ අපව උන්වහන්සේ සමඟ සම්බන්ධකම් ඇති කිරීමට සැලැස්වූයේ අපගේ ජීවිත සහ උන්වහන්සේ අපට ලබා දී ඇති සියල්ල භාර ගැනීමෙන් අප උන්වහන්සේව නියෝජනය කිරීමට ය.

හයවනුව, සභාව සඳහා දෙවියන් වහන්සේගේ අරමුණෙහි වැදගත්ම අංගයන් තුළ සභාව ඉදිරියට යන ආකාරය මැනිය යුතුය: එනම් ක්‍රිස්තුස් වහන්සේගේ සෙනඟ බලගැන්වීම, ජනතාව බලමුලු ගැන්වීම සහ එහි වගවීමේ කවයේ එවැන්ජලිස්තකරණය යන්නයි. දෙවියන් වහන්සේට කළ හැකි සහ කළ හැකි දේ සඳහා ලාභ ආදේශක මගින් මුළා වීමට සභාව ඉඩ නොදිය යුතුය.

අපට ප්‍රතිසංස්කරණය අවශ්‍යව තිබේ! අද කිතුනු ලෝකයේ බහුලව පවතින පහසු පිළිතුරු වලට ප්‍රතිවිරුද්ධව තේරීම් ඉල්ලා සිටින ගමනක්, බටහිර සභාවේ මෙම පරම්පරාව කළ යුතු ගමනක පෙරනිමිත්තක් බවට මෙම පොත වනු ඇතැයි මගේ බලාපොරොත්තුවයි.

සභාවේ ප්‍රතිසංස්කරණය සඳහා කාලය හා පරාවර්තනය ඉල්ලා සිටිනු ඇත. එය නිවැරදි කිරීමට තුඩු දෙනු ඇත. සභාවල භූගෝලීය අනුබද්ධතාවයකින් එය වඩාත් හොඳින් ඉටු වනු ඇත. ප්‍රතිඵල? සෑම අංශයකින්ම ඔවුන් තබා ගන්නා ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයක් ලබා දෙන සභාවන් අපි ගොඩනඟන්නෙමු. ඇදහිලිවන්තයන් ඔවුන්ගේ ස්ථානවල මිනිසුන් උපාය මාර්ගිකව සම්බන්ධ කරනු ඇත. අවසාන වශයෙන්, ප්‍රතිසංස්කරණය මගින් සභාවක කාර්යක්ෂමතාව එහි ව්‍යුහයෙන් නොව මිනිසුන් ඔවුන්ගේ ඇදහිල්ලෙන් කරන දෙයින් මනිනු ලබන සභා බිහි වනු ඇත.

# උපග්‍රන්ථය 1

# දෙවියන් වහන්සේගේ සභාව සඳහාවූ උන්වහන්සේගේ අරමුණ ක්‍රියාත්මක කිරීම

සභාව සඳහා දෙවියන් වහන්සේගේ අරමුණ සහ ක්‍රිස්තුස් වහන්සේගේ සෙනඟව බලගැන්වීම සඳහා නායකත්වයේ වගකීම ගැන සාකච්ඡා කර ඇති බැවින්, දැන් සභාව සිය කාර්යය ඉටු කිරීම සඳහා බයිබලානුකූල උපාය මාර්ග ක්‍රියාත්මක කරන්නේ කෙසේද?

පළමුව, අපි සභාවේ බලය සමඟද එහි සිටින උන්වහන්සේගේ සෙනඟ තුළ ජීවත්වන ශුද්ධාත්මයාණන් වහන්සේ සමඟද සහයෝගයෙන් කටයුතු කළ යුතුයි - ක්‍රිස්තුස් වහන්සේගේ සෙනඟ වන ජීවමාන දෙවියන් වහන්සේගේ සෙනඟ තුළ ආත්මයාණන් වහන්සේ ජීවත් වන කළ, අප 3 වන පරිච්ඡේදයේ කතා කළ එළිපත්ත අගයන් පහෙන් ජීවත් වනු ඇත, දෙවියන් වහන්සේගේ ප්‍රතිභාවේ කේන්ද්‍රය හෙළි වන්නේ මනුෂ්‍යයන් හට උන් වහන්සේගේ තේජස දැකීමටත්, උන් වහන්සේගේ ධර්මිෂ්ඨකම ස්පර්ශ කිරීමටත්, ජය ගනු පිණිස උන්වහන්සේට ඇද ගැනීමටත් හැකි වීම මගින්ය. දෙවියන්වහන්සේගේ දරුවන් ඔවුන්ගේ ජීවිතයේ සාමාන්‍ය කොටසක් ලෙස තම පූජකත්වය ප්‍රගුණ කරන විට, ඔවුන්ගේ විශේෂ කරුණාවේ සාක්ෂි අනුව ජීවත් වෙමින්, ඔවුන් තුළ ආත්මයේ ජීවිතයෙන් ලැබෙන ඵලයෙන් පරිණත වෙමින්, ආත්මයාණන් වහන්සේ ඔවුන් හට සේවය සඳහා ලබා දී ඇති දීමනා සහ හැකියාවන් මුදා හරින කල, සහ ඔවුන් සඳහා දෙවියන් වහන්සේගේ සැලැස්මට කීකරු වෙමින් ඔවුන්ගේ සියලු වත්කම් ගැන භාරකාරත්වය දරන විට, සභාව ශුභාරංචිය ආලෝකය මගින් ඵලදායී ලෙස අන්ධකාරය පුරවා දැමීම සිදු කරනු ඇත.

දෙවනුව, අපි ආර්ථික යථාර්ථය සමඟ සහයෝගයෙන් කටයුතු කළ යුතුය. අපගේ නායකත්වයේ ව්‍යුහය තුළ සහ අප එක්රැස් වන ස්ථානවල, අප ජීවත් වන ආර්ථික යථාර්ථය සහ දෙවියන් වහන්සේ අපට ලබා දෙන මූල්‍ය වත්කම් සමඟ වගකිව යුතු සහ සාධාරණ වීමේ අවශ්‍යතාවය යන දෙකටම සහයෝගයෙන් කටයුතු කළ යුතුය. අප ඉහත සඳහන් කළ පරිදි, දෙවියන්වහන්සේගේ සෙනඟ උන්වහන්සේගේ බලය තුළ ගමන් කළ යුතු බව අප මතක තබා

ගත යුතු අතර, ඒ අනුව අප විසින් ගෙවල් සහ තමන් නියැළෙන ක්ෂේත්‍රයේ අවට ප්‍රාදේශීය සභාවල ව්‍යුහය සහ ජීවිතය සැලසුම් කළ යුතුය, මෙය මෙහෙයවීමට නායකත්වයෙන් බහුතරයක් වැටුප් නොලබන අය විය යුතුය. අපි ගෙවනු ලබන නායකත්වයේ අවධානය අන් අයව පුහුණු කිරීමට සහ ප්‍රජාවගේ ජීවිතය තුළ බයිබලානුකූල සත්‍යය ආරක්ෂා කිරීමට ඔවුන්ගේ මූලික වගකීම් කෙරෙහි යොමු කරවා තැබිය යුතුය.

තෙවනුව, අප ශුද්ධාත්මයාණන්ගේ ඒත්තු ගැන්වීමේ සේවය සමඟ සහයෝගයෙන් කටයුතු කළ යුතුය. අපි අපගේ සමීපතම කවයන් වෙත ශුභාරංචිය ප්‍රකාශ කරන විට, දෙවියන් වහන්සේ ඔවුන්ව තමන් වෙතට ඇද ගැනීමට දැනටමත් ක්‍රියා කරමින් සිටින පුද්ගලයන් ගැන සොයා බැලිය යුතුය. අපගේ උපක්‍රම සරලව අපව ගෙන යා යුත්තේ මිනිසුන් වෙත, දෙවියන්වහන්සේගේ ආත්මයාණන් වහන්සේට තමන් වරදකරු කරන්නේ, ඒත්තු ගන්වන්නේ, සහ කැඳවන්නේ කවුරුන්ද යන්න අපට පෙන්වීමට ඉඩ සැලසීමට අවශ්‍ය තරම් සමීප භෞතික ප්‍රවේශයකට අපව ගෙන යා යැමය. අපගේ වගකීම වන්නේ අදාළ වීම හෝ ශුභාරංචිය ප්‍රසිද්ධියේ හෙළිදරව් කිරීම නොව සාමාන්‍ය ජීවන අවකාශයන්හි සහ ජීවිතයේ අත්දැකීම්වල මිනිසුන්ට භෞතික සමීපත්වය සහතික කිරීමයි.

හතරවනුව, අපි නායකයින් පුහුණු කළ යුතුයි. අපගේ නායකත්ව ව්‍යුහයන් ඵලදායි ලෙස විමධ්‍යගත කිරීම සඳහා, අපගේ සාමාජිකත්වයේ සිටින සෑම කෙනෙකුටම බලගැන්වීමේ වගකීම විශ්වාසවන්තව හා බයිබලානුකූලව ගෙන යාමට හැකි වන පරිදි ප්‍රමාණවත් නායකත්වයක් අප පුහුණු කළ යුතුය. ඕනෑම සභාවක මූලික නායකත්වයේ මූලික කර්තව්‍යය වන්නේ වැඩසටහන් කළමනාකරණය හෝ ශුද්ධ ලියවිල්ලේ තනි ප්‍රකාශය නොවේ; එය ඇදහිලි ප්‍රජාව මධ්‍යයේ සත්‍යය සුරැකීම සහ සෑම තරාතිරමකම නායකත්වය පුහුණු කිරීම සහ ප්‍රජාවගේ ජීවිතයට මුදා හැරීම වන අතර එමඟින් සභාව සඳහා ලොවෙහි දෙවියන් වහන්සේගේ අරමුණ ඉටු කිරීම සඳහා ශරීරයේ සෑම සාමාජිකයෙකුම සවිබල ගැන්වීමට ඔවුන්ට හැකි වනු ඇත.

පස්වනුව, එම ක්‍රියාවලිය හරහා අපට උපකාර කළ හැකි තවත් උනන්දුවක් දක්වන සභාවක් අපගේ ප්‍රජාව තුළ සොයා ගත යුතුය. දර්ශනය අපේම ප්‍රදේශවලින් ඔබ්බට අසල්වැසි ප්‍රදේශවලට ව්‍යාප්ත කිරීම සඳහා, අපගේ මුළු නගර, ප්‍රාන්ත හෝ ප්‍රාන්තවල සභාවේ වගකීම ඉටු කිරීමට අපට සාහය විය හැකි සහවර සභාවන් හඳුනා ගැනීමට හැකි වන පරිදි අපගේ විශාල ඇදහිලි ප්‍රජාවන් තුළ ප්‍රමාණවත් කාලයක් ගත කළ යුතුය. සභා දෙවියන් වහන්සේගේ අරමුණ සම්බන්ධයෙන් ශුභාරංචිය සඳහා හවුල් වන විට, ඔවුන්ගේ ස්ථානය සම්පූර්ණයෙන්ම

එවැන්ජලිස්ත කිරීමේ අරමුණින්, ඔවුන් අතර ඵලදායී සහ මෙහෙයුම් සහයෝගීතාවයක් ගොඩනගා ගත හැකිය. මෙම පොතේ 7 වන පරිච්ඡේදයේ අප සාකච්ඡා කළ පරිදි වෙනත් ආකාරයේ එකමුතුකමක් විසින්, මෙම "දෙවියන් වහන්සේ තම සෙනඟ හරහා මෙහෙයුමේ" බලපෑම ඇති නොකරනු ඇත.

අවසාන වශයෙන්, සන්තෘප්ත සහා රෝපණය මගින් සපයනු ලබන පුහුණු ද්‍රව්‍ය හරහා සභාවලට එහි නායකත්ව කටයුතු කළ හැකිය: SCP ගමන සහ SCP රීඩර් යන. [1] මෙම සම්පත් දෙකෙහි සභාවලට ඔවුන්ගේ දර්ශනය ගොඩනඟා ගැනීමට, දර්ශනය මැනීමට කැපවීමට, ඔවුන්ගේ ජනතාව සම්පූර්ණයෙන් බලමුලු ගැන්වීමට සහ ආත්මයාණන් වහන්සේ දෙවියන් වහන්සේ ඔවුන්ගේ ස්ථානවල සූදානම් කර ඇති ඕනෑම දෙයක් නෙළා ගැනීමට අවශ්‍ය සියලු සම්පත් අඩංගු වේ. සභාවක් එහි නායකත්වය සමඟ මෙම පුහුණු ද්‍රව්‍ය හරහා ක්‍රියා කිරීමෙන් පසු, එය දෙවියන් වහන්සේ විසින් කිරීමට නියම කර ඇති කාර්යය වටා සංවිධානය වීමට සූදානම් වන අතර අස්වැන්න නෙළීමට එය සපයන අතර වැඩ සටහන් වල සිරස් ගොඩනැඟිල්ල අභිබවා යාමට සභාවේ පාර්ශ්වීය ප්‍රසාරණයට ඉඩ සලසන ආකාරයෙන් එය ව්‍යුහගත කිරීමට හැකි වනු ඇත. බයිබලානුකූල ප්‍රතිපත්ති ක්‍රියාවට නංවන විට, දෙවියන් වහන්සේ ඔවුන්ව තමන් වෙතට ඇද ගැනීම සඳහා අපගේ ස්ථානවල සිටින මිනිසුන් සමඟ සෘජුව සම්බන්ධ වීමට උන් වහන්සේගේ සෙනඟ තුළ යේසුස් වහන්සේගේ මාංසය හැකි වනු ඇත.

# උපග්‍රන්ථය 2
# ලෝකයේ වෙනත් තැන්වල අපගේ අරමුණ ප්‍රක්ෂේපණය (දූර දර්ශණ) කිරීම

වගවීමේ කවයක් තිබීමේ එක් මානයක් මම ප්‍රක්ෂේපණය කිරීම ලෙස හඳුන්වමි. වෙනත් වචන වලින් කිවහොත්, සෑම සභාවකටම දෙවියන් වහන්සේගේ ගැලවීමේ පොරොන්දුවේ කොටසක් තමන්ගේම ස්ථානයේ පමණක් නොව අවම වශයෙන් ලෝකයේ තවත් එක් ස්ථානයක හෝ ප්‍රකාශ කිරීමට දෙවියන් වහන්සේ විසින් ලබා දී ඇති වගකීමක් ඇතැයි මම විශ්වාස කරමි. නමුත් පසුගිය පරම්පරාවල සභාව විසින් සිදු කර ඇති පරිදි ලොව පුරා මිෂනාරිවරුන් හෝ කෙටි කාලීන වැඩ කණ්ඩායම් යැවීමට වඩා, අද සභාව ප්‍රධාන වශයෙන්

ලෝකයේ අනෙකුත් ප්‍රදේශවල සිටින ඇදහිලිවන්තයන් සමඟ නිවසේ සිට හවුල් විය යුතු යැයි මම විශ්වාස කරමි.

යේසුස්වහන්සේ උන්වහන්සේගේ ගෝලයන්ට සහ ඔවුන් තුළින් අපට පැවසූ අවසාන වචන වූයේ අප ගොස් සෑම ජාතියකටම ගෝලයන් කළ යුතු බවයි (මතෙ. 28:19 බලන්න). සෑම ශුභාරංචියකම සහ ක්‍රියා 1;8 හි යේසුස් වහන්සේගේ අවසාන වදන්වල මෙය යැවීම අපි දකිමු: "ඔබ ජෙරුසලමෙහි ද මුළු ජුදයෙහි ද සමාරියෙහි ද පොළොවේ කෙළවර දක්වා ද මාගේ සාක්ෂිකරුවන් වනු ඇත." මම මෙම පොතේ 1වන පරිච්ඡේදයේ පෙන්වීමට උත්සාහ කළ පරිදි, යේසුස්ගේ ගෝලයන් අපගේ ස්වාමින්වහන්සේගේ මෙම ආඥාවට වසර දෙදහසකට වැඩි කාලයක් ඔවුන්ගේම ස්ථානවල, පරම්පරාගතව සහ මාර්ගවල ප්‍රතිචාර දක්වා ඇත. දෙවියන්වහන්සේගේ ගැලවීමේ පොරොන්දුව සහ මනුෂ්‍ය වර්ගයා යේසුස් වහන්සේ තුළ ඇති පැහැදිලි ශුභාරංචිය සම්පූර්ණ කිරීම සඳහා ඒ වන විටත් තම හදවත්, මනස, කැමැත්ත සහ ජීවිතය ලබා දී ඇති අය සමඟ ඔවුන්ගේ ස්ථානය ගැනීමට ප්‍රතිසංස්කරණයෙන් නැගී සිටි අය මෙයට ඇතුළත් වේ.

ශුභාරංචිය මුළු ලෝකයටම ඇතුල් වන බවත්, අපි නව අහසක් සහ නව පොළොවක් අපේක්ෂා කරන ආකාරයටම අපට කැරැල්ලේ අවසානය අපේක්ෂා කළ හැකි බවටත් පැවසුනු යේසුස්වහන්සේගේ වචනවලින් අපේක්ෂා කළ දේ නොදැක මේ සියලු පෙර පරම්පරාවන් මිය ගියහ. (මතෙ. 24:14 බලන්න). නමුත් අපි ජීවත් වන්නේ වෙනස් කාලයකය. එය අවසාන සිදුවීම සාර්ථක ලෙස දැකීමට අපට තවත් බොහෝ දේ කළ යුතු නොවන බව මම විශ්වාස කරන කාලයකි. ක්‍රිස්තියානි ඉතිහාසයේ වෙනත් කිසිම අවස්ථාවක බොහෝ ස්ථානවලින් බොහෝ මිනිසුන් යේසුස්වහන්සේගේ අනුගාමිකයන් පාපොච්චාරණය කළ බවක් මම නොදනිමි. අතීතයේ සිටි බොහෝ දෙනෙකුට වඩා අද සභාව විශාලය, එය කළ හැකි යැයි විශ්වාස කළ හැකි පමණට වඩා බෙහෙවින් විශාල වී ඇත. නමුත් ඇත්ත වශයෙන්ම, සමිඳාණන් වහන්සේ ආපසු නොපැමිණි බව යන්නෙන් අදහස් වන්නේ අපගේ කාර්යය සම්පූර්ණයෙන් සිදු නොවන බවයි. තවමත් ශුභාරංචිය බලාපොරොත්තුවෙන් සිටින පූර්ව ක්‍රිස්තියානි ස්ථාන කිහිපයක හෝ තවමත් ගැලවීම කරා පැමිණිය නොහැකි පශ්චාත් ක්‍රිස්තියානි ස්ථානවල මිනිසුන් නිසැකවම සිටිති.

දහනව වන ශතවර්ෂයේ අවසාන දිනවලදී, ශුභාරංචිය ලොව පුරා ගෙන යාමේ මෙම ගෝලීය උත්සාහයේ නායකත්වය යුරෝපයේ සිට ඇමරිකාව දක්වා කක්ෂගත විය. කෙසේ වෙතත්, පසුගිය දශක තුන තුළ, ලෝක එවැන්ජලිස්තකරණ ප්‍රයත්නය සඳහා ගෝලීය නායකත්වය

නැවතත් කක්ෂගත වී ඇත, මෙවර ඇමරිකානු නායකත්වයෙන් ඇත් වූ නමුත් - එය කක්ෂගත වී ඇත්තේ කාටද යන්න තවමත් පැහැදිලි නැත! සෑම ජාතියකටම ශුභාරංචිය ගෙන යාමට පසුගිය වසර පන්සියයක් පුරා පැවති ආශාව, කැපවීම සහ පරිත්‍යාගය සමහර විට කිසිදු ජාතියක් ලබා නොදෙනු ඇත. අවශ්‍ය පරිදි ඕනෑම තැනක සිට සෑම තැනකටම යැවීමේ ක්‍රියාවලිය මෙහෙයවීමට ආත්මයට හැකි වන තරමට පාපොච්චාරණය කරන ක්‍රිස්තියානීන් ලොව පුරා සිටින බොහෝ දෙනෙකු අපට දැන් හමු වේ.

කෙසේ වෙතත්, මම කනස්සල්ලට පත්වන්නේ ඇමරිකානු සභාව මත මෙම නව යථාර්ථය පටලැවීම ගැනය. 1වන පරිච්ඡේදයේ මා ප්‍රකාශ කළ පරිදි, බොහෝ ඇමරිකානු සභාවන් වල දේවගැතිවරුන් සහ ඔවුන්ගේ සභාවන් හට, මනුෂ්‍ය ඉතිහාසයට දෙවියන් වහන්සේගේ ගැළවීමේ පොරොන්දුවේ කේන්ද්‍රීයභාවය පිළිබඳ දැනුවත්භාවය නොමැතිකම ගැන මම නිතිපතා පුදුම වෙමි. දෙවියන් වහන්සේ කෙරෙහි මෙම උග්‍ර සංවේදීතාවයක් නොමැතිකම සහ උන්වහන්සේගේ ඉතිහාස නිර්මාණයේ (පවා, සහ සමහර විට විශේෂයෙන්, අපගේ පුද්ගලික ඉතිහාස නිර්මාණයේ පවා), බොහෝ දෙනෙක් දෙවියන් වහන්සේ ගෝලීය වශයෙන් කර ඇති සහ කරමින් සිටින දේ ගැන තරමක් නොදැන සිටිති.

සියලුම ජාතීන්ට ගෝලයන් කිරීමට ශුද්ධ ලියවිල්ලේ ආඥාව මගින් අපව පෙලඹවිය නොහැකි නම්, ඇමරිකානුවන් වශයෙන් අප ලෝක ජනගහනයෙන් සියයට 5කට වඩා අඩු ප්‍රමාණයක් වන අතර සමහර විට 1 හෝ 2කට වඩා වැඩි නොවන බව අවබෝධ කර ගැනීමට අපි අවම වශයෙන් ක්‍රියා කළ යුතුය. ලෝකයේ වෙනත් ස්ථානවල සිටින අය වෙත ශුභාරංචිය සඳහා නිසැකවම භාවිතා කළ හැකි බොහෝ වත්කම් අප සතුව ඇත. ශුභාරංචිය ලෝකයට ගෙනයාමට සභාව පවතින බව අප වටහාගත් විට, නිසැකවම එය අපගේ ආත්මාර්ථකාමීත්වය අඩු කළ යුතු අතර අපගේ ජීවිත හා සම්පත් කෙරෙහි වඩාත් සුදුසු අවධානයක් යොමු කළ යුතුය.

**අපගේ වර්තමාන ආදර්ශය සමඟ ගැටලු**

මෙම සදාකාලික හා ගෝලීය යථාර්ථය තුළ ක්‍රිස්තුස් වහන්සේට වඩාත් පූර්ණ ලෙස කීකරු වීමට අපට කළ හැකි දේ ගැන කතා කිරීමට පෙර, ශුභාරංචිය සමඟ ලෝකයට ළඟා වීමේ ඇමරිකානු සභාවේ වත්මන් ආකෘතීන් සමඟ ගැටලු කිහිපයක් පාපොච්චාරණය කිරීමට මට අවශ්‍යය.

පළමුව, ශුභාරංචිය දැන් ලෝකයේ සෑම ප්‍රදේශයකම පවතින බවත්, එය ගැන ප්‍රීති වී තම කාර්යය අවසන් කර විසිර යාම වෙනුවට ඔවුන් විවිධාකාර මාර්ග යොදමින් දිගටම පැවතීමට උත්සාහ දරමින් සිටිති. මෙම පැවැත්මේ මානසිකත්වය නිසා ඔවුන්ව යැවීමට නියෝජනය කළවුන්ට සහ එහි ආධාරකරුවන්ට අනවශ්‍ය ලෙස මුදල් වැය කරනවා පමණක් නොව, බොහෝ විට වෙනත් පරම්පරාවන් මිෂනාරිවරුන් යැයි සැලකූ පරාසයන්ට එකඟ නොවන මෙන් පෙනෙන මිෂනාරිවරුන් බිහි වී ඇත. ඇමරිකානු මිෂනාරිවරුන්ගේ මුළු පරම්පරාවක්ම දෙවියන්වහන්සේගේ සෙනඟ සඳහා වූ අරමුණ තේරුම් නොගන්නා අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් ජාතීන් ගෝලයන් කිරීමේදී සැලකිය යුතු උපකාරයක් ලබා නොදේ. ව්‍යාපෘති ආරම්භ කිරීම සහ ගොඩනැගිලි තැනීම සඳහා ඕනෑම දෙයක් කළත්, තමන් ගිය ස්ථානයන් එවැන්ජලීකරණය වීමට සැලකිය යුතු බලපෑමක් ඇති කරන්නේ ස්වල්ප දෙනෙකි.

මිලියන ගණනක් යේසුස්වහන්සේගේ අනුගාමිකයන් සිටින ස්ථානවල පවා, ඇමරිකානු දූත මණ්ඩල ඒජන්සි විසින් මිනිසුන්ව එහි යැවීම දිගටම කරගෙන යති. මෙම මිෂනාරිවරුන් ශුභාරංචිය දේශනා කිරීමට සභාවට උපකාර කිරීමට උත්සාහ කළද, එහි එම කාර්යය ඔවුන්ට වඩා කාර්යක්ෂමව සිදු කිරීමට දන්නා සභාවන් දැනටමත් එහි පවතී. එසේත් නැතිනම් ඔවුන් ළඟා වී නැති යැයි ඔවුන් සලකන මිනිසුන්ගේ කණ්ඩායමක් ජාතික සභාවේ වගකීම මුළුමනින්ම නොසලකා හරිමින්, ඔවුන් තම මිනිසුන් යවන්නේ, ඔවුන්ගෙන් බොහෝ දෙනෙකුට එවැන්ජලිස්තකරණය, සභා රෝපණය හෝ ඇති දැඩි කිරීම සහ දේශීය නායකත්වය පිළිබඳ දැනුමක් හෝ පළපුරුද්දක් නැතුව තිබියදීය.

දැනටමත් සිදු වී ඇති එවැන්ජලිස්තකරණය සැමරීමට සහ අපගේම උත්සාහයෙන් විසුරුවා හරින්නේ කෙසේදැයි අපි ඇත්ත වශයෙන්ම නොදන්නා බව මම සැක කරමි. ඇමරිකානු ක්‍රිස්තියානි ධර්මය මිෂනාරි කර්මාන්තයක් බවට පත්ව ඇති අතර, ලොව පුරා සිදුවන නව යහපත් යථාර්ථයන් හමුවේ අත්හැරීමට දැඩි තීරණයක් ගැනීමට හැකියාවක් නැතිවී ඇත.

දෙවනුව, ශීඝ්‍රයෙන් වර්ධනය වන ඇමරිකානු සභාවන් සංඛ්‍යාවක් මෙම යථාර්ථය වටහාගෙන ඇත්තේ දූත මණ්ඩල නියෝජිතායතන අකාර්යක්ෂම වී ඇති බවත්, ඒ නිසා ලොව පුරා තමන්ගේම මිනිසුන් යැවීමෙන් රික්තකයට පිවිසෙමිනි. එසේ කිරීම සඳහා තර්ක ඔවුන්ගේ දෘෂ්ටි කෝණයෙන් පැහැදිලි සහ බහුල ය: "ඒජන්සි අපට ඉඩ දෙනවාට වඩා ප්‍රාදේශීය සභාව අධිකව මෙයට සම්බන්ධ විය යුතුය." "දුර ඈතට යවපු අය ගැන අපේ මිනිස්සු තවදුරටත් දන්නේ දන්නේ නැති නිසා, ඒ අය ගැන සැලකිල්ලක් දක්වන්නේ නැහැ." "අපි සැබෑ දෙයක් ස්පර්ශ කරන බවක් අපට දැනිය යුතුයි." "අපේ මිනිසුන්ට ප්‍රථමයෙන් මේ ගැන වැඩියෙන්

දැනුවත් කිරීම මගින්  අධික සැපයීම සහ යාච්ඤාව ලැබෙනු ඇත.." ඒ සියල්ල ඉතා හොඳය! කොතරම් හොඳද යත්, ඇත්ත වශයෙන්ම, බොහෝ දූත මණ්ඩල ඒජන්සි කණ්ඩායමට සම්බන්ධ වී ඇති අතර ඔවුන්ගේ ක්ෂේත්‍ර පුද්ගලයින් සමඟ ඇමරිකානු කණ්ඩායම්වලට සත්කාරකත්වය සැපයීම සඳහා විශාල කාලයක් වැය කරන සංචාරක නියෝජිතායතන බවට පත් වී ඇත.

මෙම කෙටි කාලීන කණ්ඩායම් උමතුවෙන් යම් යහපතක් සිදුවිය හැකි වුවද, භූමිය මතවූ සිදු විය යුතු සාධකයන් යහපත් ප්‍රතිඵල නොපෙන්වන්නේය. එය අවුල් සහගත වී ඇත! බොහෝ කණ්ඩායම් එකම ස්ථානවලට ගොස් ප්‍රාදේශීය නායකයින් යටපත් කරන අතර, ඇමරිකානු පුද්ගලයින් යම් යම් පුද්ගලයින් සමඟ සම්බන්ධ වී අනවශ්‍ය යැපීම් ඇති කර අවසානයේ ඔවුන්ට ඔවුන් කෙලින්ම ඉල්ලා සිටි නිසා හෝ ඔවුන්ගේම කැමැත්තෙන් හෝ මුදල් පවා යවති.

නමුත් මෙම ප්‍රවේශයේ ඇති ලොකුම ගැටලුව නම් එය ශුභාරංචියේ පණිවිඩය දූෂණය කිරීමයි. ජනතාව දන්නා භාෂාවකින් සහ සංස්කෘතියකින් ප්‍රාදේශීය ජනතාව වෙත ශුභාරංචිය ගෙනයාමට මෙම කණ්ඩායම්වලට ප්‍රමාණවත් ලෙස ඔවුන්ව සූදානම් කළ නොහැකියි. ඔව්, ඇත්ත වශයෙන්ම, සමහර විට එසේ නොවන අවස්ථාද නැතුවා නොවේ. නමුත් වසර සිය ගණනක පුහුණු සහ පළපුරුදු මිෂනාරිවරුන් විසින් මෙම රීතිය ඉගෙන ගෙන ක්‍රියාවට නංවා ඇති අතර, මෙම කෙටි කාලීන කණ්ඩායම් විසින් මෙම හොඳින් උගත් සහ ඔප්පු කරන ලද සංස්කෘතික සම්බන්ධතා නීති සියල්ල බිඳ දමයි. එක් ග්‍රීෂ්ම ඍතුවකදී, සම්පූර්ණයෙන්ම විසන්ධි වූ ආයතන සහ සභාවන් විසින් ඇමරිකානු තරුණයින් දස දහසකට වැඩි පිරිසක් ප්‍රදේශවාසීන් පිරිසක් "ඉවැන්ජලිස්ත" කිරීම සඳහා යවා තිබූ අතර, අවසානයේදී එවැන්ජලීකරණය වෙනුවට සිදු වුණේ, සභාව සහ ශුභාරංචිය විදේශීය ද ඇමරිකානු ද යන්න පිළිබඳව ප්‍රදේශවාසීන් අතරේ ව්‍යාකූලත්වයක් පමණක් ඇති කළ බව මට පවසමින් මිෂනාරිවරයෙක් දුක්වූයේය.

මේ දිනවල ඕනෑම කෙනෙකුට ඉතා පහසුවෙන් ඕනෑම තැනකට යා හැකි නිසා පහසුවෙන් කළ හැකි දෙයක් වී ඇති මෙම නව උපක්‍රමය, ප්‍රාදේශීය සභාවන්ට ඔවුන්ගේ අයවැයෙන් වැඩි ප්‍රමාණයක් දේශීයව වැය කිරීමට ඉඩ සලසන සළුවක් මිස අන් කිසිවක් නොවන බව මම සැක කරමි (එනමුත් මම වැරදි යැයි මම ප්‍රාර්ථනා කරමි). මීට පෙර සභාවන් තම අයවැයෙන් සියයට 10ක් හෝ 20ක් විදේශ රටවලට යැවූ නමුත්, කෙටි කාලීන කණ්ඩායම් ඔවුන්ගේම අරමුදල්වලින් වැඩි ප්‍රමාණයක් රැස් කරගන්නා බැවින් දැන් ඔවුන්ට එය කපා හැරිය හැක.

ධර්මිෂ්ඨකම සහ විනිශ්චය පිළිබඳ ලෝකයට ඒත්තු ගැන්වීමේ කාර්යය වන දෙවියන් වහන්සේගේ ආත්මයාණන් වහන්සේ අමනාප වී ඇතැයි මම විශ්වාස කරන අතර ඒ ගැන මම තැති ගෙන සිටිමි. වෙනත් කිසිම පරම්පරාවක් සිහින මැවූවාට වඩා සභාව "හොඳින්" කිරීම වෙනුවෙන් ඇතිකරගත් අපගේ අලුතින් සොයාගත් සභා විද්‍යාව අපව මසුරුකමට පත් කර ඇති අතර දෙවියන් වහන්සේ අපට මෙම වගකීම් පවරා ඇති මිනිසුන් වෙතටද අප මෙම ආකල්පය ඇතිකර ඇත.

ගෝලීය කිතුනු ප්‍රජාවෙන් සියයට 2කට වඩා වැඩි ප්‍රතිශතයක් අප සතුව නැති නමුත් එහි වත්කම්වලින් මෙතරම් විශාල ප්‍රතිශතයක් අප සතුව ඇති බව පිළිගනිමින් දෙවියන් වහන්සේ සහ ශුභාරංචියේ ගැලවීම පිළිබඳ උන්වහන්සේගේ පොරොන්දුව ඉදිරියෙහි අප අපවම සාධාරණීකරණය කරන්නේ කෙසේද?

**අපගේ අරමුණ ප්‍රක්ෂේපණය (Telescoping - දූර දර්ශණ) කළ හැකි ආකාර**

අපගේ අරමුණ එසේනම් දෙවියන්වහන්සේගේ ගැලවීමේ පොරොන්දුවෙහි ඇඟවුම් කර ඇති කාර්යය සම්පූර්ණ කිරීමට සම්පූර්ණයෙන් සහභාගී වීමට වගකිව යුතු සභාවන් වශයෙන්, අප මෙම කාර්යයට හවුල් වන්නේ කෙසේද? හොඳම ක්‍රමය ඇමරිකානු සභාවන් ලොව පුරා ජාතික සභා ජාල සමඟ හවුල් වීම බව මම විශ්වාස කරමි. මම ප්‍රක්ෂේපණය ලෙස හඳුන්වන දෙය මෙය නිර්වචනය කරයි.

මෙය අපව දිගු කරනු ඇත; ඇත්ත වශයෙන්ම, එයට කෙතතරම් ඉල්ලුමක් ඇත්ද නම්, අපි මෙතරම් කාලයක් අපගේ මිනිසුන්ට ප්‍රතිවිරුද්ධ ප්‍රතිඵල ලබා දී ඇති නිසා, අපට වෙනසක් කළ හැකිද යන්න මට සැකයි. ඇත්ත වශයෙන්ම, දෙවියන් වහන්සේ උන්වහන්සේගේ පරමාධිපත්‍යය තුළ උන්වහන්සේගේම ආශාවන් සම්පූර්ණ කරනු ඇතැයි මම සැමවිටම බලාපොරොත්තු වෙමි, නමුත් ඇමරිකානු ක්‍රිස්තියානීන් උන්වහන්සේගේ වැඩ කටයුතුවල ඵලදායී ගෝලීය හවුල්කරුවන් වේවිද? මම නොදනිමි!

සභාවේ හවුල්කාරිත්වයේ මෙම සමස්ත මානය සඳහාම විශාල ප්‍රතිසංස්කරණයක් අවශ්‍ය වේ. පහත දැක්වෙන්නේ වත්මන් ක්‍රමයට වෙනස් කිරීම් ලෙස නොව නිර්භීත නව අදහස් ලෙස පෙර පරිච්ඡේද හතේ ප්‍රකාශිත සිතුවිලි මත පදනම්ව යෝජනා කරන ලද උපාය මාර්ග කිහිපයක් ය.

**පළමුව,** ඇමරිකානු සභාවන් ඔවුන් සහ ඔවුන්ගේ ප්‍රාදේශීය හවුල්කාර සභාවන් ඔවුන්ගේම කවයන් තුළ කරන දේ එම ස්ථානයේ කිරීමට දේශීය සභා ජාල සහ නායකයින් සමඟ ඵලදායී

හා සංවේදීව හවුල් විය හැකි ලෝකයේ එක් ස්ථානයක් තෝරා ගත යුතුය. දෙවියන් වහන්සේ අප අවට ලෝකයේ කුමක් කිරීමට ගියත්, ක්‍රිස්තුස් වහන්සේගේ සියලු සෙනඟ හරහා උන්වහන්සේ එය කිරීමට යන බවට ඇති විශ්වාසයේ ස්වාභාවික දිගුව මෙයයි. අපට සමීපතම භූගෝලීය ස්ථානවල මෙය සිදුවීමේ හැකියාව දැකීම අපට පහසු ය; අපි තව දුර යන විට එය වඩාත් දුෂ්කර වේ. නමුත් ශුභාරංචියේ පැහැදිලි යැවීමේ ස්වභාවය සහ කිතුනුවන් ලොව පුරා සිටින ගෝලීය යථාර්ථය අනුව, සෑම සභාවක්ම කාර්යයට සහභාගී වීමට මාර්ගයක් සෙවිය යුතුය.

අප දැක ඇති පරිදි, ඓතිහාසික වශයෙන් මෙයින් අදහස් කර ඇත්තේ මිෂනාරිවරුන් ලෙස හඳුන්වන පුද්ගලයින් ලොව පුරා සිටින මිනිසුන්ට සහ ස්ථානවලට යැවීමයි. මෙම ක්‍රමය සෑම විටම පරිපූර්ණ ලෙස ක්‍රියා නොකළ නමුත් දෙවියන් වහන්සේ තම ආශාවන් ඉටු කර ගැනීමට මෙම ක්‍රමය භාවිතා කළ සේක. නමුත් ලෝකය අප මත වෙනස් වී ඇත; ඇමරිකානු සභාව සමහර මිෂනාරිවරුන් යැවීම දිගටම කරගෙන යා යුතු අතර, අපට අතීතයේ තරම් බොහෝ දෙනෙක් අවශ්‍ය නොවේ. ඒ වෙනුවට ප්‍රාදේශීය සභාව ලෝකයේ තවමත් ඉටු කිරීමට නියමිත කාර්යයට තමන් සහ එහි ජනතාව සම්බන්ධ කිරීමට නව ක්‍රම සොයා ගත යුතුය.

එය කිරීමට ලොව පුරා සභාවල ජාතික හවුල්කරුවන් සොයා ගැනීමට වඩා හොඳ ක්‍රමයක් මට නොපෙනේ. කෙසේ වෙතත්, ඕනෑම හවුල්කරුවෙකු වීම පමණක් නොවේ; ඔවුන් තම ඉලක්කය හෝ ඔවුන්ගේ වගවීමේ කවය හඳුනාගෙන ඇති හවුල්කරුවන් විය යුතු අතර, මෙම ඉලක්කගත ප්‍රදේශය තුළ සිටින අය වෙත ළඟා වීමට ඔවුන්ගේ පුද්ගලයින් සහ වත්කම් බලමුලු ගැන්වීමට උත්සාහ කරන අය යුතුය. එම කවයට මුළු නගරයක් හෝ ජාතියක් ඇතුළත් වන්නේ නම් එය වඩාත් හොඳය. සභාව 100,000 ක් හෝ ඊට වැඩි ප්‍රදේශයක් වටා රවුමක් ඇඳ තිබේ නම් සහ සභාවන් දැනටමත් රෝපණය කර ඇත්තේ කොතැනද සහ ප්‍රදේශයට තවමත් ශුභාරංචිය සාක්ෂියක් අවශ්‍ය වන්නේ කොතැනදැයි දන්නේ නම් එය හොඳම දෙයයි.

මෙවැනි සූදානමකින් එම ස්ථානය සම්පූර්ණයෙන් එවැන්ජලිස්ත කිරීම සඳහා කළ යුතු දේ සියල්ලන්ටම පැහැදිලි වන අතර, ලොව පුරා සිටින මෙම සභාවන් අප කරන එකම කැඳවීමට මුහුණ දෙන බව ඇමරිකානුවන් වශයෙන් අපට වහාම හඳුනාගත හැකිය: එය නම්, දෙවියන් වහන්සේගේ සෙනඟ බලමුලු ගැන්වීම සහ නායකත්වය පුහුණු කිරීමය. මෙය දැනගැනීම මගින් අපගේ හවුල්කාරිත්වයේ වැදගත්ම අවධානය සභා ගොඩනැගිලි, රෝහල් හෝ පාසල් ගොඩනගා ගැනීමට ඔවුන්ට උපකාර කිරීමට අපව හසුවීමෙන් වලක්වනු ඇත. එනමුත්, අනාථ

දරුවන්ට සහ වැන්දඹුවන්ට උපස්ථාන කිරීම වැනි ඔවුන්ගේ ඉලක්කගත ජනගහනය අතර වර්ධනය වීමට ඔවුන්ට අවශ්‍ය ඕනෑම කාර්යයකදී, එම කාර්යය පවත්වා ගැනීමට ඔවුන්ගේ හැකියාවට ප්‍රමාණවත් අයුරින් අපට උපකාර කළ හැක.

**දෙවනුව,** ඇමරිකානු සභාවන් ඔවුන්ගේ දේශීය හවුල්කාර සභාවන් සමඟ එම එක් විදේශීය ස්ථානයකද එකට වැඩ කළ යුතුය. අපගේ වගවීමේ කවයන් තුළ තවත් සභාවන් සමඟ කාර්යයට හවුල් වුවහොත් දිගු-දුර හවුල්කාරිත්වය වඩාත් ඵලදායී ලෙස සිදු කළ හැකිය. මෙමගින් විදේශීය ඉලක්කය විශාල එකක් වීමටද ඉඩ සැලසිය හැක. අපි විදේශ රටවල තනි ප්‍රාදේශීය සභාවක් සමඟ හවුල් වීමෙන් වැළකී සිටිය යුතු නමුත් විශාල සභා ජාලයන් කෙරෙහි අවධානය යොමු කළ යුතු අතර, මෙම සභාවන්වල දේශීය වගකීම් පැහැර ගන්නා කිසිදු ආයෝජනයක් කිරීමෙන් හෝ ඔවුන්ගේ පැවැත්මට ඔබ්බට ගිය පද්ධති ගොඩනැගීමෙන් අපි වැළකී සිටිය යුතුය.

**තෙවනුව,** ඇමරිකානු සභාවන් මෙතරම් කුඩා කණ්ඩායම් වෙනත් රටවලට නොයැවිය යුතුය. අපට විදේශගත කිරීමට වඩාත්ම වැදගත් පුද්ගලයින් වන්නේ අපගේ නායකයින් ය, විශේෂයෙන් අපගේම වගකීම් කවයන් තුළ අපගේම පුද්ගලයින්ට සේවය කිරීම තුළින් නායකත්ව කාර්යයේ පරිණත වූ අයයි. අප ප්‍රාර්ථනා කරන පරිදි, වෙනත් රටවල මිනිසුන්ට අපගේ දේශනා, එවැන්ජලිස්ත කිරීමට සහ සභා සිටුවීමට අපෙන් බොහෝ උපකාර හෝ අපගේ ඕනෑවට වඩා පුහුණු ද්‍රව්‍ය අවශ්‍ය නොවේ. ඔවුන්ට අවශ්‍ය අවසාන දෙය නම් ඇමරිකානුවන් විශාල වශයෙන් සභාව කරන්නේ කෙසේද යන්න තේරුම් ගැනීමයි. ඒ නිසා වැඩි පිරිසක් පිටරට යැවීම ගැන අපි කල්පනාකාරී විය යුතුයි. අපි කණ්ඩායම්ද කණ්ඩායම් ප්‍රමාණයද අප යවන පුද්ගලයින්ද සීමා කළ යුතුය. අපිට වැඩ කණ්ඩායමක් යැවීමට අවශ්‍ය නම්, අපි නැවත ඒ ගැන සිතා බැලිය යුතුය. ඒ වෙනුවට යැවීම සඳහා ඇමරිකාවෙන් තැනක් සොයාගත හැක.

**හතරවනුව,** ඇමරිකානු සභාවන් ලෝකය ගැන තම ජනතාව දැනුවත් කිරීමට කාලය ගත යුතුය. අපි කිසිවිටෙකත් අපේ ජනතාව එතෙර නොයවා පොදුවේ ලෝකය ගැනත් අද දක්වා ලෝක එවැන්ජලිස්තකරණ ප්‍රයත්නයන් ගැනත් ඔවුන්ව දැනුවත් කිරීමට වැඩි කාලයක් හා වැයමක් යොදවන්නේ නම් මම සෑහීමකට පත් වනු ඇත. ඇත්ත වශයෙන්ම, අපි ඔවුන්ව නිසි ලෙස පුහුණු කළහොත්, අපගේ විදේශීය හවුල්කරුවන්ට මෙම කාර්යය සඳහා අපට උපකාර කළ හැකිය.

වැදගත්ම දෙය නම්, අපගේ නායකත්වයම ශුභාරංචිය මුළු ලෝකයටම ගෙනයාමේ වරම ගැන ඒත්තු ගැන්වූයේ නම් සහ සදාකාලික හා ගෝලීය ඉදිරි දර්ශනයකින් තමන්ව දැනුවත් කළේ නම්, මෙය පමණක් ඇමරිකානු සභාවන්වල පරිසරය වෙනස් කරනු ඇත. බටහිර සභාවේ ඓතිහාසික හා ගෝලීය ශුභාරංචිය සම්බන්ධව ඒත්තු ගැන්වීම සහ අවබෝධය නොමැතිකම අපගේ දැනුම නොමැතිකමේ ප්‍රධාන වරදකරු විය හැකිය.

**පස්වනුව,** ඇමරිකානු සභාවන් ඔවුන් කිසි විටෙකත් එහි නොගියද එම ස්ථානය වෙනුවෙන් යාච්ඤා කරන ලෙස තම ජනතාවගෙන් ඉල්ලා සිටිය යුතුය. අපි අපේ මිනිසුන්ට ඉගැන්විය යුතු අතර ඔවුන් ලොව පුරා ස්ථාන සඳහා යාච්ඤා කිරීමට ඉගෙන ගන්නා අතරතුර පවා සදාකාලික හා ගෝලීය ඉදිරි දර්ශනයකින් තම දරුවන් ඇති දැඩි කිරීමට පටන් ගන්නේ කෙසේදැයි ඔවුන්ට පෙන්විය යුතුය. මෙය ඇමරිකානුවන් දිනකට පැය විසිහතරක්, සතියේ දින හතේම මුණගැසෙන අපේ සංස්කෘතියේ නාර්සිස්වාදය පිටුදැකීමට බොහෝ දුර යා හැකිය.

**හයවනුව,** ඇමරිකානු සභාවන් මෙම ප්‍රක්ෂේපිත සේවාවන්ට තමන්ගේම අයවැයෙන් වැඩි ප්‍රමාණයක් ලබා දීමට ක්‍රමයක් සොයාගත යුතුය. අපගේ සභාවල අයවැයෙන් සියයට 50ක් අපගේ දේශීය කවයන්ට සහ අපගේ විදේශීය ඉලක්කවලට ලබා දීම ඇත්තෙන්ම ඕනෑවට වඩා වැඩි වේද?

**හත්වනුව,** ඇමරිකානු සභාවන් ඔවුන්ගේ මූලික නායකත්වය ඔවුන්ගේ විදේශීය ඉලක්කය වෙත යැවිය යුතු අතර අපගේ දේශීය ඉලක්ක තුළ අප කරන දේ කිරීමට එහි සිටින ඇදහිලිවන්තයන්ට උපකාර කිරීමට සහභාගී විය යුතුය. නායකත්වය මේ ගැන සැලකිලිමත් වන, අවබෝධ කර ගන්නා සහ මූල්‍යමය සම්පත් දෙන තරමටම අපගේ සභාවන්ද මේ ගැන රැකබලා ගැනීමට, අවබෝධ කර ගැනීමට සහ මූල්‍යමය සම්පත් ලබා දීමට ඉඩ ඇත. අපි අපේ නායකත්වය යවා ජනතාවට ගෙදර සිටීමට ඉඩ දිය යුතුය.

**අටවනුව,** විදේශීය දේශීය සභා ප්‍රාථමික වාහකය බවට පත් කිරීමට උදව් නොකරන සහ එවැන්ජලිස්තකරණයට සහ සභා සිටුවීමට සෘජුවම සම්බන්ධ නොවන සංවර්ධන උපාය මාර්ග ගැන ඇමරිකානු සභාව ප්‍රවේශම් විය යුතුය. වැන්දඹුවන් සහ දරුවන් රැකබලා ගැනීම වැනි සමාජ සේවා සංවර්ධනය කිරීම, බොහෝ විට සෑම විටම එවැනි කාර්යයක් වනු ඇත, මන්ද මුදල් කළමනාකරණයේ පුද්ගලයින් සමඟ හවුල් වීම වැරදි වලට තුඩු දිය හැකි බැවිනි. මගේ එක නීතියක් නම්, යම් ස්ථානයක ශුභාරංචිය ප්‍රකාශ කිරීමේ ක්‍රියාවලියේදී සංවර්ධනය අවශ්‍ය නම්, එම කාර්යය විදේශීය සභාවලට පවත්වා ගැනීමට තරම් කුඩා විය යුතු අතර, ඇමරිකානු සභා හැකිතාක් දුරට නොපෙනී සිටීමට උත්සාහ කළ යුතුය. ශුභාරංචිය හැකි තරම් සන්දර්භ හා

ස්වදේශික විය යුතුය. බොහෝ ස්ථානවල විදේශීය මුහුණු එහි ව්‍යාප්තිය අවුල් කරයි, විශේෂයෙන්ම ශුභාරංචිය ප්‍රකාශ කිරීම විදේශීය ජනයාට ලබා ගත නොහැකි ධනයේ ප්‍රකාශනවලට සම්බන්ධ නම්.

මෙම ක්‍රමය මගින් දරිද්‍රතාවය, අත්හැරීම හෝ පීඩාවට සම්බන්ධ පද්ධති වෙනස් නොකරනු ඇත. නමුත් අපි සෑම වැන්දඹුවකටම උදව් නොකළත්, ප්‍රාදේශීය සභාවන් යේසුස්වහන්සේගේ ජීවන රටාවක් ගත කරන විට, වැන්දඹුවන් තුනක් හෝ හතරක් හෝ පනහක් හෝ වැඩි ගණනක් උපකාර කරනු ලැබේ සහ ශුභාරංචියද ප්‍රකාශනය කරනු ලැබේ!

**නවවැන්න,** ඇමරිකානු සභාවන් අපේ රටෙන් ලෝකයට යන මිෂනාරිවරුන් යැවීම සහ සහය දැක්වීම දිගටම කරගෙන යා යුතුය. නමුත් අප එවිය යුත්තේ සභාව දෙවියන් විසින් නිර්මාණය කර ඇති ආකාරයටම ඔවුන් සැබවින්ම වටහාගෙන ඇති බවත්, ඒ තුළ නායකත්වය ක්‍රියාත්මක විය යුතු ආකාරය සහ වඩාත්ම වැදගත් දෙය නම්, අන් අයට පහසුකම් සපයන්නේ කෙසේද යන්න සහ තමන් විසින්ම කාර්යය කරන්නේ කෙසේද යන්නත් අත්දැකීමෙන් පෙන්වා දුන් අය පමණි. අපි සවන් දෙන හදවතක් සහ කීකරු කැමැත්තක් දකින සමහර යෞවනයන් ද එවිය යුතුය. මෙම තරුණ ඇදහිලිවන්තයන්ට ගෝලයන් වීමට පළපුරුදු පුද්ගලයන් කණ්ඩායමක් තරම් හොඳ තැනක් තවත් නැත. අනාගතයේදී ඔවුන් කුමන සේවයක සිටියත් කමක් නැත; මෙම අත්දැකීම දෙවියන් වහන්සේ ඔවුන්ව කොතැනකට ගෙන ගියත් නායකත්වයේ කොටස්කරුවන් වීමට ඔවුන් සූදානම් කරනු ඇත.

**අවසාන වශයෙන්,** ඇමරිකානු සභාවන් ඔවුන්ගේ විදේශීය හවුල්කරුවන් සහ ඔවුන් වෙත එවන මිෂනාරිවරුන් නිතිපතා වගකිව යුතුය. අපගේ දේශීය සභාවල මෙන්, අපගේ විදේශීය හවුල්කාරිත්වයන් තුළ අප විසින් මැනිය යුතු දේ අප දැනටමත් සාකච්ඡා කර ඇති දේ වේ: මිනිසුන් බයිබලානුකූල එළිපත්ත අගයන් පහ තුළ වර්ධනය වන්නේද? දෙවියන් වහන්සේ ඔවුන්ට අවස්ථාව ලබා දෙන ඕනෑම තැනක සහ සෑම තැනකම ඔවුන් එම වටිනාකම් තුළ ජීවත් වෙනවාද? සභාව එහි කවය මත මැනිය හැකි බලපෑමක් ඇති කරයිද? ඇදහිල්ලට එන අය අපි දකිනවාද? අපි අපගේ හවුල්කරුවන්ට සහ මිෂනාරිවරුන්ට වග කිව යුතු බැවින්, අපි එම දේවල් සඳහාම වගකිව යුතුය. අප චේතනාන්විතව අපටම අදාළ නොවන වගවීමේ ප්‍රමිතියක් අන් අයගෙන් ඉල්ලා සිටීම අඥාන ක්‍රියාවකි. මෙම යෝජනා කිසිවක් ඇමරිකානු සභාවේ සියලු ගැටලු විසඳන්නේ නැත. නමුත් ඉදිරි දශක කිහිපය තුළ එය සෞඛ්‍ය සම්පන්න යැවීමකට, යාමට සහ වර්ධනය වීමට ඉඩ සලසයි.

# සටහන්

**පෙරවදන**

1. මා ලියා ඇති පොත්, ලිපි සහ DVD තැටි, Saturation Church Planting International හි වෙබ් අඩවිය වන www.spcglobal.org හි ඇත.

**හැඳින්වීම**

1. දෙවියන් වහන්සේ සමඟ ඇති සබඳතාව සහ නියෝජනය පිළිබඳ ගැඹුරු සිතුවිලි සඳහා, දිව්‍යමය නිර්මාණය: ආරම්භයේ දී (http://scpglobal.org/resources/) කියවන්න.

**1 වන පරිච්ඡේදය: අපි අපේ ජාතියේ ඉතිහාසය ලියන්නෙමු**

1. මෙම සංඛ්‍යා සඳහා නිශ්චිත මූලාශ්‍රයක් මා සතුව නොමැති අතර, මම පෞද්ගලිකව මෙම සභාව් වර්ධනයේ කොටස්කරුවෙකු වී ඇති අතර මෙය නිවැරදි යැයි විශ්වාස කරන බොහෝ දෙනාගෙන් කෙනෙකි. 1990 ගණන්වල ඔපරේෂන් වර්ල්ඩ් හි පැට්‍රික් ජොන්ස්ටන් නිගමනය කළේ 2000 වන විට ඉන්දියාවේ නව සභාවන් 200,000 ක් ඇති බවත් සභාව සියයට 15 ක පමණ වාර්ෂික සාමාන්‍ය වර්ධන වේගයකින් ප්‍රතිනිෂ්පාදනය වන බවත්ය. එම අනුපාතය අදටත් නොනැසී පවතී.

2. ජිම් මොන්ට්ගොමරිගේ, *මම එය බැබළීමට ඉඩ දෙන්නෙමි:* යාමට ප්‍රදීපාගාර මිලියන 10 (පැසදීනා, CA: William Carey Library, 2001), x. "උදාහරණයක් ලෙස, 1974 දී සියල්ල ආරම්භ වූ DAWN පිලිපීනයේ, 2000 අවසානය වන විට සභා 5,000 සිට 50,000 දක්වා වැඩි කිරීමේ එහි ඉලක්කය සපුරාලීම සමරනු ලැබීය."

3. Kelly Shattuck, "විස්මිත කරුණු 7: ඇමරිකාවේ සභාවේ පැමිණීම දෙස සමීප බැල්මක්", දෙසැම්බර් 29, 2015, *ChurchLeaders,* http://churchleaders.com/pastors/pastorarticles/139575-7-startling-facts-an- up-close-lookat-church-atendance-in-america.html (ප්‍රවේශය ජූනි 5, 2017).

4. Del Tackett, "ක්‍රිස්තියානි ලෝක දර්ශනයක් යනු කුමක්ද?" පවුල කෙරෙහි අවධානය යොමු කරන්න, http://www.focusonthefamily.com/faith/christia n-worldview/whats-a-christianworldview/whats-a-worldview-anyway (ජූනි 5, 2017 ප්‍රවේශ විය).

**3 වන පරිච්ඡේදය: සභාව එහි සාර්ථකත්වය නිර්වචනය කළ යුත්තේ කෙසේද?**

1. A Min Awake: An Anthology of CS Lewis (London: Geoffrey Bles, 1968), 130. පරිච්ඡේදය

**6: සභාවේ අන්තර් රඳා පැවැත්ම**

1. DA Carson, The Gospel According to John, Pillar New Testament Commentary (Leicester, England: Inter -වර්සිටි ප්‍රෙස්, 1991), 521.

2. මෙරිල් සී.ටෙනී, ජෝන්: ද ගොස්පල් ඔෆ් බිලීෆ්: ඇන් ඇනලිටික් ස්ටඩි ඔෆ් ද ටෙක්ස්ට් (ග්‍රෑන්ඩ් රිපිඩ්ස්: ඊර්ඩ්මන්ස්, 1976), 31-32. 3. ප්‍රාදේශීය සභාව සඳහා පමණක් නොව විශාල වශයෙන් සභාව සඳහා නායකත්වයේ කාර්යයන් පහ පිළිබඳ වැඩි විස්තර සඳහා, FF Bruce විසින් රචිත පොත් දෙකක් බලන්න: The Pauline Circle and Men and Movements in Primitive Church: Studies in Early පෝලීන් නොවන ක්‍රිස්තියානි ධර්මය.

**උපග්‍රන්ථය 1: ඔහුගේ සභාව සඳහා දෙවියන්ගේ අරමුණ ක්‍රියාත්මක කිරීම**

1. ඔබට www.scpglobal.org හිදී දෙවියන් වහන්සේගේ ගැලවීමේ පොරොන්දුව වඩාත් හොඳින් අවබෝධ කර ගැනීමට සහ ක්‍රියාත්මක කිරීමට ඔබට උපකාර කිරීමට ඇති SCP ගමන සහ SCP Reader සොයාගත හැකිය.

**ප්‍රතිසංස්කරණය**

**සභා ජීවිතයේ දිව්‍යමය නිර්මිතය පිළිබඳ සමීක්ෂණයක්**

**ඩ්වයිට් පී. ස්මිත්**

Saturation Church Planting International (www.scpglobal.org) හි නිර්මාතෘ වන ඔහු දැනට ලොව පුරා වැඩෙමින් සිටින සභා නායකයින් ගණනාවක් සමඟ සෑම පිරිමියෙකුටම, ස්ත්‍රියකටම සහ දරුවෙකුටම ඔවුන්ගේ ජාතිය තුළ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ශුභාරංචිය සමඟ මෙම පරම්පරාව තුළදී ළඟා වීමේ ඉලක්කය වෙත වැඩ කරමින් සිටී. මෙම සභාවන් මෙම මූලධර්ම පිටුපස ඇති සත්‍යයට සාක්ෂි දරති. ඩ්වයිට්ගේ ස්ථිර විශ්වාසය නම් ක්‍රිස්තුස් වහන්සේගේ බයිබලානුකූල ශරීරයකට නායකත්වය උන්වහන්සේගේ මෙහෙයුම වෙත නැවත හැරීමයි.

ඩ්වයිට්ගේ අත්දැකීම් පැමිණෙන්නේ කලින් සන්තෘප්ත සභා රෝපණය සඳහා සන්ධානයේ සහ යුනයිටඩ් වර්ල්ඩ් මිෂන්හි සභාපති ලෙස සේවය කිරීමෙනි. ඔහු කැලිෆෝනියාවේ සැන් ජෝස් හි කෝනර්ස්ටෝන් බයිබල් සභාවේ ආරම්භක දේවගැතිවරයා ද වේ. අන්තර් සංස්කෘතික අධ්‍යයනය පිළිබඳ ඔහුගේ ආචාර්ය උපාධිය සඳහා ඔහු රටවල් 70කට අධික සංඛ්‍යාවකටද, කොලොම්බියාව සහ දකුණු ඇමරිකාවේ දූත මණ්ඩල වාර දෙකක සංචාරය කර ඇති අතර ඔහුගේ ජීවිතයේ වැඩි කාලයක් සභාව ලෝකය පුරා ව්‍යාප්ත කිරීමට ගත කළේය.

ඩ්වයිට් සහ ඔහුගේ බිරිඳ පැටී සෑම වසරකම බොහෝ ජාතීන් වෙතට සංචාරය කරමින් දේශීය නායකත්ව කණ්ඩායම් සමඟ කාලය ගත කිරීමටත් සහ මෙම මූලධර්ම වලින් යථාර්ථයක් ගොඩනැගීමට ඔවුන්ට උපකාර කර ඇත. ඔවුන් ගමන් කරමින් නොසිටින විට, ඔවුන් තම කාලය ජාතීන් තුනක් සහ මහාද්වීප දෙකක් අතරේ සිටින තම දරුවන් හතරදෙනා සහ මුණුබුරන් 11 දෙනා සමඟ ගත කරති.

DWIGHT SMITH

Saturation Church Planting International